
වාර්ෂික වාර්තාව
வருடாந்திர அறிக்கை
ANNUAL REPORT
2021



ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

ஸ்ரீலங்கா ஆட்டோமிக் எனர்ஜி போர்டு

SRI LANKA ATOMIC ENERGY BOARD

පටුන

	පිටු අංකය
1. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය හැඳින්වීම	**2**
2. සභාපතිතුමාගේ සමාලෝචනය	**6**
3. අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය	**15**
4. විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය - 2021	**16**
5. න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණික සේවා සැපයීමේ ප්‍රගතිය	
4.1 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය	**41**
4.2 ජෛව විද්‍යා අංශය	**47**
4.3 නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය	**53**
4.4 විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශය	**58**
4.5 කර්මාන්ත යෙදවුම් අංශය	**63**
6. ජාත්‍යන්තර සහයෝගිතා අංශය	**73**
7. පරිපාලන, මානව සම්පත් හා ප්‍රසම්පාදන අංශයේ ප්‍රගතිය	**81**
8. මූල්‍ය ප්‍රකාශනය - 2021	**88**
9. විගණකාධිපතිගේ වාර්තාව - 2021	**121**
10. විගණකාධිපති වාර්තාව -2021 සඳහා කළමනාකරණ පැහැදිලි කිරීම් හා පිළිතුරු	**131**

1.0 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

අප ගැන

ශ්‍රී ලංකාව තුළ න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධ සියලු කටයුතු පාලනය කරන්නා වූ රාජ්‍ය ආයතනය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (ශ්‍රී ල. ප. බ. ම.) වේ.

ජාත්‍යන්තර සහයෝගය ඇතුව, ජාතික සංවර්ධන අභිමතාර්ථයන් මුදුන්පත් කර ගැනීම උදෙසා මහජනතාව, පරිසරය හා විශේෂයෙන් විකිරණ සේවකයින් හානිකර මට්ටමේ විකිරණයට පාත්‍ර වීමෙන් ආරක්ෂා කර ගැනීම ඇතුළුව සෞඛ්‍ය, කර්මාන්ත, කෘෂිකර්මාන්ත සහ පරිසරය යන ක්ෂේත්‍රයන් තුළ තාක්ෂණික හුවමාරුව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ මානව සම්පත් සංවර්ධනය ඔස්සේ විවිධාකාර වූ සේවාවන් සපයනු ලබයි.

1.1 අපගේ දැක්ම

න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය තුළින් ජාතියේ තිරසාර සංවර්ධනය.

1.1 අපගේ මෙහෙවර

සාමකාමී කටයුතු සඳහා න්‍යෂ්ටික තාක්ෂණ යොදා ගැනීම වෙනුවෙන් අනුග්‍රහ දැක්වීම සහ ධෛර්යමත් කිරීම මෙන්ම විකිරණ ආරක්ෂාව, සුරක්ෂිතතාවය සහ ප්‍රමිතිය තහවුරු කර ගනිමින් රටෙහි සමාජ - ආර්ථික සංවර්ධනය උදෙසා එහි ඵල ප්‍රයෝජන භාවිත කිරීම.

හා

විකිරණ සේවකයන්, මහජනතාව හා පරිසරය, හානිකර මට්ටමේ විකිරණයට පාත්‍ර වීමෙන් ආරක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා විකිරණ ආරක්ෂණ සේවාව ලබා දීම.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අරමුණු වන්නේ:

- **න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය සාමකාමී ලෙස භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම, දිරිගැන්වීම සහ එවැනි තාක්ෂණය භාවිතයෙන් සේවා සැපයීම**
- **ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යෙදුම් සංවර්ධනය කිරීම**
- **න්‍යෂ්ටික විද්‍යාවේ සහ තාක්ෂණයේ සාමකාමී භාවිතය සඳහා ආරක්ෂාව, ආරක්ෂක පද්ධති සහ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සහ සහය වීම**
- **න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණ යෙදුම් සම්බන්ධ නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා විකිරණ ආරක්ෂණ සේවා සැපයීම**
- **වාණිජ හෝ වෙනත් අරමුණු සඳහා අයනීකරණ විකිරණ සහ අනුපූරක ශිල්පීය ක්‍රම ඇතුළත් ක්‍රියාකාරකම් වල නිරත වීම**

1.2 අධ්‍යක්ෂ මණ්ඩලය

2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතෙහි 06 වන කොටසට අනුව පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මෙහෙයවනු ලබයි. 2021 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වූයේ:

නම	අධ්‍යක්ෂ මණ්ඩල තනතුර	වෘත්තිය / තනතුරු
මහාචාර්ය එස්.ආර්.ඩී.රෝසා 2019 - සැප්තැම්බර් සිට	අධ්‍යක්ෂ මණ්ඩල සභාපති	• මහාචාර්ය, භෞතික විද්‍යා අංශය, කොළඹ විශ්වවිද්‍යාලය. • 1989 - 2003 දක්වා සහ 2005 - 2013 දක්වා උසස් පෙළ භෞතික විද්‍යා ප්‍රශ්න පත්‍රයේ සැකසුම් මණ්ඩලයේ සාමාජික, • භෞතික විද්‍යා ආයතනයේ සභාපති (2004 - 2006), • කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා ගුරු සංගමයේ සභාපති (2000 – 2009), • විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ ලේකම් (2006, 2007), • නව භෞතික විද්‍යා විෂය මාලාව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ ඇගයීම පිළිබඳ උපදේශක (1995-1996), භෞතික විද්‍යාව විෂය මාලාව සකස් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කරන ලද සාමාජික/උපදේශක (2005 සිට 2007 දක්වා)
වෛද්‍ය ඩබ්. මීගොඩ 2020 - ජනවාරි සිට	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	• සෞඛ්‍ය අමාත්‍යාංශයේ න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව සහ විකිරණවේදය පිළිබඳ විශේෂඥ විකිරණවේදී විශේෂඥ විකිරණවේදී / උපදේශක (වසර විස්සකට වැඩි - න්‍යෂ්ටික වෛද්‍ය හා විකිරණ ක්ෂේත්‍රය) • 2015 සිට පොලිස් රෝහලේ ගෞරවනීය උපදේශක විකිරණවේදී
ආචාර්ය ජයසිංගම් ජයසුගිත්තම් 2020 - ජනවාරි සිට	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	• කොළඹ විශ්වවිද්‍යාලයේ න්‍යෂ්ටික විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය • භෞතික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - කොළඹ විශ්ව විද්‍යාලයේ න්‍යෂ්ටික විද්‍යා අංශයේ, ජාත්‍යන්තර න්‍යායික භෞතික විද්‍යා මධ්‍යස්ථානය (ICTP) (2019 වසරේ සිට)
එච් .ටී. කමල් පත්මසිරි මහතා 2020 - ජනවාරි සිට	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	• පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා සහ අමාත්‍යාංශයේ ප්‍රධාන විධායක නිලධාරියා මෙන්ම ප්‍රධාන ගණකාධිකාරී (2015-2019) - ශ්‍රී ලංකා පරිපාලන සේවය (වසර 32) • පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ හිටපු ලේකම්, • කොළඹ සහ කළුතර හිටපු දිසාපති/දිස්ත්‍රික් ලේකම්, • ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්, • ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයේ සහ දේශීය ණය සංවර්ධන අරමුදලේ හිටපු සභාපති, • නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
වෛද්‍ය සුනිල් ගමගේ (2020 ජනවාරි - 2021 සැප්තැම්බර් දක්වා)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	• ජපානයේ ශ්‍රී ලංකාව සඳහා හිටපු ගරු කොන්සල් ජනරාල්, • ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ජපානයේ Hokkaido Bunkyo විශ්වවිද්‍යාලයේ බාහිර මහාචාර්ය (ගෞරව ආචාර්ය උපාධිය)(2014 වර්ෂයේ සිට), • ජපානයේ ශ්‍රී ලංකා වෙළඳ සහ ආර්ථික මධ්‍යස්ථානයේ සභාපති (2013 වර්ෂයේ සිට), • ජපන් සංස්කෘතික හා සමාජ සේවා සංගමයේ අධ්‍යක්ෂ (2015), • ජපාන ශ්‍රී ලංකා සංගමයේ සභාපති (2008 වර්ෂයේ සිට), • ජපාන ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමයේ විධායක අධ්‍යක්ෂ (2007), • ජාත්‍යන්තර ෂෝටෝකාන් කරාටේ ආසියාවේ අධ්‍යක්ෂ, Nippon තාක්ෂණ ප්‍රවර්ධන සහයෝගිතා අධ්‍යක්ෂක
අරෝෂ රුද්‍රිගු මහතා (2020 ජනවාරි - 2021 සැප්තැම්බර්)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	• වරලත් ගණකාධිකාරී

කේ.ඩී. සුනන්දලාල් මහතා (2020 ජනවාරි - 2021 සැප්තැම්බර්)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	• උපදේශක, උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ නියෝජිතායතනය
කාවින්ද දිසානායක මහතා (2021 - සැප්තැම්බර් සිට)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	• අධ්‍යක්ෂ, ජාතික කෘෂි නිපුණතා මණ්ඩලය, • උපදේශක, අපනයන සංවර්ධන මණ්ඩලය (2021 වර්ෂයේ සිට) • කළමනාකාර අධ්‍යක්ෂ, ලංකා කෘෂි නිෂ්පාදන කළමනාකරණ සංස්ථාව (2019 වර්ෂයේ සිට), • සම්බන්ධීකරණ ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (2016)
රසිත් වික්‍රමසිංහ මහතා (2021 සැප්තැම්බර් සිට)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	• තොරතුරු තාක්ෂණ පද්ධති ඉංජිනේරු - CBL Investments PVT LTD. (2011-2013), • O'Donnell Griffin (ඕස්ට්‍රේලියාව) හි ප්‍රධාන විදුලි ඉංජිනේරු (2008-2009), • GE ජලය සහ ක්‍රියාවලි තාක්ෂණයේ ස්වයංක්‍රීය ඉංජිනේරු (ඕස්ට්‍රේලියාව) (2006-2008), • Tridon Australia Ltd හි නිෂ්පාදන ඉංජිනේරු (2005-2006)
මලිත් පෙරේරා මහතා (2021 සැප්තැම්බර් සිට)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	• අධ්‍යක්ෂ - සීමාසහිත කොළඹ වාණිජ පොහොර සමාගම සහ ලංකා සිමෙන්ති සමාගම • විධායක අධ්‍යක්ෂ, සීමාසහිත කොළඹ වාණිජ පොහොර සමාගම සහ ලංකා සිමෙන්ති සමාගම • සෙන්මීන් මෝටර් රථ පෞද්ගලික සමාගමෙහි ජාත්‍යන්තර සහයෝගිතා කළමනාකාර අධ්‍යක්ෂ, • නීෂ් හෝල්ඩින්ග්ස් පෞද්ගලික සමාගමෙහි නිර්මාතෘ
එච්.පී.ජයානන්ද මහතා (2021 ජනවාරි සිට ජූලි දක්වා)	අධ්‍යක්ෂක මණ්ඩල නිරීක්ෂක	අතිරේක ලේකම් (පරිපාලන සහ සංවර්ධන) සූර්ය, සුළං සහ ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
රාජිකා ගන්කේවෙල මහත්මිය (2021 ජූලි සිට)	අධ්‍යක්ෂක මණ්ඩල නිරීක්ෂක	අතිරේක ලේකම් (පරිපාලන සහ සංවර්ධන) සූර්ය, සුළං සහ ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

1.3 ජ්‍යෂ්ඨ කළමනාකරණ කමිටුව

නම	තනතුර	සුදුසුකම්
ටී.එම්.ආර්.තෙන්නකෝන් මහතා	අධ්‍යක්ෂ ජනරාල්	බී.එස්.සී (භෞතික විද්‍යාව-විශේෂ) ගෞරව - කොළඹ වි.වි එම්.එස්.සී. (න්‍යෂ්ටික විද්‍යාව) - කොළඹ වි.වි එම්.ෆිල්. (ද්‍රව්‍ය ඉංජිනේරු)- මොරටුව වි.වි
චම්පා දිසානායක මහත්මිය	අධ්‍යක්ෂක ජෛව විද්‍යා අංශය	බී.එස්.සී. (කෘෂිකර්මය) - රුහුණ වි.වි. එම්. ෆිල් (න්‍යෂ්ටික විද්‍යාව)-කොළඹ වි.වි.
ආචාර්ය විරාජ් එදිරිසිංහ මහතා	අධ්‍යක්ෂක කර්මාන්ත යෙදවුම් අංශය	බී.එස්.සී ගෞරව-පේරාදෙණිය වි.වි. එම්.එස්.සී. (න්‍යෂ්ටික විද්‍යාව) - කොළඹ වි.වි. පී. එච්. ඩී.(සමස්ථානික ජල විද්‍යාව)- පේරාදෙණිය වි.වි
ප්‍රසාද් මහකුමාර මහතා	අධ්‍යක්ෂක විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශය	බී.එස්.සී ගෞරව (පේරාදෙණිය වි.වි.), එම්.එස්.සී.(න්‍යෂ්ටික විද්‍යාව) -කොළඹ වි.වි.
අනුර ජයතිලක මහතා	අධ්‍යක්ෂක නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය	බී.එස්.සී (පේරාදෙණිය වි.වි) එම්.එස්.සී.(ද්‍රව්‍ය ඉංජිනේරු) - මොරටුව වි.වි
එච්.එම්.එන්.ආර්.බණ්ඩාර මහතා	අධ්‍යක්ෂක ජාත්‍යන්තර සහයෝගිතා අංශය	බී.එස්.සී ගෞරව-සබරගමුව වි.වි. එම්.පී.එම් (ස්ලිඩා)
මානෙල් චන්ද්‍රසේකර මහත්මිය	අධ්‍යක්ෂක පරිපාලන හා මානව සම්පත්	බී.එස්.සී ගෞරව)-කොළඹ වි.වි එම්.පී.එම් (ස්ලිඩා) එම්.පී.ඒ(පී.අයි.එම්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
ඩී. අසරප්පෙරුම මහතා	අධ්‍යක්ෂක මුදල්	එම්.බී. ඒ(ඕස්ට්‍රේලියා),ඒ.සී.එම්.එ(යූ.කේ) සී.ජී.එම්.ඒ.(යූ.එස්) ඩී.බී.එෆ්.ඒ.(අයි.සී.ඒ.ඒස්.ඒල්)

2.0 සභාපතිතුමාගේ සමාලෝචනය



2021 වසර සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වාර්ෂික වාර්තාව / මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට අප හට අවස්ථාව ලැබීම ඉමහත් සතුටකි.

2021 වසර සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි අංශ මට්ටමේ ක්‍රියාකාරකම් හා ප්‍රධාන මූල්‍යමය කරුණු පහත සඳහන් පරිදි විස්තර කරමි.

2.1 විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශය

විකිරණ සේවකයන්, සාමාන්‍ය ජනතාව සහ පරිසරය අනවශ්‍ය ලෙස විකිරණ වලට නිරාවරණය වීම වැලැක්වීම සඳහා අවශ්‍ය විකිරණ ආරක්ෂණ සේවා සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. රටේ න්‍යෂ්ටික ආරක්ෂණය සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වන නියාමන අවශ්‍යතා පූරණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සේවා සැපයීමද මෙම අංශය මඟින් සිදු කෙරේ. 2021 වසරේ වූ කොවිඩ්-19 තත්ත්වය යටතේ වුවද, අංශයේ අත්‍යවශ්‍ය සේවා සියල්ල අඩාළ වීමකින් තොරව පවත්වාගෙන යාමට හැකි වී තිබේ.

මෙම අංශයට අයත් න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ විද්‍යාගාරය මඟින් අධ්‍යාපනික ඉදිරිපත් කිරීම් සහ පරීක්ෂණ සඳහා සුදුසු විකිරණ මිනුම් උපකරණ තුනක් සහිත කට්ටලයක් දේශීයව නිෂ්පාදනය කර ඇත. 2021 වසර තුළ දී, එම උපකරණ වල පැරණි මොඩලයේ උපකරණ 8 ක් නව මොඩලය වෙත යාවත්කාලීන කර තිබේ. අනිවාර්ය අලුත්වැඩියා කිරීම් අවශ්‍යව තිබූ ජාතික න්‍යෂ්ටික ආපදා පූර්ව හඳුනාගැනීමේ අනාවරක පද්ධතියේ, දුරස්ථ අනාවරක සියල්ල අලුත්වැඩියා කරන ලදී. නව විකිරණ මිනුම් උපකරණ නිර්මාණය කිරීම මෙන්ම එම තාක්ෂණය තුළ යොදා ගන්නා උපකරණ සඳහා අවශ්‍ය නඩත්තු සහ අලුත්වැඩියා කිරීමේ සේවා දේශීයව, අඩු මිලට ලබා දීම ද මෙම විද්‍යාගාරය මඟින් සිදු කෙරේ. 2021 වසර තුළ දී එවැනි උපකරණ අලුත්වැඩියා සේවා 29 ක් ලබා දී ඇත.

විකිරණ මිනුම් උපකරණ සඳහා දීපව්‍යාප්ත ක්‍රමාංකන සේවා ලබා දීමත්, විකිරණ සේවකයන් සඳහා දීපව්‍යාප්ත මාත්‍රාමිතික සේවා ලබා දීමත්, මෙම අංශයෙන් සිදු වේ. එම සේවා ද්විත්වයම ISO/IEC 17025 අන්තර්ජාතික සම්මතයට අනුකූලව ප්‍රතීතනය කර ඇත. 2021 වසර තුළ දී එම ප්‍රතීතන තත්ත්වය ISO/IEC 17025:2017 නව අන්තර්ජාතික ප්‍රතීතන සම්මතය වෙත යාවත්කාලීන කරන ලදී. එම වසර තුළදී මිනුම් උපකරණ 108 ක් සඳහා ක්‍රමාංකන සේවා ලබා දී ඇත. විකිරණ සේවක ආරක්ෂාව තහවුරු කිරීම සඳහා විකිරණ සේවකයන් 2,235 ක්, වසර පුරාම මාත්‍රාමිතික සේවය මඟින් අධීක්ෂණය කර තිබේ. එම සේවාව පහසු මිලට හෝ නොමිලේ, අඛණ්ඩව ලබා දීම සඳහා අවශ්‍ය පියවර මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෙරේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුග්‍රහය යටතේ, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත, විකිරණ ආරක්ෂණ මාර්ගෝපදේශ ද්විත්වයක් සම්පාදනය කිරීමට ද මෙම අංශය විශේෂිත උපදේශන සේවාවක් ලබා දෙන ලදී.

ඒ අනුව, "සෞඛ්‍ය අංශයේ විකිරණ ආරක්ෂණය සඳහා වන ජාතික මාර්ගෝපදේශන සංග්‍රහය" සහ "විකිරණ ආරක්ෂණ නිලධාරීන් සඳහා වන ක්‍රියාකාරී මාර්ගෝපදේශනය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික පිළිකා මර්දන වැඩපිළිවෙල මඟින් පළ කර තිබේ. "මූලික විකිරණ ආරක්ෂණය" පිළිබඳව තෙදින පුහුණු වැඩමුළුවක් සංවිධානය කිරීම ද අංශය විසින් සිදු කරන ලදී.

පාරිසරික විකිරණශීලීතාවය පිළිබඳව අධීක්ෂණ සේවා සහ රේඩෝන් (ස්වභාවිකව උත්පාදනය වන විකිරණශීලී වායුවකි) මිනුම් කටයුතු ද පවත්වාගෙන යන අතර, විකිරණ යෙදීම් කෙරෙන වැඩබිම් අධීක්ෂණය සඳහා වන සේවා අඛණ්ඩව ලබා දීමද වසර මුළුල්ලේ සිදු කෙරිණි.

ජනතාවගේ සුරක්ෂිතතාවය තහවුරු කරනු වස්, න්‍යෂ්ටික සුරක්ෂිතතාවය වෙනුවෙන් විශේෂඥ සේවා ලබා දීමද, අංශය මඟින් සිදු කර තිබේ. විශේෂයෙන්ම, "ඒකාබද්ධ න්‍යෂ්ටික සුරක්ෂිතතා සහයෝගිතා සැලැස්ම" (Integrated Nuclear Security Support Plan/INSSP) යටතේ ශ්‍රී ලංකාව තුළ න්‍යෂ්ටික අනාවරණ ව්‍යුහය වැඩිදියුණු කිරීම සහ බලගැන්වීම සඳහා ඉමහත් තාක්ෂණික දායකත්වයක් අංශය විසින් ලබා දී තිබේ. ප්‍රධාන තොටුපල පරිශ්‍ර තුළ (බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන්තොටුපල සහ කොළඹ වරාය) සුරක්ෂිතතාවය තහවුරු කිරීමටත්, ප්‍රභූ ආරක්ෂාව සහ පොදු උත්සව අවස්ථා වල න්‍යෂ්ටික සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහාත් අවශ්‍ය වන මානව සම්පත් සංවර්ධනය සහ තාක්ෂණික උපාංග සැපයීම අංශය මඟින් සිදු කර තිබේ. ශ්‍රී ලංකා රේගුව, ගුවන්තොටුපල ආරක්ෂණ අංශ, ශ්‍රී ලංකා පොලීසිය සහ ත්‍රිවිධ හමුදාවන් සඳහා ද මාර්ගෝපදේශනය සහ තාක්ෂණික දායකත්වය ලබා දී ඇත.

එසේම, න්‍යෂ්ටික ආපදා පූර්ව හඳුනාගැනීමේ අනාවරක පද්ධතිය අධීක්ෂණය කිරීම සහ පවත්වාගෙන යාමත්, අභාවිත විකිරණ ප්‍රභව සඳහා වන මධ්‍යම ගබඩාව පවත්වාගෙන යාමත් මෙම අංශය මඟින් සිදු කෙරේ.

විකිරණ ආරක්ෂණ සහ තාක්ෂණික සේවා අංශය, දීපව්‍යාප්ත, ලාභය මත පදනම් නොවන එහෙත් අත්‍යවශ්‍ය සේවා සැපයීම සිදු කරන නමුත්, 2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 21.85 ක ආදායමක් උපයා තිබේ. එය 2020 වසරට සාපේක්ෂව 32%ක පමණ ආදායම් ඉහළ යාමකි. මෙයට අමතරව රුපියල් මිලියන 2.0 ක වටිනාකමක් සහිත නොමිලේ සේවා ද අංශය මඟින් ලබා දී තිබේ.

2.2 නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය

නිර්විනාශක පරීක්ෂණ සහ ඒ සම්බන්ධ අනෙකුත් තාක්ෂණික ක්‍රමවේද භාවිත කරමින් ලෝහ සහ අලෝහ මඟින් කරන ලද නිෂ්පාදන හා ඉදිකිරීම් වල පලුදු අවම මට්ටමින් පවත්වාගෙන යාම සහ එමඟින් රටෙහි එවැනි නිෂ්පාදන සහ ඉදිකිරීම් වල ප්‍රමිතිය ඉහළ නැංවීම නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම නිර්විනාශක පරීක්ෂණ සේවාව ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර 04 ක් ඔස්සේ සිදු කරන ලදී.
ඒවා නම් ;

i. NDT පුහුණු සේවාව: සහතිකකරණ පුහුණු පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ, දේශන, කාර්මික පුහුණු, විභාග සහ පුද්ගල සහතිකකරණය
ii. පරීක්ෂා කිරීම: NDT පරීක්ෂණ සේවා
iii. පර්යේෂණ: කාර්මික ක්ෂේත්‍රයේ හමුවන ගැටළු විසඳීම සඳහා සහ අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා සිදු කරන කෙටි කාලීන හා දිගු කාලීන පර්යේෂණ
iv. සංවර්ධන: තාක්ෂණික සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයෙහි පුහුණු ඒකකය මඟින් IAEA TECDOC 628 සහ ISO 9712 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව කරන පුහුණු පාඨමාලා වාර්ෂිකව පවත්වනු ලබයි.

ශ්‍රී ලංකා ප්‍රතිතකරණ ආයතනය මඟින් ISO 17024 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ප්‍රතීතකරණයට ලක් කරන ලද නිර්විනාශක පරීක්ෂණ සහතිකකරණ ඒකකය (Certification Body for NDT) මඟින් ඉහත පුහුණු පාඨමාලා සම්පූර්ණ කරන ලද සිසුන් සඳහා ISO 9712 ප්‍රමිතියට අනුව විභාග පැවැත්වීම හා සහතිකකරණය සිදු කරනු ලබයි.

2021 වසර සඳහා වැඩමුළු, පුහුණු පාඨමාලා, විභාග සහ සහතිකකරණය යන කටයුතු වලට සම්බන්ධ වූ සම්පූර්ණ සිසුන් සංඛ්‍යාව 133 කි.

මීට අමතරව කාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සහ කාර්මික සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර සහ ලෝහ නිෂ්පාදන වල පලුදු අවම කිරීම උදෙසා නිර්විනාශක පරීක්ෂණ සේවාව NCNDT මඟින් පවත්වා ගෙන යනු ලබයි.

2021 වසරේදී රාජ්‍ය සහ පෞද්ගලික අංශ වල කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා නිර්විනාශක පරීක්ෂණ සේවාවන් 205 ක් ලබා දෙන ලදී.

නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය මඟින් 2021 වසර සඳහා අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 15.75 ක් වූ අතර, රුපියල් මිලියන 16.98 ක් ඉහත සියලු ක්‍රියාකාරකම් මඟින් උපයා ගන්නා ලදී. (වැට් බද්ද සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන කවුන්සිලයෙන් ලබා ගත් කුලිය හැර).

මීට අමතරව, පර්යේෂණ කටයුතු යටතේ, විශ්වවිද්‍යාල වල සිසුන් කිහිප දෙනෙකු ඔවුන්ගේ අධ්‍යයන කටයුතු හා සම්බන්ධ කෙටිකාලීන පර්යේෂණ කටයුතුවලට සහභාගී වූහ.

වසර පුරා ISO 17024 සහ ISO 9712 ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ප්‍රමිතිකරණයට භාජනය කර ඇති NCBNDT හි කටයුතු නොනවත්වා සාර්ථකව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

එසේම, ISO 17020:2012 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව NDT ක්‍රමවේද 04 ක් (Magnetic Practical Testing, Ultrasonic Testing, Liquid Penetrant Testing & Concrete Testing) ප්‍රතිතකරණයට ලක් කර ඇති අතර, එම ප්‍රතිකරණ තත්වය නොකඩවා පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

නිර්විනාශක පරීක්ෂණ ක්ෂේත්‍රයේ සේවාවන් තවදුරටත් ඉහල නැංවීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ආයතනයේ සහයෝගයෙන් ක්‍රියාත්මක වන IAEA TC project No. SLR 1009, 2016 - 2019 නැමති ව්‍යාපෘතිය 2021 වසර තුළත් ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

2.3 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ රජය සතු එකම බහුකාර්ය ගැමා ප්‍රකිරණ පහසුකම වන ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය (SLGC) බියගම අපනයන සැකසුම් කලාපයේ 2014 සිට ක්‍රියාත්මක වේ.

250 KCi ආරම්භක සක්‍රියතාවයකින් යුතුව ක්‍රියාත්මක වන මෙම ගැමා පහසුකම අඛණ්ඩ, වාහක වර්ගයට අයත් වූවකි. කොබෝල්ට් - 60 ආරම්භක සක්‍රියතාවය 2021 ජනවාරි 01 දින වන විට 170 kCi විය. එහි උපරිම ප්‍රතිලාභ උපයෝගී කර ගැනීම සඳහා පළපුරුදු සහ කැපවූ මෙහෙයුම් කාර්ය මණ්ඩලය සමඟ මෙම පහසුකම පැය 24 පුරා ක්‍රියාත්මක වේ.

පාරිභෝගිකයින්ගෙන් ඇති වැඩි ඉල්ලුම හේතුවෙන්, SLGC විසින් 2021 අප්‍රේල් මාසයේදී එහි ප්‍රභවයේ ශක්තිය තවත් 250 kCi කින් වැඩි දියුණු කරන ලදී. 2021.04.15 වන විට මුළු මූලාශ්‍ර ක්‍රියාකාරකම් 413.5 kCi විය. මීට පෙර ප්‍රභව පැටවීමේ සහ මාත්‍රා සිතියම්ගත කිරීමේ කටයුතු ඉන්දියාවේ සහ සමස්ථානික විකිරණ මණ්ඩලයේ (BRIT India) විශේෂඥයින්ගේ සහය ඇතිව සිදු කළද, මෙවර මූලාශ්‍ර පැටවීම BRIT විශේෂඥයින් නොමැතිකම නිසා SLGC කාර්ය මණ්ඩලය විසින්ම සිදු කරන ලදී.

කර්මාන්ත, ව්‍යවසායකයින්, පර්යේෂණ ආයතන යනාදිය සඳහා ප්‍රවිකිරණ සේවා සැපයීම මඟින් රටට උපරිම ප්‍රතිලාභ ලබා දීම කෙරෙහි SLGC අවධානය යොමු කරයි. ප්‍රධාන වශයෙන් ගැමා ප්‍රවිකිරණ සේවාව වෛද්‍ය නිෂ්පාදන විෂබීජහරණය කිරීම, ඇසුරුම් ද්‍රව්‍ය විෂබීජහරණය කිරීම, ආහාර හා ඖෂධ පැළැටි වල ක්ෂුද්‍රජීවී විෂබීජනාශනය හා කෘමීන් පාලනය කිරීම, ෆයිටෝ සනීපාරක්ෂක ප්‍රතිකාර, විකෘති අභිජනනය, ද්‍රව්‍ය වෙනස් කිරීම සහ රෝග පාලනය සඳහා විෂබීජ නාශක කෘමීන් යොදා ගැනීම යන කටයුතු සඳහා භාවිතයට ගෙන ඇත.

ප්‍රවිකිරණ කටයුතු සඳහා SLGC සතුව වාණිජ වාහක සහ සහායක වාහක (නියැදි වාහක) ඇති අතර ඒවාට එකිනෙකට ස්වායත්තව ක්‍රියා කළ හැකිය. වාණිජ වාහකය ප්‍රධාන වශයෙන් කැපවී ඇත්තේ, මුලින් නිෂ්පාදන වලංගුකරණ අධ්‍යයන සිදු කරන සහ අඛණ්ඩ සැපයුමක නිරත පාරිභෝගිකයින් සඳහා වේ. ප්‍රවිකිරණකයේ සුවිශේෂී ලක්ෂණයක් වන සහායක වාහකය, අඛණ්ඩ හෝ කුඩා පරිමාවන් ඇති විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල පර්යේෂකයන්ගේ සහ විවිධ කර්මාන්ත වල කර්මාන්තකරුවන්ගේ පර්යේෂණ හා සංවර්ධන අරමුණු සඳහා වන සාම්පල ප්‍රවිකිරණය කිරීමට පහසුකම් සපයයි. එමෙන්ම, අභ්‍යන්තර ක්‍රමාංකන ක්‍රියාකාරකම් සහ අන්තර් සංසන්දනාත්මක අධ්‍යයන සඳහා නියැදි වාහකය අධික ලෙස භාවිත කරනු ලැබේ.

වාණිජ පරිමාණ මෙහෙයුම් තුළින් රු. 58,636,001.60 ක මුදලක් උපයා ගැනීමට SLGC ට හැකි විය. සහායක වාහක ප්‍රවිකිරණ සේවාව මඟින් රු. 331,858.88 ක මුදලක් උපයාගෙන ඇත. ඒ අනුව, 2020 වර්ෂයේ මුළු ආදායම රු. 58,967,860.48 ක් වේ.

SLGC මඟින් ශ්‍රී ලංකාවේ සියලුම රජයේ රෝහල් සඳහා අවශ්‍ය ශල්‍ය අත්වැසුම් විෂබීජහරණය කිරීමෙන් ප්‍රවිකිරණ සේවා සපයනු ලබන්නේ රටේ ආර්ථිකයට විශාල වාසියක් අත්කර දෙමිනි. ප්‍රවිකිරණ සේවාව පහසුවෙන් ලබා ගත හැකි බැවින් ව්‍යවසායකයින් කිහිප දෙනෙකු නිෂ්පාදන පහසුකම් අලුතින් ආරම්භ කළ අතර සමහරු ආනයනය කරන ලද නිමි භාණ්ඩ ප්‍රවීකිරණය කරමින් සිටින අතර, තවත් සමහරු සිරින්ජර සහ ගෝස් සඳහා නිෂ්පාදන පහසුකම් ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටිති.

SLGC ප්‍රධාන විද්‍යාගාර තුනකින් සමන්විතය. ඩොසිමෙට්‍රි විද්‍යාගාරය, ආහාර තාක්ෂණ විද්‍යාගාරය සහ ක්ෂුද්‍රජීව විද්‍යාගාරය වේ. ඩොසිමෙට්‍රි විද්‍යාගාරය තත්ත්ව සහතිකකරණ විද්‍යාගාරය ලෙස ක්‍රියා කරන අතර එය ප්‍රවිකිරණය වන නිෂ්පාදන සඳහා ලබා දෙන මාත්‍රාව සහතික කරයි.

ක්ෂුද්‍රජීව විද්‍යාගාරය සහ ආහාර තාක්ෂණ විද්‍යාගාරය මූලික වලංගුකරණ සේවා, ක්ෂුද්‍ර ජීව විද්‍යා පරීක්ෂණ සේවා සහ අනෙකුත් පරීක්ෂණ සේවා සපයන අතර, සියලුම විද්‍යාගාර පර්යේෂණ පහසුකම් සපයයි.

කාර්ය මණ්ඩලයේ, ගැමා ප්‍රභවයේ සහ පරිසරයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රභවයට අවශ්‍ය ආරක්ෂාව සපයන අතර, වාණිජ ප්‍රවීකිරකයක් ලෙස SLGC හි සුරක්ෂිත බව සහ ආරක්ෂාව සහතික කිරීම සහ ජාත්‍යන්තර මාර්ගෝපදේශ වලට අනුකූල වීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන කවුන්සිලය (SLAERC) නිරන්තරයෙන් කරනු ලබන පරීක්ෂණ මඟින් වරින් වර ආරක්ෂිත කටයුතු , වෛද්‍ය නිරීක්ෂණ වැඩසටහන්, පුද්ගලික මාත්‍රා අධීක්ෂණ වැඩසටහන් යනාදිය මඟින් මෙහි ආරක්ෂක පියවරයන්හි ඵලදායි බව සහතික කෙරේ. SLGC හි ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය නංවාලීම සඳහා දේශීය හෝ ජාත්‍යන්තරව මෙන්ම වෙනත් විකිරණ ආරක්ෂණ වැඩසටහන් වලට සහභාගී වේ.

සේවා සපයන්නෙකු ලෙස SLGC ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා අදාළ තත්ත්ව කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම මඟින් එහි සේවාවේ ගුණාත්මකභාවය ඉතා ඉහළ මට්ටමකින් පවත්වාගෙන යනු ලබයි. ISO 9001 සහ ISO 13485 (වෛද්‍ය උපකරණ - තත්ත්ව කළමනාකරණ පද්ධති - නියාමන අරමුණු සඳහා අවශ්‍යතා).

වරින් වර පාරිභෝගිකයන් සමඟ කරන සාකච්ඡා, පාසල්, විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන වල සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් යනාදිය හරහා ගැමා ප්‍රවිකිරණ තාක්ෂණය සහ අදාළ සේවාවන් පිළිබඳව SLGC

දැනුවත් කරයි. විවිධ කර්මාන්ත සඳහා ගැමා ප්‍රවිකිරණය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් සිදු කරන පර්යේෂණ මඟින් කරනු ලබයි.

2.4 පෛව විද්‍යාත්මක අංශය

පාරිභෝගික ආරක්ෂාව උදෙසා ආනයනික කිරිපිටි විකිරණශීලීතාව හේතුවෙන් අපවිත්‍ර වී ඇත්දැයි පරීක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නියාමන අවශ්‍යතා සඳහා කාර්යක්ෂම හා ඵලදායී න්‍යෂ්ටික විශ්ලේෂණ සේවාවක් සැපයීම සඳහා **පෛව** විද්‍යා අංශය (LSD) වගකීම දරයි.

ආනයනික කිරිපිටි සාම්පල 4401 ක් සහ අපනයනය කරන ලද තේ සහ අනෙකුත් නිෂ්පාදන සාම්පල 269 ක් ගැමා වර්ණාවලීක්ෂය භාවිතයෙන් විකිරණශීලීතා මිනුම් සඳහා පරීක්ෂා කරන ලදී. සවිස්තරාත්මක විකිරණශීලීතා මිනුම් සඳහා සාම්පල 174 ක් පරීක්ෂා කරන ලදී. පස, ඛනිජ පුරාවිද්‍යාත්මක සාම්පල, මැණික්, මිශ්‍ර ලෝහ ආදියෙහි විවිධ සාම්පල නියැදි 279 ක් එක්ස් කිරණ ප්‍රතිදීප්ත වර්ණාවලීක්ෂය භාවිතයෙන් බහු-මූලද්‍රව්‍ය සංයුතිය සඳහා විශ්ලේෂණය කරන ලද අතර, දළ ඇල්ෆා සහ බීටා මිනුම් සඳහා අපජල සාම්පල 39 ක්ද, ස්ථායී සමස්ථානික සඳහා සාම්පල 130 ක්ද, පරීක්ෂා කරන ලදී. 2021 වර්ෂය තුළ සමස්ථානික අනුපාත ස්කන්ධ වර්ණාවලීක්ෂ තාක්ෂණය භාවිතයෙන් මෙම විශ්ලේෂණය කරන ලදී.

දේශීය වෙළඳපොලේ ආනයනය කරන ලද සහ දේශීයව නිෂ්පාදනය කරන ලද කිරිපිටි සඳහා විකිරණශීලීතා නිරීක්ෂණ වැඩසටහන පවත්වන ලදී. මෙම වැඩසටහන යටතේ ආනයනික කිරිපිටි සාම්පල් 35ක් සහ දේශීයව නිෂ්පාදනය කරන ලද කිරිපිටි සාම්පල් 11 ක් අහඹු ලෙස පරීක්ෂාවට ලක් කරන ලදී.

2006 වසරේ සිට ගැමා වර්ණාවලීක්ෂ විද්‍යාගාරය, ISO IEC 17025: 2005 නමැති විද්‍යාගාර පරීක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රතීතනයට අනුව තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) පවත්වා ගෙන යයි. 2020 පෙබරවාරි මාසයේදී ISO IEC 17025: 2017 හි නව අනුවාදයට අනුව සියලුම ලේඛන සහ ක්‍රියාවලීන් ඇතුළුව තත්ත්ව කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කරන ලදී.

න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සේවා වලින් LDS විද්‍යාගාරය මඟින් සම්පූර්ණ සාම්පල 5292 ක් සඳහා විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම මඟින් රුපියල් මිලියන 66.68 ක ආදායමක් උත්පාදනය කරන ලදී.

න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සේවාව සැපයීමට අමතරව, LSD මඟින් ජීව විද්‍යා යෙදුම් සහ ආහාර සහ කෘෂිකර්මය සඳහා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය යෙදීම පිළිබඳ ජාතික වශයෙන් විවිධ වැදගත් ව්‍යාපෘති වල නිරත වී ඇත.

i) 'සිලෝන් ටී' සම්භවය තහවුරු කිරීම සඳහා භූ රසායනික ප්‍රවේශය පිළිබඳ නියමු ව්‍යාපෘතිය (සහයෝගීතා ආයතන - තේ පර්යේෂණ ආයතනය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

ii) තෙත්බිම් කළමනාකරණය සහ තිරසාර සංරක්ෂණ සැලසුම් වැඩිදියුණු කිරීම - RAS 7037 (වයඹ විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතා ව්‍යාපෘතිය)

iii) කාබනික ආහාර සත්‍යාපනය කිරීමේ තාක්ෂණයක් සංවර්ධනය කිරීම සහ ස්ථායී සමස්ථානික භාවිතයෙන් පළතුරු යුෂ මිශ්‍ර කිරීම නිර්ණය කිරීම

iv) න්‍යෂ්ටික ශිල්පීය ක්‍රම භාවිත කරමින් ඉඩම් හායනය අවම කිරීම සහ බෝග ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පාංශු හා ජල තත්ත්ව තක්සේරු කිරීම සහ වැඩිදියුණු කිරීම (ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතා පර්යේෂණ)

v) AEA CRP 21090, D5.20.40 - ශ්‍රී ලංකාව තුළ ආනයනය කරන ලද සහ දේශීයව නිෂ්පාදනය කරන ලද කිරිපිටි වල සත්‍යතාව, ආරක්ෂාව සහ ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා වේගවත් පිරික්සුම් ක්‍රම සංවර්ධනය කිරීම

2.5 කර්මාන්ත යෙදවුම් අංශය

කර්මාන්ත යෙදවුම් අංශය යටතේ වන උප අංශ දෙකක් වන සමස්ථානික ජල විද්‍යා අංශය සහ විකිරණ පිරිසැකසුම් අංශය මගින් සහ සමස්ථානික පරිසර විද්‍යාව නම් වූ විද්‍යාත්මක විෂයයන් සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් මෙන්ම අදාළ සේවාවන් සිදුකරනු ලබයි. තවද පාසල් අධ්‍යාපන වැඩසටහන් සහ න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳව ගුරුවරුන් සහ පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා මෙම අංශය විසින් සම්බන්ධීකරණය කටයුතු කරනු ලැබේ. සමස්ථානික ජලවිද්‍යා වැඩසටහන යටතේ පාරිසරික තක්සේරුව හා ආරක්ෂාව සම්බන්ධ ව්‍යාපෘති, විශේෂයෙන්ම ජල ගැටළු සම්බන්ධව ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. විකිරණ පිරිසැකසුම් තාක්ෂණය මගින් කර්මාන්ත, සෞඛ්‍ය, කෘෂිකර්මාන්තය සහ පුරාවිද්‍යාව සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය සංවර්ධනය, විකිරණ තාක්ෂණය භාවිතයෙන් සිදු කෙරේ. මේ අතර, කර්මාන්ත යෙදවුම් අංශය විසින් පාර්ශවකාර ආයතන සහ අනෙකුත් අදාළ පර්යේෂණ ආයතන සහ සංවිධාන සඳහා අදාළ උපදේශන සහ විශ්ලේෂණ සේවා සපයයි. ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා ජාතික හා ජාත්‍යන්තර ආයතන/සංවිධාන සමඟ සහයෝගයෙන් කර්මාන්ත යෙදවුම් අංශය හි බොහෝදුරට පර්යේෂණ ව්‍යාපෘති පවත්වනු ලැබේ. කෙසේ වෙතත්, මෙම ක්‍රියාකාරකම් ආයතනයට ආදායම් උත්පාදනය සඳහා සෘජුවම සම්බන්ධ නොවන නමුත්, පහත සඳහන් පරිදි රටට සිදුවන ආර්ථික පාඩු අවම කර ගනිමින් න්‍යෂ්ටික තාක්ෂණය භාවිත කරමින් අනෙකුත් ආයතන වල විවිධ තීරණාත්මක තාක්ෂණික දුෂ්කරතා නිරාකරණය කර ගැනීමට අංශය සහාය වේ

2021 වර්ෂයේදී, Covid-19 වසංගත තත්ත්වය සමස්ථානික ජල විද්‍යා අංශයේ පර්යේෂණ කටයුතු වලට දැඩි ලෙස බලපෑවේය. සමස්ථානික ජල විද්‍යා වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා ප්‍රදේශයේ භූගත ජල කළමනාකරණයේ අවශ්‍යතාවය සඳහා මල්වතු ඔයේ සහ පහළ මහවැලි ද්‍රෝණියේ භූගත ජල හැසිරීම් තක්සේරු කිරීම 2021 දී අඛණ්ඩව සිදු කරන ලදී. එසේම, ලග්ගල වාරි වැවේ ජලය කාන්දු වීම සහ කොළඹ-මහනුවර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හරහා උල්පත් ජලය සම්භවය 2021 දී විමර්ශනය කරන ලදී. ගංගා ජලයේ සමස්ථානික ගෝලීය ජාලය (GNIR) සඳහා ජල නියැදි (කැලණි) ලබාගැනීම සහ වර්ෂාවේ සමස්ථානික ගෝලීය ජාලය සඳහා (GNIP) වැසි ජල නියැදි (කොළඹ, කටුගස්තොට සහ යාපනය) මාසික පදනමින් 2021 වසරේදීද එකතු කරන ලදී. විශ්ලේෂක වල අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සඳහා වසංගත තත්ත්වය තුළ ඇති වූ බාධා හේතුවෙන් ඉහත සියලු ව්‍යාපෘතිවල එකතු කරන ලද ජල සාම්පල සමස්ථානික ජල විද්‍යාගාරයේදී අර්ධ වශයෙන් විශ්ලේෂණය කළ හැකි විය. "නිවසේ සිට වැඩ" කාල සීමාව තුළ, අයන වර්ණදේහ භාවිතයෙන් ප්‍රධාන අයන විශ්ලේෂණ කටයුතුවල ප්‍රතීතනයට අදාළ බොහෝ ලේඛන කටයුතු අවසන් කරන ලදී. නියැදි විශ්ලේෂකවල තාක්ෂණික දෝෂ සහ නඩත්තු ගැටළු ඇති වූ අතර රට තුළ ආනයන/අපනයන සහ සංචාර සීමා පැනවීම නිසා එවැනි උපකරණ වල සේවා සහ අලුත්වැඩියාව සැලකිය යුතු ලෙස ප්‍රමාද විය. "බෝතල් කළ ජල කර්මාන්තයේ ජල මූලාශ්‍ර පිළිබඳ දත්ත ගබඩාව පිහිටුවීම" පිළිබඳ නව ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා වාණිජ පරිමාණ බෝතල් ජල සැපයුම්කරුවන් 17 දෙනෙකු දැනුවත් කරන ලද අතර, මූලාශ්‍රවලින් ජල සාම්පල මාසිකව ලබාදීමට ඔවුන් එකඟ විය.

විකිරණ පිරිසැකසුම් වැඩසටහන යටතේ, ජල මූලාශ්‍රවල තෙල් කාන්දුවීම් සඳහා යොදන තෙල් අවශෝෂක සංවර්ධනය, ඖෂධ අපද්‍රව්‍ය හායනය සඳහා විකිරණ ක්‍රම දියුණු කිරීම, පුරාවිද්‍යා කෞතුක වස්තු සඳහා ආරක්ෂිත වැස්මක්/තට්ටුවක් සංවර්ධනය කිරීම, විකිරණ වෙනස් කිරීම හරහා බහු අවයවීය අපද්‍රව්‍ය නැවත ප්‍රයෝජනයට ගැනීම/ප්‍රතිචක්‍රීකරණය කිරීම යනාදිය පිළිබඳ පර්යේෂණ කටයුතු 2021 දී අඛණ්ඩව සිදු කරන ලදී.

ඊට අමතරව, NCNDT පරිශ්‍රයේ අලුතින් පිහිටුවන ලද හරිතාගාරයක විවිධ කෘෂිකාර්මික භෝග සඳහා ප්‍රශස්ත ජල අවශ්‍යතා අධ්‍යයනය කිරීම සඳහා 2021 දී සමස්ථානික පරිසර විද්‍යා මඟින් පර්යේෂණ ආරම්භ කරන ලදී.

විශේෂයෙන්ම රටේ වියළි කලාපීය ප්‍රදේශවල අතිරික්ත ජල පරිභෝජනය පාලනය කිරීම තුළින් අනාගතයේදී කෘෂිකාර්මික ජල කළමනාකරණයට මෙය ප්‍රතිලාභයක් වනු ඇත. “ජල භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා සමස්ථානික ක්‍රම භාවිත කරමින් නියඟ තත්වයන් යටතේ බෝග ඵලදායිතාව ඉහළ නැංවීම” පිළිබඳ නව කලාපීය ව්‍යාපෘතියක් සඳහා IAEA හි කලාපීය සහයෝගිතා ගිවිසුම් වැඩසටහනට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති ලේඛනය සැලසුම් කිරීම 2021 දී සිදු කරන ලදී. එය IAEA පාලක මණ්ඩලය විසින් 2022 වර්ෂයේ සිට ක්‍රියාවට නැංවීමට අයවැයෙන් පරිපූරක ලබා ගැනීමේ හැකියාවට යටත්ව අනුමත කරන ලදී. ශ්‍රී ලංකාව ප්‍රමුඛ රට ලෙස ක්‍රියාත්මක වන ප්‍රථම IAEA RCA ව්‍යාපෘතිය මෙයයි. කැලණිය විශ්වවිද්‍යාලයේ වීදුරු පිඹිලීම් ඒකකයේ ආධාරයෙන් ශාක ජලය නිස්සාරණය සඳහා නියැදි සකස් කිරීමේ උපකරණයේ වැඩිදියුණු කිරීම් කිහිපයක් 2021දි සිදු කරන ලදී. පරිසර විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාලව රික්ත ආසවන සැකසුමක් ලබා ගැනීමට මූලික පියවර ගන්නා ලදී.

2021 වසරේ පාසල් අධ්‍යාපන වැඩසටහන යටතේ ආසියා සහ පැසිෆික් කලාපයේ ගුරුවරුන් සහ පාසල් ළමුන් සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමඟ ඒකාබද්ධව ජාත්‍යන්තර මාර්ගගත සම්මන්ත්‍රණ දෙකක් පවත්වන ලදී. "න්‍යෂ්ටික විද්‍යාවේ මූලික කරුණු - විකිරණ, විකිරණශීලීතාව සහ න්‍යෂ්ටික ප්‍රතික්‍රියා" යන මාතෘකාව යටතේ පළමු මාර්ගගත සම්මන්ත්‍රණය මෙහෙයවනු ලැබුවේ SLAEB හි සභාපති මහාචාර්ය S.R.D. රෝසා මැතිතුමන්ය. IAD හි අධ්‍යක්ෂ ආචාර්ය විරාජ් එදිරිසිංහ මහතා විසින් "ජලයේ සැඟවුණු තොරතුරුසෙවීම සඳහා සමස්ථානික ශිල්පීය ක්‍රම: මූලික මූලධර්ම සහ සමස්ථානික ජල විද්‍යාවේ යෙදීම්" යන මාතෘකාව යටතේ දෙවන මාර්ගගත සම්මන්ත්‍රණය පවත්වන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයේ ඊ-තක්සලාව සමඟ සම්බන්ධ වී අදාළ කටයුතු ද 2021 දී සිදුකරන ලදී. ද්විතීයික පාසල් සිසුන් සඳහා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ සිංහල විද්‍යුත් පොත E-තක්සලාව වේදිකාවේ සංවර්ධනය කර සිසුන් බඳවා ගැනීම සඳහා නිකුත් කරන ලදී. ජාතික අධ්‍යාපන ආයතනයේ ඉදිරි ද්විතීයික විෂයමාලා ප්‍රතිසංස්කරණය සඳහා වගකිව යුතු ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඒත්තු ගැන්වීය. 11 ශ්‍රේණිය සඳහා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ තේරීම් මොඩියුලයක් සංවර්ධනය කිරීමට ද මේවනවිට තීරණය වී ඇත.

2.6 ජාත්‍යන්තර සහයෝගිතා අංශය

එක්සත් ජාතීන්ගේ සංවිධාන ජාලයතුළ කටයුතු කරන සංවිධානයක් වන "සාමය හා සංවර්ධනය සඳහා වූ පරමාණු" ලෙස පුළුල් අරමුණක් ඔස්සේ දිවෙන අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (International Atomic Energy Agency-IAEA) ජාතික සම්බන්ධතා කාර්යාලය ලෙස ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සහයෝගිතා අංශය කටයුතු කරයි. ජාත්‍යන්තර සහයෝගිතා අංශය එහි තාක්ෂණික සහයෝගීතා වැඩසටහන යටතේ තාක්ෂණික ආධාර ලබා ගැනීම සඳහා අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමඟ කටයුතු සම්බන්ධීකරණය කරයි.

විවිධ ව්‍යාපෘති යටතේ අධිශිෂ්‍යත්ව, විද්‍යාත්මක සංචාර, විශේෂඥ මෙහෙවර සහ විද්‍යාගාර කටයුතු වැඩිදියුණු කිරීම සඳහා සහයෝගය ලබාදීම ආදිය මඟින් ඉහත සඳහන් පරිදි IAEA සිය තාක්ෂණික සහය සාමාජික රටවලට ලබා දෙයි. කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ හා තාක්ෂණික වෘත්තීයවේදීන්ගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා මාර්ගගත ක්‍රමවේදය යටතේ විශේෂඥ සහය කිහිපවතාවක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. අදාළ ජාතික ආයතන වල විද්‍යාඥයින්, ඉංජිනේරුවන් සහ පර්යේෂකයින් සඳහා විදේශ පුහුණුවීම්, වැඩමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ ආදියට සහභාගී වීමට අවස්ථා 05 ක් ලැබුණි. ඊට අමතරව IAEA කලාපීය හා අන්තර් කලාපීය තාක්ෂණ සහයෝගිතා ව්‍යාපෘති යටතේ මාර්ගගත තාක්ෂණය ඔස්සේ සංවිධානය කර තිබූ වැඩසටහන් 98 කට සහභාගී වීමට අපේ විද්‍යාඥයින්ට සහ තාක්ෂණවේදීන්ට අවස්ථා ලැබුණි.

2022-2023 කාල සීමාව සඳහා ජාතික තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති 06 ක් සඳහා යුරෝ 1,728,607.00 ක තාක්ෂණික ආධාර (ආසන්න වශයෙන් රුපියල් මිලියන 398 ක්) ලබා ගැනීමට 2021 වසරේදී අනුමැතිය ලැබී ඇත. මීළඟ තාක්ෂණික සහයෝගිතා චක්‍රය (2024/25) සඳහා සලකා බැලිය යුතු ව්‍යාපෘති යෝජනා ලබා

ගැනීම සඳහා න්‍යෂ්ටික තාක්ෂණය සාමකාමී අරමුණු සඳහා භාවිත කරන ශ්‍රී ලංකාවේ අදාල ජාතික ආයතන සමඟ සම්බන්ධීකරණයන් 2021 වසරේදී සැලසුම් කිරීම ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවට බලපෑ දරුණුතම සමුද්‍ර ව්‍යසනය වන එක්ස්ප්‍රස් පර්ල් නැව ගිනිබත්වීමේ සිද්ධියේදී තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා IAEA සමඟ සම්බන්ධීකරණය කටයුතු සිදුකරන ලදී. එය ශ්‍රී ලංකාවේ සංවේදී වෙරළබඩ පරිසරයට, ප්‍රාදේශීය ප්‍රජාවන්ට සහ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත. මුහුදු ජලයේ ඇති වූ ප්‍රරෝහණය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය රසායනාගාර ද්‍රව්‍ය සහ උපකරණ සැපයීමට IAEA කටයුතු යොදා ඇත. IAEA විසින් ව්‍යසනය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සඳහා විශේෂඥයකු ශ්‍රී ලංකාවට පැමිණීමට පවා සුදානම් කරන ලදී. නමුත් එම කාලය තුළ පැතිර ගිය COVID වසංගත තත්ත්වය හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මෙහිදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වෙත අවශ්‍යපකරණ සහ ඒවාට අවශ්‍යවන රසායනික ද්‍රව්‍ය ආදිය අප ආයතනය හරහා ලබාදීමට නියමිතය.

න්‍යෂ්ටික බලශක්ති වැඩසටහනක් හඳුන්වාදීම සඳහා ජාතික යටිතල ව්‍යුහයේ තත්ත්වය ඇගයීමට ශ්‍රී ලංකාවට සහය වීම සඳහා පිහිටුවන ලද අන්තර් සම්බන්ධිත න්‍යෂ්ටික යටිතල පහසුකම් සමාලෝචන මෙහෙයුම සිදු කිරීම සඳහා සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කරන ලදී. පිරිසිදු හා හරිත බලශක්ති ප්‍රභවයක් ලෙස, කාබන් උදාසීන විමෝචන සංකල්පයට අනුව න්‍යෂ්ටික බලය ජාතික න්‍යාය පත්‍රය සපුරාලයි.

මෙම අංශය , දකුණු කොරියාවේ කලාපීය සහයෝගිතා ගිවිසුම් කලාපීය කාර්යාලය, ජපානයේ අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන, න්‍යායික භෞතික විද්‍යාව සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය වැනි අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමඟ ද කටයුතු සම්බන්ධීකරණය කරයි.

රට තුළ න්‍යෂ්ටික තාක්ෂණය දියුණු කිරීම සඳහා තාක්ෂණික සහය ලබා ගැනීම, IAEA සාමාජික රටවල් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම, ශ්‍රී ලංකාවට තාක්ෂණික සහාය ලබා ගැනීමේ හැකියාව සහ න්‍යෂ්ටික දැනුම කළමනාකරණ සම්බන්ධීකරණය මෙම අංශය මඟින් සිදු කෙරෙන අනෙකුත් වැදගත් කාර්යන් වේ.

2.7 පරිපාලන අංශය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පරිපාලන අංශය විද්‍යාත්මක අංශවලට අවශ්‍ය සහයෝගය ලබාදීමේ වගකීම දරන අතර, පරමාණුක බලශක්ති මණ්ඩල පනතේ නීතියට සහ රජයට අදාළ අනෙකුත් නීතිමය අවශ්‍යතා සහ රෙගුලාසිවලට යටත්ව කටයුතු කරනු ලැබේ. කාර්යාල පද්ධතිවල කාර්යක්ෂම කළමනාකරණය, සාමාන්‍ය පරිපාලනය සහ ප්‍රසම්පාදනය මෙම අංශයේ විෂය පථය තුළ ඇති ප්‍රධාන ක්ෂේත්‍ර වේ. වාර්ෂික පරිපාලන වාර්තා සකස් කිරීම, මානව සම්පත් සංවර්ධනය, විද්‍යාත්මක නොවන උපකරණ සහ ගොඩනැගිලි නඩත්තු කිරීම, සේවක යාවත්කාලීන ඉදිරිපත් කිරීම, ප්‍රාග්ධන අයවැය යාවත්කාලීන කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම සහ නිශ්චිත ලේඛන සහ වාර්තා සැකසීම සඳහා සහය වීම මෙම අංශයේ වගකීම වේ. මීට අමතරව, විද්‍යාත්මක හා විද්‍යාත්මක නොවන අංශ විසින් ඉල්ලා සිටින කාර්යක්ෂම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති ස්ථාපිත කිරීම, උපයෝගිතා ප්‍රසම්පාදන ක්‍රියාවලීන් කළමනාකරණය කිරීම, උපයෝගිතා සේවා කළමනාකරණය කිරීම සහ අනෙකුත් ආධාරක සේවා සැපයීම මෙම අංශයේ වගකීම වේ.

2021 වර්ෂයේදී මානව සම්පත් කළමනාකරණය යටතේ බඳවා ගැනීම් සිදු නොකළ අතර ශ්‍රේණි උසස්වීම් 06 ක් සිදු කර ඇත. විශ්‍රාම ගැනීම් 10 ක් ද සිදුවී ඇත. ස්ථිර කිරීම් 13 ක් සහ වැටුප් වැඩිවීම් 141ක් සිදු වූ අතර වසර තුළ ඉල්ලා අස්වීම් සිදු වී නොමැත. මීට අමතරව, සැලසුම් කළ දේශීය පුහුණු කිරීම් වලින් 50% ක් සිදු කරන ලදී. (COVID 19 වසංගත තත්වය නිසා උපරිම ඉලක්කය කරා ළඟා වීමට අපොහොසත් විය).

ආයතනයේ සාමාන්‍ය පරිපාලනය යටතේ ආරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා නඩත්තු කිරීම, ප්‍රවාහන පහසුකම් සැපයීම, තැපැල් සේවා හැසිරවීම, විදුලිය, ජලය, දුරකථන ආදී පහසුකම් නඩත්තු කිරීම, අභ්‍යන්තර හා බාහිර චක්‍රලේඛ පිළිබඳ දැනුවත් කිරීම, ගෙවීම් වැනි කටයුතු අතිකාල හා නිවාඩු දීමනා ආදිය විධිමත් ලෙස සැලසුම් කළ පරිදි සිදු කරන ලදී. මීට අමතරව, සැලසුම් කළ මිලදී ගැනීම් වලින් 88% ක් සම්පූර්ණ කර ඇත.

2.8 මූල්‍යමය තත්වයන්

2021 දී සපයන ලද බාහිර පාරිභෝගික සේවාවන්ගෙන් ආදායම

(වටිනාකම රු. මිලියන)

	ආදායම් ප්‍රභවය	**ඉලක්ක ගත ආදායම**	**ලැබූ ආදායම**
1	පෛව විද්‍යා අංශය (LSD)	70.0	66.7
2	විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශය (RPTSD)	19.0	21.7
3	ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය (SLGC)	65.0	59.0
4	නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය (NCNDT)	27.9	25.3
5	වෙනත් අදායම්	5.3	3.9
6	**එකතුව**	**187.1**	**176.6**

තරහකාරී වෙළඳපොල වාතාවරණය යටතේ වුවද, ඉහත සඳහන් වැඩසටහන් සාර්ථකව කර ගෙන යාමට සහයෝගය දැක්වීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට, ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයට සහ SLAEB හි සියළුම කාර්ය මණ්ඩලයට මම ස්තූතිය පළ කරමි.



මහාචාර්ය එස්. ආර්. ඩී රෝසා
සභාපති
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

3.0 අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය



දෛනික ජීවිතයේ මිනිසුන් මුහුණ දෙන ප්‍රශ්න ගණනාවක් න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය මඟින් විසඳිය හැකිය. ආරක්ෂාකාරීව හා මනා සංයමයෙන් යුතුව න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය යොදා ගන්නා විට සෑම ආකාරයටම යහපත් ප්‍රතිඵල ලබාදේ. එම නිසා ශ්‍රී ලංකාවේ පවතින පහසුකම් යොදාගෙන න්‍යෂ්ටික විද්‍යාවේ හා තාක්ෂණයේ අපරිමිත දායාදයන් ප්‍රයෝජනයට ගැනීම අත්‍යාවශ්‍යය.

1969 දී ආයතනය ආරම්භ කළ කාලයේ සිට එහි යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා වැඩි කැපවීමක් කළ අතර මේ වන විට නොයෙකුත් ක්ෂේත්‍ර තුළ ආයතනික ක්‍රියාකාරකම් කැපී පෙනෙන ආකාරයට දියුණු වී ඇත.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට මේ සම්බන්ධව පුළුල් වගකීමක් ඇති අතර එහි මූලෝපායික මෙහෙවර වන්නේ, න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යෙදීම් මහජනතාවට ලබාදී, එම තාක්ෂණය යොදා ගැනීමට දිරි දීම මෙන්ම, එමඟින් ලබාදෙන වාසි ශ්‍රී ලංකාවේ ආර්ථික සාමාජීය සංවර්ධනය උදෙසා යොදාගන්නා අතරතුර විකිරණ සේවකයන් මෙන්ම මහජනතාව හා පරිසරය ද අයනීකරණ විකිරණ වල අහිතකර බලපෑම් වලින් ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීමයි.

මම මෙම අවස්ථාවේ දී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව සාඩම්බරයෙන් ඉදිරිපත් කරමි. මෙම වාර්තාව ආයතනයේ ප්‍රගතිය සාරාංශ කරමින් 2021 වසරේ මූල්‍ය තත්වය විදහා දක්වයි. 2022 ඉදිරි වර්ෂය අප ආයතනයට අභියෝගාත්මක වසරක් වනු ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කාර්යක්ෂම සංවිධානයක් බවට මෙම ආයතනය සංවර්ධනය කිරීමට අපි නොකඩවා ඇපකැප වී සිටිමු.

සමස්තයක් වශයෙන් ගත් කළ, කොවිඩ් -19 වසංගත තත්ත්වයට අපි දරුණු ලෙස මුහුණ දී සිටියත්, 2021 වසර සඳහා එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට අප ආයතනය සමත් වූ බව මම විශ්වාස කරන අතර, අභියෝගාත්මක වුවත් තෘප්තිකර සාර්ථක ඉදිරි වසරක් උදාවේ යැයි බලාපොරොත්තු වෙමි.

ටී.එම්.ආර්.තෙන්නකෝන්
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

4.0 විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචනය - 2021

2021 වර්ෂයේදී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

a) කමල් පත්මසිරි මහතා	විගණන හා කළමනාකරණ කමිටු සභාපති
b) අරෝෂ රොඩ්රිගෝ මහතා	කමිටු සාමාජික (23-06-2021 දින දක්වා)
c) ආචාර්ය ජයසිංහම් ජෙයසුගීතන් මහතා	කමිටු සාමාජික
d) කාවින්ද චානක මහතා	කමිටු සාමාජික (09-11-2021 දින දක්වා)

ඉහත සඳහන් සාමාජිකයන් සිව්දෙනා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වන අතර ඔවුන් පරිපාලනමය, මූල්‍ය, විද්‍යාත්මක හා ව්‍යාපාර පරිපාලනය යන ක්ෂේත්‍ර සම්බන්ධව පුළුල් පලපුරුද්දක් සහිත අය වේ.

විගණකාධිපති නියෝජනය කරමින් නියෝජිතයෙකු ලෙස විගණන අධිකාරී (එම්.ඩබ්ලිව්.ගුණවර්ධන මිය) රැස්වීම් සඳහා සහභාගී විය.විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක (බී.ඒ.ඩී.ඒ. අබේවර්ධන මිය) සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් නියෝජනය කරමින් නියෝජිතයෙකු ලෙස 2021 නොවැම්බර් 09 වන දින සිට රැස්වීම් සඳහා සහභාගී විය. අභ්‍යන්තර විගණක, විගණන හා කළමනාකරණ කමිටුවේ කැඳවුම්කරු ලෙස ක්‍රියාකරන අතර අවශ්‍ය වාර්තා ආදිය ඉදිරිපත් කරමින් කමිටුවය සහයවිය.අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විගණන හා කලමනාකරණ කමිටු ලේකම් ලෙස ක්‍රියාකරන ලදි. අධ්‍යක්ෂ ජනරාල්, ටී.එම් ආර්.තෙන්නකෝන් මහතා, අධ්‍යක්ෂ (මූල්‍ය), ඩී.අසරප්පෙරුම මහතා, අධ්‍යක්ෂ (පරිපාලන), මානෙල් චන්ද්‍රසේකර මහත්මිය සහ අනෙකුත් අංශවල අධ්‍යක්ෂවරුන් විගණන හා කලමනාකරණ කමිටු තීරණය පරිදි රැස්වීම් සඳහා සහභාගී විය.

2021 වර්ෂයේදී විගණන හා කලමනාකරණ කමිටු 04 ක් පහත සඳහන් දිනයන්වල පැවැත්වූ අතර කමිටු තීරණ/නිර්දේශ මෙහි අමුණා ඇත.(2021 මාර්තු 09, ජුනි 23, නොවැම්බර් 09 සහ දෙසැම්බර් 29)

කමිටුවේ කාර්යයන්

2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 55, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ "යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශය" සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි අර්ථ දක්වා ඇති අරමුණු සලකා බැලීමෙන් අනතුරුව, ඉහත චක්‍රලේඛ සහ පනත්වල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට විගණන කමිටුව උත්සාහ කරන ලදි.

කමිටුව විසින් ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිවල නිවැරදි,කාලීනබව සහ පැවැත්ම සහ මෙහෙයුම්වල නොගැලපීම, මූල්‍ය වාර්තාකරණ පද්ධතිවල අනාවරණය කිරීම් ප්‍රමාණවත් බව කමිටුව සමාලෝචනය කළ යුතුය. තවදුරටත් කමිටුව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අනුකූලතාව සහ මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා භාවිතා කරන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් ඇතුළු මූල්‍ය වාර්තාකරණ පද්ධතියට අනුකූල වීම සහතික කළ යුතුය. රජය සතු ව්‍යවසායන්හි විගණන කමිටු ක්‍රියාත්මක වීම පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2021-11-16 සිට බලපැවැත්වෙන පරිදි නව මාර්ගෝපදේශයක් නිකුත් කරන ලදි. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට 25/11/2021 දින අනුමත කරන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුව විසින් 2021 වර්ෂය තුල සිදුකරන ලද කාර්යයන්

- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ ජාතික විගණන පනත මගින් පෙන්වාදෙනලද අවශ්‍යතා සහ මාර්ගෝපදේශ සපුරාලීමට කමිටුව උත්සාහ කරන ලදි.
- 2021 මාර්තු 09 වැනි දින පැවති කමිටු රැස්වීමේදී 2021 අභ්‍යන්තර විගණන සැලැස්මට අනුමැතිය ලබා දෙන ලදී.
- 2022 අභ්‍යන්තර විගණන සැලැස්ම 2021-09-11 දින පැවති කමිටු රැස්වීමට ඉදිරිපත් කර ඇති අතර 2022 අයවැය, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම ආදිය සම්පූර්ණ කිරීමෙන් පසු 2022 අභ්‍යන්තර විගණන සැලැස්ම අවසන් කරන ලෙස කමිටුව අභ්‍යන්තර විගණනකට උපදෙස් දෙන ලදී.
- වර්ෂය තුළ නොවිසඳුනු විගණන විමසුම් සහ කළමනාකරණ ගැටළු වලට පිළිතුරු දීමට කටයුතු කර ඇත.
- විගණන විමසුම් සඳහා ප්‍රමාදයකින් තොරව පිළිතුරු සැපයීම සඳහා අධීක්ෂණ පද්ධතියක් සැකසීමට කටයුතු යොදා ඇත.

කමල් පත්මසිරි
විගණන හා කළමනාකරණ කමිටු සභාපති

රැස්වීම් පැවැත් වූ දිනයන් සහ න්‍යාය පත්‍ර අයිතම අංකය	රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු/ ප්‍රධාන දෝෂ	දෝෂ නිරාකරණය සඳහා විගණන හා කළමනාකරණ කමිටුව ලබාදුන් නිර්දේශ
රැස්වීම් දිනය- 2021-03-09 න්‍යාය පත්‍ර අයිතම අංකය -2021-01-02	**විගණකාධිපති වාර්තාව 2019 හි** **1.අයිතම අංක.2.2 (අ) (ආයතන සංග්‍රහය XII වැනි පරිච්ඡේදය)** විගණන හා කළමනාකරණ කමිටු විසින් " රජයේ විගණන විමසුම් අභ්‍යන්තර විගණක සහ නිසි ක්‍රමවේදය හරහා ලබා දී නොමැත " යන ප්‍රකාශය පිලිබඳව ප්‍රශ්න කරන ලදි. රජයේ විගණන විමසුම් සඳහා ආයතනයෙන් නියමිත දිනට පිලිතුරු ඉදිරිපත් නොකරන බවට රජයේ විගණනයෙන් චෝදනාවක් ඇති බවට අධ්‍යක්ෂ ජනරාල් විසින් පැහැදිලි කරන ලදි. එම නිසා අදාල අංශවල අධ්‍යක්ෂවරුන් සෘජුවම ඔවුන්ගේ පිලිතුරු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු පිලිතුරු සමාලෝචනය කරන ලදි.	රජයේ විගණන විමසුම් සමාලෝචනය කිරීම සඳහා අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතු බව හා විගණන හා කළමනාකරණ කමිටු සභාපති විසින් අවධාරණය කරන ලදි. එබැවින් විගණන විමසුම් සඳහා නියමිත කාලසීමාව තුල පිලිතුරු සකස් කිරීමට සහය වීම අභ්‍යන්තර විගණකගේ වගකීමකි.
	2.අයිතම අංක.3.6 (ඇ) සහ 3.8 (පුනරාවර්ථන වියදම්) ප්‍රසම්පාදන සැලැස්ම 2021-01-26 දින ඉදිරිපත් කර ඇති අතර මානව සම්පත් සැලැස්ම 2021-03-08 දින ඉදිරිපත් කර ඇති බව කමිටුව නිරීක්ෂණය කරන ලදි. ප්‍රසම්පාදන සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය 2021-2023 සංයුක්ත සැලැස්මට නොගැලපෙන බව අභ්‍යන්තර විගණකවරයා පැහැදිලි කළ අතර දැනටමත් ආරම්භ කර ඇති ව්‍යාපෘති සංයුක්ත සැලැස්මට ඇතුළත් නොවන බවත් එම ව්‍යාපෘති එම සැලැස්මට ඇතුළත් කළ යුතු බවත් වැඩිදුරටත් පැහැදිලි කරන ලදි. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉල්ලා ඇති තොරතුරු සහ ලේඛනවලින් කොටසක් පමණක් ලැබී ඇත. එබැවින්, අභ්‍යන්තර විගණකට 2021 වසරේ අභ්‍යන්තර විගණන සැලැස්ම සම්පූර්ණ කිරීමට හැකියාවක් නොමැත.	අභ්‍යන්තර විගණකගේ කාර්යභාරය ආයතනික සැලැස්ම ඇගයීම පමණක් නොවන බවත් ආයතනික සැලැස්ම සකස් කිරීම සඳහා ඔහුගේ/ඇයගේ සහභාගීත්වය ද ලබාදිය යුතු බවත් විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා පැහැදිලි කරන ලදි. එබැවින්, නිවැරදි කරන ලද සංයුක්ත සැලැස්ම ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලෙස විගණන හා කලමනාකරණ කමිටු සභාපති අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් දෙන ලදි.
න්‍යාය පත්‍ර අයිතම අංකය - 2021-01-03	**<u>අභ්‍යන්තර විගණන සැලැස්ම 2021</u>** 2021 වසරේ අභ්‍යන්තර විගණන සැලැස්ම 2020 දෙසැම්බර් මාසයේදී විගණන හා කලමනාකරණ කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබිය යුතුය. කෙසේ වෙතත්, අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ බරපතල ප්‍රමාදයක් පෙන්නුම් කරයි. 2021 වසරේ අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන හා කලමනාකරණ කමිටුවට ප්‍රමාද වී ඉදිරිපත් කිරීමට හේතු අභ්‍යන්තර විගණන වාර්තා අංක **IASR/2021/01** යන වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.	විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා 2021 වසරේ අභ්‍යන්තර විගණන සැලැස්ම මීළඟ රැස්වීමට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දුන් අතර විගණන සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය සියලුම ලියකියවිලි අභ්‍යන්තර විගණක වෙත ලබා දෙන ලෙස අධ්‍යක්ෂ ජනරාල් හට උපදෙස් දෙන ලදි.

න්‍යාය පත්‍ර අයිතම අංකය - 2021-01-04	**<u>මුදල් පනතේ වගන්ති 13 (7) ප්‍රකාරව 2019 විගණකාධිපති වාර්තාව සඳහා කමිටු තීරණයන් සහ කලමනාකරණ පැහැදිලි කිරීම්</u>** පහත ඉස්මතු කරන ලද ක්ෂේත්‍ර ඇතුළුව 2019 වසරේ විගණකාධිපති වාර්තාව කමිටුව සාකච්ඡා කර සමාලෝචනය කරන ලදී. 1.4.1 (අ) 2019 වසර සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන සහ පාරිතෝෂික ගෙවීම් වටිනාකම් වැරදි ලෙස මුල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම.	විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා විගණකාධිපති වාර්තාවේ දැක්වෙන කමිටු නිර්දේශ තීරුව සම්පූර්ණ කරන ලෙස උපදෙස් දුන්නේය. විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලද කරුණු සම්බන්ධයෙන් කමිටුව එකඟ විය.
	1.4.1(ආ) වත්කම් ලේඛනවල ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම්හි වෙනස්කම්	-එම-
	1.4.1(ඇ) වත්කම් ලේඛනවල ක්ෂය වටිනාකම් සහ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ක්ෂය වටිනාකම්වල වෙනස්කම්	-එම-
	1.4.2 (අ) යල්පැන ගිය තොග ඉන්වෙන්ට්‍රිවලට ඇතුළත් කර ඇත.	මෙම ගැටළුව සති දෙකකින් විසඳීම සඳහා විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා උපදෙස් දෙන ලදි.
	1.4.2 (ආ) භාවිතා කළ නොහැකි තොග 1.4.2(ඇ) ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොමැත.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන රේඛීය අමාත්‍යාංශයට යොමු කර ඇත. 2021 වසර සඳහා භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට දැනටමත් තීරණය කර ඇත.
	1.4.2(ඈ) සේවක පාරිතෝෂිකය ගණනය කිරීමට ක්‍රියා පටිපාටියක් නොමැත.	පෙර ක්‍රමයම ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමටත් තීරණය විය.
	1.4.3(ඇ) NCNDT ඉදිකිරීම් වල වැට බදු ප්‍රමාණය සලකා බලා නොමැත.	කළමනාකාරීත්වය ලබා දුන් පිළිතුරුවලට කමිටුව එකඟ විය.
	1.4.4 අවසරයකින් තොරව සිදු කරන ලද ගනුදෙනු ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පරිපාලන හා විගණන කටයුතු, මාණ්ඩලික වැටුප් විෂමතා පිළිබඳ අනුකමිටු සාමාජික, කමල් පත්මසිරි මහතා විසින් ජ්ෂ්ඨ විද්‍යාත්මක නිලධාරී කේ. ආර්. සි. ද සිල්වා මහතාගේ වැටුප පිරික්සීමට අවශ්‍ය බව පැහැදිලි කළ අතර, එබැවින් සිල්වා මහතා සම්බන්ධයෙන් වැටුප් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ පරිපාලනයට නියෝග කළේය. තවද, බඳවාගැනීම් පරිපාටියේ (2011 සිට, 2015 විසින් සංශෝධිත පරිදි) වර්තමානයේදී විද්‍යාත්මක නිලධාරීන්හ බඳවා ගැනීමේ මට්ටම විධායකය බව ඔහු පැහැදිලි කළේය. කෙසේ වෙතත්, මීට පෙර විද්‍යාත්මක නිලධාරීන් බඳවා ගැනීමේ මට්ටම IV ශ්‍රේණිය වූ අතර එය විධායක මට්ටමක් නොවේ.	වර්තමාන සහ පෙර පැවති බඳවාගැනීම් පටිපාටිය හා සසඳන විට, පෙර විශේෂ උපාධිය සමඟ පමණක් **SO** හි වර්තමාන බඳවා ගැනීමේ නිර්ණායකවලට සමාන වීමේ හැකියාවක් ඇත. එබැවින්, එය විද්‍යාත්මක නිලධාරීන්ගේ වර්තමාන බඳවා ගැනීමේ මට්ටමට (විධායක) සමාන කිරීමට උත්සාහ කළ හැක්කේ, පෙර විශේෂ උපාධිධාරීන්ට, ඔවුන්ට පුද්ගලික පදනමින් පමණි.
	1.6 **(ආ) (i)** මුදල් රෙගුලාසි 128 (1) **(ඡ)** ගිණුම් නිලධාරීන්ගේ වගකීම	මෙම කරුණු දෙක (අංක **1.6 (ආ)(i))** දැනටමත් විසඳා ඇති බව කමිටු සභාපතිවරයා දැනුම් දෙන ලදි.

	1.6 (ඇ) රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ (1994.04.20 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක: 30/94) මේ සම්බන්ධයෙන් විගණන විමසුමක් ලැබී ඇති අතර, නිසි ක්‍රියා පටිපාටියක් සකස් කරන ලෙස ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ සභාපතිවරයා විසින් අභ්‍යන්තර විගණකට උපදෙස් දෙන ලදි.	විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ විධිමත් සාකච්ඡාවක් පවත්වා මෙම ගැටළුව සමථයකට පත් කරන ලෙස විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් දෙන ලදි.
	1.7 **(ආ)** සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘතීන්වල ප්‍රගතිය	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ලබා දුන් පිලිතුර නිශ්චිත විය යුතු බව විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා පෙන්වා දෙන ලදි.
	3.1**(අ)** කාර්යය පටිපාටි සංග්‍රහය සෑදීම	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ලබා දුන් පිලිතුර නිශ්චිත විය යුතු බව විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා පෙන්වා දුන් අතර කාර්යය පටිපාටි සංග්‍රහය සඳහා අනුමැතිය ඉල්ලා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත නැවත ලිපියක් ඉදිරිපත් කරන ලෙසට අධ්‍යක්ෂ පරිපාලනයට උපදෙස් දෙන ලදි.
	3.1(ඇ) ප්‍රවාහන වියදම්	එම මුදල් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලෙස විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දෙන ලදි.
	3.4 (ආ) වෙළඳපොලේ ඇති ආනයනික කිරිපිටිවල විකිරණ පරීක්ෂණ සිදු නොකිරීම.	විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා සභාපතිවරයා විසින් 2020 දෙසැම්බර් දක්වා පරීක්ෂා කරන ලද සම්පූර්ණ සාම්පල ගණන එකතු කරන ලෙසට උපදෙස් දෙන ලදී.
	3.5**(ආ)** සේවක නිවාඩු සම්බන්ධයෙන් සාප්පු සහ කාර්යාල පනත අනුගමනය නොකිරීම**.**	මෙම ගැටළුව නිවැරදි කර ඇති බව කමිටු සභාපතිවරයා පවසන ලදි.

	4.3 (ආ) ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ වෙළඳපල කොටස සංවර්ධනය කිරීමට සැලසුම් කර නොමැත	විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා ඔවුන්ගේ පෙර රැස්වීමේදී කමිටුව විසින් ලබා දුන් නිරීක්ෂණය තහවුරු කරන ලදි.
	4.3 (ඇ) (i) & (ii) ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය	විගණකාධිපති වාර්තාවේ 4.3 (ඇ) (i) සහ (ii) අංශයටතේ සඳහන් ක්‍රියාකාරකම් පිළිබඳව විගණන අධිකාරීවරයාගෙන් පැහැදිලි කර ගන්නා ලෙස කමිටු සභාපතිවරයා අභ්‍යන්තර විගණක වෙත දැනුම් දෙන ලදි.
න්‍යාය පත්‍ර අයිතම අංකය - 2021-01-05	**<u>අභ්‍යන්තර විගණන වාර්තා 2020</u>** කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය-**2020** සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන නිරීක්ෂණ අධ්‍යක්ෂ (පරිපාලන) මෙම කරුණු වලට පිළිතුරු මීළඟ විගණන හා කලමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන බවට ප්‍රකාශ කර ඇත.	---
න්‍යාය පත්‍ර අයිතම අංකය - 2021-01-06	අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක **2021-01-06** "පාරිතෝෂික ප්‍රතිපාදන ගණනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම" (ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ වගකීම - ශ්‍රී.ලං.ප.බ.ම**)** රජයේ විගණනය විසින් නිර්දේශ කරන ලද ගිණුම්කරණ ප්‍රමිතියේ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කරන ලෙස ඉල්ලා ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් ඒ සඳහා වැය වන මුදල සහ රජය සතු ව්‍යාපාර යන කරුණු පිළිබඳ සලකා බලා දැනට සිදුකරන ප්‍රතිපත්තිය දිගටම කරගෙන යාමට එකඟ වී ඇත.	මෙම තීරණය අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට කමිටුව තීරණය කළ අතර ඒ සඳහා වන පිරිවැය සහ රජයේ ආයතනය සලකා බලා එම ක්‍රමයම පවත්වාගෙන යාමට රේඛීය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමට ද තීරණය කළේය.
න්‍යාය පත්‍ර අයිතම අංකය - 2021-01-07	01) **<u>2019-12-20 දින පැවැත් වූ අමාත්‍යාංශ විගණන හා කලමනාකරණ කමිටු රැස්වීමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා රැස්වීම් වාර්තාව</u>** පහත සඳහන් ඉස්මතු කරන ලද ක්ෂේත්‍ර ඇතුළුව ඉහත ප්‍රගති වාර්තාව කමිටුව විසින් සාකච්ඡා කර සමාලෝචනය කරන ලදී. .	අභ්‍යන්තර විගණන නිරීක්ෂණ අභ්‍යන්තර සටහන් ලෙස නිකුත් කළ හැකි බව කමිටු සභාපති අධ්‍යක්ෂ (මුදල්) සහ අධ්‍යක්ෂ (පරිපාලන) වෙත පැහැදිලි කරන ලදි
	01.වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම	
	02. භාණ්ඩ සමීක්ෂණය	
	03. දීර්ඝ කාලයක සිට නිරවුල් නොවී පවතින ණය ශේෂ	
	04.මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සේවකයින් සඳහා විශේෂ අතිකාල හා නිවාඩු දින වැටුප් ඇතුළු දීමනා ගෙවීම	

	05. පරමාණුක බලශක්ති අධිකාරිය අහෝසි කර මණ්ඩලය ස්ථාපිත කිරීම සහ එදිනට පැවති වත්කම්, බැඳීම්, සහ වගකීම් පවරා දීමේ කටයුතු	
	06. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය	අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අයිතම අංක **2020-09-135** යටතේ මෙම කරුණ දැනටමත් සාකච්ඡා කර ඇති බව කමිටු සභාපතිවරයා පැහැදිලි කළ අතර අදාළ රැස්වීම් වාර්තා පරීක්ෂා කරන ලෙස විගණකාධිපති නියෝජිතගෙන් ඉල්ලා සිටින ලදි.
	07. <u>මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම.</u> (i) වවුචර්පත් පෙර විගණනයට ලක් කිරීම (ii) චක්‍රලේඛ ප්‍රකාරව මණ්ඩලයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු නොකිරීම.	
	08. විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය.	විගණන විමසුම් සඳහා පිළිතුරු නියමිත වේලාවට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු බව කමිටු සභාපතිවරයා සඳහන් කරන ලදි.
	09. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති	
	10. <u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u> Spectra Meter System LSD උපකරණය මිලදී ගැනීමේ දී අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සිය මගින් ලැබිය යුතු රු. මිලියන 3.6 ක මුදල ආපසු අයකර ගැනීමේ ප්‍රගතිය.	කමිටු සභාපතිවරයා මේ සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ලබා දෙන ලෙස අධ්‍යක්ෂ (පරිපාලන) වෙත නියෝග කරන ලදි
	11. කාර්ය මණ්ඩල පරිපාලනයේ දුර්වලතා නව බඳවාගැනීමේ හා උසස්වීමේ ටිපාටිය අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව අධ්‍යක්ෂ ජනරාල් දැනුම් දෙන ලදි.	
	12. 2014 දී ඉදිකිරීම් අවසන් කර තිබූ මණ්ඩලයේ නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරීම	කමිටු සභාපතිවරයා මේ සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ලබා දෙන ලෙස අධ්‍යක්ෂ (මුදල්) වෙත නියෝග කරන ලදි
	13. මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් නොවූ වත්කම්	කමිටු සභාපතිවරයා මෙම පිළිතුර ප්‍රමාණවත් නොවන බව පෙන්වා දී ඇති අතර එබැවින් මේ සම්බන්ධයෙන් සංශෝධිත පිළිතුරක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ (මුදල්) වෙත යෝජනා කරන ලදි.

	14. නිලධාරීන්ට වැටුප් ගෙවීම සම්බන්ධ තොරතුරු හා සහනදායී පදනම මත මෝටර් බලපත්‍ර ලබාගත් නිලධාරීන් හතර දෙනෙකුගේ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම	මෙම ගැටළුව සමථයකට පත් කරන ලෙස කමිටු සභාපතිවරයා අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් දී ඇත.
	15. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තා	
	16. පරමාණුක බලශක්ති මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	
	17. මෙම ප්‍රශ්නයට පිළිතුර ඉදිරිපත් කරන බව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රකාශ කර ඇත.	ඊළඟ කමිටුවේදී මෙම කාරණය සාකච්ඡා කරනු ලැබේ
	18.මෙම ගැටළුව නිරාකරණය කර අවසන් වී ඇත.	
	19. <u>**වැටුප් ගෙවීම,සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීම සහ ව්‍යත්තීය දීමනා ගෙවීම**</u> විගණන විමසුමේ සඳහන් පරිදි බලපෑමට ලක් වූ නිලධාරීන්ට තවත් වසර **5**කින් වාහන බලපත්‍රයක් ලබා ගැනීමේ වරප්‍රසාදය වෙනස් බව දන්වමින් අධ්‍යක්ෂ ජනරාල් දැනටමත් ලිපි නිකුත් කර ඇත.	**2020/06/26** දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලිපිය ලැබුණු බව කමිටු සභාපතිවරයා දන්වා සිටි අතර එහි **IV** ශ්‍රේණියට ව්‍යත්තීය දීමනාවක් හිමි නොවන බව පැහැදිලිව සඳහන් කර ඇති බවයි. එනිසා, **IV** ශ්‍රේණියට ව්‍යත්තීය දීමනාවට සුදුසු බව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට සලකා බැලිය නොහැකි අතර එය සම්පූර්ණයෙන්ම වැරදි වූ අතර මණ්ඩලයට මෙවැනි තීරණයක් ගත නොහැකි අතර එය බලතලවල අභිබවා යෑමකි. **IV** ශ්‍රේණියට ව්‍යත්තීය දීමනාවට හිමිකමක් නොමැති බවටත්, **2021/02/25** දින සිට එම ගෙවීම නතර කිරීමටත් මණ්ඩලය තීරණය කරන ලදි.
	(02) <u>න්‍යාය පත්‍රයේ නොමැති අයිතම</u> දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අතිරික්ත වෙක්පත් ගෙවීම් ලෙස ගිණුම්වල රුපියල් **17,158** ක් දක්වා ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එම දිනය වෙනස් කර මාස **2** කට පසුව වෙක්පත තැන්පත් කර ඇති බව මූල්‍ය අධ්‍යක්ෂ පැහැදිලි කරන ලදි. එබැවින්, මෙම ගෙවීම දෙවරක් ගිණුම්ගත වී ඇත. කෙසේ වෙතත්, නව වෙක්පත නිකුත් කිරීමට පෙර නිකුත් කල වෙක්පත නැවත ලබාගෙන නොමැති අතර හෝ එම වෙක්පත අවලංගු කර නොතිබුණි. මෙම ප්‍රශ්නය **2011** වසරේ සිට ඇති වූවක් වන අතර එය මෙතෙක් විසඳී නොමැත. මේ සම්බන්ධයෙන් ආයතනය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට	මෙම නීතිරීතිවලට පටහැනි ගෙවීම පිලිබඳ අවධාරණය කරමින් දේශීය ආදායම් කොමසාරිස් වෙත ලිපියක් කෙටුම්පත් කරන ලෙස කමිටු සභාපතිවරයා මුදල් අධ්‍යක්ෂවරයාට උපදෙස් දුන්නේය.

	ලිඛිතව දන්වා ඇතත් ඔවුන්ගෙන් තවමත් පිළිතුරක් ලැබී නැත. **(03)** විගණන කමිටුවට ආරාධනා කිරීම	මීළඟ විගණන හා කලමනාකරණ කමිටුව සඳහා සියලුම අංශ ප්‍රධානීන් සහභාගී විය යුතු බව කමිටු සභාපතිවරයා දන්වා ඇති අතර විගණන ක්‍රියා පටිපාටිය පිළිබඳව දැනුවත්වීම සඳහාද එය උපකාරී වේ.
රැස්වීම් දිනය- 2021-06-23 න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-02-10	පහත සඳහන් ඉස්මතු කරන ලද ක්ෂේත්‍ර ඇතුළුව 2019 වසරේ විගණකාධිපති වාර්තාව කමිටුව සාකච්ඡා කර සමාලෝචනය කරන ලදී. **1.2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 1.6 (ආ) (iv) (ඇප තැබිය යුතු නිලධාරීන් -මුරෙ 880)** ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය උපදෙස් දී නොමැති බව මුදල් අධ්‍යක්ෂවරයා පැහැදිලි කරන ලදි. එබැවින් ඔහු තවදුරටත් මේ සම්බන්ධයෙන් කමිටු උපදෙස් ඉල්ලුම් කරන ලදි. නිලධාරීන්ගේ රාජකාරිමට වගවීම ඉටු කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් ඇති බව අභ්‍යන්තර විගණක පැහැදිලි කළේය.	---
	2. 2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක 1.4.3 (ඇ**) – 2019 (**ගෙවිය යුතු වැට බද්ද නොසලකා හැරීම**)** කමිටු සභාපතිවරයා මේ පිළිබඳව විමසූ අතර**,** මණ්ඩලයේ නීති නිලධාරී විසින් ආයතනය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය**,** ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය අතර ඉඩම් හුවමාරු කිරීමේ ක්‍රියාවලියේ අතීත සහ වර්තමාන තත්ත්වය පිළිබඳව සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් කර ඇත. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නීති නිලධාරියා විසින් දීර්ඝ සාකච්ඡාව සිදු කර ඇති අතර එය විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් සටහන්වල අමුණා ඇත.	මෙම කරුණ නිසි සැලකිල්ලෙන් කඩිනමින් සිදු කරන ලෙස කමිටුව විසින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් දෙන ලදී.
	3. 2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක.1.5.1 (වෙළඳ ලැබියයුතු දෑ**)** කමිටුව වෙක්පත් නිශ්කාෂණය කර ගැනීමේ ගැටළු සාකච්ඡා කරන ලදි. වෙක්පත් සහ අනෙකුත් මුදල් සම්බන්ධ කරුණු පසු විපරම් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම අදාළ අංශවල සහාය ඇතිව අවසන් කළ යුතුය.	මෙම කරුණු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව තුළ සාකච්ඡා කර ඒවා සෙවීමට සුදුසු ක්‍රියාමාර්ගයන් ගන්නා ලෙස විගණන හා කලමනාකරණ කමිටුව උපදෙස් දී ඇත. විගණන හා කලමනාකරණ කමිටුව විසින් මුදල් ගැටළු පමණක් නොව විගණන ගැටළු ද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව තුළ සාකච්ඡා කර අවසන් කළ හැකි බව පෙන්වා දී ඇත.
	8. 2019 විගණකාධිපති වාර්තාවේ අයිතම අංක.3.8 (ආ**) (**ප්‍රසම්පාදන කළමනාකරණය**)** කෙසේවෙතත්, ඇතැම් විද්‍යාත්මක අධ්‍යක්ෂවරුන් එසේ ප්‍රකාශ කළ නමුත් එය දුෂ්කර කාර්යයක් බව අධ්‍යක්ෂ ජනරාල් පෙන්වා දෙන ලදි.	සංයුක්ත සැලැස්මට අනුකූලව වසර 3 ක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා උපදෙස් දෙන ලදි.
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-02-11	**<u>ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන-2020</u>** 1. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය, නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය සහ කාර්මික යෙදුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද 2021 ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳීමෙන් වූ විචලනයන් කමිටුව විසින් පරීක්ෂා කරන ලද අතර, අදාළ සියලුම අංශ සහිතව ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සංශෝධිත	මූල්‍ය ප්‍රකාශන සමඟ අංශයන්හි කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු බව විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා උපදෙස් දෙන

	ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල් වෙත නියෝග කරන ලදී. 2. මූල්‍ය අංශය සේවක හිඟය සඳහා මුහුණදී ඇති බවත්, පොත් තබන්නාගේ තනතුරද පුරප්පාඩු වී ඇති බවත් අධ්‍යක්ෂ (මුදල්) පැහැදිලි කරන ලදි. එම අපහසුතා හේතුවෙන් බොහෝ ප්‍රායෝගික ගැටලු ඇති වන අතර අංශයේ ඉලක්කය නියමිත වේලාවට සපුරාලීමටද අපහසු වේ. 3.මුලු ආදායම **(පිටු අංක.30)** පවතින කොවිඩ් තත්ත්වය ආදායම් අඩුවීමට හේතු වූ බව අධ්‍යක්ෂ මුදල් පැහැදිලි කරන ලදි. තවද, NCNDT පුහුණු පාඨමාලා සහ පරීක්ෂණ නොමැතිකම ද අපේක්ෂිත ආදායම අඩු වීමට බලපා ඇත. 2018 දී ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ ප්‍රභවය උත්ශ්‍රේණි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කළ බව අධ්‍යක්ෂ මුදල් පැහැදිලි කරන ලදි. කෙසේ වෙතත්, ආයතනය 2019 වර්ෂයේදී අතුරු සම්මත ගිණුම මත පවත්වාගන යාමට සිදුවීම නිසා ප්‍රභවය උත්ශ්‍රේණි කිරීම සඳහා වූ අයවැය 2020 ජුනි මාසයේදී ලැබී තිබුණි. කෙටුම්පත් ලංසු ලේඛන අවසන් කිරීමෙන් පසුව, ලංසු කැඳවීමේ ක්‍රියාවලිය 2020 මාර්තු මාසයේදී ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, නියමිත වේලාවට ලංසුව කැඳවනු ලැබුවේ නම් ප්‍රභවය උත්ශ්‍රේණිගත කිරීමේ පාඩුව සහ අනවශ්‍ය ප්‍රමාදය වලක්වාගැනීමට අවස්ථාව තිබූ බව අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදි.	ලදි. බඳවාගැනීම් පරිපාටිය අනුමත කරන තුරු, වසරක කොන්ත්‍රාත් පදනමක් සඳහා පොත් තබන්නෙකු බඳවා ගන්නා ලෙස ඉල්ලා ඇති ලිපිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස විගණන හා කලමනාකරණ කමිටු අධ්‍යක්ෂ පරිපාලන හට උපදෙස් දෙන ලදි. විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා මුළු ආදායම පිළිබඳව විමසා සිටින ලදි.

	4. **මුල්‍ය ප්‍රකාශන 2020 - ණයගැතියෝ (පිටු අංක.22)** 2019 වසර හා සසඳන විට, අඩමාණ ණය අඩු වී ඇත. කෙසේ වෙතත්, NCNDT ආයතනයේ වෙළඳ ණය ගැතියන් මිලියන 17 ක් ඇත. ණය ගැතියන්ගෙන් 68%ක් අයකරගෙන ඇති බව මුදල් අධ්‍යක්ෂවරයා පෙන්වා දෙන ලදි. නමුත් NDT සේවා සහ TLD සේවා ඉන්වොයිසි අඛණ්ඩව පියවීම ප්‍රමාද වී ඇත. විශේෂයෙන් ආරක්ෂක හමුදා සහ රාජ්‍ය ආයතනවල අනුමත ගෙවීම් පියවීම් සඳහා දීර්ඝ ක්‍රියාවලියක් පැවතීම පියවීම් ප්‍රමාදයට හේතුව බව අධ්‍යක්ෂ (සාමාන්‍ය විද්‍යාත්මක) පැහැදිලි කරන ලදි. TLD කාඩපතේ විකුණුම් මිල රුපියල් 12,500/- ක් වන අතර එහි මිලදී ගැනීමේ මිල රුපියල් 12,672/- ක් බව අධ්‍යක්ෂ (සාමාන්‍ය විද්‍යාත්මක) පැහැදිලි කරන ලදි. තව දුරටත් TLD කාඩපත් බහාලුම් විවෘත කිරීමේ උපාංගය රු. 5500/- ට විකුණනු ලබන අතර එහි මිලදීගැනීමේ මිල රු. 7, 477/- කි. සමහර TLD කාඩපත් අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය වෙතින් ලැබෙන අතර එම කාඩපතේ මිල ඩොලර් 30 ක් විය. අනෙකුත් TLD කාඩපත් සෘජුවම ආයතනය විසින් මිලදී ගන්නා ලද අතර, එක් කාඩපතක මිල ඩොලර් 60 ක් විය. කෙසේ වෙතත්, ඉහත පිරිවැය වර්ග දෙක යටතේ (ඩොලර් 30 සහ 60) ලබාගත් TLD කාඩපත්වල පිරිවැය ගණනය කිරීමේ ක්‍රමය යටතේ රු.14,000/- කට අගය කර ඇත. පෙර TLD කාඩපත් රුපියල් 12,900/- කට අගය කරන ලදි. 2021/12/31 දිනට ආයතනයේ ශේෂ පත්‍රයේ TLD කාඩපත්හි තොග වටිනාකම ලෙස එක් අයිතමයක් ලෙස (රු. 7,770,997/-) ඉදිරිපත් කර ඇති බව අභ්‍යන්තර විගණක පැහැදිලි කළේය. එබැවින්, අභ්‍යන්තර විගණන අංශය විසින් TLD තොග ශේෂ තොරතුරු ගබඩාවලින් (තොග ලෙජරයෙන්) පරීක්ෂා කිරීමට උත්සාහ කළද, ගබඩා භාරකරු පෙන්වා දුන්නේ TLD තොග ගබඩා පොත්වල සටහන් කර නොමැති බවයි. පරිත්‍යාග සහ මිලදී ගත් TLD කාඩපත්හි පිරිවැය පත්‍ර මූල්‍ය අංශය විසින් සකස් කරනු ලබන අතර එම තොරතුරු අභ්‍යන්තර විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇති නමුත් අභ්‍යන්තර විගණන අංශය විසින් ඉල්ලා සිටි තොරතුරු වගුව සම්පූර්ණ කර නොතිබුණි. අභ්‍යන්තර විගණන අංශය විසින් කාඩපතේ පිරිවැය ඉන්වොයිසි අගය සමඟ සංසන්දනය කර ඇති අතර එම විකුණුම් මිල අනුව මිලදී ගැනීමේ පිරිවැයට වඩා අඩු වේ.	කමිටු සභාපතිවරයා අභ්‍යන්තර විගණන විමසුම නිශ්චිතව සඳහන් කළ යුතු අතර අදාළ වර්ෂයද සඳහන් කර නොමැති බව පැහැදිලි කරන ලදි. කමිටු සභාපතිවරයා අභ්‍යන්තර විගණන වාර්තාවේ පිටු අංක 12 පිළිබඳව විමසා සිටියේය. අභ්‍යන්තර විගණක විසින් මෙම කාරණය සම්බන්ධ වර්ෂය සඳහන් කර නොමැති බවද ඔහු පෙන්වා දෙන ලදි.
	5.අඩමාණ ණය සඳහා වෙන් කිරීම් (පිටු අංක.22) මෙම අඩමාණ ණය ගැතියන් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් නොකළ යුතු බවට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පෙන්වා දී ඇති අතර අඩමාණ ණය සඳහා වෙන් කිරීම් සිදුකිරීමට උපදෙස් දී ඇති බව අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදි.	මේ සම්බන්ධයෙන් සියලු අංශවල සහයෝගීතාව ලබා ගන්නා ලෙසට උපදෙස් කමිටු සභාපතිවරයා අධ්‍යක්ෂ මුදල්ට උපදෙස් දුන් අතර මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණයක් ගැනීම සඳහා අඩමාණ ණය ගැනි ලැයිස්තුවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි.
	6. මුල්‍ය ප්‍රකාශන 2020 - සේවක ණයගැතියෝ (පිටු අංක.22)	කාර්ය මණ්ඩල ණය ගැතියන් යටතේ ඇති කුඩා මුදල් නිසි සාධාරණීකරණයන් සමඟ මණ්ඩලයට

		කපා හැරිය හැකි බව කමිටු සභාපතිවරයා පැහැදිලි කල අතර එම තොරතුරු ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ මුදල් වෙත උපදෙස් දෙන ලදි.
	7. මූල්‍ය ප්‍රකාශන 2020 - පෙරගෙවීම් (පිටු අංක.23) 2019/2020 වෛද්‍ය රක්ෂණ වාරිකයට අදාළ මුදල් 2019 දෙසැම්බර් මාසයේදී ගෙවා ඇති බව අධ්‍යක්ෂ මුදල් පෙන්වා දී ඇත. එබැවින්, පෙරගෙවුම් සැලකිල්ලට නොගෙන මුළු මුදල 2019 වියදම් ලෙස ගිණුම්ගත කර ඇත. 2020 වසරට අදාළ වියදම් සමඟ සංශෝධිත මූල්‍ය ප්‍රකාශය නිවැරදිව ඉදිරිපත් කරන ලෙස විගණන අධිකාරීවරයා උපදෙස් දෙන ලදි.	වෛද්‍ය රක්ෂණ වාරික පෙරගෙවුම් පිළිබඳව කමිටු සභාපතිවරයා විමසා සිටියේය.
	8. මූල්‍ය ප්‍රකාශන 2020 - විකිරණ නිරාවරණ කාමරය ඉදිකිරීමට අදාල වියදම් (පිටු අංක.24) ඉහත ඉදිකිරීමේ රඳවාගත් රුපියල් මිලියන 1 ක මුදල උපදේශක ආයතනය විසින් ගෙවීම අනුමත කළ පසු ඉදිකිරීම්කරු වෙත මුදා හැරිය හැකි බව අධ්‍යක්ෂ මුදල් පෙන්වා දෙන ලදි.	
	9. මූල්‍ය ප්‍රකාශන 2020 - හදුනානොගත් තැන්පතු (පිටු අංක.24) බොහෝ ගනුදෙනුකරුවන්ට තම ගෙවීම් සම්බන්ධයෙන් ආයතනයට නිසි ලෙස දැනුම් දී නොමැති නිසා තැන්පතු හඳුනා ගැනීමට ක්‍රමයක් නොමැති බව මූල්‍ය අධ්‍යක්ෂවරයා දන්වා සිටින ලදි.	
	10. මූල්‍ය ප්‍රකාශන 2020 - පුනරාවර්ථන ප්‍රධාන (පිටු අංක.25) රජයේ ප්‍රදාන ලබා ගැනීම අඩු කිරීමට ආයතනය උත්සාහ දරන බව අධ්‍යක්ෂ මුදල් පැහැදිලි කරන ලදි. 2020 සඳහා ආයතනය වෙත සම්පූර්ණ පුනරාවර්තන අයවැය ප්‍රතිපාදන ලැබී නොමැති බවත්, ඒ ආකාරයෙන්ම ආයතනය විසින් 2021 මාර්තු මාසයේ වැටුප් වියදම් ඉපයූ ආදායමෙන් කළමනාකරණය කර ඇති බවත් ඔහු පෙන්වා දුන්නේය.	කමිටු සභාපතිවරයා මෙම අයිතමය පිළිබඳව විමසා සිටියේය.
	11. මූල්‍ය ප්‍රකාශන 2020 - පාරිභෝගික ද්‍රව්‍ය පරිත්‍යාග ලැබීම් (පිටු අංක.25) විදේශ ප්‍රදාන පිළිබඳව රජයේ විගණනය විමසා සිටින ලදි. විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ මෙම සාකච්ඡාව සිදු කර ඇති බව අධ්‍යක්ෂ මුදල් පැහැදිලි කරන ලදි.පරිත්‍යාග ලැබීම් ක්‍රියාවලිය 2021 ජුනි 25 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ලෙස ඉදිරිපත් කර ඇත. ඇතැම් අවස්ථාවල අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් විද්‍යුත් තැපෑලෙන් පරිත්‍යාග/අරමුදල් ලබාදීම් දැනුම් දෙන අතර සමහර ඒවා දැනුවත් කිරීම සිදු නොවන බැවින් පරිත්‍යාග/අරමුදල් භාණ්ඩාගාරයට සෘජුවම ලැබුණු විට ආයතනයට එම තොරතුරු සොයා ගැනීමට නොහැකි වන බව අධ්‍යක්ෂ (සාමාන්‍ය විද්‍යාත්මක) විසින් ප්‍රකාශ කරන ලදි. මෙම කරුණ රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර විසඳිය යුතු බව අධ්‍යක්ෂ (මුදල්) විසින් පෙන්වා දෙන ලදී. ඊට හේතුව සියලු පරිත්‍යාග ගිණුම් තොරතුරු රේඛීය අමාත්‍යාංශයට යොමු කිරීමයි.	
	12. මූල්‍ය ප්‍රකාශන 2020 - අත්තිකාරම් ගෙවීම් මිලදී ගත් භාණ්ඩවලට රු.600,000/- ක් දක්වා දැනටමත් මිලදී ගැනීමේ අත්තිකාරම් ලබා දී ඇතත්, ලංකා ඔක්සිජන් සමාගමෙන් අදාළ ඉන්වොයිසි මෙතෙක් ලැබී නොමැත. එබැවින්, එම අත්තිකාරම් පියවීමේ ජ'නල් සටහන් ඇතුළත් කර නොමැති අතර, මිලදී ගැනීමේ පිරිවැය තවමත් අත්තිකාරම් ගිණුමේ ඉතිරිව	කමිටු සභාපතිවරයා සඳහන් කළේ, අලුතින් බඳවාගත් විද්‍යාත්මක නිලධාරීන් තවමත් ඵලදායී වැඩ ක්‍රියාවලියකට අනුයුක්ත කර නොමැති බව ඉහත අභ්‍යන්තර විගණන වාර්තාවේ අභ්‍යන්තර

	ඇත.	විගණක පෙන්වා දුන් බවයි. ඉහත සඳහන් ගැටළු නිවැරදි කිරීමට යටත්ව විගණන හා කලමනාකරණ කමිටුව විසින් 2020 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලබා දෙන ලදී.
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-02-12	**<u>ක්‍රියාකාරී සැලැස්ම සමඟ විචලනයන්</u>** 2020 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන වැඩසටහන ද සංශෝධනය කළ යුතු බව අභ්‍යන්තර විගණක දන්වා සිටින ලදි. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය, නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය සහ කර්මාන්ත යෙදවුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද 2021 ක්‍රියාකාරී සැලැස්ම සමඟ වූ විචලනයන් කමිටුව විසින් පරීක්ෂා කරන ලදී.	සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සියලුම අදාළ අංශ සහිත මීළඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස කමිටුව අධ්‍යක්ෂ ජනරාල් වෙත නියෝග කරන ලදි.
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-02-13	**<u>රැස්වීම් වාර්තා බෙදාහැරීම</u>** නියමිත වේලාවට විගණන හා කලමනාකරණ රැස්වීම් ගොනුව නොලැබීම හේතුවෙන් පෙර රැස්වීම් වාර්තාව පරීක්ෂා කර කරුණු සොයා බැලීමට සැලකිය යුතු කාලයක් නොලැබුනු බව අධ්‍යක්ෂ (පරිපාලන) පෙන්වා දෙන ලදි. මෙම අයිතමයන් පසුගිය කමිටුවල සාකච්ඡා කල අතර අධ්‍යක්ෂවරුන් ද එම රැස්වීමට සහභාගී වූ බැවින් ඒවා සකස් කිරීමට ඔවුන්ට බැඳී සිටින බව අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදි. විගණන හා කලමනාකරණ කමිටු ලේකම් සති දෙකක කාලයක් තුළ රැස්වීම් වාර්තා සකස් කර නියමිත වේලාවට අභ්‍යන්තර විගණකට පිටපතක් සමඟ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බව පෙන්වා දෙන ලදී. එසේම කළ යුතු වැඩ ලැයිස්තුවක් සකස් කර එය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (මුදල්) සහ අධ්‍යක්ෂ (පරිපාලන) අතර බෙදා හරින ලදී.	නියමිත වේලාවට අදාළ අධ්‍යක්ෂවරුන් වෙත රැස්වීම් වාර්තා බෙදා හරින ලෙස කමිටු සභාපතිවරයා අභ්‍යන්තර විගණක වෙත නියෝග කරන ලදි.
	<u>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටු රැස්වීම් (SMC) වෙනුවට එක් එක් අංශවල රැස්වීම්</u> ජේෂ්ඨ කළමනාකරණ කමිටු රැස්වීම දුක්ගැනවිලි කමිටුවක් වැනි බව අධ්‍යක්ෂ ජනරාල් පැහැදිලි කරන ලදි. එබැවින් අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් ජේෂ්ඨ කළමනාකරණ කමිටුවලට වඩා ඵලදායී වන අතර එය අදාළ අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත වේ. වැඩිදුරටත් ජේෂ්ඨ කළමනාකරණ කමිටු රැස්වීම සියලුම අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සමහර විට ජ්‍යෙෂ්ඨ විද්‍යා නිලධාරීන්ගෙන්ද සමන්විත වන බවත්, අංශ රැස්වීම්වලදී අභ්‍යන්තර විගණක සහ නීති නිලධාරී පමණක් මග හැරුණු බවත් අධ්‍යක්ෂ ජනරාල් වැඩිදුරටත් පැවසීය. කෙසේ වෙතත්, ජේෂ්ඨ කළමනාකරණ කමිටු රැස්වීම අධ්‍යක්ෂවරුන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත වන බව නීති නිලධාරී/ජේෂ්ඨ කළමනාකරණ කමිටු ලේකම් පැහැදිලි කළේය. වැටුප්, විශේෂ දීමනා ගෙවීමේ ගැටළු සම්බන්ධයෙන් විශේෂ රැස්වීමක් ලෙස පැවති එක් ජේෂ්ඨ කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පැවැත් වූ බැවින් ඊට අදාළ නිලධාරීන් සහභාගී කරවන ලෙසට ආයතනයේ සභාපතිවරයා නියෝග කරන ලදි. කෙසේ වෙතත්, එදින ද ඊට අමතරව සහභාගි වූයේ නිලධාරීන් දෙදෙනෙකු පමණි. ඉහත රැස්වීමට ජේෂ්ඨ කළමනාකරණ කමිටු සභාපති / වැටුප් විෂමතා කමිටුවේ කමිටු සාමාජිකයා ද සහභාගී වූ බව ඇය පවසන ලදි.	

	<u>රජයේ සහ අභ්‍යන්තර විගණන විමසුම් 2020</u> විගණන හා කලමනාකරණ කමිටු අභ්‍යන්තර විගණකට පෙන්වා දුන්නේ ඉහත සඳහන් කළ 2020 රජයේ සහ අභ්‍යන්තර විගණන විමසුම් මෙම න්‍යාය පත්‍ර අයිතමවලට ඇතුළත් කර නොමැති අතර එය ගැටළුවක් බවයි. ඒ අනුව, විගණන විමසුම් ගණන සහ ආයතනය විසින් පිළිතුරු ලබාදුන් විමසුම් ගණන මැනිය නොහැක. විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට පෙර **2020** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සමාලෝචනය කිරීම සඳහා මෙම විශේෂ රැස්වීම කැඳවා ඇති බැවින් ඇය වෙනත් විගණන වාර්තා න්‍යාය පත්‍රයට ඉදිරිපත් කර නොමැති බව අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි.	
	<u>සෞඛ්‍ය සේවා මාර්ගෝපදේශ-2021</u> අධ්‍යක්ෂ ජනරාල් විසින් 2021 සෞඛ්‍ය සේවා මාර්ගෝපදේශයක් කමිටුව වෙත ඉදිරිපත් කළ අතර ඒවාට අනුකූලව ආයතනය පවත්වාගෙන යාමට කමිටුව වෙතින් උපදෙස් ඉල්ලා සිටින ලදි.	වක්‍රලේඛයක් ලෙස නිකුත් කරන තුරු මාර්ගෝපදේශ මත පදනම්ව කමිටුවට උපදෙස් ලබා දිය නොහැකි බව කමිටු සභාපතිවරයා පැහැදිලි කරන ලදි.
රැස්වීම් දිනය-2021-11 න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-03-15	**<u>පෙර රැස්වීම් වාර්තාවලින් සාකච්ඡා කල කරුණු</u>** 1. "ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන-2020" යන මාතෘකාව යටතේ අයිතම අංක 6 (සේවක ණයගැතියන්) සම්බන්ධයෙන්, 2020 මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සේවක ණයගැති වාර්තාව ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ (මුදල්) පොරොන්දු විය.	කාවින්ද වානක මහතා (කමිටු සාමාජික) අභ්‍යන්තර විගණක වෙත මේ සම්බන්ධයෙන් අදාළ සියලුම ලිපි හුවමාරු කර ගන්නා ලෙස උපදෙස් දුන්නේය. (මෙම රැස්වීම් වාර්තාව තහවුරු කරන ලද්දේ අදාළ සියලු ලිපි හුවමාරු කර ගැනීමට යොමු වීමට හේතුව එක් කිරීමෙනි)
	2. "SLAEB මූල්‍ය ප්‍රකාශන-**2020"** යන මාතෘකාව යටතේ අයිතම අංක **8 (NCNDT** ඉදිකිරීම්) සම්බන්ධයෙන් නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා දරන අමතර පිරිවැය පිළිබඳව කමිටුව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදි. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය අනුමත කල කොන්ත්‍රාත්තු මුදලේ වටිනාකම රුපියල් මිලියන **370** ක් බවත්, එබැවින් මෙය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට **(MPC)** යොමු කළ නොහැකි බවත් සටහන් කර ඇත. තවද, අතිරේක කටයුතු සඳහා හිඟ බිල්පත් මිලියන **38**ක් තිබී ඇති බව කාරක සභා කමිටුව විමසා බැලීය. කෙසේ වෙතත්, අතිරේක වැඩ පෙර අනුමත වැඩවල ඇතුළත් කර නොතිබූ අතර එබැවින් ඒවා "අතිරේක වැඩ" ලෙස අර්ථ දැක්විය නොහැකි අතර මේවා අමතර වැඩ ලෙස අර්ථ දැක්විය හැකි බවයි.	මෙය අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු වෙත යොමු කළ යුතු බව විගණන කමිටුව පෙන්වා දෙන ලදි. මිලියන 38 ක හිඟ බිල්පත් අමතර වැඩ බැවින්,ඉහත ක්‍රමවේදය පරිදි අනුමැතිය ලබාගැනීම සිදු කර නොතිබුණද, මෙම අතිරේක වැඩ සඳහා වෙනම ටෙන්ඩර් පටිපාටියක් ක්‍රියාත්මක කළ යුතු බව කාවින්ද වානක (සාමාජික) මහතා පෙන්වා දෙන ලදි. ඊට අමතරව මෙය විෂය පථයේ බැහැරවීමක් බවත් එය අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවය ඇතිව අදාළ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතුව තිබූ බවත් ඔහු පැහැදිලි කරන ලදි. කෙසේ වෙතත්, එය නිසි පරිදි සිදු කර නොමැති

		අතර, එබැවින් එය නීතිරීතිවලට පටහැනි වේ. මෙම කරුණ සැලකිල්ලට ගනිමින්, කමිටු සාමාජිකයා පැහැදිලිව පෙන්වා දුන්නේ, මෙම ගැටළුව විසඳිය යුත්තේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සමඟ වන අතර ආයතනය සමඟ නොවන බවයි. අවසාන වශයෙන්, මේ සම්බන්ධයෙන් පුළුල් වාර්තාවක් මීළඟ විගණන කමිටුවට වෙත ඉදිරිපත් කරන ලෙස කමිටුව අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් දෙන ලදි.
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-03-16	**<u>කෙටුම්පත් අභ්‍යන්තර විගණන සැලසුම-2022</u>** 2022 කෙටුම්පත් විගණන සැලැස්ම සකස් කර ඇත්තේ 2020/2023 සංයුක්ත සැලැස්ම පමණක් පදනම් කරගනිමින් වන අතර 2022 අයවැය, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සම්පූර්ණ කර නොමැති නිසා සංයුක්ත සැලැස්ම මත පදනම්ව විගණන සැලැස්ම සකස් කල බව අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදි.	අවසන් කරන ලද අභ්‍යන්තර විගණන සැලසුම මීළඟ විගණන කමිටුවට ඉදිරිපත් කරන ලෙස අභ්‍යන්තර විගණක වෙත උපදෙස් දෙන ලදී.
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-03-17	**<u>සම්බන්ධීකාරක ව්‍යාපෘති, RAS, තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති සහ ජාතික මට්ටමේ ව්‍යාපෘති සඳහා පරිත්‍යාග ලෙස ලැබුණු විදේශ අරමුදල් සහ වත්කම් සඳහා ගිණුම්කරණ ක්‍රියා පටිපාටිය.</u>** මෙම කරුණ පිලිබඳව 2019 විගණකාධිපති වාර්තාවේ (රජයේ මූල්‍ය චක්‍රලේඛය 30/94) අංක 1.6 (ඊ) අයිතමය යටතේද සාකච්ඡා විය. මේ සම්බන්ධයෙන් ආයතනයේ නිශ්චිත ගිණුම් ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් අන්තර්ජාතික පරමාණුක බලශක්ති ආයතනය වෙතින් ලැබෙන පරිත්‍යාග නිසි ලෙස ගිණුම්ගත නොවන බව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා පෙන්වා දෙන ලදි. තවද ඉහත දක්වා ඇති විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවට ලැබෙන ඕනෑම ආකාරයක විදේශ ආධාර එම ආයතනය හරහා ලබා දිය යුතු බව ද පෙන්වා දෙයි. සියලුම විදේශ අරමුදල් සහ ආධාර ඔවුන් හරහා ලබාගත යුත බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව නිර්දේශ කෙරේ. අභ්‍යන්තර විගණක දන්වා සිටියේ පරමාණුක බලශක්ති පනතට අනුව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත ලැබෙන සියලුම විදේශ පරිත්‍යාග සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බවයි.	මෙම රජයේ මූල්‍ය චක්‍රලේඛය අංක 30/94 ශ්‍රී ලංකා ඉංජිනේරු මණ්ඩලයට අදාළ වන්නේද යන්න කාවින්ද වානක මහතා (සාමාජික) ප්‍රශ්න කරන ලදි. තවද විදේශීය අනුග්‍රහය ලබන සිදුවීම් අදාළ ආයතනය තුළ ගිණුම්ගත නොකරන බව ඔහු පැහැදිලි කළේය. මෙම පරිත්‍යාග ලැබීම් ඔවුන්ට සටහන් කරගැනීමේ කිරීමේ අරමුණ සඳහා පමණක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත පමණක් දැනුම් දිය යුතු බව කමිටු සභාපතිවරයා පෙන්වා දෙන ලදි. එසේ සිදුකිරීමට නොහැකි වූයේ නම්, එය ගැටළු සහගත බව දැන්වීය.

න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-03-18	**<u>ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ ගිණුම්කරණ ගැටළු සහ වත්මන් තත්ත්වය</u>** විගණකාධිපති වාර්තාව - 2019 (ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය) අයිතම අංක 1.6 යටතේ මෙම ගැටළුව කිහිප වතාවක් සාකච්ඡා කර ඇත. කමිටු සාමාජික (කාවින්ද මහතා) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය විමසා සිටින ලදි.කමිටුව පහත කරුණු අවධාරණය කළේය. • නව කැළණි පාලම් ව්‍යාපෘතිය හේතුවෙන් පැරණි ගොඩනැගිල්ල කඩා එම ඉඩම ව්‍යාපෘති අවශ්‍යතාවය සඳහා පවරා ගැනීම. • පරමාණුක බලශක්ති අධිකාරිය විසින් සපයනු ලබන නව ඉඩමේ කොන්දේසිවලට යටත්ව පරමාණුක බලශක්ති අධිකාරියේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය (ව්‍යාපෘති අධ්‍යක්ෂ) එකඟ විය. පරමාණුක බලශක්ති අධිකාරිය මාලඹේ නව ඉඩමක් මිලදී ගැනීම සඳහා 2014 වසරේදී රුපියල් මිලියන 181ක් ගෙවා ඇතත් මාලඹේ ඉඩම සම්බන්ධයෙන් තවමත් ඔප්පුවක් නොමැත. • වන්දි හෝ වැඩිපුර ගෙවූ බදු මුදල් ලෙස ලැබිය යුතු රු.මිලියන 7.6 ක් නාගරික සංවර්ධන අධිකාරිය හෝ මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ආයතනයට ලැබී නොමැත. 2018 අප්‍රේල් මාසයේ සිට පරමාණුක බලශක්ති මණ්ඩලයේ නව ගොඩනැඟිල්ලේ පදිංචි වූවත්, මේ වන තෙක් මණ්ඩලය සතු දේපළ (ඉඩම් සහ ගොඩනැඟිල්ල) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොමැත. • විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා මෙම කාරණය පිළිබඳව විමසූ අතර ඒ අනුව නීති නිලධාරියා පෙර පැහැදිලි කළ ආකාරයටම පැහැදිලි කළේය. [පෙර රැස්වීම් යොමු අංකය – 2020-02-10 (02)] • නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂවරයාගෙන් ලැබුණු ලිපියට අනුව සහ කිසිදු තක්සේරු වාර්තාවක් නොමැතිව මාලඹේ ඉඩම සඳහා එම මුදල රුපියල් 181,000,000/- ගෙවා ඇත. • තක්සේරු වාර්තාවට අනුව, මාලඹේ ඉඩමේ වටිනාකම රු.119,000,000 කි. ඒ අනුව පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් තක්සේරු වාර්තාවක් ලබාගැනීමකින් තොරව රු.62,000,000 ක් වැඩිපුර ගෙවා ඇත. • මේ සම්බන්ධයෙන් ආයතනය විසින් අදාළ පාර්ශව සමඟ රැස්වීම් කිහිපයක් පැවැත්වූ අතර රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා ද මෙම රැස්වීම් සඳහා සහභාගී විය. එම රැස්වීමේදී ආයතනයේ පැරණි ඉඩම රජයට හිමි බවත් එබැවින් ආයතනය වෙත කිසිදු වන්දියක් ලබා දිය නොහැකි බව මාර්ග සංවර්ධන අධිකාරිය තර්ක කරන ලදි. • කෙසේ වෙතත්, නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා සිටියේ මණ්ඩලය වන්දි ක්‍රියාවලියට අවතීර්ණ වී නොමැති අතර මෙම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරියා මාර්ග සංවර්ධන අධිකාරිය වේ. • මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම කාරණය පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත පිටපතක් සමඟ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් 2021/11/05 දින නීතිපති දෙපාර්තමේන්තුවට ලිපියක් ද යවා ඇත.	මේ සම්බන්ධයෙන් මීළඟ විගණන හා කලමනාකරණ කමිටුව වෙත සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස විගණන හා කලමනාකරණ කමිටුව මූල්‍ය අංශය, පරිපාලන අංශය සහ නීති නිලධාරි වෙත උපදෙස් දෙන ලදි.

න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-03-19	**<u>රජයේ විගණන විමසුම්</u>** **<u>1. මූල්‍ය විගණනය 2020 (II) (POE/B/CD/AEB/2020/05)</u>** **<u>මානව සම්පත් කළමනාකරණය</u>** විගණන හා කලමනාකරණ කමිටුව මෙම කාරණය පිළිබඳව අධ්‍යක්ෂ (පරිපාලන) වෙතින් ප්‍රශ්න කරන ලදි. ඒ අනුව, බඳවා ගැනීම් පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා දෙන තුරු පුරප්පාඩු වූ තනතුරු පිරවීමට ඇයට හැකියාවක් නොමැති බව අධ්‍යක්ෂ (පරිපාලන) පැහැදිලි කළාය. පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටියක් නොමැති අතර පරමාණුක බලශක්ති අධිකාරිය සඳහා බඳවා ගැනීම් පරිපාටියක් පමණක් ඇත. එබැවින් පරමාණුක බලශක්ති මණ්ඩලයේ සේවක සංඛ්‍යාව හරහා පුරප්පාඩු පිරවීම නැවත්වන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ලිඛිත උපදෙස් ලබා දී ඇත. ඊට අමතරව, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ (පරිපාලන) නව බඳවා ගැනීම් පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහතික කිරීමේ අදියරේ පවතින බව ප්‍රකාශ කරන ලදි.	කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය සවිස්තරාත්මක විස්තර සහිතව ලිඛිතව ඉදිරිපත් කරන ලෙස විගණන හා කලමනාකරණ කමිටු සභාපති අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් දෙන ලදි. තවදුරටත් එම ලිපිය ඉදිරි විගණන හා කලමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස කමිටු සභාපති අධ්‍යක්ෂ ජනරාල්ට උපදෙස් දෙන ලදි.
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-03-20	**<u>අභ්‍යන්තර විගණන වාර්තා</u>** 01. **<u>සේවක වෛද්‍ය රක්ෂණාවරණය පිළිබඳ අභ්‍යන්තර විගණන නිරීක්ෂණ-2020 (IA(R)/2020/09) සහ පිලිතුරු වාර්තාව</u>** ලංසු ඇගයීම් වාර්තාවේ දෝෂ පැවති බව අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදි. විශේෂයෙන්ම, ලංසු ඇගයීම් නිසි කාලසීමාවන් තුල සිදුකර නොමැති බව සහ නිසි සැලකිල්ලෙන් තොරව සිදුකර ඇති බව අභ්‍යන්තර විගණක පෙන්වා දෙන ලදි. ඉහත කරුණුවලට අමතරව, තවදුරටත් අධ්‍යක්ෂ (පරිපාලන) විසින් එක් එක් ප්‍රසම්පාදන සඳහා වැරදි ලෙස අනුමත කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවලට සාමාජිකයන්ගේ ලයිස්තුව භාවිතා කරමින් සිදු කරන බව අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි. ඒ අනුව, අධ්‍යක්ෂ (පරිපාලන) අභ්‍යන්තර විගණන නිරීක්ෂණ ඇතුළත් කිරීමට පොරොන්දු විය. සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් නොමැතිකම හේතුවෙන් මෙම දෝෂ මතු වී ඇති බව විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා ප්‍රකාශ කරන ලදි.	කාවින්ද වානක මහතා (කමිටු සාමාජික) තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා පත්වීම් සභාපතිවරයා හරහා සිදු කළ යුතු බවත් ටෙන්ඩර් මණ්ඩල සඳහා පත්කිරීම් අමාත්‍යාංශ මට්ටමින් සිදු කළ යුතු බවත් පැහැදිලි කරන ලදි.
	02. **<u>ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ වාහන අනතුර (53-6147) පරීක්ෂා කර අභ්‍යන්තර විගණන නිරීක්ෂණ/ නිර්දේශ ඉදිරිපත් කරන ලදී (IA(R)/2021/01)</u>** කාවින්ද වානක මහතා (කමිටු සාමාජික) මේ සම්බන්ධයෙන් පරිපාලනමය අංශයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර මුදල් රෙගුලාසි 104 යටතේ තවත් පරීක්ෂණයක් කළ යුතු බව පැහැදිලි කරන ලදි. අලාභ ඇස්තමේන්තු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති බව අධ්‍යක්ෂ (පරිපාලන) සඳහන් කරන ලදි. කෙසේ වෙතත්, එම ලේඛන ඉදිරිපත් කිරීමට වාර්තා පවත්වාගෙන යන අදාළ නිලධාරියා නොමැතිකම හේතුවෙන් ඇයට නොහැකි වී ඇති බව අධ්‍යක්ෂ (පරිපාලන) ප්‍රකාශ කරන ලදි.	පරීක්ෂණ කමිටු පත්කිරීම් ඇතුළු විමර්ශන වාර්තාව සහ ඊට අදාළ අනෙකුත් ලියකියවිලි විගණන හා කලමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස කාවින්ද වානක මහතා ඉල්ලා සිටින ලදි. එබැවින්, එම වාර්තා සහ ලේඛන සති 2ක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස විගණන හා කලමනාකරණ කමිටුව අධ්‍යක්ෂ (පරිපාලන) වෙත නියෝග කරන ලදි.

	03.<u>**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වසර 05 ක ආදායම සහ ණයගැති විශ්ලේෂණය (කෙටුම්පත් අභ්‍යන්තර විගණන වාර්තාව)**</u> කර්මාන්ත යෙදවුම් අංශයේ තොරතුරු මෙම වාර්තාවට ඇතුළත් කර නොමැති බව අධ්‍යක්ෂ ජනරාල් පෙන්වා දෙන ලදි.	විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා මෙම වාර්තාව අගය කරන අතර ක්‍රියාකාරකම් ආදායමට සමාන්තර නොවන බවත් එයින් පෙන්නුම් කරන්නේ සේවා වර්ධනයෙන් ලැබෙන ආදායම බවත් ඔහු පෙන්වා දෙන ලදි. "ප්‍රධාන කාර්යයසාධන දර්ශක" අනුව මෙහි අවසන් වාර්තාව සකස් කරන ලෙස විගණන හා කලමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණක වෙත උපදෙස් දෙන ලදී. ඒ අනුව, උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේ අවස්ථාවේදී මෙම වාර්තාව ඉදිරිපත් කරන ලෙස විගණන හා කලමනාකරණ කමිටුව විසින් නියෝග කරන ලදී.
නීතිය පත්‍ර අයිතම අංක - 2021-03-21	<u>**වෙනත් කරුණු**</u> **01.2021-03 වන කාර්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යයසාධන වාර්තාව** පහත සඳහන් ඉස්මතු කරන ලද ක්ෂේත්‍ර ඇතුළුව ඉහත කාර්යසාධන වාර්තාව කමිටුව විසින් සාකච්ඡා කර සමාලෝචනය කරන ලදී. • **රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකගේ අත්පොත** ඉහත සඳහන් අත්පොත දැනටමත් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර එම අත්පොත ආයතනයට භාවිතා කිරීමට ඔවුන්ගේ එකඟතාවය ලබාගෙන ඇති බව අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලදි. • **භාණ්ඩ සමීක්ෂණය** භාණ්ඩ සමීක්ෂණ වාර්තාව-2021 නියමිත කාලය තුළ ඉදිරිපත් කළ යුතු බව ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා පැහැදිලි කරන ලදි. ඒ අනුව 2022 මාර්තු මාසයේදී මෙම වාර්තාව ඉදිරිපත් කළ යුතුය. • **භෞතික තොග සත්‍යාපන වාර්තාව** මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා පැහැදිලි කරන ලදි. මෙම වාර්තාව මීළඟ විගණන හා කලමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන බව අධ්‍යක්ෂ (මුදල්) ප්‍රකාශ කරන ලදි. • **රජයේ චක්‍රලේඛ අංක:2020/01** ඉහත සඳහන් චක්‍රලේඛයෙන් ලබා දී ඇති උපදෙස් අනුව සේවා ගාස්තු වැඩි කිරීම සිදු කළ යුතු බව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ප්‍රකාශ කරන ලදි. · **සංයුක්ත සැලැස්ම** ඉහත කරුණු වලට අමතරව, සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සංශෝධනය කර නොමැති බව විගණකාධිපතිවරයාගේ නියෝජිතයා පෙන්වා දෙන ලදි.	එම අත් පොතට අනුව, කමිටුව විසින් පෙන්වා දෙන ලද එක් එක් ගැටළු/ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වගකිවයුතු නිලධාරියා පැහැදිලිව දක්වා ඇති පරිදි කමිටු ව්‍යවස්ථා සකස් කළ යුතුය.
	• **විගණකාධිපති වාර්තාව-2019** <u>අයිතම අංක. 2 යටතේ-Isotope Ratio Mass Spectrometer</u> ඉහත සඳහන් උපකරණ රු. 3,963,384/- ක් වැය කර 2019 දී සවිකර ඇති අතර, වාණිජ මෙහෙයුම් 2020 මැයි දක්වා සිදු කර නොමැති බව විගණකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇත.	

	මේ වන විට විද්‍යාගාරය ප්‍රතිනතය කිරීමට සැලසුම් කර ඇති බවත් ඒ අනුව මෙම උපකරණ භාවිතයෙන් තවත් සේවාවන් සැපයීමට හැකියාව පවතින බවත් අධ්‍යක්ෂ (ජෙව විද්‍යා) ප්‍රකාශ කරන ලදි. 3 (අ)- SCFR/662/2010 රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2020 යටතේ රජය සතු ව්‍යවසායන්හි මානව සම්පත් සම්බන්ධයෙන් කැපී පෙනෙන මතභේදාත්මක කරුණු සඳහා ස්ථාවර කාරක සභාව වෙත මෙම කරුණ යොමු කර ඇති බව විගණන කමිටු සභාපතිවරයා පැහැදිලි කළේය. 3 (ආ)- ආනයන කරන ලද කිරිපිටි පිලිබඳ වෙළඳපල සමීක්ෂණය විගණකාධිපති වාර්තාව යටතේ, ආනයනික කිරිපිටිවල විකිරණ මට්ටම මැනීම සඳහා වෙළෙඳපොළෙන් සාම්පල ලබා නොගත් බව පැහැදිලිව පෙන්වා දී ඇත. කෙසේ වෙතත්, මෙය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට අනිවාර්ය නොවන බව කමිටුව පැහැදිලි කරන ලදි. ආයතනය පුද්ගලික දත්ත රැස්කිරීමේ අරමුණින් පමණක් මෙම පරීක්ෂාව සිදු කර ඇත. 3 (ඉ)- FTIR විගණකාධිපති වාර්තාව යටතේ, ඉහත සඳහන් උපකරණ නව කාර්යාල පරිශ්‍රයේ සවිකර නොමැති බවත්, එබැවින් එය ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන බව දක්වා ඇති බවත් සඳහන් කර ඇත. අධ්‍යක්ෂ (කර්මාන්ත යෙදවුම්) විසින් විද්‍යාගාරයේ ආර්ද්‍රතා ගැටළුවක් පවතින බවත් එම නිසා අලුත්වැඩියා කටයුතු සිදුවෙමින් පවතින බවත් පැහැදිලි කළේය.	එබැවින් එය තවදුරටත් කමිටු රැස්වීමේදී හෙළි කිරීමට අවශ්‍ය නොවන බව විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා පැවසීය. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් හරහා මෙය ඉදිරිපත් කළ යුතු බව විගණන හා කලමනාකරණ කමිටුව පැහැදිලි කරන ලදි. ඒ අනුව මේ සම්බන්ධයෙන් අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම සඳහා මෙම කරුණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත යොමු කිරීමට මණ්ඩලයට හැකිය. ඉන් අනතුරුව ආහාර පරීක්ෂකවරයා හරහා මෙය අනිවාර්ය කිරීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය උත්සාහ කළ යුතු බව කාවින්ද වානක මහතා වැඩිදුරටත් පවසන ලදි. විගණන හා කලමනාකරණ කමිටුව යාවත්කාලීන පිළිතුරක් බලාපොරොත්තු වූ අතර එම නිසා මීළඟ විගණන හා කලමනාකරණ කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ (කර්මාන්ත යෙදවුම් අංශය) වෙත යොමු කරන ලදී.
	‘‘වෙනත් කරුණු" යන මාතෘකාව යටතේ අයිතම අංක 4 සම්බන්ධයෙන් (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටු රැස්වීම්)	මෙම කමිටුවට නිලධාරීන් පත් කරන ලෙස විගණන හා කලමනාකරණ කමිටුව විසින් මණ්ඩලයේ සභාපතිවරයාට යෝජනා කරන ලදී. ඊට අමතරව පූර්ව ආරක්ෂණ ක්‍රමය ලෙස අභ්‍යන්තර විගණක සහ නීති නිලධාරී ජෙෂ්ඨ කලමනාකරණ කමිටුවට සහභාගී කරවා ගැනීම වඩා හොඳ බවත්, එමගින් ආයතනය මුහුණ දෙන නීතිමය , මෙහෙයුම් සහ මූල්‍ය

		කළමනාකරණ ගැටළු අවම කර ගැනීමට එය උපකාර වන බවත් කාවින්ද වානක මහතා පෙන්වා දෙන ලදි.
රැස්වීම් දිනය- 2021-12-29 න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-04-23	1. SLAEB මූල්‍ය ප්‍රකාශන-2020" යන මාතෘකාව යටතේ අයිතම අංක 6 (සේවක ණයගැතියන්) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවට අදාළව කැපී පෙනෙන ණයගැති ශේෂයක් පවතින බව අධ්‍යක්ෂ (මුදල්) විසින් විගණන හා කලමනාකරණ කමිටුවට දන්වා සිටින ලදි. ශ්‍රී ලංකා රේගුව විසින් ආයතනයෙන් XRF විශ්ලේෂණයක් සිදු කරන ලෙස ඉල්ලුම් කර පසුව එය අවශ්‍ය නොවන බව දැනුම් දී ඇත. කෙසේ වෙතත්, ලිපි හුවමාරුව මේ කාරණය සම්බන්ධයෙන්ද යන්න සැබවින්ම තහවුරු වී නැත.	මේ සම්බන්ධයෙන් අදාළ සියලුම ලිපි හුවමාරු කර ගැනීම සඳහා මෙම කරුණ අභ්‍යන්තර විගණක (IA) වෙත යොමු කිරීමට කමිටුව තීරණය කරන ලදි. ඒ අනුව ණයගැති ශේෂයක් නොමැති නම්, එම පදනම මත මිලදී ගැනීමේ ඇණවුම අවලංගු කළ හැකිය.
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-04-24	**01. ජාතික නිර්විනාශක පරීක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් පිළිබඳ සවිස්තර වාර්තාව** කාවින්ද වානක මහතා ව්‍යාපෘතියේ වෙනත් වැඩ සහ අතිරේක වැඩ අතර වෙනස පැහැදිලි කරන ලදි. ඒ අනුව වෙනත් කාර්යයන් විෂය පථය වැඩි දියුණු කිරීමට අදාල වන අතර අතිරේක කාර්යයන් විෂය පථයෙන් බැහැරව සිදු කරනු ලබන අතර මේවා එකිනෙකට වෙනස් වැඩ වේ. අතිරේක වැඩ සඳහා ප්‍රතිපාදන තිබිය යුතු අතර එවැනි ප්‍රතිපාදන නොමැතිව වෙනම ටෙන්ඩර් කැඳවිය නොහැක. පෙර කමිටු රැස්වීම් වාර්තාවලට අනුව, අධ්‍යක්ෂ (මුදල්) විසින් අතිරේක වැඩ සඳහා රුපියල් මිලියන 9 ක් දක්වා ඇති බව අභ්‍යන්තර විගණක පෙන්වා දෙන ලදි. කෙසේ වෙතත්, ගෙවිය යුතු හිඟ මුදල වූ රුපියල් මිලියන 38 න් රුපියල් මිලියන 9 ක් පමණක් ගෙවීම් සිදුකරන්නේ කෙසේද යන්න අභ්‍යන්තර විගණක විමසා සිටියේය. ඊට හේතුව වූයේ ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන මණ්ඩලය විසින් 2021/09/09 දිනැති ලිපියේ මුළු හිඟ මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සඳහන් කර ඇති නිසාවෙනි. අමතර වැඩ සඳහා රුපියල් මිලියන 9 ක මුදල අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හරහා සිදු කළ හැකි බව අධ්‍යක්ෂ (මුදල්) දන්වා සිටින ලදි. කෙසේ වෙතත් තවත් මිලියන දහයක අතිරික්තයක් ගෙවීමට කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ලබාගත යුතුයි. ඒ අනුව එම වාර්තාව කොන්ත්‍රාත්කරු හරහා අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට නියමිතය. මෙම වාර්තාව අධ්‍යයනය කිරීමෙන් පසු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නේද නැද්ද යන්න අමාත්‍යාංශය තීරණය කරනු ඇත. මෙම අතිරේක වැඩ සියල්ල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇති බව පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා තහවුරු කරන ලදි.	
	02. <u>පරමාණුක බලශක්ති අධිකාරිය/ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ ගැටළු සම්බන්ධයෙන් පරිපාලන, මුදල් සහ නීති අංශය විසින් සකස් කරන ලද වාර්තාව</u>	

	I.ඉඩම් ආරවුල් • **පරමාණුක බලශක්ති අධිකාරියේ පැරණි ඉඩම** නීතිපති දෙපාර්තමේන්තුව විසින් අංක 18/විවිධ (019) හි අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 77 අවුරුදු බදු අයිතිය පිළිබඳ කාරණය අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ සහයෝගීතාවයෙන් විසඳා ගැනීමට යෝජනා කරන ලදී. එසේ නොමැති නම් මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙසද යෝජනා කරන ලදි.	
	• **පරමාණුක බලශක්ති මණ්ඩලයේ නව ඉඩම** රජයේ ප්‍රදානය හරහා මෙම ඉඩමේ අයිතිය ලබා ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව යෝජනා කරන ලදි. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ බදු අයිතිය යටපත් කරමින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙසට වැඩිදුරටත් උපදෙස් ලැබී ඇත.	
	II. නව ගොඩනැඟිලි ගැටලුව හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සනින් භාරදීම සඳහා ලියවිල්ලක් ඇත. මේ වන විටත් ගොඩනැගිලිවල පිරිවැය ඇතුළත් ලිපි ලේඛන භාර දී ඇති බව මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා ඇති බව අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදි.	
	03.<u>ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ වාහන අනතුර සම්බන්ධයෙන් විමර්ශන වාර්තාව සහ විමර්ශන කමිටුව ඇතුළු අනෙකුත් අදාළ ලියකියවිලි</u> මේ සම්බන්ධයෙන් දැනට පවත්වාගෙන ගොස් ඇති ලිපිගොනුව පිළිබඳව කමිටුව විමසා සිටින ලදි. කෙසේ වෙතත් එම ලිපිගොනුව විමර්ශන මණ්ඩලය විසින් රැගෙන ගොස් ඇති බව අධ්‍යක්ෂ (පරිපාලන) ප්‍රකාශ කරන ලදි. කමිටුව මේ සම්බන්ධයෙන් මූලික විමර්ශන වාර්තාව සහ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අලාභ හෝ හානි සඳහා වගකීම නියම කිරීම පිළිබඳව විමසා සිටින ලදි. මෙම කරුණ නීති නිලධාරි වෙත යොමු කළ බව අධ්‍යක්ෂ (පරිපාලන) දන්වා සිටින ලදි. මෙම ගැටළුව රට වසා තැබූ කාලය තුළ සිදු වූවක් බව නීති නිලධාරිනිය පැහැදිලි කල අතර, මේ ගැටළුව ඇයට ඉදිරිපත් නොකල බවද පවසන ලදි. බොහෝ කලකට පසු මෙම කාරණය ඇය වෙත යොමු කර ඇති අතර එම අදියරේදී පවා කාරණය දුරදිග ගොස් තිබුණි. එබැවින් පැහැදිලි සාධාරණ හේතු සහිතව ඇය විමර්ශනය ප්‍රතික්ෂේප කර ඇත. මෙම වාහනය ලියාපදිංචි ගරාජයට ඉදිරිපත් කිරීම සිදු කලේද යන්න කමිටු සභාපතිවරයා විමසා සිටින ලදි. එම අනතුර රට වසා දැමූ කාල සීමාව තුල සිදු වූ නිසා වාහනය ළඟම ඇති ගරාජයට යොමු කළ බව අධ්‍යක්ෂ (පරිපාලන) දැනුම් දෙන ලදි. ඉහත කරුණු වලට අමතරව, මූලික විමර්ශන වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා පරිපාලන නිලධාරීන් දෙදෙනෙකු පත් කළ බව දැනුම් දුන් අතර, පාඩු අයකර ගැනීමේ විමර්ශන මණ්ඩලය දින **7**ක් ඇතුළත තම වාර්තාව ඉදිරිපත් කරන බවට කමිටුවට දන්වා අධ්‍යක්ෂ (පරිපාලන) දන්වා සිටින ලදි. මේ අතර, මෙම වාර්තාවේ තාක්ෂණික තත්වය පිළිබඳව කමිටුව විමසා සිටින ලදි. මෙම වාහනය භාවිතයට ගැනීමෙන් ඉවත් නොකිරීමට සහ මෙම වාහනය රක්ෂණ සමාගමෙන් අලුත්වැඩියා කිරීමට පරීක්ෂණ මණ්ඩලය තීරණය කර ඇත. එය රට වසා තැබූ කාලයේ සිදු වූ අතර එම නිසා තාක්ෂණික වාර්තාව ලබා ගැනීම සඳහා මෙම වාහනය ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඉන් පසු වාහනය ගරාජයට යැවීමට පෙර	මෙවැනි පරීක්ෂණ නීති නිලධාරියාට පමණක් නොව ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියාට ද කළ හැකි බව කමිටුව අවධාරණය කරන ලදි. සමස්තයක් වශයෙන් ගත් කල, අනෙකුත් මධ්‍යස්ථාන දෙකෙහිද එවැනි විමර්ශනයක වගකීම පැවරෙන්නේ අධ්‍යක්ෂ පරිපාලනට බව, කමිටුව පැහැදිලි කරන ලදි. එබැවින්, උපදෙස්වලට අනුකූල නොවීම සඳහා හේතු අදාළ පරිපාලන නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලෙස කමිටුව අධ්‍යක්ෂ (පරිපාලන) වෙත උපදෙස් දෙන ලදි. දැන් වුවද, කමිටුව විසින් තාක්ෂණික නිලධාරියාගෙන් තාක්ෂණික වාර්තාවක් ලබා ගන්නා ලෙස අධ්‍යක්ෂ (පරිපාලන) වෙත උපදෙස් දෙන ලදි.

	තාක්ෂණික වාර්තාව ලබාගැනීමට ඉදිරිපත් නොකළ බව පවසමින් කාර්මික නිලධාරියා තාක්ෂණික වාර්තාව නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විමර්ශනය සහ වගකීම් නියම කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් පවත්වා ගෙන නොයන බව අභ්‍යන්තර විගණක දැනුම් දෙන ලදී.	
	04. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ දිගුකාලීන නොපියවූ රාජ්‍ය අංශයේ ණයගැතියන් TLD කාඩ්පත් ඉල්ලීම්කරුවන්ගේ ලයිස්තුවක් අභ්‍යන්තර විගණක ඉල්ලා ඇති බව ඇය දන්වා සිටින ලදි. කෙසේ වෙතත්, එවැනි ලැයිස්තුවක් නොමැති බවත් ඔවුන් ලියාපදිංචි පාරිභෝගිකයින්ට ණය පදනම මත සේවා සපයන බවත් අධ්‍යක්ෂ (විකිරණ හා තාක්ෂණික සේවා අංශය) පෙන්වා දී ඇත . එබැවින් අභ්‍යන්තර විගණන අංශය මේ සම්බන්ධයෙන් පද්ධති විගණනයක් සිදුකිරීමට නියමිත බව අභ්‍යන්තර විගණක වැඩිදුරටත් සඳහන් කරන ලදි. ණය දීමේ පදනම මත සේවා සැපයීම රජයේ ආයතනවල විෂය පථය නොවන බව කාවින්ද වානක මහතා පැහැදිලි කළේය. කිසියම් අංශයක් ණය දීමේ පදනම මත සේවා සපයන්නේ නම්, ණය එකතු කිරීම ද ඔවුන්ගේ වගකීමකි. අනෙකුත් රාජ්‍ය ආයතන හා සසඳන විට ඒවා ණය දීමේ පදනම මත සේවා සැපයීම සිදු නොකරයි. දිගු කාලීනව නොපිය වූ ණය ගැනියන් සඳහා වන පොලී අනුපාතයක් ඇතුලත් කර ප්‍රතිපත්තියක් සකස් කිරීමට ද අමාත්‍යාංශ නිරීක්ෂකයා යෝජනා කළේය. අධ්‍යක්ෂ (විකිරණ හා තාක්ෂණික සේවා අංශය) සහ අධ්‍යක්ෂ (මුදල්) විසින් දිගුකාලීනව නොපිය වූ ණය ගැනියන්ගේ මෙම ගැටලුව විසඳීම සඳහා ව්‍යාපාර සංවර්ධන ඒකකය ශක්තිමත් කිරීමට යෝජනා කරන ලදී.	තවද, ණය දීමේ පදනම මත පුද්ගලික අංශයට සේවා සැපයීම කිසිසේත්ම පනතේ අවශ්‍යතාවයක් නොවන බව කමිටුව අවධාරණය කළේය. එබැවින් සාධාරණ කාලයකට පසු අවම වශයෙන් රජයේ ණයගැතියන්ගෙන් නිදහස් කළ හැකි බව කමිටුව අවධාරණය කරන ලදි. කෙසේ වෙතත්, පෞද්ගලික අංශයේ ණයගැතියන් නිදහස් කිරීමට පනතේ ප්‍රතිපාදන නොමැත. අවසාන වශයෙන්, විගණන හා කලමනාකරණ කමිටුව විසින් රජයේ අවශ්‍යතාවය සහ අංශවල විෂය පථයන් සැලකිල්ලට ගනිමින් සේවා සැපයීම පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කිරීමට උපදෙස් දුන් අතර, මෙම ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසට ද නියම කරන ලදී. කාවින්ද වානක මහතා විකල්පයක් ලෙස ‘‘තැන්පතු වාරික ක්‍රමය’’ යෝජනා කරන ලදි.
	05.FTIR වාර්තාව මෙම උපකරණයේ එක් අයිතමයක් අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති බව අධ්‍යක්ෂ (විකිරණ හා තාක්ෂණික සේවා අංශය) දැනුම් දෙන ලදි. හේලීස් පුද්ගලික ආයතනයේ මිල කැඳවීමට අනුව, මෙම අයිතමය නැවත ස්ථාපනය සඳහා මිලියන 8 ක් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මෙම උපකරණ හරහා එවැනි ආදායමක් උපයා ගත හැකිද යන්න තහවුරු කළ යුතුය.අනෙක් අතට, මෙම උපකරණ නඩත්තු කිරීම සඳහා ද්විත්ව වායුසමීකරණ අවශ්‍යතාවය වැනි විශේෂ අවශ්‍යතාවයන්ද තිබේ. එබැවින් අළුත්වැඩියා කිරීමට පෙර මෙම උපකරණ මගින් ලබා ගත හැකි සැබෑ ලාභය බව තහවුරු කර ගත යුතු බව අධ්‍යක්ෂ (විකිරණ හා තාක්ෂණික සේවා අංශය)වැඩිදුරටත් දන්වා සිටින ලදි. විරාජ් එදිරිසිංහ අධ්‍යක්ෂ (කර්මාන්ත යෙදවුම් අංශය), එදින විගණන හා කලමනාකරණ කමිටුවට සහභාගී නොවූ බව කමිටුව සඳහන් කරන ලදි. අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔහු මේ සඳහා සහභාගී විය යුතු වේ.	කෙසේ වෙතත්, අධ්‍යක්ෂ (කර්මාන්ත යෙදවුම් අංශය) හරහා මීළඟ විගණන හා කලමනාකරණ කමිටුව වෙත මේ සම්බන්ධයෙන් පුළුල් වාර්තාවක් කමිටුව බලාපොරොත්තු විය.
	06.විගණකාධිපති වාර්තාව-2019-(අයිතම අංක 2-IRMS) මෙම උපකරණයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව කමිටුව විමසා සිටින ලදි. උපකරණවලට අනුකූලව දත්ත සකස් කර ඇති බවත් එබැවින් එම ක්‍රියාවලිය සඳහා සාධාරණ කාලයක් ගත වූ බවත් අධ්‍යක්ෂ (ජෛව විද්‍යා අංශය) විසින් පෙන්වා දෙන ලදි. ඇය මෙම විගණන විමසුමට ප්‍රමාණවත් විස්තර සහිතව පිළිතුරු දුන් බව විද්‍යා අංශය වැඩිදුරටත් සඳහන් කරන ලදි.	මේ සම්බන්ධයෙන් මීළඟ විගණන හා කලමනාකරණ කමිටුව වෙත සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන බව අධ්‍යක්ෂ (ජෛව විද්‍යා අංශය) ප්‍රකාශ කරන ලදි.

	කෙසේ වෙතත්, පිළිතුර පිළිගත හැකි මට්ටමේ නොතිබූ බැවින් මෙම විමසුම විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාවේ පළ කර ඇති බව කමිටුව පෙන්වා දෙන ලදි.	
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-04-26	<u>අභ්‍යන්තර විගණන වාර්තා සහ කළමනාකරණ පිළිතුරු</u> **01.කළමනාකාරිත්වය විසින් අභ්‍යන්තර විගණන වාර්තා සඳහා ලබාදුන් පිළිතුරු සාරාංශය (2017 සිට 2021 දක්වා)** සමහර අංශවල පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් ඇති බව අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදි. අංශවල පවත්වන රැස්වීම්වලදී විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන ලෙස කාවින්ද වානක මහතා උපදෙස් දෙන ලදි. මූල්‍ය රෙගුලාසිවලින් බැහැරවීම පිළිබඳ කාරණය සොයා බැලීම සඳහා අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂ (පරිපාලන) සහ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කමිටුවක් අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලදි. තවද, 1980 සිට ස්ථාවර වත්කම් ලේඛනය සහ පොත් වටිනාකම අතර ආරම්භක ශේෂය අතර රුපියල් මිලියන 3 ක වෙනස්කම් ඇති බව අධ්‍යක්ෂ (මුදල්) දැනුම් දෙන ලදි. එම කාරණය දීර්ඝ කාලයක සිට විගණන විමසුමක් ලෙස පවතී.	තීරණයක් ගැනීම සඳහා මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස කමිටුව අධ්‍යක්ෂ (මුදල්) වෙත නියෝග කරන ලදි. තවද, එවැනි කරුණු දීර්ඝ කාලීනව පවත්වා නොගන්නා ලෙස කමිටුව උපදෙස් දෙන ලදි.
	02. අභ්‍යන්තර විගණනය සහ රජයේ විගණනය මගින් පෙන්වා දී ඇති ගැටළු වල සාරාංශය මෙම අයිතමය යටතේ, සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලැබුණු ප්‍රදානයන් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වියදම් සඳහා යොදාගෙන ඇත. 2020 සිට සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලද ප්‍රදාන සහ ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යයි. ප්‍රායෝගිකව, එම වියදම් නිවැරදිව අදාල සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘති ගිණුම් යටතේ ගිණුම්ගත කර නොමැත. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ අරමුදල් කළමනාකරණය වෙනස් කරුණු දෙකක් බව කමිටුව පෙන්වා දුන්නේය. වාර්තා තැබීමේ අරමුණින් ව්‍යාපෘති සඳහා වෙනම වියදම් ගිණුම් පවත්වා ගෙන තිබිය යුතුය. ඊට අමතරව නිශ්චිත ව්‍යාපෘතීන් සඳහා අයවැය සකස් කර අදාළ ගිණුමට වියදම් බැර කළ යුතුය. එබැවින් ව්‍යාපෘති යෝජනාව සහ එහි අයවැය සහ වියදම් තොරතුරු ඉදිරිපත් කිරීමට අදාළ අධ්‍යක්ෂවරුන් බැඳී සිටිය යුතු බව කමිටුව පැහැදිලි කරන ලදි.	
	03. i රජයේ විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති ගැටළු මහඟරවා ගැනීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පරීක්ෂාව (IA/(R)/2021/02) ii අභ්‍යන්තර විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති ගැටළු මහඟරවා ගැනීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පරීක්ෂාව (IA/(R)/2021/03) iii මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ අභ්‍යන්තර විගණන නිරීක්ෂණ (IA/(R)/2021/05) විගණන විමසුම් සභාපතිවරයාට පිටපතක් සමඟින් අධ්‍යක්ෂ (පරිපාලන) වෙත යැවිය යුතු බව කමිටුව පෙන්වා දෙන ලදි. අධ්‍යක්ෂ (පරිපාලන) ප්‍රකාශ කළේ ඇයට විගණන විමසුම් කෙටුම්පත සඳහා පිළිතුරු සැපයිය නොහැකි බවයි. iv පරමාණුක බලශක්ති මණ්ඩලයේ වසර 05 ක ආදායම සහ ණයගැති විශ්ලේෂණය (IA/(R)/2021/06) ඉහත සඳහන් අභ්‍යන්තර විගණන වාර්තාව පිළිබඳව තමන් දැන නොසිටි බවත්, මෙම වාර්තාව සකස්	බඳවාගැනීම් පරිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසු සමස්ත ආයතනය සඳහාම බලපැවැත්වෙන ප්‍රතිව්‍යුහගත සැලැස්මක් සකස් කරන ලෙස කමිටුව අධ්‍යක්ෂ (පරිපාලන) වෙත උපදෙස් දෙන ලදි. එබැවින්, මෙම වාර්තාව අදාළ අධ්‍යක්ෂවරුන් වෙත යැවීමට විගණන හා කලමනාකරණ කමිටු සභාපතිවරයා අභ්‍යන්තර විගණකට උපදෙස් දෙන ලදි. එවිට එය සාධනීය වාර්තාවක් වනු ඇත.

	කිරීම සඳහා ඔවුන්ගේ මැදිහත්වීමක් සිදු නොවූ බවත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂවරු පෙන්වා දෙන ලදි. 1. කරුණු සලකා බැලීමෙන් පසු, මේවා කපා හැරිය හැකිද නොහැකිද යන්න කමිටුව තීරණය කරනු ඇත. 2. කලින් සිටි එක් සේවකයෙකුට වැඩිපුර ගෙවූ මුදල් පිලිබඳ ගැටලුවක් පවතින බව නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) දැනුම් දෙන ලදි. එනම් ආයතනයේ එක් සේවකයෙකු වෙනුවෙන්, එම සේවකයාගේ ඉල්ලීම මත සිංගර් ශ්‍රී ලංකා සමාගම වෙත ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත වාරික මුදල් ගෙවීමක් සිදුකර ඇත. පසුව සේවකයා එම වාරික මුදල් ගෙවීම නතර කරන ලෙස ආයතනයට දැනුවත් නොකිරීම හේතුවෙන් ඉහත සඳහන් කළ සමාගමට ආයතනය විසින් වැඩිපුර ගෙවීමක් සිදු කර ඇත. 3. නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ් ආයතනයට වැඩිපුර ගෙවීම් පරමාණුක බලශක්ති මණ්ඩලයට නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ් ආයතනයෙන් බොහෝ කලකට පෙර භාණ්ඩ ලැබී ඇත. කෙසේ වෙතත්, නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ් ආයතනයට වැඩිපුර ගෙවීමක් සිදු විය. 4. ක්‍රියාකාරී අධ්‍යක්ෂ සිදුකල ගෙවීම් මෙම ආයතනයට ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් සඳහා ඉඩ ලබා දී නොමැති බව පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් ලිපියක් ලැබී තිබිණ. කෙසේ වෙතත්, මෙම කාලය තුළ සිදු කර ඇති ඉන්ධන දීමනාවක් තිබූ අතර එය වැඩිපුර ගෙවීමකි.	වෙළඳ නොවන ලැබිය යුතු ලැයිස්තුව සඳහා දින **14**ක් ලබා දෙමින් අවසාන සිහිකැඳවීම් යැවීමට කමිටුව අධ්‍යක්ෂට (මුදල්) උපදෙස් දෙන ලදි. එබැවින් එම වැඩිපුර ගෙවීම අදාල සේවකයාගෙන් අධිභාර ලෙස අයකිරීමට කටයුතු කරන ලෙස කමිටුව අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් දෙන ලදි. ඊට අමතරව ආයතනයක් ලෙස මෙවැනි පුද්ගලික ගෙවීම්වල මැදිහත් නොවන ලෙසට කමිටුට උපදෙස් දෙන ලදි. **2021** දෙසැම්බර් **31** වැනි දින ඇතුළත මෙම වැඩිපුර ගෙවීම ලබා ගන්නා ලෙස කමිටුව අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් දෙන ලදි. එබැවින් මෙම ගෙවීම සිදු කරන ලෙස දන්වමින් ක්‍රියාකාරී අධ්‍යක්ෂව සිටි සම්පත් චන්ද්‍රසේන මහතාට ලිපියක් යොමුකරන ලෙස කමිටුව විසින් අධ්‍යක්ෂට (මුදල්) නියෝග කළේය. වාර්තා කිරීමේ අරමුණින් එම ලිපිය ද කමිටුවටද ඉදිරිපත් කරන ලෙස ද කමිටුව නියම කරන ලදි. මීට අමතරව, මීළඟ විගණන හා කලමනාකරණ කමිටුව වෙත මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂක (මුදල්) සහ අධ්‍යක්ෂක (පරිපාලන) වෙත උපදෙස් දෙන ලදි.
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-04-27	**<u>ශාන්තිලාල් මහතා විසින් පරමාණුක බලශක්ති මණ්ඩලයේ වත්කම් (විද්‍යාත්මක උපකරණය) අවභාවිත කිරීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිල්ල</u>** අනුරුද්ධ ජයලත් මහතා (ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ විශ්‍රාමික නිලධාරී) Automess Scintillator Probe නමැති විද්‍යාත්මක උපකරණය (ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වත්කම්) නීති විරෝධී ලෙස මාලදිවයිනට රැගෙන ගොස් ඇති බව සඳහන් කරමින් බාහිර පුද්ගලයකු (ශාන්තිලාල් මහතා) පැමිණිල්ලක් කර ඇති බව අභ්‍යන්තර විගණක දැනුම් දුන්නේය. මෙම නීතිවිරෝධී ක්‍රියාව පොදු දේපළ අයථා පරිහරණයකට සමාන බව ඔහු සිය පැමිණිල්ලේ සඳහන් කර ඇත. 2021 නොවැම්බර් 27 වැනි දින නීතිවිරෝධී ක්‍රියාවක් සිදුවී ඇති බවට වන ඉහත සඳහන් කළ පැමිණිල්ලට අනුව අනුරුද්ධ ජයලත් මහතා, ප්‍රසාද් මහකුමාර මහතා සහ තෙන්නකෝන් මහතා හමුවීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩල පරිශ්‍රයට නුදුරින් පිහිටි ස්ථානයකට පැමිණ ඇත. ඇයට මෙම විද්‍යුත් තැපෑල 2021/11/29 දින ලැබුණු බව අභ්‍යන්තර විගණකට වැඩිදුරටත් දන්වා සිටින ලදි. මේ අතර, 2021/12/02 වන දින සභාපතිවරයා විසින් එම උපකරණයේ තිබේදැයි පෞද්ගලිකව පරීක්ෂා කර	

	ඇති බවත්, මෙම උපකරණය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය භාරයේ පවතින බව සඳහන් කරමින් රේඛීය අමාත්‍යාංශයට දන්වා ඇති බවත් අභ්‍යන්තර විගණක දන්වා සිටින ලදි. මෙම කරුණ පොලිසියට පැමිණිල්ලක් ලෙස කළ යුතුව තිබූ බව කමිටුව පෙන්වා දෙන ලදි. මේ සම්බන්ධයෙන් සභාපතිවරයා මේ වන විටත් පොලිසියට ලිපියක් යවා ඇති බව අභ්‍යන්තර විගණක සහ නීති නිලධාරිවරයා දැනුම් දුන්නේය. ඊට සමගාමීව, අභ්‍යන්තර විගණක සහ නීති නිලධාරියාගේ ඉල්ලීම පරිදි, සභාපතිවරයා මේ සම්බන්ධයෙන් විද්‍යුත් තැපෑලක් මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වා ඇත. කෙසේ වෙතත්, සභාපතිවරයාගේ වාචික උපදෙස් මත 2021/12/02 දින ඔවුන් ඉහත සඳහන් උපකරණ පරීක්ෂා කර එදින වාහන ධාවන සටහන්, නිවාඩු වාර්තා සහ ගේට්ටු අවසරපත් ආදිය එක්රැස් කර ගත් බව අභ්‍යන්තර විගණක සහ නීති නිලධාරී වැඩිදුරටත් සඳහන් කරන ලදි. එම අවස්ථාවේ දී, විකිරණ හා තාක්ෂණික සේවා අංශයේ අධ්‍යක්ෂ සහ නිරාෂා මෙනවිය (විද්‍යාගාරභාර නිලධාරී) සියළුම උපකරණ ඔවුන් භාරයේ ඇති බව තහවුරු කළ බව අභ්‍යන්තර විගණක සහ නීති නිලධාරී දන්වා සිටින ලදි. 2021/12/01 දින තමාට මේ සම්බන්ධයෙන් පළමු ලිපිය ලැබී ඇති බවත්, එය තමාට පිටපතක් සමඟ ශාන්තිලාල් මහතා විසින් සභාපතිවරයා වෙත එවූ විද්‍යුත් තැපෑලක් බවත් නීති නිලධාරිනිය සඳහන් කළාය.	
න්‍යාය පත්‍ර අයිතම අංක - 2021-04-28	**වෙනත් කරුණු** **1.භාණ්ඩ සමීක්ෂණ වාර්තා** භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන බව අධ්‍යක්ෂ (මුදල්) දන්වා සිටින ලදි. කෙසේ වෙතත්, කමිටුව පෙන්වා දුන්නේ මෙම වාර්තාව පළමුව විගණන හා කලමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු බවයි. කෙසේ වෙතත්, මෙම වාර්තාව විගණන හා කලමනාකරණ කමිටුවට ඉදිරිපත් කළ හැකි බව අධ්‍යක්ෂ (මුදල්) දැනුම් දෙන ලදි. ඒ අනුව, භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් ගැටළු නිරාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ (පරිපාලන), අධ්‍යක්ෂ (විකිරණ හා තාක්ෂණික සේවා අංශය) සහ තමන් ඇතුළුව කමිටුවක් පිහිටුවා ඇති බව අධ්‍යක්ෂ (මුදල්) පැහැදිලි කළේය. ඒ අනුව එම කමිටුව භාණ්ඩ අපහරණය සහ බැහැර කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන ඇත. අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණන අංශයට මෙම වාර්තාවේ පිටපතක් ඉල්ලා සිටින ලදි.	ඌණ භාණ්ඩ, හදුනා නොගත් භාණ්ඩ සහ අතිරික්ත භාණ්ඩ යනාදිය තිබේ නම්, එම ලැයිස්තු කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු බව කාවින්ද වානක මහතා (විගණන හා කලමනාකරණ කමිටු සාමාජික) උපදෙස් දෙන ලදි. ඒ සම්බන්ධයෙන් විගණන හා කලමනාකරණ කමිටුවට තීරණයක් ගත හැකි බවද ඔහු වැඩිදුරටත් අවධාරණය කරන ලදි.
	2.සංයුක්ත සැලැස්ම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට රු. මිලියන **48** ක පුනරාවර්තන අයවැයක් භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇති බන අධ්‍යක්ෂ (මුදල්) දැනුම් දෙන ලදි. උපායමාර්ගික සැලසුම් සකස් කිරීමේදී රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන මත රඳා නොසිටීමට උත්සාහ කරන ලදි. ඒ අනුව**,** රුපියල් මිලියන **22** ක හිඟයක් පවතින බව අධ්‍යක්ෂ (මුදල්) වැඩිදුරටත් පෙන්වා දෙයි.	පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම ජනවාරි මැද භාගයේදී අවසන් කළ හැකි බව කමිටුව පැහැදිලි කරන ලදි. කෙසේ වෙතත්**, 2022** වසර සඳහා ආයතනික සැලැස්ම අවසන් කිරීමට කමිටුව උපදෙස් දෙන ලදී. මෙම සැලැස්මට අනුව**,** ආයතනික කාර්යයන් සහ අයවැය සකස් කිරීමට කමිටුව වැඩිදුරටත් උපදෙස් දෙන ලදි. අවදානම් විශ්ලේෂණයකින් තොරව භාණ්ඩාගාරයේ පුනරාවර්තන අයවැය මත රඳා නොසිටීමට තීරණයක් ගත නොහැකි බව කමිටු සභාපතිවරයා අවධාරණය කරන ලදි. එබැවින්**,** රු.මිලියන 48 ක

		පුනරාවර්ථන අයවැයද සමඟ **2022** අයවැය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂකට (මුදල්) උපදෙස් දෙන ලදි. මෙම අයවැය විස්තරය පළමුව කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු බව ද කමිටුව විසින් පෙන්වා දෙන ලදී.
	3. භාවිතයට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම විගණන හා කළමනාකරණ කමිටුව සහ විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සඳහන් කළේ ආයතනය විසින් භාවිතයට නොගත් වෛද්‍ය නිවාඩු ගෙවීම සඳහා 1983 නිකුත් කල චක්‍රලේඛයට අනුව සිදු කරන බවයි. විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ප්‍රකාශ කළේ මෙම ගෙවීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට හිමිකමක් නොමැති බවයි.	එබැවින්, ඉහත සඳහන් චක්‍රලේඛය යටතේ හෝ වෙනත් කුමන හෝ ප්‍රතිපාදන යටතේ ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් දිගටම කරගෙන යාමට ආයතනයේ කාර්ය මණ්ඩලයට අයිතියක් තිබේද යන්න පිළිබඳව උපදෙස් ඉල්ලා මෙම කරුණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ලිවීමට කමිටුව උපදෙස් දුන්නේය. ඉහත උපදෙස් ඉල්ලීමට මෙම ගෙවීමේ අතීත වාර්තා සහ ආයතනයේ උපයාගත් ආදායම සඳහන් කරමින් අවශ්‍ය සියලු තොරතුරු ඇතුළත් කිරීමට කමිටුව උපදෙස් දුන්නේය.

කමල් පත්මසිරි
විගණන හා කළමනාකරණ කමිටු සභාපති

5 . න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ සේවා සැපයීම

න්‍යෂ්ටික විද්‍යාවේ හා තාක්ෂණයේ ප්‍රතිලාභ සැබවින්ම දැක ගත හැක්කේ සේවදායකින්ගේ මෙන්ම සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතා සහ ගැටළු වලට විසඳුම් ලබා දීම තුළින් ය. රාජ්‍ය ආයතනයක් ලෙස න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධව සිය සුවිශේෂී හැකියාවන් තුළින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය කර්මාන්ත, කෘෂිකාර්මික, සෞඛ්‍ය, පරිසර, අධ්‍යාපනය යන ක්ෂේත්‍ර සඳහා අනුපමේය සේවාවක් ලබා දෙයි.

5.1 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය මඟින් සපයන ගැමා ප්‍රවිකිරණ සේවාවන්

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය යනු, රජයට අයත් එකම බහුකාර්ය ප්‍රවිකිරණ මධ්‍යස්ථානය වන අතර, එය 2014 වසරේ සිට බියගම අපනයන සැකසුම් කලාපය තුළ සේවා සැපයීම කෙරේ. මෙම ආයතනය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට අයත් එක් ආයතනයකි. මෙම ප්‍රවිකිරණ යන්ත්‍රාගාරයෙහි විකිරණශීලී ප්‍රභවය ලෙස කොබෝල්ට්-60 භාවිත කෙරේ. 2013 වසරේදී කිලෝකියුරි 250 ක ධාරිතාවයක් ආරම්භක සක්‍රියතාවය ලෙස ස්ථාපනය කරන ලද ප්‍රභවය, 2017 සහ 2021 වසර වලදී පිලිවෙලින් කිලෝකියුරි 125 ක සහ 250 ක ධාරිත්වයන්ගෙන් යුතුව උත්ශ්‍රේණිගත කරන ලදී.

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ යන්ත්‍රාගාරය, පැය 24/7 ලෙස ක්‍රියාත්මක වන අතර, එය මනා පුහුණුව ලද කැපවීමකින් යුතු කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. ප්‍රවිකිරණ යන්ත්‍රාගාරයට අමතරව මෙහි නවීන උපකරණ වලින් සමන්විත විද්‍යාගාර 3 ක්ද, ස්ථාපිතව ඇත. එනම්, තත්ත්ව සහතික කිරීමේ මාත්‍රාමිතික විද්‍යාගාරය, ක්ෂුද්‍රජීවී විද්‍යාගාරය සහ ආහාර තාක්ෂණ විද්‍යාගාරයයි. මාත්‍රාමිතික විද්‍යාගාරය මඟින් ප්‍රවිකිරණයේදී නිෂ්පාදන වෙත ලබාදෙන විකිරණ මාත්‍රාව සහතික කිරීම සිදු කරනු ලබන අතර, ක්ෂුද්‍රජීවී විද්‍යාගාරය මඟින් ක්ෂුද්‍රජීවී පරීක්ෂණ තුළින් ප්‍රවිකිරණයේ තත්ත්ව සහ වලංගුභාවය තහවුරු කරනු ලැබේ. මේ අතර ආහාර තාක්ෂණ විද්‍යාගාරය ආහාර සම්බන්ධ පර්යේෂණයන් සිදු කරනු ලබයි.



ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය - බියගම අපනයන සැකසුම් කලාපය

කර්මාන්ත, ව්‍යවසායක, පර්යේෂණ හා අනෙකුත් අදාළ සියලුම අංශ ගැමා ප්‍රවිකිරණ සේවා සම්බන්ධයෙන් දිරිමත් කිරීම හා ඊට අදාළව ප්‍රවිකිරණ සේවාවන් ලබා දීම මෙම මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ ය.

ගැමා ආයතනයෙන් මේ වන විට ප්‍රධාන වශයෙන් ශල්‍ය උපකරණ ජීවානුහරණය, ඇසුරුම් ජීවානුහරණය, අපනයනය ඉලක්ක කරගත් ආහාර ද්‍රව්‍යවල / ඖෂධීය ද්‍රව්‍ය වල ක්ෂුද්‍රජීවී ගහණය අඩු කිරීම හා කෘමි පාලනය, ශාක ද්‍රව්‍ය නිරෝධායන ආදී භාවිතාවන් සඳහා ප්‍රවිකිරණ සේවාවන් ලබා දේ.

අන්තර්ජාතික මාර්ගෝපදේශවලට අනුකූලව ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය ආරක්ෂිතව පවත්වාගෙන යාම ඉතාමත් වැදගත් වේ. මෙහිදී සේවකයන්ගේ, විකිරණශීලි ප්‍රභවයේ මෙන්ම පරිසරයේ ආරක්ෂාව තහවුරු කිරීම ඇතුළත් වේ. අයතනයේ අනුගමනය කර ඇති ආරක්ෂක ක්‍රමවේදයන් ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන යන්නේදැයි, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව මඟින් නිසි පරීක්ෂාවට ලක් කර අවුරුදු පතා ආයතනය පවත්වාගෙන යාමට අවසරයක් ලබා දෙනු ලබයි. මෙහිදී ස්ථාපිත කර ඇති විකිරණ ආරක්ෂක පද්ධතියේ ක්‍රියාකාරිත්වය, සේවකයන්ගේ වෛද්‍ය පරීක්ෂණ වැඩසටහන, සේවකයන්ගේ විකිරණ මාත්‍ර සටහන් යනාදිය පිලිබඳව මූලික වශයෙන් සොයා බලනු ලබයි. ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ සේවකයන් අන්තර්ජාතික සහ ජාතික මට්ටමේ පුහුණු වැඩසටහන් වලට සහභාගි කරවීම මඟින් ආයතනයේ විකිරණශීලී ආරක්ෂක වැඩසටහන් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලබයි.

ගැමා මධ්‍යස්ථානය එහි ප්‍රශස්ත සේවා තත්ත්වයක් පවත්වා ගැනීම සඳහා ISO 9001 සහ ISO 13485 යන තත්ත්ව කළමනාකරණ පද්ධතීන්ට අනුකූල කර ඇත. ආයතනය මඟින් ප්‍රවිකිරණ තාක්ෂණය හා එහි සේවාවන් පිළිබඳ, පාරිභෝගිකයන් දැනුවත් කිරීම් වැඩසටහන් නිරන්තරයෙන් සිදු කරයි. එමෙන්ම, විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සමඟ සහයෝගීතාවයෙන් කරනු ලබන පර්යේෂණ මඟින්, විවිධ අංශ කෙරෙහි ගැමා ප්‍රවිකිරණයෙහි ප්‍රායෝගික භාවිතය පිලිබඳ දැනුම බෙදා හැරීම සිදු කරනු ලබයි.

2021 ජනවාරි 01 වන විට කොබෝල්ට් - 60 ප්‍රභවයෙහි ආරම්භක සක්‍රියතාවය 170 kCi ක් විය. පාරිභෝගිකයන්ගේ සේවා ඉල්ලීම වැඩි වීම මත 2021 අප්‍රේල් මස ප්‍රභවය කිලෝකියුරි 250ක ප්‍රමාණයකින් උත්ශ්‍රේණිගත කරන ලදී. මේ අනුව, 2021.04.15 දින වන විට මුළු සක්‍රියතාවය කිලෝකියුරි 413.5ක් විය. පෙර වර්ෂවල විකිරණශීලී ප්‍රභවය යාවත්කාලීන කිරීම සහ ඊට අදාළව විකිරණ මාත්‍රාවන්ගේ ව්‍යාප්තිය මැන තහවුරු කිරීමේ කටයුත්ත ඉන්දියාවේ විකිරණ සහ සමස්ථානික තාක්ෂණ මණ්ඩලයෙහි (BRIT) සහයෝගිතාවයෙන් සිදු කළ ද, 2021 වසරේ කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තිය හේතුවෙන් ඉන්දියානු කණ්ඩායමට පැමිණීමට නොහැකිවීම නිසාවෙන් එම කටයුත්ත SLGC කාර්ය මණ්ඩලය විසින්ම සිදු කරන ලදී. විදේශ විශේෂඥ කණ්ඩායම නොමැතිවීම හේතුවෙන් මෙම බැරෑරුම් අන්තාරයකාරී අභියෝගය ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ විද්‍යාත්මක සහ තාක්ෂණික නිලධාරී මණ්ඩලය විසින් භාරගෙන සාර්ථකව අවසන් කරන ලදී. එහිදී පෙර 2013 සහ 2017 වසරවල ලැබූ දැනුම සහ පළපුරුද්ද ඉතාමත් ඉවහල් විය. IAEA මාර්ගෝපදේශ වලට අනුකූලව සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ රෙගුලාසි සහ අවශ්‍යතා වලට අනුකූලව SLGC ආයතනය මඟින් විකිරණශීලී ප්‍රභවය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි කිසිදු අනතුරක් හෝ සිදුවීමක් ඇති නොවන ආකාරයෙන් ඉතාමත් ආරක්ෂිතව සිදු කරන ලදී. මෙහිදී විකිරණශීලී ප්‍රභවයෙන් ආරක්ෂා වීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් නිසි පරිදි අනුගමනය කළ අතර, එමනිසා කිසිදු පුද්ගලයෙකු විකිරණ වලට අනවශ්‍ය නිරාවරණයක් සිදු නොවිණි. විකිරණශීලී ප්‍රභවයේ ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ කාර්ය බලකායේ සහය නිරන්තරයෙන් ලැබෙන අතර, මෙවරද කොළඹ වරායේ සිට SLGC දක්වා විකිරණශීලී ප්‍රභවය ආරක්ෂාකාරීව ගෙන ඒම සඳහා ඔවුන් විසින් කටයුතු යොදන ලදී. මීට අමතරව විකිරණශීලී ප්‍රභවය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියට පෙර ප්‍රවාහන ආරක්ෂක සැලසුම (Transport Security Plan), Target Folder සහ Site Security Plan යන ක්‍රියා පටිපාටින් SLGC ආයතනය මඟින් සකස්

කරන ලද අතර ඒවා සමාලෝචනය කර අනුමත කිරීම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව මඟින් කරන ලදී. විකිරණ ප්‍රභවය උත්ශ්‍රේනිගත කිරීමේ කටයුත්තේදී පහත ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

(අ) විකිරණ කුටීරයේ ස්ථාපිත විශාල ලෝහමය සැකිලි ගැලවීම සහ ඉවත් කිරීම.

(ආ) විකිරණශීලි ආරක්ෂණ පිළිවෙත් අනුගමනය කරමින් විකිරණ ප්‍රභවය රැගෙන පැමිණි අධි බරැති ඊයම් ආවරක දෙක ප්‍රවාහනය කල කන්ටෙනරයෙන් ඉවත්කර ජල තටාකය තුළ තැන්පත් කිරීම.

(ඇ) විකිරණ පැන්සල් රාක්ක මත තැන්පත් කිරීමේ කටයුත්තේදී යොදාගන්නා සුදු යකඩ මේසය ජල තටාකයේ රැඳවුම් බිත්තියෙන් ඉවත්කිරීම, පිළිසකර කිරීම සහ නැවත බිත්තියෙහි රැඳවීම.

(ඈ) විකිරණශීලි පැන්සල් දුර සිට හැසිරවීම සඳහා විශේෂයෙන් සකස් කළ දිග ඇලුමිනියම් රිටි භාවිතයෙන් ජල තටාකය තුලදීම විකිරණශීලි පැන්සල් අදාළ රාක්කවල නියමිත ස්ථානවල ස්ථාපිත කිරීම. (පෙර භාවිතා කල විකිරණශීලි පැන්සල් 30 සහ නව පැන්සල් 22 නව ස්ථානවල ස්ථාපනය කරන ලදී.).




විකිරණශීලී කුටියෙහි විශාල සැකිලි ගලවා ඉවත් කිරීම

ප්‍රභවය ස්ථාපනය කිරීමේ ක්‍රියාකාරකම් වලින් පසුව, එම කුටීරය තුල හා භාණ්ඩ ඇසුරුම් පෙට්ටි තුළ විකිරණ මාත්‍රාවන් ව්‍යාප්තිය, විශාලත්වය ආදී කරුණු විශ්ලේෂණය කිරීම සඳහා plant recommissioning dosimetry ක්‍රියාදාමය සිදු කරන ලදී. මෙසේ ප්‍රභවය සෑම උත්ශ්‍රේණිගත කිරීමකින් පසුවම මෙම වලංගුතාවය පරීක්ෂා කිරීමේ (validation) ක්‍රියාකාරකම සිදු කළ යුතුය. මෙය වෛද්‍ය නිෂ්පාද නවලට සමාන ඝනත්වයකින් යුත් අනුව්‍යාජ භාණ්ඩ පෙට්ටි (dummy material) හා පාරිභෝගික භාණ්ඩ යොදා ගෙන සිදු කරනු ලැබුණි.

ISO ASTM 52303, ISO 11137 ප්‍රමිතිවලට අනුකූලව සහ වෛද්‍ය නිෂ්පාදන ජීවානුහරණය සඳහා IAEA මාර්ගෝපදේශ අනුකූලව මෙම අධ්‍යයනයන් සිදු කරනු ලැබිය. මෙම අභ්‍යාස වලින් පසුව සාමාන්‍ය වාණිජ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාවලිය SLGC සේවකයින් විසින් සිදු කරන ලද නිසාවෙන් රුපියල් මිලියන 11 ක පමණ මූල්‍යමය ඉතිරියක් සිදු කිරීමට ගැමා කාර්ය මණ්ඩලයට හැකි විය.



විකිරණ ප්‍රභවය අසුරා ඇති, ඊයම් වලින් නිර්මිත රඳවනය විකිරණ කුටීරයේ ඉහල මාලයට ගෙන එම



විකිරණ ප්‍රභවය සහිත ඊයම් රඳවනය ජල තටාකය තුල තැන්පත්කිරීම



කොබෝල්ට-60 විකිරණශීලි පැන්සල් විකිරණ රක්කයේ රැඳවීම

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ විකිරණ සේවාව ප්‍රධාන වශයෙන්ම භාවිත කරනු ලබන්නේ රජයේ රෝහල්වලට අවශ්‍ය ශල්‍ය අත්වැසුම් නිෂ්පාදනය සහ සැපයුම් කිරීමටයි. 2021 වර්ෂය තුළ SLGC මඟින් ප්‍රවිකිරණය කරන ලද ශල්‍ය අත් වැසුම් මුළු පරිමාව ඝණ මීටර 3851.12 විය. පෙට් බෝතල්, ගෝස්, ශල්‍ය ඇඳුම්, නාසය උගුර ආශ්‍රිත නියැදි ලබා ගන්නා වෛද්‍ය උපකරණ කට්ටල, පෙකෙනි කටු, ඇස් ආවරණ ආදිය නිෂ්පාදනය කරන වෛද්‍ය නිෂ්පාදන පාරිභෝගිකයින්ට 2021 වසරේදී ප්‍රවිකිරණ සේවා සැපයීමට SLGC සමත් විය.


එබැවින් 2021 වර්ෂය තුළ SLGC මඟින් ප්‍රවිකිරණය කරන ලද වෛද්‍ය උපකරණ වල මුළු පරිමාව ඝණ මීටර් 4005.84 ක් විය. ඖෂධීය තේ සහ සපත්තු මල් (hibiscus flower) ඇතුලු ආහාර නිෂ්පාදන කිලෝ ග්‍රෑම් 8162.52 ක් වූ ප්‍රමාණයක් සඳහා ද 2021 වසරේදී ප්‍රවිකිරණ සේවය ලබා දී ඇත.




විකිරණ ව්‍යාප්තිය මැනීමේ කටයුත්තට සුදානම් වීම

තවද, කාබනික පොහොර වර්ග, ළදරු සනීපාරක්ෂක ඇඳුම්, කජු කිරි, බහු විධ මලු, රසායනාගාර පරීක්ෂණ තැටි, මුරුංගා කැප්සියුල, පැපොල් කැප්සියුල, ඖෂධ ගබඩාකරණ බෝතල් ආදිය සඳහා ද මෙම වසරේ විකිරණ සේවාව ලබා දී ඇත. වාණිජ මට්ටමේ මෙහෙයුම් මඟින් ශ්‍රී.ල.ගැ.ම. රුපියල් 58,636,001.60 ක මුදලක් 2021 වසරේ උපයා ඇති අතර පර්යේෂණ අතිරේක වාහක පද්ධතිය භාවිතයෙන් ප්‍රවිකිරණය

කිරීමෙන් රුපියල් 331,858.88 ක මුදලක් උපයා ඇත. අතිරේක වාහක පද්ධතිය (Auxiliary conveyor) භාවිත කරනු ලබන්නේ කුඩා පරිමාණ පාරිභෝගිකයන්ගේ භාණ්ඩ ප්‍රවිකිරණය සඳහා වේ.
2021 වසරේ මුළු අදායම ලෙස රුපියල් 58,967,860.48 ක් ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය උපයා ඇත.




විකිරණ ප්‍රභවය ස්ථාපනයට පෙර ජල තටාකය තුල වූ කොබෝල්ට් 60 විකිරණ ප්‍රභවය (පැන්සල් 30) පෙනුණු ආකාරය



විකිරණ ප්‍රභවය ස්ථාපනයට පසු ජල තටාකය තුල වූ කොබෝල්ට් 60 විකිරණ ප්‍රභවය (පැන්සල් 52) පෙනෙන ආකාරය

SLGC තුළ ISO 13485:2016 තත්ත්ව කළමනාකරණ පද්ධතිය පවත්වා ගෙන යාම සඳහා වන බාහිර විගණනය Ascent Lanka (Pvt) Ltd යන ආයතනය මඟින්ද, ISO 9001:2015 සඳහා වන බාහිර විගණනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින්ද 2021 වසරේදී පවත්වන ලදී. ආයතනය තුල තත්ත්ව කළමනාකරණ පද්ධති නිසි පරිදි පවත්වාගෙන යාමට මෙම බාහිර විගණන වැදගත් වන අතර එමඟින් පාරිභෝගිකයන් හට ලබා දෙන සේවාවන්හි ප්‍රමිතිය පවත්වාගෙන යා හැකි වේ. ජීවානුහරණය සඳහා අවශ්‍ය වන විකිරණ මාත්‍රාවෙහි වලංගුභාවය නිර්ණය කිරීම සඳහා වන ක්ෂුද්‍රජීවී පරීක්ෂණ සේවාවන් ද, SLGC හි ක්ෂුද්‍රජීවී විද්‍යාගාරය මඟින් ලබා ලබා දී ඇත.

මෙමඟින් අදාළ "Sterility Assurance Level (SAL)" ලබා ගැනීම සඳහා එම විකිරණ මාත්‍රාවෙහි සුදුසු බව තහවුරු කිරීම, පාරිභෝගික අවශ්‍යතාවය මත සිදු කරයි. ආහාර වර්ග සඳහා වන Total viable count, Total Yeast and mold count, *Coliform* count යන පරීක්ෂණ සේවාවන් ලබා දෙන අතර එමඟින් ප්‍රවිකිරණයෙන් පසු එම ආහාර අදාළ පිරිවිතර වලට අනුකූල වන බව තහවුරු කර ගැනීම සිදු කරයි.



2021 දී ගැමා මධ්‍යස්ථානය සිදුකල පර්යේෂණවල විද්‍යාත්මක ප්‍රකාශන:

- S. M. D. R. R. Senarathne, A. A. G. Madurakanthi, N. E. Wedamulla, W. A. J. P. Wijesinghe (2021). Extension of Shelf Life of Fresh Mushroom (Pleurotus ostreatus) Using Gamma Irradiation and Determination of Physicochemical and Microbiological Parameters Associated Prop erties of Ceylon Black Pepper (Piper nigrum L.)

- T. K. V. V. Chandrasekara, A. M. N. L. Abeysinghe, A. I. H. W. Surendra (2021). Effect of Gamma Irradiation on Microbiological and Physiochemical Properties of Ceylon Cinnamon (Cinnamomum zeylanicum) Powder

5.2 පෛව විද්‍යා අංශය විසින් සපයනු ලබන න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සේවා

පෛව විද්‍යාත්මක අංශයේ පවතින න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සේවා සඳහා අති නවීන න්‍යෂ්ටික විශ්ලේෂණ සහ ඒ ආශ්‍රිත ශිල්පීය ක්‍රම භාවිත කරයි. එමඟින් ප්‍රතිඵල වල නිරවද්‍යතාවය සහ කාර්යක්ෂමතාව අරමුණු කර ගනිමින් පර්යේෂණ සහ නියාමන කටයුතු සඳහා සේවා සපයනු ලබයි. අපනයනය කිරීමට පෙර නිෂ්පාදනවල විකිරණශීලීතාව සහතික කිරීම සඳහා මෙම සේවාව විශේෂයෙන් සපයනු ලබයි. අනෙකුත් තාක්ෂණයන් හා සසඳන විට, න්‍යෂ්ටික සහ සමස්ථානික විශ්ලේෂණ ශිල්පීය ක්‍රම මඟින් පුළුල් පරාසයක සංයෝග සහ මූලද්‍රව්‍ය වල වඩාත් නිවැරදි ප්‍රතිඵල කාර්යක්ෂමව ලබා දීමේ වාසිය ඇත. එපමණක් නොව, එහිදී යම් විශ්ලේෂනයන්හිදී නියදියට හානි නොකර විශ්ලේෂණය කිරීමට හැකියාව ඇත.

මෙම විශ්ලේෂණ සේවා සපයනු ලබන්නේ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ස්ථාපිත විශ්ලේෂණ විද්‍යාගාර හරහාය. එනම් ගැමා වර්ණාවලීක්ෂ (Gama spectroscopy විද්‍යාගාරය, එක්ස් රේ (X-ray) වර්ණාවලීක්ෂ විද්‍යාගාරය, ඇල්ෆා (Alpha) වර්ණාවලීක්ෂ සහ දළ ඇල්ෆා බීටා (Alpha Beta) විද්‍යාගාරය, ප්‍රේරක ප්ලාස්මා ස්කන්ධ වර්ණාවලීක්ෂමිතික විද්‍යාගාරය (ICP-MS) සහ සමස්ථානික අනුපාත ස්කන්ධ වර්ණාවලීක්ෂමිතික විද්‍යාගාරය (IRMS) වේ. උපකරණ ලෙස වර්ණාවලීක්ෂමිතික මාන (HPGe සහ සෝඩියම් අයඩයිඩ් අනාවරක සහිත) XRF වර්ණාවලීක්ෂමිතික මාන, දළ ඇල්ෆා බීටා වර්ණාවලීක්ෂමිතික මාන, සමස්ථානික අනුපාත ස්කන්ධ වර්ණාවලීක්ෂමිතික මානය සහ ප්‍රේරක ප්ලාස්මා ස්කන්ධ වර්ණාවලීක්ෂමිතික මානය දැක්විය හැක.

පෛව විද්‍යාත්මක අංශය විසින් සපයනු ලබන විශ්ලේෂණ සේවාවන් පරීක්ෂණ අරමුණ මත පදනම්ව වර්ගීකරණය කළ හැක.

i. ස්වභාවික විකිරණශීලීතා මට්ටම් නිර්ණය කිරීම
ii. කිසියම් විකිරණශීලී දූෂණයක් ඇති බව තහවුරු කිරීම.
iii. මූලද්‍රව්‍ය සංයුතිය නිර්ණය කිරීම හෝ ප්‍රමාණාත්මක මැනීම


2021 වසර තුළදී, පෛව විද්‍යාත්මක අංශය විසින් නියැදි 5292 ක් පරීක්ෂා කිරීමෙන් ආනයන සහ අපනයන අංශය, දේශීය කර්මාන්ත සහ පර්යේෂණ සහ සංවර්ධන ආයතන සඳහා විශ්ලේෂණ සේවා සපයා ඇත. 2016 වසරේ සිට 2021 වසර දක්වා පරීක්ෂා කරන ලද සාම්පල සංඛ්‍යාව මෙහි පහත ප්‍රස්තරගතකර ඇත. මීට ඇතුළත් වන නියැදි වර්ග වන්නේ:

- ආනයනික කිරි නිෂ්පාදන
- තේ, වියළි පොල්/පොල්, අපනයනික කුළුබඩු
- කාර්මික අංශයෙන් ජලය, පස, ආදිය සහ විශේෂිත මිශ්‍ර ලෝහ/ලෝහ අයිතම වැනි පාරිසරික නියැදි ආදියයි.

මීට අමතරව, පෛව විද්‍යාත්මක අංශය මඟින් වාර්ෂිකව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය විශ්ලේෂණ දත්ත සපයයි. තවද පෛව විද්‍යාත්මක අංශය විසින් දේශීයව නිපදවන ලද සම්පූර්ණ යොදය සහිත කිරිපිටි සඳහා ද දත්ත ලබාගැනීම උදෙසා විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබයි. 2021 වසර තුල දිස්ත්‍රික්ක 12 ම ආවරණය වන පරිදි දේශීය වෙළෙඳ පොළෙන් කිරිපිටි සාම්පල එක්රැස් කරන ලදී. COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වැඩසටහන සැලසුම් කළ පරිදි සිදුකිරීමට බාධා ඇති විය. විශ්ලේෂණයකරනලද නියැදි, විකිරණශීලීතා මට්ටම් 1995.07.21 දිනැති ගැසට් නිවේදනය මඟින් නියම කර ඇති සීමාවන් තුළ පවතින බව අනාවරණය විය.

මෙම විශ්ලේෂණ සේවා හරහා උපයා ඇති ආදායම 2021 දී රුපියල් මිලියන 66.68 ක් වූ අතර 2016 සිට 2021 දක්වා කාලය තුළ උපයා ඇති ආදායමේ ප්‍රවණතා විශ්ලේෂණය රූප සටහන පහත ප්‍රස්ථාරිකව ඉදිරිපත් කර ඇත.

තවද මූලද්‍රව්‍ය විශ්ලේෂණය සහ ස්ථායී සමස්ථානික විශ්ලේෂණය සඳහා අලුතින් පිහිටුවන ලද රසායනාගාර එහි නිත්‍ය විශ්ලේෂණ සේවා ආරම්භ කර ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ නියාමන අවශ්‍යතා යටතේ අපජලය සඳහා දළ ඇල්ෆා බීටා මිනුම් සඳහා විශ්ලේෂණ සේවාව ආරම්භ කර ඇත. අපගේ විද්‍යාගාරය 2020 වන විට පරිසර දූෂණ පාලනය සහ කළමනාකරණය සඳහා උපදේශක විද්‍යාගාරයක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇත.



ජෛව විද්‍යාත්මක අංශය මඟින් 2016 සිට 2021 දක්වා ආදායම් ලැබීම්



දළ ඇල්ෆා බීටා මිනුම් සඳහා කාර්මික ස්ථානයක අප ජල නියැදී ලබා ගැනීම

ගැමා වර්ණාවලීක්ෂ විද්‍යාගාරය 2006 වසරේ සිට ISO IEC 17025:2005 පරීක්ෂණාගාර සඳහා ජාත්‍යන්තර ප්‍රතිනතය තත්ත්ව කළමනාකරණ පද්ධතිය පවත්වා ගෙන යනු ලබයි. තත්ත්ව කළමනාකරණ පද්ධතිය, ISO IEC 17025:2017 හි නව තත්වයන්ට අනුව සියළුම ලේඛන සහ ක්‍රියාවලි යාවත්කාලීන කරන ලදී. 2021 මාර්තු මාසයේදී මෙම ඇගයීම් පවත්වන ලදී.

දේශීයව මෙන්ම ජාත්‍යන්තරව පවත්වනු ලබන QA/QC වැඩසටහන් සඳහා අඛණ්ඩව සහභාගී වීම තුළින් ස්ථාපිත තත්ත්ව කළමනාකරණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීමට ජෛව විද්‍යාත්මක අංශය 2021 වසර තුළ සමත් විය. ශ්‍රී ලංකා ප්‍රතිනත මණ්ඩලය සහ අන්තර් ජාතික පරමාණුක බලශක්ති ආයතනය විසින් පවත්වනු ලබන අභ්‍යන්තර හා බාහිර ප්‍රවීණතා පරීක්ෂණ අභ්‍යාස, තත්ත්ව විගණන, නිත්‍ය ඇගයීම් සඳහා විද්‍යාගාර සහභාගී විය. ජෛව විද්‍යාත්මක අංශය මඟින් වලංගු පරීක්ෂණ ප්‍රතිඵල අඛණ්ඩව ලබා දීමට අවශ්‍ය තාක්ෂණික නිපුණතා සහ කළමනාකරණ හැකියාවන් යන දෙකම අඛණ්ඩව පවත්වා ගෙනයනු ලබයි.

පෙව විද්‍යාත්මක අංශය මඟින් සිදු කරන ලද පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්:

ජාතික සමාජ-ආර්ථික සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නවල පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. මෙම පර්යේෂණ මඟින් න්‍යෂ්ටික සහ විකිරණ යෙදීම් වල, කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව වැඩි දියුණු කිරීම, වඩා හොඳ වෛද්‍ය සේවා සැපයීම, කාර්මික නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ තරහකාරිත්වය වැඩිදියුණු කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම වැනි විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රයෝජනවත් බව ඔප්පු වී ඇත. ගෝලීය COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන්, සැලසුම් කළ පරිදි පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීමට මෙම වසර තුළ නොහැකි විය. පෙව විද්‍යාත්මක අංශය විසින් පෙව විද්‍යා යෙදීම සහ ආහාර සහ කෘෂිකර්මය සඳහා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය යෙදීම පිළිබඳ විවිධ ජාතික වශයෙන් වැදගත් පහත සඳහන් ව්‍යාපෘතිවල නිරත වී ඇත.

1. 'සිලෝන් ටී' (Ceylon Tea) සඳහා මූලාරම්භය තහවුරු කර ගැනීම කිරීම සඳහා වන භූ රසායනික ප්‍රවේශය පිළිබඳ නියමු ව්‍යාපෘතිය (තේ පර්යේෂණ ආයතනය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ සහයෝගීතා ව්‍යාපෘතිය).
2. තෙත්බිම් කළමනාකරණය සහ තිරසාර සංරක්ෂණ සැලසුම් වැඩිදියුණු කිරීම (වයඹ විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතා ව්‍යාපෘතිය)

3. කාබනික ආහාර සත්‍යාපනය කිරීමේ තාක්ෂණයක් සංවර්ධනය කිරීම සහ ස්ථායී සමස්ථානික භාවිතයෙන් පළතුරු යුෂ වල ව්‍යාජ මිශ්‍ර කිරීම් නිර්ණය කිරීම.

4. න්‍යෂ්ටික ශිල්පීය ක්‍රම භාවිත කරමින් ඉඩම් හායනය අවම කිරීම සහ බෝග ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පාංශු හා ජල තත්ත්ව තක්සේරු කිරීම සහ වැඩිදියුණු කිරීම (කෘෂිකාර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘතිය)

5. සමුද්‍ර විකිරණශීලිතා අධීක්ෂණය සඳහා කලාපීය හැකියාවන් වැඩි දියුණු කිරීම සහ ආසියා පැසිෆික් සමුද්‍ර පරිසර පද්ධති හි න්‍යෂ්ටික ක්‍රියාකාරකම් වලින් විකිරණශීලී මුදා වැහැරීම් වල බලපෑම තක්සේරු කිරීම

I. 'සිලෝන් ටී' (Ceylon Tea) සඳහා මූලාරම්භය තහවුරු කර ගැනීම කිරීම සඳහා වන භූ රසායනික ප්‍රවේශය පිළිබඳ නියමු ව්‍යාපෘතිය

ඉහත ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ තේ පර්යේෂණ ආයතනය අතර **ත්‍රෙපාර්ශ්වික** ගිවිසුමක් 2020 දෙසැම්බර් 18 වන දින අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, සමස්ථානික සහ මූලද්‍රව්‍ය සංයුතිය මඟින් විද්‍යාත්මක සත්‍යාපන ක්‍රමයක් සකස් කිරීමයි. එහිදී වෙනත් සම්භවයක් ඇති තේ වලින් ශ්‍රී ලංකා තේ වෙන් කර හඳුනා ගැනීමක් සිදු කෙරේ. මෙම ක්‍රමයේදී භාවිත කරන ප්‍රධාන න්‍යෂ්ටික විශ්ලේෂණ ශිල්පීය ක්‍රම වන්නේ මූලද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා ප්‍රේරක ප්ලාස්මා ස්කන්ධ වර්ණාවලීක්ෂමිතික (ICP-MS) ක්‍රමය සහ තේවල සමස්ථානික මැනීම සඳහා සමස්ථානික අනුපාත ස්කන්ධ වර්ණාවලීක්ෂමිතික (IRMS) ක්‍රමය වේ.

2021 වර්ෂය තුළ නියමු ව්‍යාපෘතිය සඳහා තෝරාගත් තේ කර්මාන්තශාලාවලින් දිවයිනේ වගා කෙරෙන තේ කලාප හතෙන්ම සාම්පල 875 ක් එකතු කරන ලදී. එනම්, දේශීය තේ සඳහා සබරගමුව, මහනුවර, රුහුණු, දිඹුල, නුවරඑළිය, උඩපුස්සලාව, බණ්ඩාරවෙල, මල්වත්තවේලි සහ වෙනත් සම්භවයක් ඇති තේ ලෙස උතුරු ඉන්දියාව, දකුණු ඉන්දියාව, චීනය, වියට්නාමය, කෙන්යාව යන රටවලින් සාම්පල 74 ක් එකතු කර ඇත.

සියලුම සාම්පල විශ්ලේෂණය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි අනුව සකස් කරන ලදී. ස්ථායී සමස්ථානික සහ අංශු මාත්‍ර මූලද්‍රව්‍ය සඳහා නියැදි විශ්ලේෂණය සිදු වෙමින් පවතී. 'සිලෝන් ටී' සම්භවය සත්‍යාපනය කිරීමේ ක්‍රමය සංවර්ධනය කිරීම සඳහා නියමු ව්‍යාපෘති කටයුතු 2022 වසර තුළ ද අඛණ්ඩව සිදු කෙරේ.

II. තෙත්බිම් කළමනාකරණය සහ තිරසාර සංරක්ෂණ සැලසුම් වැඩි දියුණු කිරීම

මෙම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ව්‍යාපෘති කණ්ඩායම පත් කරන ලදී. සකස් කරන ලද වැඩ සැලැස්ම සහ ව්‍යාපෘති අරමුණු සහ ක්‍රියාකාරකම් වලට අදාළ නියැදි සකස් කිරීම් සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය සමාලෝචනය කරන ලදී. Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ සැලැස්මට අනුව නියැදීම සිදු කිරීමට නොහැකි විය.
කෙසේ වෙතත්, මෙම කාල පරිච්ඡේදය තුළ වයඹ විශ්වවිද්‍යාලය සමඟ එක්ව සාම්පල රැස් කරන ලද අතර ස්ථායී සමස්ථානික සඳහා මෙම සාම්පල විශ්ලේෂණය කරන ලදී. ප්‍රතිඵල වල සංඛ්‍යානමය විශ්ලේෂණය සහ අර්ථ නිරූපණය කිරීමට අපේක්ෂා කරයි.

III. කාබනික ආහාර සත්‍යාපනය කිරීමේ තාක්ෂණයක් සංවර්ධනය කිරීම සහ ස්ථායී සමස්ථානික භාවිතයෙන් පළතුරු යුෂ වල ව්‍යාජ මිශ්‍ර කිරීම් නිර්ණය කිරීම

මෙම ව්‍යාපෘතිය තේ පර්යේෂණ ආයතනය සමඟ එක්ව ක්‍රියාත්මක වේ. වසර 10කට වැඩි කාබනික සහ සාම්ප්‍රදායික තේ වගා ඉතිහාසයක් ඇති තලවාකැලේ ශාන්ත කූම්බස් වත්ත, තේ පර්යේෂණායතනය, හපුතලේ විශාල තේ වතු සහ ගුරුතලාව සහ දියතලාව කුඩා තේ වතු ආශ්‍රිතව කාබනිකව සහ සම්ප්‍රදායිකව කළමනාකරණය කරන ලද TRIORCON (TRI කාබනික සහ සාම්ප්‍රදායික) දිගුකාලීන පර්යේෂණාත්මක බිම් කොටස් වලින් පස් සහ කොළ සාම්පල එකතු කරන ලදී. 2021 වසර තුළ සාම්පල 34 ක් එකතු කරන ලදී. COVID-19 තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි නිම කිරීමට නොහැකි විය. සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිවලට අනුව නියැදිය සකස් කරන ලදී. ස්ථායී නයිට්‍රජන් සහ කාබන් සමස්ථානික සඳහා සාම්පල විශ්ලේෂණය කෙරේ. ව්‍යාපෘති කටයුතු තව දුරටත් සිදු වෙමින් පවතී.

IV. න්‍යෂ්ටික ශිල්පීය ක්‍රම භාවිත කරමින් ඉඩම් හායනය අවම කිරීම සහ බෝග ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පාංශු හා ජල තත්ත්ව තක්සේරු කිරීම සහ වැඩිදියුණු කිරීම

මේ යටතේ අදාළ ප්‍රදේශ තුල පසෙහි විකිරණශීලි මූලද්‍රව්‍ය විශ්ලේෂණය සම්පූර්ණ කරන ලදී. Cs137 සහ Pb210 යන මුපද්‍රව්‍ය සඳහා සියළුම දත්ත ජාත්‍යන්තර විද්‍යා ප්‍රකාශනයක, දේශීය විද්‍යා ප්‍රකාශනයක ද මේ සම්බන්ධයෙන් සාරාංශගත ප්‍රකාශන තුනක් ජාත්‍යන්තරව ප්‍රසිද්ධ කර ප්‍රකාශයට පත් කරන ලදී. දොළොස්බාගේ අග්‍රිතව සිදුකල පර්යේෂණ දත්ත, ජපානයේ ෂුකුබා ERAN දත්ත ගබඩාව වන වෙත ඉදිරිපත් කර ඇත. ICPMS තාක්ෂණය මඟින් බැර ලෝහ සහ මූලද්‍රව්‍ය සඳහා ජල සාම්පල ද මේ යටතේ විශ්ලේෂණය කරන ලදී. තාක්ෂණික දුෂ්කරතා හේතුවෙන් ස්ථාවර සමස්ථානික විශ්ලේෂණය සිදු නොකෙරුණු අතර "ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ පාංශු සංරක්ෂණ උපාය මාර්ග සංවර්ධනය කිරීම" යන මාතෘකාව යටතේ ලිපියක් අන්තර් ජාතික පරමාණුක බලශක්ති ආයතනය වෙත ඉදිරිපත් කරන ලදී.



ස්ථායී සමස්ථානික විශ්ලේෂණය සඳහා ජල නියැදී ලබා ගැනීම

v. සමුද්‍ර විකිරණශීලිතා අධීක්ෂණය සඳහා කලාපීය හැකියාවන් වැඩි දියුණු කිරීම සහ ආසියා පැසිෆික් සමුද්‍ර පරිසර පද්ධති හි නාෂ්ටික ක්‍රියාකාරකම් වලින් විකිරණශීලී මුදා හැරීම්වල බලපෑම තක්සේරු කිරීම

ජෛව විද්‍යාත්මක අංශය මඟින් දැනටමත් රට තුළ සමුද්‍ර විකිරණශීලී දත්ත පදනමක් ස්ථාපිත කර ඇත. සමුද්‍ර විකිරණශීලිතා නිරීක්ෂණ වැඩසටහනක් සංවර්ධනය කිරීම සඳහා සමුද්‍ර විකිරණශීලිතාව අඛණ්ඩව අධීක්ෂණය කිරීම ඉතා වැදගත් වේ. COVID-19 තත්ත්වය හේතුවෙන් එය සැලසුම් කළ පරිදි නිම කිරීමට නොහැකි විය.

ජෛව විද්‍යාත්මක අංශයේ විද්‍යාත්මක ප්‍රකාශන ලැයිස්තුව - 2021

1. Thiwanka Weerakkody, Champa Dissanayake, A.G. Chandrapala, Maheshika Kalpage, Thilaka Attanayaka, Indrani Dissanayake, Kasun Binduhewa, “Terrestrial background radiation study in Bathalegoda, North western province Sri Lanka” Ninth International Conference on Radiation in Various Fields of Research (RAD 2021) 14-18 June 2021. Montenegro (virtual oral presentation)

2. Thiwanka Weerakkody, Lakmali Handagiripathira, Poshitha Dabare, Thisari Guruge Determination of Gross Alpha and Gross Beta Activity in Water samples by iSolo Alpha/Beta Counting System, ICRER 2021 : 23th International Conference on Radioecology and Environmental Radioactivity held in Vienna, Austria , June 29-1 July, 2021 (virtual oral presentation).

3. Rajapaksha, D. M., Weerakkody, T., Weerasinghe, P., Attanayake, T., Hadagiripathira, L., Dissanayake, I., & Waduge, V. (2021). Radiological Risk Assessment of Naturally Occurring and Anthropogenic Radionuclides in Marine Sediments of Sri Lanka. Peradeniya University International Research Sessions (iPURSE)). Peradeniya: Peradeniya University

4. Ilya Strashnova, Nuwan Bandara Karunarathne, Biyagamage Ruchika Fernandob, Champa Dissanayake, Kasun Madusanka Binduhewa (2021). An Isotope Dilution Liquid Chromatography-Mass Spectrometry method for detection of melamine in milk powder. Food Additives and Contaminants: Part A; https://www.tandfonline.com/doi/abs/10.1080/19440049.2021.1937709?journalCode=tfac20

5. T.N. Fernando, A. G. B. Aruggoda, S.A. Ariadurai, and C. K. Dissanayake (2021). Effects of Different Watering Intervals on Growth Performance of *Abelmoschus Esculentus* Presence with Super Absorbent Polymer Layer at the Root Zone with Moist Coir Dust Layers, International Journal of Research Studies in Agricultural Sciences (IJRSAS), Volume 7, Issue 5, 2021, PP 11-17, ISSN No. (Online) 2454–6224, DOI: http://dx.doi.org/10.20431/2454-6224.0705002, www.arcjournals.org

6. Maheshika Kalpage, Champa Dissanayake, Saranga Diyabalanage, Rohana Chandrajith, Russell Frew and Ruchika Fernando. Stable Isotope and Element Profiling for Determining the Agro-Climatic Origin of Cow Milk within a Tropical Country (2021) *Journal of Foods.* 11 (3),275. https://doi.org/10.3390/ foods11030275

7. R K Dulanjalee Madhusha, T L Weerakkody, W P P C Weerasinghe, T N Attanayake, H M N L Hadagiripathira, V A Waduge, K S G S Priyadarshanee Anthropogenic ^{137}Cs distribution and Radiological risk assessment in the Coastal Environments of Sri Lanka *Global Scientific Journals GSJ*: Vol 9 (8), August 2021, Online: ISSN 2320-9186 pp 2951-2960 (IM.F 2.4)

8. R.K.D Madhusha, W.A.T.L Weerakkody, H.M.N.L Handagiripathira, T.N Attanayake Radioactive status and spatial distribution of anthropogenic ^{137}Cs in the coastal environment of Sri Lanka in the 2nd international multidisciplinary conference on current research trends 2021 IMCCRT pp28, 6^{th} -7^{th} March 2021.

9. Thiwanka Weerakkody, Champa Dissanayake, A.G. Chandrapala, Maheshika Kalpage, Thilaka Attanayaka, Indrani Dissanayake, Kasun Binduhewa (2021) Gamma spectrometry analytical determination of terrestrial radiation level in Kuruwita area, Rathnapura district, Sri Lanka was submitted to Second International Conference on Applications of Radiation Science and Technology (ICARST-2021).

10. A.G. Chandrapala, C.K. Dissanayake, K.M.A. Kendaragama, S.K. Wetthasinghe, M.D. Kalpage, A.M.T.N. Attanayake, A.K. Hettiarachchi. Assessment of soil erosion under different land uses in Nalanda reservoir catchment and Kuruwita, Kaluganga sub catchment using nuclear techniques (2020) accepted in the journal of Tropical Agriculturist.

11. Thiwanka Weerakkody, Lakmali Handagiripathira, Poshitha Dabare, Thisari Guruge (2021) Determination of Gross Alpha and Gross Beta Activity in Water samples by iSolo Alpha/Beta Counting System accepted as an oral presentation at ICRER 2021: 23th

12. International Conference on Radioecology and Environmental Radioactivity to be held in Vienna, Austria during Jun 21-22, 2021

13. Thiwanka Weerakkody, Champa Dissanayake, A.G. Chandrapala, Maheshika Kalpage, Thilaka Attanayaka, Indrani Dissanayake, Kasun Binduhewa (2021) "Terrestrial background radiation study in Bathalegoda, North western province Sri Lanka" has been accepted for oral presentation at the Ninth International Conference on Radiation in Various Fields of Research (RAD 2021), Herceg Novi, Montenegro, from 14th to 18th of June, 2021.

5.3 නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය මඟින් සපයනු ලබන නිර්විනාශක පරීක්ෂණ සේවාවන්



නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය

නුවර පාර, කැලණිය, බුලුගහ හංදියෙහි පිහිටා ඇති ශ්‍රී පරමාණුක බලශක්ති මණ්ඩලයට අයත් නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය මඟින් නිර්විනාශක පරීක්ෂණ සේවාවන් සිදුකිරීම, තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීම, ක්ෂේත්‍රයට අදාළ උපදේශන සේවා ලබාදීම අඩිය සිදු කරනු ලබයි. ජාත්‍යන්තර පිළිගත් ක්‍රමවේදයන්ට අනුව කර්මාන්ත හා සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍ර සඳහා සියලුම වර්ගයේ නිර්විනාශක පරීක්ෂණ සේවාවන් සැපයීම සඳහා ඉතා නවීන උපකරණ වලින් පරිපූර්ණ ප්‍රතීතකරණය කරන ලද විද්‍යාගාර මෙහි පවත්වගනයනු ලැබේ.

5.3.1 නිර්විනාශක පරීක්ෂණ පුහුණු සේවා:

නිර්විනාශක පරීක්ෂණ පුහුණු කටයුතු ඉහළ නැංවීම සඳහා ISO 9712 සහ ISO 17024 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව කටයුතු කරන නිර්විනාශක පරීක්ෂණ සහතිකකරණ ජාතික ආයතනය (National Certification Body for NDT -NCBNDT) මෙම ආයතනයට අනුබද්ධව පවත්වාගනයනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මෙම NCBNDT ආයතනය, ප්‍රතීතකරණයට ලක් කර ඇත. සේම NCBNDT ආයතනය, නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධ ජාත්‍යන්තර කමිටුවේ (ICNDT) පිරිස් සහතිකකරන ආයතනය (Personnel Certification Body-PCB) සඳහා වන බහුපාර්ශවිය පිළිගැනීමේ සම්මුතියෙහි (MRA) ලියාපදිංචි වී ඇත. ISO 9712 ට අනුව NCBNDT මඟින් මෙහෙයවනු ලබන විභාග හා සහතිකකරන ක්‍රියාවලියට සහභාගී වීම සඳහා, නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ පුහුණු ඒකකය මඟින් පවත්වනු ලබන සහතිකකරණ පාඨමාලා, NCBNDT මඟින් පිළිගනු ලැබ ඇත. එසේම, 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ විධිවිධානවලට අනුකූලව NCNDT පුහුණු ඒකකය මඟින් පවත්වනු ලබන සහතික කිරීමේ පාඨමාලා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති අතර සංවර්ධන සැලැස්ම අංක 887/8 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙහි පළ කර ඇත (1995 සැප්තැම්බර් 7 දිනැති). මීට අමතරව, සේවාලාභීන්ගේ ඉල්ලීම් මත පදනම්ව වාර්ෂිකව NDT වැඩමුළු සහ විශේෂ පුහුණු පාඨමාලා මෙම ආයතනය මඟින් පවත්වනු ලැබේ.

2021 දී ඉහත සියළු ක්‍රියාකාරකම් සඳහා අපේක්ෂකයන් 133 ක් සහභාගී වූහ. මෙම ක්‍රියාකාරකම් යටතේ උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 2.1 කි. නමුත් COVID-19 ගෝලීය වසංගතය හේතුවෙන් අපේක්ෂිත ප්‍රමාණයේ සහභාගිත්වයක් පුහුණු පාඨමාලා සඳහා නොවිය.



2021 දී පුහුණු / සුදුසුකම් ලත් / සහතිකලත් NDT අපේක්ෂකයින් සංඛ්‍යාව

නිර්විනාශක පරීක්ෂණ සහතිකකරණ ජාතික ආයතනයෙහි ප්‍රතීතන කටයුතු පවත්වාගෙන යෑම:

නිර්විනාශක පරීක්ෂණ සුදුසුකම් සහ පිරිස් සහතික කිරීම සඳහා වන නිර්විනාශක පරීක්ෂණ සහතිකකරණ **ජාතික** ආයතනයෙහි ප්‍රතීතන කටයුතු ISO 17024:2012 ට හා ISO 9712:2012 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව සාර්ථකව පවත්වාගෙන යාමට අදාල කටයුතු සිදු කල අතර පහත සඳහන් ක්‍රියාකාරකම්ද ඊට අමතරව සිදු කරන ලදී.

සහතිකකරණ **ඒකකය:**

i) NCBNDT හි ප්‍රතීතන නඩත්තු කටයුතු ISO/IEC 17024:2012 ට අනුව අඛණ්ඩව සිදු කරන ලදී.
ii) 20 දෙනෙකු සඳහා නිර්විනාශක පරීක්ෂණ සහතික නිකුත් කිරීම.
iii) 06 දෙනෙකුගේ නිර්විනාශක පරීක්ෂණ සහතික අළුත් කිරීම.
iv) ICNDT MRA උපලේඛන 2 යටතේ ලියාපදිංචියේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා OP 19 පෝරමය C "වාර්ෂික යාවත්කාලීන කිරීම- ICNDT MRA උපලේඛන 2 යටතේ ලියාපදිංචි PCB" පුරවා ඇත.
v) NCBNDT හි දෙවන නිරීක්ෂණ තක්සේරුව (Second surveillance assessment) සිදු කරන ලදී.
vi) නිවැරදි කිරීමේ ක්‍රියාවන් (09) ලේඛණ ගත සාක්ෂි සමඟ SLAB වෙත ඉදිරිපත් කරන ලදී.
vii) ප්‍රධාන ලැයිස්තු ලේඛණය (CBNDT/MLD) සංශෝධනය කරන ලදී.
viii) NCBNDT හි තත්ත්ව අත්පොත (Quality Manual) සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.
ix) සුදුසුකම් සහ පිරිස් සහතික කිරීම සඳහා වන නිර්විනාශක පරීක්ෂණ මාර්ගෝපදේශනය සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.
x) NDT පුහුණුව සඳහා අවශ්‍ය අවම ප්‍රයෝගික පුහුණු ආදර්ශ ලැයිස්තුව සහ උපකරණ ලැයිස්තුව සකස් කරන ලදී.
xi) කළමනාකරණ සමාලෝචන රැස්වීම (Management Review Meeting) පවත්වන ලදී.
xii) සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය "දර්ශන අවශ්‍යතා සඳහා වූ ක්‍රියා පටිපාටිය"(SOP- Procedure for Vision Requirement) සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.

xiii) සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය “කළමනාකරණ සමාලෝචන රැස්වීම""(SOP- Management Review Meeting) සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.

xiv) සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය “සහතිකය අත්හිටුවීම සහ ආපසු ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටිය”(SOP- Procedure for Suspension and Withdrawal of Certification) සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.

xv) මාර්ගගත (virtual) තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී.

xvi) NCNDT හි පුහුණු ඒකකයේ PT රසායනාගාරයේ පූර්ව අභ්‍යන්තර විගණනය සිදු කරන ලදී.

xvii) NCBNDT හි ආයතනික ව්‍යුහය සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.

xviii) NCBNDT විසින් COVID 19 වසංගත කාලය තුළ තෝරාගත් අපේක්ෂකයින් සඳහා සහතික කිරීමේ සහ විභාග කල් ඉකුත්වන දින තාවකාලිකව දීර්ඝ කිරීමේ ප්‍රතිපත්තිය, නිකුත් කරන ලදී.

xix) NCBNDT හි අරමුණු සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.

xx) "NCBNDT හි ක්‍රියාකාරකම්" යන මාතෘකාව යටතේ කෙටි දේශනයක් SLAEB මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

xxi) NCBNDT වෙබ් පිටුව යාවත්කාලීන කරන ලදී.

xxii) අපක්ෂපාතීත්වය ආරක්ෂා කිරීම - අවදානම් විශ්ලේෂණ (Safe Guarding Impartiality-Risk Analysis) වාර්තාව සකස් කරන ලදී.

xxiii) විභාග සඳහා සහ සහතික කිරීම් සඳහා ඇති පාරිභෝගික ප්‍රතිපෝෂණ ආකෘති ඇගයීමට ලක් කරන ලදී.

xxiv) අභ්‍යන්තර තත්ත්ව විගණනය පවත්වන ලදී.

xxv) දැනට පවතින පෝරම, ලැයිස්තු සහ ආකෘති සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.

<u>NCBNDT හි විභාග කමිටුව:</u>

ISO 9712:2012 ප්‍රකාරව නිර්විනාශක පරීක්ෂණ 11ක් සඳහා පරීක්ෂණ පහත පරිදි පවත්වන ලදී.

	පරීක්ෂණ කාණ්ඩය	පරීක්ෂණයේ නම
1	මුල් සුදුසුකම් විභාගය	දෘව විනිවිද යාමේ පරීක්ෂාව - **තෙවන මට්ටම**
2		**චිකිරණ පරීක්ෂාව – පළමු මට්ටම**
3		දෘව විනිවිද යාමේ පරීක්ෂාව – **සෘජු දෙවන මට්ටම** – Camso Loadstar
4		දෘව විනිවිද යාමේ පරීක්ෂාව – **සෘජු දෙවන මට්ටම – සාමාන්‍ය**
5		අතිධ්වනික පරීක්ෂාව – **දෙවන මට්ටම**
6		අතිධ්වනික පරීක්ෂාව – **පළමු මට්ටම**
7	මුල් සුදුසුකම් විභාගයේ පළමු නැවත විභාගය	චුම්බක අංශු පරීක්ෂාව - **තෙවන මට්ටම - මූලික විභාගය**
8		**චිකිරණ පරීක්ෂාව – පළමු මට්ටම**
9		දෘව විනිවිද යාමේ පරීක්ෂාව – **පළමු මට්ටම**
10		දෘව විනිවිද යාමේ පරීක්ෂාව – **දෙවන මට්ටම**
11	මුල් සුදුසුකම් විභාගයේ දෙවන නැවත විභාගය	දෘව විනිවිද යාමේ පරීක්ෂාව – **දෙවන මට්ටම**

<u>ප්‍රතීතණය කරන ලද පරීක්ෂණ ආයතනය නඩත්තු කිරීම:</u>

i. NCNDT හි පරීක්ෂණ ආයතනය (Inspection Body), ISO/IEC 17020: 2012; “Conformity assessment - Requirements for the operation of various types of bodies performing inspection” අනුව, 2017 වර්ෂයේ සිට චුම්බක අංශු පරීක්ෂාව, දෘව විනිවිද යාමේ පරීක්ෂාව,

අතිධ්වනික පරීක්ෂාව, සහ කොන්ක්‍රීට් ව්‍යුහ පරීක්ෂාව සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතණය කර ඇති අතර එම ප්‍රතීතණ නඩත්තු කටයුතු සාර්ථකව අඛණ්ඩව සිදුවෙමින් පවතී. තවද, පළමු නිරීක්ෂණ තක්සේරුව සහ **වික්‍රිරණ පරීක්ෂාව** සහ දෘශ්‍ය **පරීක්ෂාව** - මෙවලම් කට්ටලය සඳහා විෂය පථය දිගු කිරීමේ තක්සේරුව ද සාර්ථකව සිදු කෙරුණි.



පරීක්ෂණ ආයතනයේ (Inspection Body) ප්‍රතීතන ප්‍රමිතිය



NDT පරීක්ෂණ සේවා

5.3.2 නිර්විනාශක පරීක්ෂණ සේවා:

ඉහතින් විස්තර කරන ලද නිර්විනාශක පරීක්ෂණ පුහුණු සේවා වලට අමතරව NCNDT මඟින් පරීක්ෂණ සේවා කර්මාන්ත ක්ෂේත්‍රය වෙත ලබා දෙයි. එමඟින් කාර්මික ඵලදායිතාව සහ සුරක්ෂිතතාව ඉහල නැංවීමේ අරමුණින් යන්ත්‍ර සූත්‍ර සහ ඒ ආශ්‍රිත ලෝහ කොටස් වල පැවතිය හැකි හානිකර පලුදු පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් ISO 17020 ට අනුව, ප්‍රතීතකරණය කරන ලද NDT සේවා ඒකකය මඟින් මෙම සේවා ලබා දෙනු ලබයි. ISO /IEC 17011ට අනුව ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ප්‍රතීතන සංවිධානය (International Organization for Accreditation, Bodies - ILAC) මඟින් ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය පිළිගෙන ඇත. පරීක්ෂණ සේවා ආයතන, වෛද්‍ය පරීක්ෂණ විද්‍යාගාර, අනිකුත් පරීක්ෂණ විද්‍යාගාර, ක්‍රමාංකන විද්‍යාගාර යන ආයතන පිළිවෙලින් ISO 17020, ISO 15189, ISO 17025 යන ජාත්‍යන්තර සම්මත ක්‍රමවේදයන්ට අනුව ප්‍රතීතකරණයට ලක්කිරීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව, NCNDT හි විද්‍යාගාර වලට අයත් චුම්බක අංශු පරීක්ෂාව , ද්‍රව විදාවුත් පරීක්ෂාව, අතිධ්වනි ශබ්ද තරංග පරීක්ෂාව සහ කොන්ක්‍රීට් ආකෘති පරීක්ෂාව යන ක්‍රමවේදයන් හතර ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් ප්‍රතීතකරණයට ලක් කර ඇත.

ඉතා හොඳින් පුහුණු කර සහතිකකරණයට ලක් කර ඇති දක්ෂ කාර්ය මණ්ඩලයක් මඟින් මෙම NDT සේවා සපයනු ලබයි. රාජ්‍ය සහ පෞද්ගලික අංශ සඳහා NDT සේවා **205** ක් 2021 වසරේදී ලබා දී ඇති අතර එමගින් රුපියල් මිලියන **13.634** ක ආදායමක් උපයා ගෙන ඇත. නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය එහි මූලික පරමාර්ථය වන රටේ කාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ ලෝහමය සංරචක, එකලස් කිරීම් සහ ව්‍යුහයන් වල මෙන්ම සිවිල් ඉදිකිරීම් වල ද ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා වන අරමුණු සාක්ෂාත් කර ගන්නා අතරම ඉදිරි දශකය තුල මහා භාණ්ඩාගාරයට බරක් නොවන තිරසර සංවර්ධිත ආයතනයක් ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබේ.

5.3.3 පෑස්සුම් ශිල්පී යෝග්‍යතා පහසුකම:

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ පෑස්සුම්ශිල්පී යෝග්‍යතා පහසුකම (Welder Qualification Facility-WQF) ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත්තේ

ජාත්‍යන්තරව පිළිගත් පැස්සුම්කරුවන්, පැස්සුම් අධ්‍යක්ෂක වරුන් හා පරීක්ෂකවරුන් වැනි වෘත්තිකයින් බිහි කිරීම සඳහා ය. මෙම පැස්සුම්ශිල්පී යෝග්‍යතා පහසුකම, ක්‍රමාංකිත පැස්සුම් උපකරණ, සුරක්ෂිත වැඩ පරිසරය හා CWI, CSWIP වැනි ආයතන වලින් සුදුසුකම් ලැබූ දක්ෂ සම්පත් දායක මණ්ඩලයකින් සමන්විත වනු ඇත. **මෙම පැස්සුම් ශිල්පි යෝග්‍යතා පහසුකම ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ:**

i. ශ්‍රී ලංකාවේ පැස්සුම් ශිල්පීන් සහතික කිරීමේ වැඩසටහනට පහසුකම් සැපයීම.
ii. පැස්සුම්කරුවන් ASME Section IX වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් හෝ සේවාදායකයාගේ සමාගමේ ප්‍රමිතීන් සපුරාලන්නේ නම් ඒ සඳහා ඔහුට සහතිකයක් ලබා දීමෙන් ඔහුගේ නිපුණතාවය සහ කුසලතාවය සහතික කිරීම.
iii. පැස්සුම් ක්ෂේත්‍රයේ පවතින පටිපාටි සඳහා සුදුසුකම් සේවා සැපයීම.
iv. ASME Section IX වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් හෝ සේවාදායකයාගේ සමාගමේ ප්‍රමිතීන් සපුරාලන නිපුණතාවයකින් සහ කුසලතාවයකින් සමන්විත පැස්සුම් ශිල්පින් තේරීම.
v. පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්.
vi. වෙල්ඩින් කලාව පිළිබඳ වෘත්තීය නිපුණතාවයකින් සමන්විත ප්‍රජාවක් ගොඩනැගීම.

මෙම ආයතනය විසින් මෙම වැදගත් ව්‍යාපෘතිය නිර්මාණය කිරීම නිසා පැස්සුම් ශිල්පීන්ට බහුවිධ ප්‍රතිලාභ ලබා ගත හැකි අතර ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි රැකියා අවස්ථාවන් සඳහා අවශ්‍ය වෘත්තීය සුදුසුකම අත්පත් කරගත හැකිය. තවද, ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමෙන් මෙය ඔවුන්ට ප්‍රයෝජනවත් වනු ඇත. ඒ අනුව, 2021 දී ප්‍රධාන වශයෙන් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

i. වෙල්ඩර් කාර්ය සාධන සුදුසුකම් (WPQ) සේවා (එනම්, WPQ විභාගය සහ පැස්සුම්කරුවන් පිරික්සීම) සිදු කරන ලදී.

අයදුම්පත් ගණන		ආදායම/(රු.)
පැස්සුම්කරුවන් පිරික්සීම	WPQ පරීක්ෂණය	
20	10	553, 800.00

ii. ගෑස් ටංස්ටන් ආර්ක් වෙල්ඩින් (GTAW) හි 6G ස්ථානය සඳහා ක්‍රියාපටිපාටි සුදුසුකම් වාර්තාව සංවර්ධනය කරන ලදී.
iii. ප්‍රචාරක ක්‍රියාකාරකම් ආරම්භ කර දැනුම බෙදාගැනීමේ ක්‍රියාකාරකම් හරහා වෙල්ඩින් ප්‍රජාව ගොඩනංවන ලදී.
iv. SLAEB සහ TSUKUBA Technical Promotions (Pvt) Ltd අතර අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කරන ලදී.

5.3.4 නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය තව දුරටත් වැඩිදියුණු කිරීම සඳහා IAEA TC-SRL 1009 ව්‍යාපෘතිය හරහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සහාය ලබා ගැනීම

ව්‍යාපෘති ප්‍රතිඵලය:

කාර්මික නිෂ්පාදන, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි සහ සිවිල් ඉංජිනේරු ව්‍යුහයන් වැනි නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා නිර්විනාශක පරීක්ෂණ හා ඊට අදාළ තාක්ෂණ ක්‍රමවේදයන් සම්බන්ධව තිරසාර හා ස්වාධීන පුහුණු මධ්‍යස්ථානයක් සහ සේවා මධ්‍යස්ථානයක් ලෙස නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සම්බන්ධ පියවරයන් ගෙන ඇත.

- ISO 17020 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව, ප්‍රතිඵලය ලත් පරීක්ෂණ ආයතනයක් හරහා සාම්ප්‍රදායික (conventional) නිර්විනාශක පරීක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් සේවා ලබා ගත හැකි වීම.
- ISO 17020 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ප්‍රතිඵලය ලත් පරීක්ෂණ ආයතනයක් හරහා කොන්ක්‍රීට් පරීක්ෂණ සඳහා නිර්විනාශක පරීක්ෂණ සේවා ලබා ගත හැකි වීම.
- ISO 9712 / ISO 17024 ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නිර්විනාශක පරීක්ෂණ ශිල්පීන් පුහුණු කිරීම, සුදුසුකම් ඇගයීම සහ සහතික කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් පද්ධතියක් පැවතීම.
- වැල්ඩින් ශිල්පීන්ගේ සුදුසුකම් ඇගයීම සහ සහතික කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් පද්ධතියක් පැවතීම.
- සාම්ප්‍රදායික නොවන නිර්විනාශක පරීක්ෂණ ක්‍රම භාවිතයෙන් පරීක්ෂණ සේවා ලබා ගත හැකිවීම.

5.4 විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශය



විකිරණ ආරක්ෂණ පුහුණු වැඩමුළුව සහ න්‍යෂ්ටික සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

න්‍යෂ්ටික බලය භාවිත නොකරන රාජ්‍යයක් ලෙස මේ වන විට ශ්‍රී ලංකාව න්‍යෂ්ටික ඉන්ධන චක්‍රයට අදාළ කිසිදු ක්‍රියාකාරකමක් සිදු නොකරයි. කෙසේ නමුත්, විකිරණශීලී ද්‍රව්‍ය හා එම තාක්ෂණය, වෛද්‍ය, කර්මාන්ත, පර්යේෂණ සහ පාරිසරික සංරක්ෂණය වැනි ක්ෂේත්‍ර වල බහුලව භාවිත කරනු ලැබේ. විකිරණ තාක්ෂණය මානව වර්ගයාගේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට සම්බන්ධ කාර්යයන් හි නිරත වන විකිරණ ශිල්පීන් 2,235 ක් පමණ රට තුළ විසිරී සිටිති. දිවයින පුරා විකිරණ සේවකයන්ගේ ආරක්ෂාව සහතික කිරීමේ නියාමන අවශ්‍යතාවය සපුරාලීම සඳහා විකිරණ ආරක්ෂණ හා සුරක්ෂිතතාවය සම්බන්ධ සේවා ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම අංශය මඟිනි.

විකිරණ ආරක්ෂණ ක්ෂේත්‍රයට සමගාමීව රටේ විකිරණශීලී ප්‍රභවයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා තාක්ෂණික නිපුනතාවය අත්‍යවශ්‍ය වේ. එමඟින් විකිරණ ප්‍රභව සොරකම් කිරීම, විකිරණ භාවිත කරන ආයතන වල ක්‍රියාකාරිත්වය කඩාකප්පල් කිරීම, හානිකර ක්‍රියා සඳහා විකිරණශීලී ප්‍රභව අනිසි ලෙස භාවිත කිරීම හෝ අනවසර භාවිතයෙන් සිදු කරන වෙනත් ද්වේශ සහගත ක්‍රියාකාරකම් සිදුවීම නැවැත්වීම සඳහා ද අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබාදෙනු ලැබේ. විකිරණ භාවිත කරන ආයතන වල න්‍යෂ්ටික සුරක්ෂිතතාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද, ක්‍රියාපටිපාටි සහ මානව සම්පත් සංවර්ධන කිරීම අත්‍යවශ්‍ය නියාමන අවශ්‍යතාවයන් වේ. එය මහජනතාවගේ, විකිරණ සේවකයින්ගේ සහ පරිසරයේ ආරක්ෂාව තවදුරටත් සහතික කිරීම සඳහා දායක වේ. අනිවාර්ය ජාත්‍යන්තර සම්මතයක් ලෙස අධිවිකිරණ නිරාවරණයෙන් මහජනතාව හා

පරිසරය ආරක්ෂා කරගැනීම සහ විකිරණ ප්‍රභවවල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා තාක්ෂණික හා විද්‍යාත්මක සහය සැපයීම SLAEB හි ප්‍රධාන වගකීමකි. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2021 වර්ෂය තුලදී අංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් හා සේවාවන් ක්‍රියාත්මක කර ඇත.

5.4.1 පුද්ගල විකිරණමිතික සේවාව තුළින් විකිරණ ශිල්පින් අනවශ්‍ය ලෙස විකිරණ නිරාවරණයට ලක් වීම පාලනය කිරීම

අනිවාර්ය නියාමන අවශ්‍යතාවයක් ලෙස විකිරණ ශිල්පින් සඳහා වෘත්තීමය විකිරණ නිරාවරණ පාලන (Occupational Exposure Control) වැඩසටහනක් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කර ඇත. විකිරණශීලී ප්‍රභව භාවිත කරන ආයතන වල පාලිත ප්‍රදේශ වල සේවය කරන සියලුම විකිරණ සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා මෙම සේවාව ලබා ගත යුතුය. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලබන්නේ පුද්ගල විකිරණමිතික සේවාව මඟිනි. ISO 17025: 2017 ට අනුව, ප්‍රතීතනය කරන ලද පුද්ගල විකිරණමිතික සේවාව විද්‍යාගාරය (Personnel Radiation Monitoring Laboratory) මඟින්, තාප සංදීප්ත මාත්‍රාමාපක (Thermo-Luminescent Dosimeters -TLDs) භාවිතයෙන් පුද්ගල විකිරණමිතික සේවාව දීප ව්‍යාප්තව ලබා දීම සිදු කෙරේ. මෙම සේවාව 2021 වසරේදී දිවයින පුරා ආයතන 181 ක සේවය කරන විකිරණ ශිල්පින් 2,235 ක් භාවිත කළ TLD මාපක පත් 11,356 ක් නිරීක්ෂණය කර වාර්තා සකස් කිරීම සඳහා සේවා සපයන ලදි. මෙම සේවාව මඟින් රු. මිලියන 20.67 ක ආදායමක් 2021 වසර තුළ උපදවා ඇත. මෙම සේවාවේ කාර්යක්ෂමතාවය සහ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය (ERP) පදනම් කරගත් මෘදුකාංග පද්ධතියක් මෙම වසරේ හඳුන්වා දෙන ලදී. විකිරණ සේවකයන්ගේ විකිරණ ආරක්ෂණයට අදාළ තාක්ෂණික කුසලතා සහ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා මූලික විකිරණ ආරක්ෂණය පිළිබඳව වන ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත පුහුණු තෙදින වැඩමුළුවක් අංශය මඟින් පවත්වන ලදී.

2021 වර්ෂය තුලදී විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශය විසින් අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) විසින් පවත්වන ලද වෘත්තීය විකිරණ ආරක්ෂණ ඇගයීම් සේවා වැඩසටහනේ (Ocupatianal Radiation Protection Appraisal Service - ORPAS) නිර්දේශ සහ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්මක් නිර්මාණය කිරීම ආරම්භ කරන ලද අතර, ඒ සඳහා එම වැඩසටහන වෙත සහභාගී වූ සියලුම ආයතන වල දායකත්වය ද ලබා ගනිමින් සිටියි.

ලෝක සෞඛ්‍ය සංවිධානය සහ ජාතික පිළිකා මර්දන ව්‍යාපෘතියේ ආරාධනය මත, "වෛද්‍ය අංශ වල විකිරණ ආරක්ෂණය සඳහා වන ජාතික මාර්ගෝපදේශන සංග්‍රහය" සහ "විකිරණ ආරක්ෂණ නිලධාරීන් සඳහා වන යොමු කිරීම් අනුදේශ" යන තාක්ෂණික සංග්‍රහයයන් නිර්මාණය කර දීම ද අංශය විසින් එම වසර තුළදී අවසන් කරන ලදී.

5.4.2 ද්විතීයික සම්මත මාත්‍රාමිති ක්‍රමාංකන සේවාව (Secondary Standard Dosimetry Service)

විකිරණ උපකරණ ක්‍රමාංකනය කිරීම, උපකරණ වල ක්‍රියාකාරීත්වයේ නිවැරදිතාවය සහතික කරන අත්‍යාවශ්‍ය විකිරණ ආරක්ෂණ ක්‍රියාපටිපටියකි. විශේෂයෙන් රෝග විනිශ්චය සහ චිකිත්සක විකිරණවේදය සිදු කරන රෝහල් වලට මෙම සේවාව ලබා දිය යුතුය. ISO 17025:2017 ට අනුව, ප්‍රතීතනය කරන ලද ද්විතියික සම්මත මාත්‍රාමිති ක්‍රමාංකන විද්‍යාගාරය (SSDL) විකිරණ මාපක, විකිරණ ක්ෂේත්‍ර මාපක, විකිරණ තැවරුම් අධීක්ෂණ උපකරණ වැනි මිනුම් උපකරණ ක්‍රමාංකනය කිරීම සඳහා දීපව්‍යාප්ත සේවාවන් සපයයි. එහි ප්‍රවිකිරණ ප්‍රමිතීන් IAEA සහ BIPM ප්‍රාථමික ප්‍රමිතීන්ගෙන් ලබා ගෙන ඇත. ISO 4037 ට අනුකූලව වෛද්‍ය සම්මත X-කිරණ කදම්බයක්ද පවත්වාගෙන යාම මෙම විද්‍යාගාරය මඟින් සිදු කෙරේ. එය පටු වර්ණාවලි X -කිරණ මිනුම් සහ X -කිරණ ජනනය කිරීමේ උපකරණ ක්‍රමාංකනය කිරීම සඳහා යොදා ගනී. විකිරණ ආරක්ෂාව සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස 2021 වර්ෂය තුලදී විද්‍යාගාරය මඟින් විකිරණ

මිනුම් උපකරණ 108 ක් සඳහා ක්‍රමාංකන සේවා ලබා දී ඇත. මෙම සේවාව මඟින් රු. මිලියන 0.81 ක ආදායමක් 2021 වසර තුල උපයාගෙන ඇත.

5.4.3 න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ සේවා

න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ සේවා සැපයීම සඳහා ඇති එකම දේශීය විද්‍යාගාරය ලෙස විකිරණ හඳුනා ගැනීම සහ විශ්ලේෂණය සඳහා තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කිරීමේ වගකීම න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ විද්‍යාගාරය (Nuclear Instrument Laboratory) වෙත පැවරී ඇත. එහි කර්තව්‍යය වන්නේ, න්‍යෂ්ටික මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික සහාය සහ මාර්ගෝපදේශකත්වය ලබා දීමයි. විශේෂයෙන් මණ්ඩලයෙහි පිහිටුවා ඇති විකිරණ උපකරණ සහ පද්ධති සඳහා මෙම සේවාව ලබා දෙනු ලැබේ. මෙම අංශය මඟින් උපකරණ තෝරා ගැනීම, දෝෂ හඳුනාගැනීම, භාවිතය සහ නඩත්තු කිරීම සඳහා උපදේශන සේවා ද ආරම්භ කර ඇත. NIL විසින් වාණිජ මට්ටමේ අඩු වියදම් විකිරණ මිනුම් උපකරණ නිර්මාණය කර සංවර්ධනය කර ඇත. 2021 වර්ෂය තුළ GM ගයිගර්මුලර් අනාවරකය සහිත කුඩා උපකරණ කට්ටල 8ක් එහි නවතම මාදිලිවලට යාවත්කාලීන කරන ලදී. එසේම, න්‍යෂ්ටික ආරක්ෂණ අරමුණු සඳහා අතේ ගෙන යා හැකි, අඩු වියදම් පුද්ගලික විකිරණ නිරාවරණ උපකරණයක් (personal radiation monitor) නිර්මාණය කරන ලදී.

ජාතික න්‍යෂ්ටික පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියට අයත් විකිරණ නිරීක්ෂණ මධ්‍යස්ථාන අටක් (08) සාර්ථකව අළුත්වැඩියා කර නැවත ප්‍රතිස්ථාපනය කරන ලදී. 2021 වසර තුළදී න්‍යෂ්ටික උපකරණ විද්‍යාගාරය මඟින් සේවාදායකයින්ගේ ඉල්ලීම් 29 ක් සඳහා වාණිජ මට්ටමේ අලුත්වැඩියා සේවාවන් ලබා දී ඇත. අලුත්වැඩියා කිරීම් සේවා සඳහා රු. මිලියන 0.11 ක ආදායමක් න්‍යෂ්ටික විද්‍යා උපකරණ ඒකක විසින් 2021 වර්ෂය තුල උපයා ඇත.

5.4.4 න්‍යෂ්ටික සුරක්ෂිතතාවය


න්‍යෂ්ටික සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ගෝලීය ප්‍රජාව තුළ මතු වෙමින් පවතින අවශ්‍යතා අනුව කටයුතු සම්පාදනය කිරීම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් බවට පත්ව ඇත. අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සහයෝගය සමග, ජාත්‍යන්තර න්‍යෂ්ටික ආරක්ෂණ වැඩපිළිවෙල සඳහා විශිෂ්ට දායකත්වයක් ලබා දීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට හැකි වී තිබේ. සාමාන්‍ය විද්‍යාත්මක සේවා අංශය මේ සම්බන්ධයෙන් වන ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති (Coordinated Research Project - CRP) දෙකකට පහත සඳහන් පරිදි එම නියෝජිතායතනය සමග සම්බන්ධ වී ඇත.

- නියාමන පාලනයෙන් බැහැර න්‍යෂ්ටික හා වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා වන විකිරණ අනාවරක උපකරණ වැඩි දියුණු කිරීම. (J02012)

- විකිරණ හඳුනාගැනීමේ උපකරණ නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ ක්‍රමාංකනය කිරීම. (J02014)

CRP J02012 යටතේ, විකිරණශීලී සමස්ථානික හඳුනාගැනීමේ නවීන තාක්ෂණික උපකරණ 07 ක් පරිත්‍යාගයක් ලෙස ලැබී ඇති අතර, ඒවා රටේ න්‍යෂ්ටික/විකිරණ අනාවරණ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා භාවිත කළ හැකිය.

CRP J02014 ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය අන්තර්ජාතික පරමාණු බලශක්ති නියෝජිතායතනය (International Atomic Energy Agency - IAEA) විසින් අනුමත කර ඇති අතර, පළමු සැලසුම් මූලාකෘතිය අවසන් කර නියෝජිතායතනයට ඉදිරිපත් කර ඇත.



සැලසුම් කරන නව විකිරණ අනාවරණ උපකරණයේ රූපසටහන්

එසේම, අංශයේ නිලධාරීන් ජාත්‍යන්තර මට්ටමින් න්‍යෂ්ටික සුරක්ෂිතතා සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වී ඇත. ගනුදෙනුකරුවන් ගේ ඉල්ලීම පරිදි විකිරණ ආරක්ෂණ හා තාක්ෂණික සේවා අංශයේ නිලධාරීන් විසින් තාක්ෂණික සංචාරයන් (technical visit) සහ විශේෂඥ උපදේශන සේවා ලබා දීම ද මෙම වසර තුළ සිදු කරන ලදී. මේ හැරුණු විට රට තුළ න්‍යෂ්ටික සුරක්ෂිතතාවය පිළිබඳව වන අවධානය වැඩිවීමත් සමග, 2021 වර්ෂය තුළ විකිරණ ආරක්ෂණ සහ තාක්ෂණික සේවා අංශය විසින් ආරක්ෂක හමුදා සාමාජිකයින් සඳහා න්‍යෂ්ටික ආරක්ෂණ පුහුණු වැඩසටහන් පවත්වා, න්‍යෂ්ටික අනාවරණය සහ ප්‍රතිචාර දැක්වීම සඳහා ඉදිරි පෙළ නිලධාරීන් 147 ක් පමණ පුහුණු කර ඇත. ශ්‍රී ලංකා රේගුවේ ඉල්ලීම පරිදි, කොළඹ වාරයේ මෙගාපෝර්ට් අන්වේෂණ ඒකකය විසින් හඳුනාගත් අවස්ථා 10ක් තහවුරු කිරීම සඳහා විශේෂඥ සහය ලබා දී ඇත.

5.4.5 විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය

නියාමන සභාව මගින් ලබාදෙන බලපත්‍රය යාවත්කාලීන කරමින් "අහාවිත විකිරණ ප්‍රභව සඳහා වන මධ්‍යම ගබඩා" (Central Disused Radioactive Source Storage/CDRSS), පහසුකම පවත්වා ගැනීම හා නඩත්තුව සිදුකරන ලදී. එම පහසුකම සඳහා විකිරණ ආරක්ෂණ , විකිරණ සුරක්ෂණ හා හදිසි ප්‍රතිචාර සැලැසුම් සාදා ක්‍රියාත්මත කිරීම සිදුකරයි. එසේම භාවිතයෙන් ඉවත් කරන විකිරණ ප්‍රභව සඳහා ස්ථීර හා තාවකාලික ගබඩා කිරීම් සිදුකිරීමට මෙහෙයුම් ක්‍රමවේද නිර්මාණය කර තිබේ. වාණිජ සේවාවන් සැපයීමට මෙම පහසුකම සූදානම් කර ඇත.

5.4.6 විකිරණ හදිසි ආපදා පෙර සූදානම සහ විකිරණ අධීක්ෂණය

රටේ විකිරණ ආරක්ෂණය හා ප්‍රභව වල සුරක්ෂිතභාවය සම්බන්ධ අරමුණු කරා තව දුරටත් යොමු වීම සඳහා විකිරණ හදිසි ආපදා ප්‍රතිචාර වැඩසටහන සහ විකිරණ අධීක්ෂණ වැඩසටහන ස්ථාපිත කර ඇත. විකිරණ අධීක්ෂණය වැඩසටහන වාණිජ සේවාවක් ලෙස ශක්තිමත් කර ඇත. 2021 වර්ෂයේ දී පහත සඳහන් ක්‍රියාකාරකම් හරහා විකිරණ හදිසි ආපදා පෙර සූදානම සහ විකිරණ අධීක්ෂණය සිදුකිරීමට පියවර ගෙන ඇත.

5.4.6.1 න්‍යෂ්ටික ආපදා පූර්ව හඳුනාගැනීමේ අනාවරක පද්ධතිය

කලාපයේ සිදුවිය හැකි න්‍යෂ්ටික අනතුරක බලපෑම සාර්ථකව හඳුනාගැනීම සඳහා මෙම න්‍යෂ්ටික ආපදා පූර්ව අනතුරු ඇගවීමේ පද්ධතිය ස්ථාපිත කර ඇත. පද්ධතිය සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයව පාලනය වන අතර එය 2012 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම පද්ධතියේ තත්වය හා නිවැරදි ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා සමාසිකව ක්‍රමාංකනය කිරීම අවශ්‍ය වේ.

5.4.6.2 පාරිසරික විකිරණ අධීක්ෂණය


ජාතික අවශ්‍යතාවය ලෙස අවශ්‍ය මූලික විකිරණ දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම සඳහා පාරිසරික විකිරණශීලිතා අධීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ස්ථානීය ගැමා වර්ණාවලි විශ්ලේෂණය (In-situ Gamma Spectroscopy), පසුබිම් ගැමා විකිරණමිතිය (Ambient Gamma Radiation Surveys) සහ පාංශු රේඩොන් මිනුම් (Soil Radon Measurements) භාවිත කරමින් මෙම විකිරණ දත්ත ගබඩාව සකස් කර තිබේ. අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් පවත්වාගෙන යනු ලබන “අන්තර්ජාතික විකිරණ මිනුම් දත්ත පද්ධතිය” (International Radiation Measurement Information System/IRMIS) වෙත අඛණ්ඩව පාරිසරික විකිරණශීලිතා දත්ත ලබා දීමට අවශ්‍ය කටයුතු ද අංශය මඟින් සම්පාදනය කරගෙන යනු ලබයි.

5.4.6.3 වැඩබිම් අධීක්ෂණ වැඩසටහන

වැඩබිම් අධීක්ෂණය මඟින් විකිරණ යෙදුම් සහිත සේවා ස්ථාන වල විකිරණ මට්ටම් තක්සේරු කරනු ලබන අතර එමඟින් විකිරණ පාලන ප්‍රදේශ සහ සේවකයන් නිරාවරණය වන විකිරණ මාත්‍රා ඇස්තමේන්තු කිරීම සඳහා තොරතුරු සපයාගත හැකිය. එබැවින් මෙම සේවාව ක්‍රමානුකූලව ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සඳහා අංශය මඟින් කටයුතු කරන ලදී. සාමාන්‍ය විද්‍යාත්මක අංශය මඟින් 2021 දී වැඩබිම් අධීක්ෂණ සේවා 02 ක් පවත්වන ලදී.

5.4.7 තොරතුරු තාක්ෂණ සේවා

අභ්‍යන්තර සේවාවක් ලෙස කාර්යාල පරිපාලනය සහ විද්‍යාත්මක ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ සේවා සැපයීම මේ අංශය යටතේ සිදු කෙරේ. මුල්‍ය සැලසුම්කරණය, වාර්තා තබා ගැනීම සහ කුවිතාන්සි නිකුත් කිරීම, භෞතික බෙදාහැරීම්, සැපයුම් සහ පුද්ගලික වාර්තා පවත්වාගැනීම සම්බන්ධ කාර්යාල, ස්වයංක්‍රියකරණ ක්‍රියාකාරකම් සඳහා මෙම අංශයෙන් සහය ලබා දේ. විද්‍යාත්මක වැඩසටහන් හා වැදගත් සිදුවීම් ක්‍රියාත්මක කිරීමේ දී මෙන්ම දැනුම කළමනාකරණ සඳහා තොරතුරු තාක්ෂණ පහසුකම් බෙහෙවින් උපයෝගී කර ගනු ලැබේ.



විකිරණ ආරක්ෂණ සහ තාක්ෂණික සේවා අංශයේ වාර්ෂික ආදායම

තවද මෙම අංශය විසින් 2021 දී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

I. **මණ්ඩලයේ නව වෙබ් අඩවිය නිර්මාණය කිරීම.**
II. **දෘඪාංග හා ජාල පහසුකම් පුළුල් කිරීම.**
III. **ව්‍යවසාය සම්පත් සැලසුම් (Enterprise Resource Planning) ක්‍රමවේදය භාවිතයෙන් කාර්යාල කටයුතු පරිගණක ආශ්‍රයෙන් ස්වයංක්‍රීයකරණය කිරීමට අදාළ කටයුතු ආරම්භ කිරීම.**
IV. **පරිගණක හා අදාල දෘඪාංග සඳහා අලුත්වැඩියා සහ නඩත්තු සේවා සැපයීම.**
V. **විද්‍යුත් තැපැල් පහසුකම්, අන්තර්ජාල පහසුකම් සහ නිල වෙබ් අඩවියේ සාමාන්‍ය නඩත්තු කටයුතු**
VI. **මෘදුකාංග ආශ්‍රිත සේවාවන් සැපයීම සහ නඩත්තු කටයුතු සිදු කිරීම.**

5.5 කර්මාන්ත යෙදුවුම් අංශය

කර්මාන්ත යෙදවුම් අංශය යටතේ වන උප අංශ දෙකක් වන සමස්ථානික ජල විද්‍යා අංශය සහ විකිරණ පිරිසැකසුම් අංශය මගින් සහ සමස්ථානික පරිසර විද්‍යාව නම් වූ විද්‍යාත්මක විෂයයන් සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් මෙන්ම අදාළ සේවාවන් සිදුකරනු ලබයි. තවද පාසල් අධ්‍යාපන වැඩසටහන් සහ න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳව ගුරුවරුන් සහ පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා මෙම අංශය විසින් සම්බන්ධීකරණය කටයුතු කරනු ලැබේ. සමස්ථානික ජලවිද්‍යා වැඩසටහන යටතේ පාරිසරික තක්සේරුව හා ආරක්ෂාව සම්බන්ධ ව්‍යාපෘති, විශේෂයෙන්ම ජල ගැටළු සම්බන්ධව ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. විකිරණ පිරිසැකසුම් තාක්ෂණය මගින් කර්මාන්ත, සෞඛ්‍ය, කෘෂිකර්මාන්තය සහ පුරාවිද්‍යාව සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය සංවර්ධනය, විකිරණ තාක්ෂණය භාවිතයෙන් සිදු කෙරේ

5.5.1 සමස්ථානික ජල විද්‍යා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සහ ව්‍යාපෘතිවලට අදාල ක්‍රියාකාරකම්

5.5.1.1 මල්වතු ඔය ද්‍රෝණියේ සහ පහළ මහවැලි ද්‍රෝණියේ භූගත ජල පරීක්ෂණ

මෙම අධ්‍යයනය අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සියේ (IAEA) හි තාක්ෂණික ජාතික සහයෝගීතා වැඩසටහන (TC ව්‍යාපෘතිය: SRL7006) යටතේ සිදු කරන ලදී. ඉහත ප්‍රදේශවල ප්‍රධාන පානීය ජල මූලාශ්‍රය වන භූගත ජලයේ පවතින ස්වාභාවික දූෂක විමර්ශනය කෙරෙහි මෙම ව්‍යාපෘතිය යටතේ අවධානය යොමු කරන ලදී. ක්ෂේත්‍ර නියැදි ගැනීම 2021 වර්ෂයේදී අවසන් කරන ලදී. එකතු කරන ලද ජල නියැදි පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි සමස්ථානික ජලවිද්‍යා අංශයේ විද්‍යාගාරවලදී රසායනික පරාමිතීන් සඳහා විශ්ලේෂණය කෙරුණි. නියැදි වලින් කොටසක් විශ්ලේෂණය සඳහා චීනයේ, චීන විද්‍යා ඇකඩමියට (Chinese Academy of Sciences, CAS) යැවීම සඳහා කටයුතු කර ඇත.



මන්නාරමේ නොගැඹුරු වාරි ළිඳකින් ජල සාම්පල විදුලි ජල පොම්පයක් භාවිතයෙන් එකතු කිරීම



භූගත ජල නිරීක්ෂණ ළිඳකින් ජල නියැදි එකතු කිරීම



පානීය නල ළිඳකින් ජල නියැදි එකතු කිරීම

CAS හි ආචාර්ය උපාධිය හදාරමින් සිටින සමස්ථානික ජල විද්‍යා අංශයේ විද්‍යාත්මක නිලධාරිනියක් විසින් මෙම දත්ත ඇගයීමට ලක්කරනු ලැබීය. එම දත්ත ඇයගේ ආචාර්ය උපාධිය සඳහා ද භාවිතා කරන ලදී . 2021 අවසානය වන විට ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර තිබුණද, උපකරණ දෝෂ හේතුවෙන් බොහෝ නියැදි සමස්ථානික පරාමිතීන් සඳහා විශ්ලේෂණය කිරීමට නොහැකි විය. කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් මෙම උපකරණ අළුත්වැඩියාකිරීම බොහෝ ලෙස ප්‍රමාදවීම නිසා සැලසුම්කල කටයුතු අඩාල විය.

5.5.1.2 සමස්ථානික සහ රසායනික ක්‍රම භාවිතයෙන් ශ්‍රී ලංකාවේ බටහිර කොටසේ කොළඹ සිට මීගමුව දක්වා නොගැඹුරු වෙරළබඩ ජලධර පද්ධතියේ ජල දූෂණ අවදානම් තක්සේරුව

බස්නාහිර වෙරළබඩ කලාපයේ කොළඹ සිට මීගමුව දක්වා ප්‍රදේශය, ඉහළ ඵලදායිතාවයක් සහිත ජලධර ඒකකවලින් සමන්විත වේ. මෙම ජලධර ඒකක නිර්මාණය වී ඇත්තේ බාදනය වූ මවු පාෂාණයේ පැළුම් තුල මෙන්ම කබොක් පසින් සමන්විත භූ පද්ධතියන්ගේ වේ. තවද වෙරළ තීරයට ආසන්නයේ නොගැඹුරු වැලි ස්ථර ආශ්‍රිතවද ජලධර පිහිටා ඇත. මෙම ප්‍රදේශයේ ජනගහනයෙන් 90% කට වඩා වැඩි පිරිසක් පානීය, ගෘහාශ්‍රිත සහ වෙනත් අවශ්‍යතා සඳහා භාවිතා කරනුයේ භූගත ජලයයි. මෙම ජල පද්ධතිය, කොළඹ නගරයට සමීපව පවතින ඉහළ විභවයක් සහිත මිරිදිය ජල මූලාශ්‍රවලින් එකක්වීම නිසා මෙම සංවර්ධනය ව්‍යාපෘති සඳහා බෙහෙවින් වැදගත් වන බව හොඳින්ම වැටහේ. කොළඹ සිට මීගමුව දක්වා විවිධ වර්ගයේ නිෂ්පාදන කම්හල් වලින් සමන්විත කර්මාන්ත කලාප පිහිටා ඇත. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ ජලධර පද්ධතියේ ඇති ස්වභාවික දූෂකාරක හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් මුදාහරින ලද අපවිත්‍රකාරක/දූෂක පිළිබඳව අවබෝධ කර ගැනීමය. තවද භූගත ජලය නැවත ආරෝපණය / සම්භවය, භූගත ජලයේ වයස, මතුපිට ජලය සහ භූගත ජලය අන්තර්ක්‍රියා කිරීම, මුහුදු ජලය ජලධර පද්ධතියට ඇතුළුවීම හා ජලයේ ගුණාත්මකභාවය ආදී තොරතුරු සමස්ථානික සහ රසායනික ක්‍රම භාවිතා කරමින් විමර්ශනය කෙරේ.

මෙම අධ්‍යයනයට අදාළව පළමු ක්ෂේත්‍ර චාරිකාව 2020 වර්ෂයේදී සිදු කරන ලද අතර, 2021 වර්ෂයේදී එම නියැදිවල ප්‍රධාන අයන සංයුතීන් සහ මූලික රසායනික පරාමිතීන් විශ්ලේෂණය කරන ලදී. IAEA විසින් ජලයේ පවතින C-14 සහ ට්‍රිටියම් ප්‍රමාණ විෂ්ලේශණයට අදාලව නියැදි සැකසීම සඳහා අවශ්‍යවන රසායනාගාර ද්‍රව්‍ය සහ උපකරණ ලබා දීමෙන් ව්‍යාපෘතියට සහාය විය.

5.5.1.3 ශ්‍රී ලංකාව පුරා වැසි ජලයේ සමස්ථානික අධ්‍යයනය

ඕනෑම සමස්ථානික ජල විද්‍යාත්මක, සමස්ථානික පාරිසරික හෝ දේශගුණික අධ්‍යයනයන් සඳහා මූලික තොරතුරු ලබා ගැනීමට රට පුරා ලැබෙන වර්ෂා ජලයේ සමස්ථානිකවල අවකාශීය සහ කාලීන විචලනය දැනසිටිය යුතුය. එබැවින් ශ්‍රී ලංකාව පුරා විවිධ භූගෝලීය පිහිටීම්වලින් වැසි ජලය එක්රැස් කිරීම වැදගත් වේ. මෙම සමීක්ෂණයේ පළමු අදියරය 2012 සිට 2015 දක්වා කාලය තුළ උතුරු-මැද, නැගෙනහිර, මධ්‍යම පළාත්වලද වයඹ පළාතේ සමහර ප්‍රදේශ වලද සිදුකරන ලදී. 2018 වසරේ, ඉහත සමීක්ෂණයේ දෙවන අදියරය දකුණ, ඌව, සබරගමුව, බස්නාහිර සහ නැගෙනහිර පළාත්වලද වයඹ පළාතේ සමහර ප්‍රදේශ වලද ආරම්භ කරන ලදී.



නැගෙනහිර පළාතේ පිහිටි මහඔය ගමේ ගම්වැසියෙකු විසින් මාසිකව රැස් කරන වැසි ජලය

මේ සඳහා මාසිකව වර්ෂා ජලය එකතු කිරීම සඳහා එකතු කිරීමේ ස්ථාන 20කට වැඩි ප්‍රමාණයක් වර්ෂ තුනක පමණ කාලයකට එකතු කිරීම සඳහා තාවකාලිකව ස්ථාපිත කරන ලදී. 2019, 2020 සහ 2021 සඳහා සාම්පල ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලදී.

එසේම, සමස්ථානික ජල විද්‍යා අංශය 2008 වසරේ සිට IAEA විසින් මෙහෙයවනු ලබන වර්ෂාපතනයේ සමස්ථානික සඳහා වූ ගෝලීය ජාල (Global Network of Isotopes in Precipitation, GNIP) වැඩසටහන සඳහා වර්ෂා ජලය එක්රැස් කරගෙන යනු ලබයි. මෙම වැඩසටහන යටතේ කොළඹ, කටුගස්තොට සහ යාපනය යන ස්ථානවල වර්ෂා නියැදි ලබාගැනීමට අදාල සැකසුම් ස්ථිරව ස්ථාපිත කර ඇත. මේ සඳහා වාර්ෂිකව අප ආයතනය විසින් වැසි ජල නියැදි IAEA වෙත යවා ඇත. කලාපීය සහ දේශීය වශයෙන් සිදු කෙරෙන ජල විද්‍යා, පාරිසරික හා දේශගුණික අධ්‍යයනයන් සඳහා මෙම දත්ත IAEA ට අයත් GINP දත්ත පදනමෙන් බාගත හැක.

5.5.1.4 බෝතල්කල පානීය ජල කර්මාන්තයේ ජල මූලාශ්‍ර පිළිබඳ දත්ත ගබඩාවක් පිහිටුවීම

බෝතල්කල පානීය ජල කර්මාන්තය දිනෙන් දින රට තුළ ව්‍යාප්තවන අතර මේ සඳහා සිටින නිෂ්පාදකයින් සංඛ්‍යාව වාර්ෂිකව ඉහළ යමින් පවතී. දිනෙන් දින ඉහළ යන ඉල්ලුමත්, ලැබෙන ඉහළ ආර්ථික ප්‍රතිලාභත් සමඟ ඇතැම් ව්‍යාජ නිෂ්පාදන වෙළෙඳ පොළට හඳුන්වා දෙමින් පවතී. ජලය බෝතල් කිරීම සඳහා විවිධ භූගෝලීය ස්ථාන වලින් ආරම්භ වන ජල ප්‍රභවයන් භාවිත වන අතර භූගෝලීය පිහිටීම මත ජලයේ ලාක්ෂණික සමස්ථානික සහ ජල-භූ රසායනික සංයුතීන් ඇති කරයි. ඒ මඟින් බෝතල් කළ ජලය සඳහා යොදාගත් මූලාශ්‍ර පහසුවෙන් සොයා ගත හැකි අතර වෙළෙඳ පොළේ ඇති ජල බෝතල් විශ්ලේෂණය කිරීමෙන් වංචනික නිෂ්පාදන හඳුනාගත හැක. තවද, බෝතල් කළ ජලය සඳහා යොදාගත් මූලාශ්‍රවල ජලයේ ගුණාත්මකභාවයද

මූලික රසායනික පරාමිතීන්, ප්‍රධාන අයන සහ අංශුමාත්‍ර මූලද්‍රව්‍ය විශ්ලේෂණය කිරීමෙන් තීරණය කළ හැකිය. ජල මූලාශ්‍රවල තිරසාර බව ජල මූලාශ්‍රවල වයස නීර්නය කිරීම මඟින් තීරණය කළ හැක.

මෙම අධ්‍යයනය ඉහත අරමුණ සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස සැලසුම් කර ඇත. දිවයිනේ සියලුම භූගෝලීය ප්‍රදේශ ආවරණය වන පරිදී තෝරාගත් බෝතල් ජල කර්මාන්තයේ පාර්ශවකරුවන් වෙත මෙම අධ්‍යයනය සඳහා කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපි යවා ඇත. මේ සඳහා මේ වනවිට මාසිකව ජල නියැදි එවීමට සමාගම් 17ක් එකඟ වී ඇත. 2021 වසරේදී නියැදි රැස්කිරීම ආරම්භ කල අතර එය මාස 18 ක පමණ කාලයක් සඳහා සිදුකිරීමට අපේක්ෂිත තර 2021 වසරේ රස කල ජල නියැදි වල ඒවායේ රසායනික පරාමිතීන් ද විශ්ලේෂණය කරනු ලැබීය.

5.5.1.5 අයන් ක්‍රොමැටොග්‍රෆි (Ion Chromatography) මඟින් ජල තත්ත්ව විශ්ලේෂණය ප්‍රතීතනය කිරීම

ISO/IEC 17025 සහතික කිරීම මඟින් රසායනාගාරවල සිදු කරන පරීක්ෂණ ප්‍රතිඵල සඳහා ඇති නිපුණතාවය තහවුරු කරයි. මෙම සහතික කිරීම, පරීක්ෂණ සහ ක්‍රමාංකන රසායනාගාර සඳහා ගෝලීයව සම්මත ප්‍රමිතියකි. එය ප්‍රතීතන ආයතනයකින් ප්‍රතීතනය ලබාගැනීම සඳහා ඇති පදනම වේ. මෙම ISO/IEC 17025 සහතික කිරීමේ ප්‍රමිතිය, ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය (ISO) සහ ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණ කොමිෂන් සභාව (IEC) විසින් පරීක්ෂණ සහ ක්‍රමාංකන රසායනාගාරවල නිපුණතාවය පවත්වා ගැනීම සඳහා ප්‍රකාශයට පත් කර ඇත. රසායනාගාර අපක්ෂපාතීව සහ නිපුනලෙස ක්‍රියාත්මක වී වලංගු ප්‍රතිඵල ලබාදීමට ඇති මූලික අවශ්‍යතාව ISO 17025:2017 මඟින් සපුරයි. තවද ජාතික වශයෙන් මෙන්ම අන්තර්ජාතිකවද පිළිගත් ප්‍රතිඵල ලබාදීම සඳහා රසායනාගාර කාර්ය මණ්ඩලයේ කාර්යන් කිරීමට ඇති විශ්වාසය ප්‍රවර්ධනය කිරීම මඟින් ස්ථාවර ක්‍රියාකාරිත්වයක් ඇති කරයි. මේ අනුව Ion Chromatography ක්‍රමවේදයෙන් ISO/IEC 17025 තත්ව සහතික කිරීමට අනුකූලව ජලයේ තත්ත්ව පරීක්ෂාව සඳහා අදාල වන සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සැකසීම, තත්ත්ව අත්පොත සැකසීම හා ක්‍රමාංකන ප්‍රස්ථාර ඇදීම 2021 දී සිදු කරනු ලැබීය.

5.5.1.6 රාජ්‍ය විශ්වවිද්‍යාල සමඟ එක්ව සිදුකරන පර්යේෂණ

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකුට ඔවුන්ගේ කාර්මික පුහුණු අවශ්‍යතා යටතේ සමස්ථානික ජල විද්‍යාව පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී.

5.5.1.7: 2021 වර්ෂයේ සිදුකරන ලද පර්යේෂණ ප්‍රකාශන

2021 දී ක්ෂේත්‍රයේ සිටින විවිධ සංවිධාන/ආයතන සමඟ සහයෝගයෙන් පහත පර්යේෂණ ප්‍රකාශන සිදු කරන ලදී.

I. Senarathne, S., J.M.C.K. Jayawardana, E.A.N.V. Edirisinghe & Chandrajith, Rohana, (2021). Geochemical and isotope evidence for groundwater mineralization in a semi-arid river basin, Sri Lanka, *Applied Geochemistry*, 124, 104799. doi: 10.1016/j.apgeochem.2020.104799

II. Matiatos, I., Wassenaar, L.I., Monteiro, L.R. *et al.* Global patterns of nitrate isotope composition in rivers and adjacent aquifers reveal reactive nitrogen cascading. *Commun Earth Environ* 2, 52 (2021). https://doi.org/10.1038/s43247-021-00121

III. Galhenage, A.C. *et al.* (2021). Assessment of Groundwater Quality for Drinking Water from Deep Confined Aquifer in Wanathawilluwa. In: Dissanayake, R., Mendis, P., Weerasekera, K., De Silva, S., Fernando, S. (eds) ICSECM 2019. Lecture Notes in Civil Engineering, vol 94. Springer, Singapore. https://doi.org/10.1007/978-981-15-7222-7_41

IV. Priyadarshanee K.S.G.S., Edirisinghe, E.A.N.V., Dharmagunawardhane, H. A., Pitawala, H. M. T. G. A. (2021). Source and mechanism of recharge of deep groundwater in different flow

regimes of Sri Lanka: A study based on environmental isotopic and chemical signatures. *Symposium Proceedings,* Eight International Symposium on Water Quality and Human Health: Challenges Ahead, 26 & 27 November, *Post Graduate Institute of Science*, University of Peradeniya, Sri Lanka.

5.5.2 සමස්ථානික පරිසර විද්‍යා වැඩසටහන

භූ රසායන විද්‍යාව, ජෛව භූ රසායනික චක්‍ර, ශාඛ හා සත්ත්ව විශේෂවල ව්‍යාප්තිය, පරිසර දූෂක සංසරණය, ආහාර ජාල සහ පරිසර පද්ධති ආදිය පිළිබඳ වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා ප්‍රබල මෙවලමක් ලෙස ස්ථායී සමස්ථානික යොදා ගනී. ජීවියෙකුගේ පටකවල සමස්ථානික අනුපාත එම ජීවියා අනුභව කරන හෝ වර්ධනය වන ස්ථානයේ සමස්ථානික අනුපාත පිළිබිඹු කරයි. එසේම පෘථිවියේ යම් ස්ථානයෙන් ස්ථානයට සමස්ථානික අනුපාත වෙනස් අගයන් ගනී. මෙම දැනුම ඒකාබද්ධ කරමින් විද්‍යාඥයින්ට කුරුල්ලන්, ක්ෂීරපායින් සහ මත්ස්‍යයන්ගේ ආහාර පුරුදු සහ සංක්‍රමණ මාර්ග මෙන්ම පරිසර දූෂක වල ගමන් මඟ සහ සත්ව හා ශාක විශේෂ වල වාස්ථාන පිළිබඳව නිගමනයන් කළ හැකිය. ස්ථායී සමස්ථානික අධ්‍යයනයන් පාරිසරික සංරක්ෂණය සහ පාරිසරික වෙනස්වීම් පිළිබඳ සිදු කරන පර්යේෂණ සඳහා නව ප්‍රවේශයක් ලබා දෙයි.

5.5.2.1 ජල භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා සමස්ථානික ශිල්පීය ක්‍රම භාවිතයෙන් නියඟ තත්ත්වයන් යටතේ බෝග ඵලදායිතාව වැඩි කිරීම

"ජල භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා සමස්ථානික ශිල්පීය ක්‍රම භාවිත කරමින් නියඟ තත්ත්වයන් යටතේ බෝග ඵලදායිතාව ඉහළ නැංවීම" කෘෂිකර්මාන්තයට අදාළ යෙදුම් පර්යේෂණයකි. 2022-2023 වසර සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ කලාපීය සහයෝගිතා ගිවිසුම යටතේ ආසියා පැසිෆික් කලාපය සඳහා මෙම ක්ෂේත්‍රය (කෘෂිකාර්මික සහ පරිසර විද්‍යාව) පිළිබඳ වසර දෙකක ව්‍යාපෘති යෝජනාවක් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මඟින් ඉදිරිපත් කරන ලදී. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය මඟින් මෙම ව්‍යාපෘතිය 2022 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන ඇත්තේ අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලැබීම මතය. නමුත් ආසියා පැසිෆික් කලාපයෙන් ඉදිරිපත් වූ ව්‍යාපෘති යෝජනා 15න් තෝරාගනු ලැබූ ව්‍යාපෘති 8 න් එකක් මෙම ව්‍යාපෘතිය වීම සුවිශේෂය. මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අප ආයතනය මූලිකත්වය ගත් හේතුවෙන් කලාපීය ව්‍යාපෘතියේ ප්‍රමුඛ රට ශ්‍රී ලංකාවයි. ප්‍රශස්ත මට්ටමින් අවශ්‍ය ප්‍රමාණයට පමණක් කෘෂිකර්මාන්තයට ජලය භාවිත කරමින් බෝග ඵලදායිතාව වැඩිදියුණු කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාවයට දායක වීම මෙම ව්‍යාපෘතියේ මුඛ්‍ය අරමුණයි. එමගින් එදිනෙදා ජීවිතයට පිරිසිදු ජලය ඉතිරි කර ගැනීමද වක්‍රව සිදුවේ. මෙම අධ්‍යනයන සඳහා පාලන තත්ත්ව යටතේ වගා කරන ලද තෝරාගත් භෝග වල ජල අවශ්‍යතාව සහ ඊට අදාලව භෝගවල හැසිරීම සමස්ථානික තාක්ෂණික ක්‍රමවේද මඟින් අධ්‍යයනය කෙරේ. ව්‍යාපෘතිය අවසන් වන විට සංවර්ධනය කරන ලද නිසි වාරි ජල කළමනාකරණ ශිල්පීය ක්‍රම හරහා ගොවි ජනතාවට ප්‍රතිලාභ ලබා දීම අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ පර්යේෂණ අංශ වල දායකත්වය සහ උපදෙස්ද ලැබේ.

2022 දී සැලසුම්ගත ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා, ව්‍යාපෘතිය සඳහා යටිතල පහසුකම් ලෙස හරිතාගාරයක් ස්ථාපිත කරන ලදී. මීට අමතරව, ශාක ජලය නිස්සාරණය සඳහා රසායනාගාර යටිතල පහසුකම් 2021 දී වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.

5.5.2.2 හරිතාගාර පද්ධතිය ස්ථාපිත කිරීම

හරිතාගාර පද්ධතිය 2021 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. හරිතාගාරයේ විශාලත්වය වර්ග අඩි 500 කි. එය ජලය හා පොහොර ලබා දීමේ පද්ධතියක්, පාංශු තෙතමන අනාවරක පද්ධතියක් සහ දේශගුණ පාලන පද්ධතියකින් සමන්විත වේ. හරිතාගාරය දුරස්ථ ක්‍රම යටතේ ස්වයංක්‍රීයව ද ක්‍රියාත්මක කළ හැක. ව්‍යාපෘතියේ පළමු අත්හදා බැලීමේ බෝගය ලෙස පාලිත තත්ත්ව යටතේ මිරිස් වගා කිරීම අපේක්ෂා කෙරේ. මිරිස් පැල 75ක් හරිතාගාර තුළ එක් වරක් වගා කළ හැකිය.





පර්යේෂණ කටයුතු සඳහා ඉදිකෙරුණු හරිතාගාරය

5.5.3 විකිරණ පිරිසැකසුම් අංශයට අදාළ පර්යේෂණ කටයුතු

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ විකිරණ පිරිසැකසුම් අංශය මඟින්, අයනීකරණ විකිරණ භාවිතයෙන් ද්‍රව්‍ය වල ගතිගුණ වැඩිදියුණු කිරීම සහ එම ද්‍රව්‍ය වලට අගය එකතු කිරීමේ මූලික අරමුණ ඇතිව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති කටයුතු සිදු කරයි. රටේ කෘෂිකාර්මික, පාරිසරික සෞඛ්‍ය සහ කාර්මික ගැටළු විසඳීමට තාක්ෂණික සහයෝගය ලබාදීම සඳහා වෙනත් පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් මෙහිදී කටයුතු සිදු කරනු ලැබේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යන අංශය සමඟ සහයෝගී අධ්‍යනයකදී ප්‍රතික්‍රියාශීලී ඒකාවයවික එකතුවකින් පුරාවිද්‍යාත්මක සංරක්ෂණ යෙදුම්වල විභවය තක්සේරු කිරීම සඳහා ගැමා විකිරණ මඟින් කෂූ බිජ ප්‍රතිකාර කර නිස්සාරකයක් සකස් කිරීම කරන ලදී. මෙය "සංස්කෘතික උරුමයන් සංරක්ෂණය සඳහා න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීම" - RAS 1021 යන ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ ව්‍යාපෘතියකට අදාලව සිදු කරන ලදී. මෙම අධ්‍යනයට රසායනික සූත්‍ර කිහිපයක් වැඩිදියුණු කිරීම, විවිධ වායුගෝලීය තත්ව යටතේ ප්‍රවිකිරණ තත්ව ප්‍රශස්ත කිරීම සහ ඉහත සූත්‍රගත කිරීම් සමඟ ප්‍රතිකාර කරන කඩදාසි මත පදනම්වූ ද්‍රව්‍ය වල බහු අවයවික උත්පාදනය, ජල විකර්ෂණය, ආහාන්‍ය ශක්තිය සහ ප්‍රති -දිලීර ගුණ ඇගයීම ඇතුළත් විය. ප්‍රතිකාර කරන ලද පත්‍ර වල තාප ස්ථායීතාවය, ඇවෑම් පරීක්ෂාව සහ තාපහාරමිතික විශ්ලේෂණය භාවිතයෙන් අධ්‍යනය කරන ලදී. මෙම අධ්‍යනයෙන් හෙළි වන්නේ විකිරණ ප්‍රේරිත බද්ධ සහ බහු අවයවීකරණය සාර්ථක බවයි.



මුද්‍රිත ද්‍රව්‍යයන් කල් තබා ගැනීම සඳහා රසායනික සකස් කිරීම

තවත් අධ්‍යනයක දී, ප්‍රතික්‍රියාශීලි ඒකාවයවික සහ බහුඅවයවික භාවිතයෙන් රසායනික සූත්‍ර ගණනාවක් වැඩිදියුණු කරන ලද අතර, ස්වභාවිකව ඇවෑම් වන කඩදාසිවලට යොදන ලද අතර, පසුව ගැමා ප්‍රවිකිරණයද සිදු කරන ලදී. බද්ධ සහ බහු අවයවීකරණය ප්‍රමාණය භාරමිතික මිනුම් මඟින් තීරණය කරන ලද අතර සාම්පල පරිලෝකන ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂය මඟින් විශ්ලේෂණය කරන ලද අතර ඒවායේ ආභාන්‍ය ශක්තිය (ISO 1924-2) සහ ඉරීම ප්‍රතිරෝධය (ISO 1974) වැනි භෞතික ගුණාංග සඳහා ඇගයීමට ලක් කරන ලදී. මූලික අත්හදා බැලීම්වල ප්‍රතිඵල සහ විද්‍යාත්මක සාහිත්‍ය මත පදනම්ව සුදුසු ඒකාවයවික සහ බහුඅවයවික තෝරා ගන්නා ලද අතර, ගිල්වීමේ ක්‍රමය විසිර ක්‍රමයට වඩා සුදුසු බව නිරීක්ෂණය විය. කඩදාසි ද්‍රව්‍ය වලට අවම විකිරණ හානිය සමඟ උපරිම බහුඅවයවීකරණය ලබා ගැනීම සඳහා ගැමා විකිරණ මාත්‍රාව තෝරා ගන්නා ලදී. ඇල්කිඩ් රෙසින් එහි මේද අම්ල සංයුතිය සහ ද්‍රව්‍ය හඳුනා ගැනීම GC-MS සහ FT-IR මඟින් සහ දුස්රාවිතාවය, දෘඪතාව, ඔපය සහ වියළන කාලය වැනි භෞතික ගුණාංග තීරණය කිරීම සඳහා විශ්ලේෂණය කර සංලක්ෂිත කරන ලදී. එහි ප්‍රතිඵල ජාත්‍යන්තර සමුළුවකදී ප්‍රකාශයට පත් කෙරිණි.

මීට අමතරව, "කාර්මික භාණ්ඩ නිෂ්පාදනය සඳහා විකිරණ මඟින් වෙනස් කිරීම හරහා බහු අවයවික අපද්‍රව්‍ය නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රියකරණය කිරීම ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ ව්‍යාපෘතියකට අදාලව සිදු කරන ලදී (IAEA TC-RAS1024). ව්‍යාපෘති මඟින් ශ්‍රී ලංකාවේ බහු අවයවික ප්‍රතිචක්‍රියකරණය සඳහා විභව විකිරණ තාක්ෂණ යෙදුම් පිළිබඳ පසුබිම් අධ්‍යනය කිරීම සිදු විය. අධ්‍යනයේ සොයාගැනීම්වලින් හෙළි වූයේ පවතින කර්මාන්තය අවිධිමත් සහ කුඩා ප්‍රමාණයේ බවයි. ප්ලාස්ටික් අපද්‍රව්‍ය සැපයීමේ අවිධිමත් බව, මිල උච්චාවචනයන් (නොඉදුල් ප්ලාස්ටික් වලට එදිරිව ප්‍රතිචක්‍රියකරණය කරන ලද ප්ලාස්ටික්) සහ මිශ්‍ර අපද්‍රව්‍ය, අපවිත්‍රකරණය සහ වර්ග කිරීම සම්බන්ධ ගැටළු බහුලව වාර්තා වී ඇත. දැනට ප්‍රතිචක්‍රියකරණය කරන ලද නිෂ්පාදන වලින් වැඩි ප්‍රමාණයක් අධ්‍යනය අඩුවක්‍රීය කර ඇති අතර, සමාගම් කිහිපයක් රෙදිපිළි නූල් නිෂ්පාදනය සඳහා ප්‍රතිචක්‍රියකරණය කරන ලද PET යොදාගැනීම (MAS ආයතනය මඟින් 2019 ක්‍රිකට් ලෝක කුසලාන සඳහා ශ්‍රී ලංකා කණ්ඩායමට ජර්සි නිෂ්පාදනය කිරීම) සහ කොන්ක්‍රීට් හෝ තාර වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය ප්ලාස්ටික් අපද්‍රව්‍ය මඟින් නිපදවා ඇත. [රත්මලාන-බොරුපන මාර්ගය (2018) සහ මීගොඩ-දම්පේ බෙරුකැටිය මාර්ගය (2020) ඉදිකිරීම සඳහා නියමු පරිමාණයෙන් (pilot scale) භාවිත කර ඇත].

විකිරණ සැකසුම් තාක්ෂණය පිළිබඳ දැනුම බෙදා හැරීම සඳහා, අංශය විසින් මාර්ග ගත දේශනයක් පවත්වා සඟරාවක් සඳහා ලිපියක් ඉදිරිපත් කරන ලදී. තවද, මෙම අංශය 2021 දී නව IAEA ව්‍යාපෘතියකට සම්බන්ධ වී ඇත. එය "සාගර ප්ලාස්ටික් දූෂණයේ බහුලත්වය සහ බලපෑම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා සමුද්‍ර පරිසරය නිරීක්ෂණය කිරීම" (RAS7038) කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති පසුබිම, ව්‍යාපෘති අරමුණු, සහ ඉදිරි ක්‍රි ක්‍රියාකාරකම් පිලිබඳ සාකච්ඡා කිරීම සඳහා මෙම ව්‍යාපෘතියේ තොරතුරු විස්තරාත්මක රැස්වීම 2021 අවසාන කාර්තුවේදී මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී.

විද්‍යාත්මක ප්‍රකාශන

- "Gamma Radiation Curable Polymers for Safeguarding Tangible Cultural Heritage: Sri Lankan Experience in Paper Conservation". In *3rd International Conference on Intangible Cultural Heritage – ICICH 2021*, University of Sri Jayewardenepura, 22 - 23 December 2021 (Pg. 63)

5.5.4 පාසල් සඳහා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය හඳුන්වාදීමේ වැඩසටහන

න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අප රටේ මහජනතාව තුළ සැබෑ අවබෝධයක් පවතීද යන්න ගැටළුකරී තත්වයකි. ලෝකයේ ස්ථාන කිහිපයක සිදු වූ න්‍යෂ්ටික අනතුරු පිළිබඳ ඇතැම් සෘණාත්මක අත්දැකීම් හේතුවෙන් බොහෝ දෙනා තුළ න්‍යෂ්ටික විරෝධී මානසිකත්වයක් පවතී. න්‍යෂ්ටික

තාක්ෂණය/විකිරණ භාවිතය මඟින් අපට ලැබෙන විශාල ප්‍රතිලාභ ගැන සාකච්ඡා කරනවාට වඩා ඒ සම්බන්ධ ගැටලු හා අනාරක්ෂිත බව පිළිබඳ ඉස්මතු කිරීම වැඩි වශයෙන් සිදු වේ.

න්‍යෂ්ටික තාක්ෂණයේ යෙදුම්වල තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමට නම් ක්‍රමිකව දියුණු කරන ලද ඉහළ පුහුණුව ලත් මානව සම්පතක අවශ්‍යතාවය හඳුනාගත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය පාසල් සිසුන්ට න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ වැඩි අවබෝධයක් ලබා දීමට සහ ඔවුන්ගේ උනන්දුව වැඩි කිරීමට වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත. ව්‍යුහගත ඉගෙනීම මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම් හරහා න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ යෙදවුම් පිළබඳ මනා අවබෝධයක් ලබා දීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් මේ සඳහා විවිධ කාර්යන් සිදු කර ඇත.

I. උසස් පෙළ භෞතික විද්‍යා විෂය මාලාව යාවත්කාලීන කිරීම
II. දීප ව්‍යාප්ත උසස් පෙළ භෞතික විද්‍යා ගුරුවරුන් සඳහා යාවත්කාලීන කරන ලද විෂය මාලාව පිළිබඳ පුහුණු වැඩසටහන්
III. න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය විෂය සඳහා විද්‍යා ගුරුවරුන්ගේ සම්පත් කණ්ඩායමක් ගොඩනැගීම යන ඉලක්ක මේ වන විට සපුරා ගෙන ඇත
IV. අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරුවරුන් සහ විද්‍යා නිලධාරීන් සඳහා ජාත්‍යන්තර පුහුණු අවස්ථා ලබා දීම
V. පාසල්වල ඉල්ලීම් අනුව දැනුවත් කිරීමේ වැඩසටහන්/පුහුණුවීම්/වැඩමුළු/ප්‍රදර්ශන පැවැත්වීම
VI. දේශීයව නිපදවන ලද විකිරණ මිනුම් උපකරණ සැපයීම සඳහා එකඟතාවයකට පැමිණීම
VII. අන්තර්ජාලය හරහා ස්වයං ඉගෙනුම් මොඩියුල දියුණු කිරීම

පශ්චාත් පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය සමඟද න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය විෂය ඒකාබද්ධ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පවතී. පාසල් අධ්‍යාපන වැඩසටහන ඊළඟ මට්ටම වන විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා ව්‍යාප්ත කිරීම මෙම වැඩසටහනේ සාර්ථකත්වය පවත්වා ගැනීමට ඉතා වැදගත් වේ.

5.5.4.1 ද්විතීයික පාසල් සිසුන් සඳහා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ස්වයං අධ්‍යාපන මොඩියුලය

මෙය න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ස්වයං අධ්‍යාපන මොඩියුලයකි. මෙම මොඩියුලය අනු කාණ්ඩ පහකින් සමන්විත වේ.

මූලික විකිරණ, ඒකක සහ මිනුම්, විකිරණ ආරක්ෂණ සහ සෞඛ්‍ය බලපෑම්, න්‍යෂ්ටික බලය සහ විකිරණ යෙදුම්. සෑම අනු කාණ්ඩයක්ම පාඨමාලා අන්තර්ගතය, ප්‍රශ්නාවලියක් සහ සිසුන්ගේ උනන්දුව වැඩි කිරීම සඳහා ඇතුළත් කර ඇති සරල ක්‍රීඩාවක් ඇතුළත් වේ. සංවාද, ඉදිරිපත් කිරීම, කතාව, කාටූන් සහ ඉදිරිපත් කිරීම් යන විවිධ ආකෘති පහකින් අනු කාණ්ඩ පහ සමන්විත වේ. මෙම මොඩියුලයේ සිංහල පිටපත Moodle මෘදුකාංගයෙන් අවසන් කරන ලදී.

මෙම මාර්ගගත වැඩසටහන නිපදවීම සඳහා සුදුසු අන්තර්ජාල පද්ධතියක් සොයා ගැනීම අභියෝගයක් විය.

ආයතනයේ වත්මන් සභාපති මහාචාර්ය එස්.ආර්.ඩී. රෝසා මහතාගේ මැදිහත්වීමෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල සහ දුරස්ථ ඉගෙනුම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ නිල ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය වන e-තක්සලාව වෙත ප්‍රවේශය ලබා දීමට ඔවුන් එකඟ විය. න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ස්වයං අධ්‍යාපන මොඩියුලය https://www.e-thaksalawa.moe.gov.lk/Courses-EN.html හි URL යටතේ e-තක්සලාව තුළට ඇතුළත් කර ඇත. න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණ විද්‍යුත් පොත සිසුන් සඳහා සිංහල භාෂාවෙන් ලබා ගත හැකි විය.




SMART Book, E-තක්සලාව හි සිංහල පිටපත

5.5.4.2 IAEA Webinar මාලාවට දායකත්වය

IAEA TC ව්‍යාපෘතිය RAS0079 සමස්ත අරමුණ වන්නේ ආසියා ශාන්තිකර කලාපයේ රටවල්වල ද්විතීයික පාසල් සිසුන් සහ ගුරුවරුන් අතර න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණ තොරතුරු, අධ්‍යාපනය සහ සන්නිවේදනය පුළුල් කිරීම සහ පවත්වාගෙන යාමයි. මෙම අරමුණ ඇතිව IAEA විසින් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීමේදී න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය (NST) සම්බන්ධ තෝරාගත් මාතෘකා පිළිබඳව කලාපයේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනික webinars මාලාවක් සංවිධානය කෙරිණි. ශ්‍රී ලංකාව මෙහි සැසි දෙකක් ක්‍රියාත්මක කිරීම සඳහා දායක විය. කලාපය තුළ NST සහ එහි යෙදුම ගැන වැඩි විස්තර දැන ගැනීමට කැමති සියලුම සිසුන්, ගුරුවරුන්, විකිරණ ආරක්ෂණ නිලධාරීන් සහ මෙම ක්ෂේත්‍රයේ කටයුතු කරන විද්‍යාත්මක හා තාක්ෂණ නිලධාරීන් සඳහා මෙම webinar විවෘත විය.


Webinar 2 - න්‍යෂ්ටික විද්‍යාවේ මූලික කරුණු - විකිරණ, විකිරණශීලීතාව සහ න්‍යෂ්ටික ප්‍රතික්‍රියා
දිනය: 15 ජූනි 2021
වේලාව: 6:30-9:00 AM (CET) වියානා, ඔස්ට්‍රියාව
මාතෘකා: විකිරණ, විකිරණශීලීතාව සහ න්‍යෂ්ටික ප්‍රතික්‍රියා.
ප්‍රශ්නෝත්තර සැසිය
ඉදිරිපත් කරන්නා: SLAEB සභාපති මහාචාර්ය S.R.D රෝසා



IAEA Webinar- Basics of Nuclear Science -
මහාචාර්ය එස් ආර් ඩී රෝසා (SLAEB හි සභාපති)

Webinar 5 - සමස්ථානික ශිල්පීය ක්‍රම: සමස්ථානික ජල විද්‍යාවේ මූලික මූලධර්ම සහ යෙදුම්

දිනය: 10 අගෝස්තු 2021
වේලාව: 6:30-8:00 AM (CET) වියානා, ඔස්ට්‍රියාව
මාතෘකා: භූගත ජලය ඇතිවීම, සමස්ථානික ජල විද්‍යාවේ මූලික මූලධර්ම, සමස්ථානික ජල විද්‍යාවේ යෙදීම් ප්‍රශ්නෝත්තර සැසිය
ඉදිරිපත් කරන්නා: ආචාර්ය විරාජ් එදිරිසිංහ, කර්මාන්ත යෙදුම් අංශයේ අධ්‍යක්ෂ සහ ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ (ආවරණ) වේ.
R.R.U.R. පෙරේරා, විද්‍යාත්මක නිලධාරී, කර්මාන්ත යෙදුම් අංශය



සමස්ථානික ජල විද්‍යාව පිළිබඳ IAEA Webinar,

ආචාර්ය විරාජ් එදිරිසිංහ - අධ්‍යක්ෂක, කර්මාන්ත යෙදවුම්


5.5.5 විශ්ව විද්‍යාල, පර්යේෂණ සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් සඳහා කාර්මික පුහුණුව/සීමාවාසික/පර්යේෂණ අවස්ථා

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් පහත අරමුණු උදෙසා විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් සඳහා කාර්මික පුහුණුව/සීමාවාසික/පර්යේෂණ අවස්ථා ලබා දීම සිදුකරයි.

- න්‍යෂ්ටික විද්‍යාවේ සහ තාක්ෂණයේ සාමකාමී යෙදීම් ප්‍රවර්ධනය කිරීම සහ දිරිමත් කිරීම
- අයනීකරණ විකිරණ සහ අනුපූරක ශිල්පීය ක්‍රම සම්බන්ධ නව වර්ධනයන් සහ යෙදුම් පිළිබඳ දැනුම බෙදා හැරීම සහ පුද්ගලයින් පුහුණු කිරීම
- රටේ න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සහ මහජන පිළිගැනීමේ මට්ටම ඉහළ නැංවීම
- ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුම සහ අත්දැකීම් අනාගත පරපුරට පැවරීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් 2021 වර්ෂයේදී උපාධි අපේක්ෂකයින් 25 දෙනෙකුට සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 01 දෙනෙකුට පුහුණුව ලබා දී ඇති අතර සවිස්තරාත්මක තොරතුරු පහතින් දක්වා ඇත.





6. ජාත්‍යන්තර සහයෝගිතා අංශය

6.1 ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සහ අනෙකුත් අදාළ ජාත්‍යන්තර ආයතන හරහා ලැබෙන තාක්ෂණික සහයෝගීතාව

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) ජාතික සම්බන්ධීකරණ කාර්යාලය ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ජාත්‍යන්තර සහයෝගිතා අංශය ප්‍රධාන වශයෙන් එහි තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරයි. රටේ සමාජ ආර්ථික සංවර්ධනය කරා යොමු වන න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය දියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගිතාව වැඩසටහන සහ ද්විපාර්ශ්වික ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එය ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සාමාජික රටවල් සමඟ ගනුදෙනු කරයි. අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ නියමයන්ට අනුකූලව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ පිළිගැනීම ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික කේන්ද්‍රීය ආයතනය ලෙස ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කාර්යභාරය මෙම අංශය ඵලදායී ලෙස ඉටු කර ඇත. එනම් රට තුළ න්‍යෂ්ටික තාක්ෂණය ආශ්‍රිත යෙදුම් වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර

පරමාණුක බලශක්ති නියෝජිතායතනය වෙතින් ලැබෙන සැලකිය යුතු ආධාර සහ විශේෂඥ උපදේශණ සේවා ලබා ගැනීමට කටයුතු කිරීමයි.

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සිය සාමාජික රටවලට තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති යටතේ සාමාජිකත්ව, විද්‍යාත්මක චාරිකා, පුහුණු පාඨමාලා, න්‍යෂ්ටික ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු කරන විශේෂඥ මෙහෙයුමක් සහ ව්‍යාපෘති වල සැලසුම් සහගත ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය උපකරණ වැනි තාක්ෂණික සහය ලබා දෙයි. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගිතාව හරහා රටට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මෙම ව්‍යාපෘති සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම ජාත්‍යන්තර සහයෝගිතා අංශයට පවරා ඇත. පහත සඳහන් භූගෝලීය පදනම අනුව ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘති හරහා එවැනි තාක්ෂණික සහාය ලැබේ.

- ජාතික තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති
- කලාපීය තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති (ගිවිසුම්/ ගිවිසුම් නොවන ව්‍යාපෘති).
- අන්තර් කලාපීය තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති.

6.1.1 වෙනත් ව්‍යාපෘති සහ වැඩසටහන්

- පර්යේෂණ කොන්ත්‍රාත් වැඩසටහන (සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘති).
  - න්‍යෂ්ටික බල අධ්‍යයනය සහ සැලසුම් ව්‍යාපෘතිය (ලං.වි.ම සහයෝගිතාවයෙන්).
  - න්‍යෂ්ටික දැනුම කළමනාකරණ ක්‍රියාකාරකම්.
    - ක්‍රියාකාරකම් දින වැඩසටහන (න්‍යෂ්ටික දැනුම බෙදා හැරීම සහ ප්‍රාදේශීය ධාරිතාව ශක්තිමත් කිරීම).
    - ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සංවර්ධනය.
    - අන්තර්ජාලය උපයෝගී කරගෙන කරන දැනුම ලබා ගැනීමේ කටයුතු) ආදී වශයෙන් වෙයි.

මෙම අංශය න්‍යෂ්ටික තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා පහත සඳහන් අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධීකරණය කරයි.

- ආසියා - පැසිපික් කලාපීය සහයෝගිතා සංවිධානය (RCARO).
- අධ්‍යාපන ක්‍රීඩා, සංස්කෘතික විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (MEXT) ජපානය.
- ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JAICA).
- කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA)
- පුකුයි ජාත්‍යන්තර මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය, සුරුගා , ජපානය
- සෛද්ධාන්තික (Theoretical) භෞතික විද්‍යාව සඳහා වූ අන්තර්ජාතික මධ්‍යස්ථානය (ICTP) ට්‍රියස්ටේ, ඉතාලිය.
- රුසියානු රජය සතු පරමාණුක බලශක්ති සංස්ථාව (ROSATOM)

2021 වර්ෂය තුළ, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ අනෙකුත් කලාපීය සහ අන්තර් කලාපීය ව්‍යාපෘති වලට සම්බන්ධ වෙමින් පහත සඳහන් ජාතික තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති දහතුනක් (13ක්) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

COVID-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, ශ්‍රී ලාංකේය විද්‍යාඥයින්ගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා අන්තර්ජාලය හරහා විශේෂඥ සහය කිහිපයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. විදේශීය පුහුණුවීම්, වැඩමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ ආදියට සහභාගී වීමට අදාළ ජාතික ආයතනවල විද්‍යාඥයින්, ඉංජිනේරුවන් සහ

පර්යේෂකයන් හට අවස්ථා හයක් (06) ලැබුණු අතර, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ කලාපීය සහ අන්තර් කලාපීය තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති යටතේ සංවිධානය කරන ලද එවැනි සිදුවීම් සඳහා ප්‍රායෝගිකව සහභාගී වීමට අපගේ විද්‍යාඥයින්ට අවස්ථා ද ලැබී ඇත. 2021 වසරේදී "විදේශීය පුහුණු ඇගයීම් කමිටුව" කමිටුවක් මඟින් එවැනි විදේශීය ඉසව් සඳහා කමිටු රැස්වීම් 14 ක් තුලින් සුදුසු නාමයෝජනා තෝරා ගනු ලැබීය. තවද, මෙම ජාතික ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලද ආයතනවලට සහ ව්‍යාපෘති වල සැලසුම් ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා විවිධ වර්ගයේ වටිනා විද්‍යාත්මක උපකරණ සහ රසායනික ද්‍රව්‍ය 2021 දී ද ලැබුණි. ව්‍යාපෘතිවල සැලසුම් සහගත ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය විවිධ වර්ගයේ වටිනා විද්‍යාත්මක උපකරණ මෙම ජාතික ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන වෙත 2021 වසරේ දී ලැබී ඇත.

6.1.2 2021 දී ක්‍රියාත්මක වන ව්‍යාපෘති

අංක	ව්‍යාපෘති අංක	ව්‍යාපෘතියේ නම
1	SRL/5/050	තේ වල ජාන වැඩිදියුණු කිරීම සඳහා සහය වීම
2	SRL/5/049	එළුවන්ගේ බඩේ පණුවන් ආසාදනය පාලනය කිරීම සඳහා සහය වීම
3	SRL9/011	විකිරණ ප්‍රභවයන් පාලනය කිරීම සඳහා නියාමන යටිතල පහසුකම් ශක්තිමත් කිරීම
5	SRL/6/037	පිළිකා රෝගී සත්කාර කළමනාකරණයේදී භාවිත කරන අණුක රූපකරණ ශිල්පීය ක්‍රම සඳහා අවශ්‍ය රේඩියෝ ඖෂධ නිෂ්පාදනය සඳහා වෛද්‍ය සයික්ලොට්‍රෝන් පහසුකම ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සමඟ සාකච්ඡා කර රටේ ජාතික පාර්ශවකරුවන්ගේ ආයතන විසින් සකස් කරන ලද පහත සඳහන් ජාතික ව්‍යාපෘති යෝජනා හයක් (06) මීළඟ තාක්ෂණික සහයෝගීතා චක්‍රය 2022/23 සඳහා සලකා බැලීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය වෙත ඉදිරිපත් කරන ලදී.

ඉදිරිපත් කරන ලද සංකල්ප හත මූලික වශයෙන් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් සැලසුම් අදියර යටතේ වැඩිදුර සංවර්ධනය සඳහා පිළිගෙන ඇති අතර ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සංකල්ප අතෙන් ව්‍යාපෘති ගණනාවක් පිළිගැනීමට යටත්ව මෙම ව්‍යාපෘති හරහා තාක්ෂණික අනුග්‍රහය ලැබීමට නියමිතය. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2022 දී ආරම්භ කෙරේ.

6.1.3 තාක්ෂණික සහයෝගීතා 2022/23 චක්‍රය සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය වෙත ඉදිරිපත් කරන ලද ජාතික ව්‍යාපෘති යෝජනා

අංකය	ව්‍යාපෘති මාතෘකාව	ව්‍යාපෘතියේ නම
1	**SRL1010**	කාර්මික ඵලදායිතාව සඳහා උසස් විකිරණශීලී ක්‍රම සහ අනෙකුත් උසස් NDT ක්‍රම භාවිතය වැඩි කිරීම".
2	**SRL2011**	න්‍යෂ්ටික බල ව්‍යාපෘතිය සඳහා ජාතික මට්ටමෙන් යටිතල පහසුකම් දියුණු කිරීම
3	**SRL6038**	පිළිකා රෝගී සත්කාර කළමනාකරණයේදී භාවිතා කරන අණුක රූපකරණ ශිල්පීය ක්‍රම සඳහා අවශ්‍ය රේඩියෝ ඖෂධ නිෂ්පාදනය සඳහා වෛද්‍ය සයික්ලොට්‍රෝන් පහසුකම ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම (අදියර II)
4	**SRL9012**	ශ්‍රී ලංකාවේ රෝගීන් සඳහා සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා විකිරණ ආරක්ෂණ හැකියාවන් සහතික කිරීම මගින් ගුණාත්මක හා මුල් පිළිකා රෝග විනිශ්චය සහ විවිධ ප්‍රතිකාර ක්‍රම සඳහා සමාන ප්‍රවේශය වැඩි දියුණු කිරීම
5	**SRL9013**	න්‍යෂ්ටික හෝ විකිරණ හදිසි අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීමේ ජාතික හැකියාවන් ශක්තිමත් කිරීම.

6	SRL5051	දේශගුණික ස්මාර්ට් කෘෂිකාර්මික භාවිතයන් හරහා හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ධාරිතා ගොඩනැගීම.

6.1.4 අසියා - පැසිපික් කලාපීය සහයෝගීතා සමුළුව (RCA)

RCA යනු ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ අනුග්‍රහය යටතේ ආසියා සහ පැසිපික් කලාපය සඳහා වන අන්තර් රාජ්‍ය ගිවිසුමකි. ආසියා සහ පැසිපික් කලාපය සඳහා න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණයේ සාමකාමී යෙදීම් සඳහා පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන කලාපීය සහයෝගීතා ගිවිසුම (RCA) යනු දකුණු ආසියාවේ, අග්නිදිග ආසියාව, පැසිෆික් සහ ඈත පෙරදිග පිහිටා ඇති ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සාමාජික රටවල් අතර අන්තර් රාජ්‍ය ගිවිසුමකි.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ RCA ව්‍යාපෘති සමාජ-ආර්ථික අවශ්‍යතා සපුරාලීමට සහ රටේ තිරසාර සංවර්ධනයට දායක වීමට න්‍යෂ්ටික තාක්ෂණයන් සපයයි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේ,

- කෘෂිකර්ම
- පරිසරය
- කර්මාන්තය
- මානව සෞඛ්‍ය සහ
- විකිරණ ආරක්ෂණය

ශ්‍රී ලංකාව දැනට ඉහත ක්ෂේත්‍රවල RCA ව්‍යාපෘති 14කට සහභාගී වේ. මෙම RCA ව්‍යාපෘති හරහා, ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින්ට COVID19 වසංගතය නොතකා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් සංවිධානය කරන ලද විවිධ ආකාරයේ රැස්වීම්, පුහුණුව, වැඩමුළු ආදියට අන්තර්ජාලය හරහා සහභාගී වීමට අවස්ථාව ලැබුණි. රට තුළ RCA ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපකරණ කිහිපයක් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය වෙතින් ඉල්ලා ඇති අතර ඒවා ලැබීමට නියමිතය.

COVID19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවට 2021 දී ශ්‍රී ලංකාවේ කිසිදු ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ කිසිදු සම්මන්ත්‍රනයක් පැවැත්වීමට නොහැකි විය.

6.1.5 ශ්‍රී ලංකාවේ මැදිහත්වීමෙන් පර්යේෂණ ව්‍යාපෘති සම්බන්ධීකරණය (CRP)

2021 කාලය තුළ ශ්‍රී ලංකා විද්‍යාඥයින් සම්බන්ධ CRP ව්‍යාපෘති ලැයිස්තුව:

- D52038 - ආහාර සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන සත්‍යාපනය කිරීමේදී සොයා ගැනීමේ පද්ධතියක් ලෙස ස්ථායී සමස්ථානික සහ බහු මූලද්‍රව්‍ය විශ්ලේෂණය භාවිත කිරීම.
- D52040 - ශ්‍රී ලංකාව තුළ ආනයනය කරන ලද සහ දේශීයව නිෂ්පාදනය කරන ලද කිරිපිටි වල සත්‍යතාව, ආරක්ෂාව සහ ගුණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා වේගවත් පරීක්ෂණ ක්‍රම සංවර්ධනය කිරීම.
- J02012 - පවතින රේඩියෝනියුක්ලයිඩ් හඳුනා ගැනීමේ උපාංග (RIDs) හඳුනා ගැනීමේ හැකියාවන් විමර්ශනය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- F32007 - ගංගා සහ විල්වල නයිට්‍රජන් දූෂණය සහ Eutrophication සමස්ථානික අධ්‍යයනය කිරීම.
- J 02005 - භයානක බහාලුම්වල (Alarming Containers) විකිරණ හඳුනා ගැනීමේ දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීම.

- CRP K41016 - සමස්ථානික සහ න්‍යෂ්ටික මෙවලම් යෙදීමෙන් තෝරාගත් වෙරළබඩ ප්‍රදේශවල පරිසර දූෂණයේ තාවකාලික ප්‍රවණතා අධ්‍යයනය කිරීම.
- F23032 - "සංරක්ෂිත ද්‍රව්‍ය සහ සංස්කෘතික උරුම කෞතුක වස්තු සංරක්ෂණය කිරීම සඳහා විකිරණ ප්‍රතිකාර ක්‍රම සහ නව සූත්‍ර සංවර්ධනය කිරීම"
- K41015- "ශ්‍රී ලංකාවේ සමුද්‍ර පැලියෝ-වාර්තා වල දේශගුණික ප්‍රවණතා සහ විචල්‍යතා පිළිබඳ විකිරණ විශ්ලේෂණ හා සමස්ථානික අධ්‍යයනය"
- I12007 – “කුඩා හා මධ්‍ය පරිමාණ මාපාංකික ((Small & medium scaled modular) න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරක (SMR) ව්‍යාපෘතිවල ආර්ථික තක්සේරුව: ක්‍රමවේද සහ යෙදුම්”
- J02014 - විකිරණ හඳුනා ගැනීමේ උපකරණවල නඩත්තුව, අලුත්වැඩියාව සහ ක්‍රමාංකනය දියුණු කිරීම

මානව සම්පත් සංවර්ධනය වැඩි දියුණු කිරීම මඟින් කලාපීය ගැටළු විසඳීම සඳහා RCA වෙතින් ගිවිසුම් නොවන කලාපීය ව්‍යාපෘති සකස් කර ඇත. එම ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක විය. විකිරණ තාක්ෂණය භාවිතා කරන ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සාමාජික රටවල කර්මාන්ත, වෛද්‍ය සහ කෘෂිකර්ම යන ක්ෂේත්‍රවල විශිෂ්ටතා ඇති ආයතන වල පුහුණුවීම්, රැස්වීම් සහ වැඩමුළුවලට සහභාගී වීමට දේශීය විද්‍යාඥයින්ට සහ අනෙකුත් නිලධාරීන්ට අවස්ථාව ලබා දීම සහ දෙවනුව විශේෂඥ සේවය සැපයීම සඳහා මානව සම්පත් සංවර්ධනය කර ඇත.

2021 වර්ෂය තුළ අන්තර් කලාපීය ව්‍යාපෘති එකක් (01) ක්‍රියාවට නංවා ඇති අතර එක් කලාපයකට පමණක් නොව අනෙකුත් ප්‍රදේශවලට ද අදාළ පවතින ගැටලු විසඳීම සඳහා මෙවැනි ව්‍යාපෘති සංවර්ධනය කර ඇත. ඉහත සඳහන් කළ ව්‍යාපෘති කාණ්ඩවල ක්‍රියාකාරකම් වලට අමතරව, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය විසින් න්‍යෂ්ටික විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ සේවය කරන එහි සාමාජික රටවලට නිලධාරීන්ට කලාපීය වශයෙන් පුහුණුවීම්, වැඩමුළුව, රැස්වීම්, සම්මන්ත්‍රණ සහ සම්මන්ත්‍රණවලට සහභාගී වීමෙන් ජාත්‍යන්තර නිරාවරණය ලබා ගැනීමට අවස්ථාව සලසා දෙයි.

2021 වසර තුළ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට පහත සඳහන් ආයතනවලින් මාර්ගගත ක්‍රමයට (virtual) පාදක දැනුම බෙදාගැනීමේ/පුහුණු අවස්ථා කිහිපයක් ලැබිණි. ජපානයේ අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (MEXT), කොරියාවේ ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA), පුකුයි ජාත්‍යන්තර මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය, සුරුගා , ජපානය, දකුණු කොරියාවේ කලාපීය සහයෝගීතා ගිවිසුම් ප්‍රාදේශීය කාර්යාලය (RCARO),සෛද්ධාන්තික (Theoretical) භෞතික විද්‍යාව සඳහා වූ අන්තර්ජාතික මධ්‍යස්ථානය (ICTP) ට්‍රියස්ටේ, ඉතාලිය සහ රුසියානු රජය සතු පරමාණුක බලශක්ති සංස්ථාව (ROSATOM) රටට ඉමහත් ප්‍රයෝජනවත් විය.

6.1.6 විදේශ පුහුණු ඇගයීම් කමිටුව (FTEC)

2021 වර්ෂයේදී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ විදේශ පුහුණු ඇගයීම් කමිටු (FTEC) දහහතර (14) රැස්වීමක් පවත්වා විදේශයන්හි තාක්ෂණික රැස්වීම්, වැඩමුළු, පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම සඳහා රාජ්‍ය ආයතනවල (අභ්‍යන්තරව සහ බාහිරව) අදාළ නිලධාරීන්ට කටයුතු සම්පාදනය කරන ලදී.

6.2 න්‍යෂ්ටික දැනුම කළමනාකරණය **(Nuclear Knowledge Management)**

න්‍යෂ්ටික දැනුම කළමනාකරණය මූලික කොටස් තුනකින් සමන්විත වේ:

- පුද්ගලයන්

- ක්‍රියාවලි සහ
- තාක්ෂණය

න්‍යෂ්ටික දැනුම බෙදාගැනීම සහ භාවිතය උත්තේජනය කිරීම සහ පෝෂණය කිරීම සඳහා දැනුම කළමනාකරණය පුද්ගලයන් සහ ආයතනික සංස්කෘතිය කෙරෙහි අවධානය යොමු කරයි. න්‍යෂ්ටික දැනුම සොයා ගැනීමට, නිර්මාණය කිරීමට, ග්‍රහණය කර ගැනීමට සහ බෙදා ගැනීමට ක්‍රියාවලි හෝ ක්‍රම පිළිබඳව සහ දැනුම ගබඩා කර තබා ගැනීමට සහ ප්‍රවේශ විය හැකි බවට පත් කිරීමට සහ මිනිසුන් එකට ස්ථානගත නොවුනත් එකට වැඩ කිරීමට ඉඩ සැලසීමට තාක්ෂණය මත, දැනුම කළමනාකරණය කිරීම මිනිසුන්ගේ දැනුම බෙදා ගැනීමට සහ නැවත භාවිතා කිරීමට ඇති කැමැත්ත මත රඳා පවතින වඩාත් වැදගත් අංගයකි. දැනුම කළමනාකරණ වැඩසටහන් සාමාන්‍යයෙන් ආයතනික අරමුණු සමඟ බැඳී ඇති අතර බෙදාගත් බුද්ධිය, වැඩිදියුණු කළ කාර්ය සාධනය, තරඟකාරී වාසි හෝ ඉහළ මට්ටමේ නවෝත්පාදන වැනි නිශ්චිත ප්‍රතිඵල අත්කර ගැනීමට අදහස් කෙරේ. ජාත්‍යන්තර ක්‍රියාකාරකම් සහභාගි වූ නිලධාරීන්ට තම දැනුම උනන්දුවක් දක්වන අනෙකුත් පිරිස් අතර බෙදා ගැනීමට හැකි වන පරිදි ක්‍රියාකාරකම් වැඩසටහන් කිහිපයක් පැවැත්වීමට අංශයට හැකි විය.

6.3 න්‍යෂ්ටික බලශක්ති අධ්‍යයනය සහ සැලසුම් වැඩසටහන - 2021

රුසියානු සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර න්‍යෂ්ටික විද්‍යාවේ සහ තාක්ෂණයේ සාමකාමී භාවිත වන විදුලිබල උත්පාදනය සහ අනෙකුත් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම සම්බන්ධයෙන් වන ද්වීපාර්ශවික අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන් සාකච්ඡා / රැස්වීම්වලට 2021 වර්ෂය තුල සහභාගී විය.

දිනය	ස්ථානය	සහභාගී වන ආයතන	සටහන
2021 අප්‍රේල් මස 21 වන දින සාකච්ඡාව	විදුලි බල අමාත්‍යාංශය, කොළඹ 03	කොළඹ පිහිටි රුසියානු තානාපති කාර්යාලය, විදුලි බල අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන්	ව්‍යාපෘති සම්බන්ධ ගැටළු නිරාකරණය
2021 අප්‍රේල් මස 29 වන දින සාකච්ඡාව	විදුලි බල අමාත්‍යාංශය, කොළඹ 03	විදුලි බල අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන්	අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධ ගැටළු නිරාකරණය
2021 ජුනි මස 24 වන දින සාකච්ඡාව	මාර්ගගත ක්‍රමය	රුසියානු සමූහාණ්ඩුව වෙනුවෙන් එහි රාජ්‍ය පරමාණුක බලශක්ති සංස්ථාව (“රෝස් ඇටම්” සමාගම සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන්	ද්වී පාර්ශවික අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සහ යෝජිත රේඩියෝ ඖෂධ නිෂ්පාදනය සඳහා වෛද්‍ය සයික්ලොට්‍රෝන් පහසුකම ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම
2021 ජුනි මස 30 වන දින සාකච්ඡාව	මාර්ගගත ක්‍රමය	රුසියානු සමූහාණ්ඩුව වෙනුවෙන් එහි රාජ්‍ය පරමාණුක බලශක්ති සංස්ථාව (“රෝස් ඇටම්” සමාගම සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන්	යෝජිත ද්වී පාර්ශවික අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම
2021 ජුලි මස 22 වන දින සාකච්ඡාව	විදුලි බල අමාත්‍යාංශය, කොළඹ 03	විදුලි බල අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන්	ගරු සූර්ය, සුළං සහ ජල විදුලි බලාගාර ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා වෙත යෝජිත රුසියානු

			ද්වී පාර්ශවික අවබෝධතා ගිවිසුම ,සහ න්‍යෂ්ටික බල සැලසුම් වැඩසටහනේ වත්මන් තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීම
2021 අගෝස්තු මස 24 වන දින සාකච්ඡාව	මාර්ගගත ක්‍රමය	පරිසර අමාත්‍යාංශය, විදුලි බල අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන්	පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාට යෝජිත රුසියානු ද්වී පාර්ශවික අවබෝධතා ගිවිසුම සහ න්‍යෂ්ටික බල සැලසුම් වැඩසටහනේ වත්මන් තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් 2021 ජූලි 12 වැනි දින ශ්‍රී ලාංකික න්‍යෂ්ටික වෘත්තිකයන්ට "න්‍යෂ්ටික බලශක්ති තාක්ෂණය සහ එහි නෛතික සහ නියාමන රාමුවක් ක්‍රියාත්මක කිරීම" සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියාවේ GNE ආයතනයේ උපදේශක, හෙලන් කුක් මහත්මියගේ මෙහෙයවීම මත දේශනයක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය සමඟ එක්ව 2018 වසරේ සිට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ " ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන සඳහා මාර්ග සිතියමක් ස්ථාපිත කිරීම" පිළිබඳ ව්‍යාපෘතිය දියත් කරන ලදී. ශ්‍රී ලංකා සන්දර්භය තුළ න්‍යෂ්ටික බලය ශක්‍ය විකල්පයක් ලෙස සැලකීම සඳහා දේශපාලන, ආර්ථික, සමාජ විද්‍යාත්මක, තාක්ෂණික, පාරිසරික සහ නෛතික අංශයන් අධ්‍යනය කිරීමට තාක්ෂණික සහය ලබා ගැනීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වෙයි. මේ වන විට ශ්‍රී ලංකාව විදුලිය උත්පාදනය සඳහා සිය ජල සම්පත්වල සන්තෘප්තිය බොහෝ දුරට ළඟා කර ගෙන ඇති අතර රටේ විදුලි නිෂ්පාදනයෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයකට ළඟා වෙමින් විදුලි නිෂ්පාදනය සඳහා ආනයනික පොසිල ඉන්ධන මත යැපීම වැඩි වී තිබේ. ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව 5-6%ක විදුලි ඉල්ලුම වැඩි වීම සහ රට තුළ අපේක්ෂිත අනාගත සංවර්ධනයන් සමඟ, දිගුකාලීනව රටට තවත් බලශක්ති ප්‍රභවයන් අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.ආනයනික ෆොසිල ඉන්ධන මත අධික ලෙස යැපීම වැළැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා විකල්ප බලශක්ති සැපයුම් විකල්පයන් ගවේෂණය කිරීම ඉතා වැදගත් වේ. දේශගුණික විපර්යාස වැලැක්වීමට සහ රටේ මෙන්ම කලාපයේ සමාජ-ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමේ මාධ්‍යක් ලෙස න්‍යෂ්ටික බලය වඩ වඩාත් වැදගත් වනු ඇත. ශ්‍රී ලංකාව දුප්පත් රාජ්‍යක් වන බැවින් න්‍යෂ්ටික බලාගාර හඳුන්වාදීම සහ ඒවායේ පිහිටීම අසල්වැසි රටවල් අතර කලාපීය සහයෝගීතාවයේ එකඟතාව සමඟ හොඳින් හඳුනාගත යුතුය.

- තවද, ඉහත සඳහන් කළ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.
- න්‍යෂ්ටික දැනුම වෙනස් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කරමින් මහජන පිළිගැනීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්පාදනය කරන ලදී.
- න්‍යෂ්ටික බල සැලසුම් ව්‍යාපෘතියට අදාළ මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ජාත්‍යන්තර මට්ටමේ පුහුණුවක් ලබා දීමෙන් සහ පාර්ශවකාර ආයතන වලින් ඉන්ජිනේරුවන්/විද්‍යාඥයින් සහ තාක්ෂණික පිරිස් ශක්තිමත් කිරීම කරන ලදී.
- 2020-2039 ලංවිම අවම පිරිවැය දිගුකාලීන ජනන සහ ව්‍යාප්ති සැලැස්ම යටතේ න්‍යෂ්ටික බල සැලසුම් ව්‍යාපෘතිය පිළිබඳ යෝජනා ඉදිරියට ගෙන යාමට අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සහය හරහා ජාත්‍යන්තර සහයෝගීතාව ලබා ගැනීම කරන ලදී.
- න්‍යෂ්ටික බලශක්ති ප්‍රභවයන් මත පදනම් වූ ශ්‍රී ලංකා රාජ්‍යයේ ප්‍රතිපත්තිය සන්නද්ධ කිරීම සහ ශක්තිමත් කරන ලදී.
- 2021 තුළ ස්වයං ඇගයීම් වාර්තාව සහ විස්තීරණ වාර්තාව සකස් කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායම් වාර්තා කෙටුම්පත් කරන ලදී.
- අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ විශේෂඥයින් මෙන්ම දේශීය විශේෂඥයින්ගෙන් කෙටුම්පත් කරන ලද ස්වයං ඇගයීම් වාර්තාව සමාලෝචනය කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී.

- 2022-2023 තාක්ෂණික සහයෝගිතා චක්‍රය සඳහා "ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බල යටිතල පහසුකම් සංවර්ධනය" පිළිබඳ අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී.
- සාමාජික රාජ්‍යයන් අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ වෙත ඔවුන්ගේ සංවර්ධනය සහ යෙදවීම සඳහා ආර්ථික ඇගයීම් රාමුවක් ලබා දීමෙන් ක්ෂුද්‍ර ප්‍රතික්‍රියාකාරක ඇතුළු කුඩා මොඩියුල ප්‍රතික්‍රියාකාරකවල ආර්ථික විද්‍යාව කෙරෙහි අවධානය යොමු කිරීම අනුව සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘතියට සම්බන්ධ විය.
- 2021/2022 කාල සීමාව තුළ අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ විශේෂඥයින්ගේ සමාලෝචනයට අනුව ස්වයං-ඇගයුම් වාර්තාව සහ විස්තීරණ වාර්තාව සංශෝධනය කරන ලදී.
- ඕස්ට්‍රේලියාවේ GNE උපදේශක හෙලන් කුක් මහත්මියගේ සහ ඇයගේ විශේෂඥ කණ්ඩායමේ සහය ඇතිව කෙටුම්පත් කරන ලද ස්වයං ඇගයීම් වාර්තාව සමාලෝචනය කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී.
- 2021 අගෝස්තු 25 සිට 26 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලශක්ති යටිතල ව්‍යුහයේ තත්ත්වය පිළිබඳ අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ වැඩමුළුව අතථ්‍ය ආකෘතියක් ලෙස පැවැත්වීමට සම්බන්ධීකරණය කරන ලදී.

- ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යාම 2022-2023 තාක්ෂණික සහයෝගිතා චක්‍රය සඳහා "ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බල යටිතල පහසුකම් සංවර්ධනය" පිළිබඳ අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් SRL/2011 ආරම්භ කිරීමට කටයුතු සම්පාදනය සම්පාදනය කරන ලදී.
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘතියට සහභාගි වූයේ "ක්ෂුද්‍ර ප්‍රතික්‍රියාකාරක ඇතුළුව කුඩා මොඩියුල ප්‍රතික්‍රියාකාරකවල කෙරෙහි අවධානය යොමු කිරීම, සාමාජික රටවලට ඔවුන්ගේ සංවර්ධනය සහ අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ වෙත යෙදවීම සඳහා ආර්ථික ඇගයීම් රාමුවක් ලබා දීමෙනි.

- මීට අමතරව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ අන්තර් කලාපීය ව්‍යාපෘතිය INT/ 2023: සහය කුඩා මොඩියුලර් ප්‍රතික්‍රියාකාරක සහ ක්ෂුද්‍ර ප්‍රතික්‍රියාකාරක මත සාමාජික රටවල ධාරිතා ගොඩනැගීම සහ න්‍යෂ්ටික බලයේ දායකත්වයක් ලෙස ඔවුන්ගේ තාක්ෂණය සහ යෙදුම්, දේශගුණික විපර්යාස අවම කිරීම. තවද, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ලංකා විදුලිබල මණ්ඩලයෙන් නාමයෝජනා ඉල්ලා සිටී. විදුලි ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්වවිද්‍යාලය සහ දෙපාර්තමේන්තුව අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ වැඩමුළු/පුහුණුව සඳහා සහභාගී වීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විදුලි ඉංජිනේරු විද්‍යාව අනුව දැනුම සහ නිරාවරණය ලබා ගැනීම සඳහා පාඨමාලා සහ තාක්ෂණික රැස්වීම් න්‍යෂ්ටික බලශක්ති අධ්‍යනය සහ සැලසුම් සම්පාදනය කරන ලදී.

6.3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් සහ මෙහෙයුම් කමිටු රැස්වීම්

අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සංධිස්ථාන ප්‍රවේශයට අනුව ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා 2021 තුළ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්, මෙහෙයුම් කමිටු රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. ඊට අමතරව, "ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලය විකල්පයක් ලෙස" අධ්‍යනය කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායම්/ මෙහෙයුම් කමිටු සඳහා රැස්වීම් පවත්වන ලදී.

රැස්වීමේ නම	සහභාගී වන ආයතන	ස්ථානය	දිනය
ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම	ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා පරමාණු බලශක්ති නියාමන සභාව සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන්	මාර්ගගත ක්‍රමය	2021 පෙබරවාරි මස 10 වන දින

සාමකාමී අරමුණු සඳහා න්‍යෂ්ටික බලශක්තිය සාමකාමීව භාවිත කිරීමේ ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳ ශ්‍රී ලංකාව සහ රුසියාව අතර යෝජිත ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා සාකච්ඡා/රැස්වීම් පැවැත්වීම කරන ලදී.

දිනය	ස්ථානය	සහභාගී වන ආයතන	සටහන
2021 දෙසැම්බර් මස 22 වන දින සාකච්ඡාව	විදුලි බල අමාත්‍යාංශය, කොළඹ 03	රුසියානු සමූහාණ්ඩුව වෙනුවෙන් එහි රාජ්‍ය පරමාණුක බලශක්ති සංස්ථාව (“රෝස් ඇටම්” සමාගම සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන්	ව්‍යාපෘතිය සම්බන්ධ ගැටළු නිරාකරණය

මීට අමතරව, **" ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලය විකල්පයක් ලෙස"** අධ්‍යනය කිරීම සඳහා සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ක්‍රියාකාරී කණ්ඩායම්/ මෙහෙයුම් කමිටු සඳහා රැස්වීම් පවත්වන ලදී.

සටහන	සහභාගී වන ආයතන	ස්ථානය	දිනය
පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාට යෝජිත රුසියානු ද්වී පාර්ශවික අවබෝධතා ගිවිසුම සහ න්‍යෂ්ටික බල සැලසුම් වැඩසටහනේ වත්මන් තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීම	පරිසර අමාත්‍යාංශය, විදුලි බල අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ නිලධාරීන්	මාර්ගගත ක්‍රමය	2021 අගෝස්තු මස 24 වන දින සාකච්ඡාව

7.0 පරිපාලන, මානව සම්පත් හා ප්‍රසම්පාදන අංශය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය රටේ සහ රජයේ යහපත උදෙසා පරිපාලනය කිරීමේ වගකීම පරිපාලන අංශය සතු වන අතර පනතේ නීතියට සහ රජයේ අදාළ වෙනත් නීතිමය අවශ්‍යතා හා රෙගුලාසි වලට අනුකූල වේ. කාර්යාල සහ කාර්යාල පද්ධති කාර්යක්ෂමතා කළමනාකරණය, සාමාන්‍ය පරිපාලනය, ප්‍රසම්පාදනය, මානව සම්පත් කළමනාකරණය, ධාරිතාව ගොඩනැගීම, ප්‍රවාහනය සහ විද්‍යාත්මක නොවන උපකරණ නඩත්තු කිරීම සහ ගොඩනැගිලි මෙම අංශයේ විෂය පථයට අයත් ප්‍රධාන ක්ෂේත්‍ර වේ. වාර්ෂික පරිපාලන වාර්තා පිළියෙල කිරීම, මානව සම්පත් සංවර්ධනය, විද්‍යාත්මක නොවන උපකරණ හා ගොඩනැගිලි නඩත්තු කිරීම, සේවක යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කිරීම, ප්‍රාග්ධන අයවැය යාවත්කාලීන කිරීම් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම, නිශ්චිත ලේඛන, වාර්තා සකස් කිරීම සඳහා සහය වීම මෙම අංශය විසින් වගකීම දරයි. ඉහළ බලධාරීන්, කාර්යක්ෂම තොරතුරු හා සන්නිවේදන පද්ධති ස්ථාපිත කිරීම, උපයෝගිතා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කළමනාකරණය කිරීම, උපයෝගිතා සේවා කළමනාකරණය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙහි විද්‍යාත්මක හා විද්‍යාත්මක නොවන අංශ විසින් ඉල්ලා සිටින වෙනත් උපකාරක සේවාවන් ලබා දීම වේ.

7.1 පරිපාලන, මානව සම්පත් සහ ප්‍රසම්පාදන අංශයේ සේවක සංඛ්‍යාව

අධ්‍යක්ෂක	: 01
නියෝජ්‍ය අධ්‍යක්ෂ	: 01
පරිපාලන නිලධාරී	: 01
කළමනාකරණ සහකාර - ප්‍රසම්පාදන අංශය	: 03
කළමනාකරණ සහකාර - පුද්ගලික ගොනුව	: 02
කළමනාකරණ සහකාර - HRD/EB/Exam	: 02
කළමනාකරණ සහකාර - නඩත්තු ඒකකය	: 01
කළමනාකරණ සහකාර - DG ඒකකය	: 01
කළමනාකරණ සහකාර - ප්‍රවාහන අංශය	: 01
කළමනාකරණ සහකාර - සභාපතිගේ ඒකකය	: 01
කළමනාකරණ සහකාර - පිළිගැනීමේ නිලධාරියා	: 01
කළමනාකරණ සහකාර - නිවාඩු/පැමිණීම	: 01
කළමනාකරණ සහකාර - සාමාන්‍ය පරිපාලක	: 01
විදුලි නඩත්තු ශිල්පී	: 01
රියදුරු	: 05
කාර්යාල සහායක	: 06

7.2 පරිපාලන අංශය විසින් සිදු කරනු ලබන අනෙකුත් ක්‍රියාකාරකම්වල සාරාංශය

1. වසරේ ආරම්භකදින රාජ්‍ය උත්සවයට සමගාමීව වැඩසටහන් කිරීම
2. පුහුණු සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සහ මානව සම්පත් සැලැස්ම සඳහා මණ්ඩල අනුමැතිය ලබාගැනීම
3. බඳවා ගැනීමේ ක්‍රමය සකස් කර කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.
4. ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය සහ සියලුම ද්විතීයික සහ තෘතීයික මට්ටම් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම
5. චක්‍රලේඛ වලට අනුව 2021 දිරිදීමනා ගෙවීම සඳහා මණ්ඩල අනුමැතිය ලබාගැනීම
6. අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත ඉතිරි වෛද්‍ය නිවාඩු ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම
7. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව රුපියල් 4000/= ක විශේෂ දීමනා ගෙවීමට කටයුතු කිරීම
8. සියලුම කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම
9. ගොඩනැගිලි සඳහා ඉඩම් නිරවුල්කරගැනීම සිදු වෙමින් පවතී. අදාළ බලධාරීන් සමඟ රැස්වීමට සහභාගී විය.
10. කාර්ය මණ්ඩලය සඳහා සූදානම් කර මාසික වැටුප් ගෙවීම
11. COVID 19 මත කාර්ය මණ්ඩල සෞඛ්‍ය ආරක්ෂාව සඳහා මුහුණු ආවරණ, සනීපාරක්ෂක, සබන්, දියර සබන්, අත්වැසුම් සහ අනෙකුත් සෞඛ්‍ය ද්‍රව්‍ය ලබා දීම
12. COVID 19 පිළිබඳ දැනුවත් කිරීමේ කාර්යය
13. කාර්ය මණ්ඩලය සඳහා COVID 19 එන්නත් ලබාදීම සම්බන්ධීකරණය කිරීම
14. COVID 19 බලපෑමට ලක්වූවන් සඳහා ආහාර පැකේජය ලබාදීම
15. ඩෙංගු මර්දන වැඩසටහන් පැවැත්වීම
16. රජයේ විගණන හා අභ්‍යන්තර විගණනයේ අදාළ විගණන ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීම
17. වෙබ් පාදක ඇඟිලි සලකුණු පැමිණීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම
18. කාර්ය මණ්ඩලය තහවුරු කිරීම සඳහා මණ්ඩල අනුමැතිය ලබාගැනීම

19. අමාත්‍යාංශය, වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිසම අඩිය සම්බන්ධීකරණය කිරීම
20. 2022 අයවැය සඳහා වැටුප් විස්තර සකස් කිරීම
21. ශ්‍රේණියේ උසස්වීම් ලබා දීම
22. කළමනාකරණ සහකාර - III ශ්‍රේණිය සඳහා NVQ 4 ලබා දීම
23. නගර සභාව සමඟ සම්බන්ධීකරණය
24. ආයතනයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා සංසරණ අභ්‍යන්තර චක්‍රලේඛ සැකසීම
25. සියලුම විශ්‍රාමික හා අදාළ ඉල්ලා අස් වූ කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාම යන හෝ ඉල්ලා අස් වූ දිනයේ පාරිතෝෂික ගෙවීමට කටයුතු කිරීම
26. ඵලදායිතා සංකල්පය ආරම්භ කිරීම
27. 2/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කාර්යමණ්ඩල කාර්ය සාධන ඇගයුම් පටිපාටිය සිදු කිරීම
28. මානව සම්පත් සංවර්ධනය සඳහා රු. 1,270,180/= වියදම් කිරීම
29. සේවා ලිපි නිකුත් කිරීම
30. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සේවක වන්දි රක්ෂණයක් ලබා දීම
31. 2021 දී විශ්‍රාම ගිය, ඉල්ලා අස් වූ සේවකයෙකු සඳහා ගෙවන ලද EPF/ETF සහ පාරිතෝෂිත ගෙවීම
32. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම
33. කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නිල ඇඳුම් ලබා දී ඇත
34. සන්නිවේදන පහසුකම් සැපයීම
35. විනය පරීක්ෂණ පැවැත්වීම
36. හරිත උයන නඩත්තු කිරීම.
37. සනීපාරක්ෂක සහ ආරක්ෂක සේවා අධීක්ෂණය
38. නව ගොඩනැගිලි සේවා සහ උපකරණ සමඟ ගිවිසුම් අත්සන් කිරීම සම්පූර්ණ කිරීම
39. සියලුම කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය රක්ෂණයක් ලබා දීම
40. විද්‍යාත්මක කාර්ය මණ්ඩලය සහ අනෙකුත් විද්‍යාත්මක නොවන කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය පරීක්ෂණයක් ලබා දීම
41. සියලුම කාර්ය මණ්ඩලය සඳහා සේවක වන්දි රක්ෂණයක් ලබාගෙන ඇත
42. සංක්‍රමණ රක්ෂණයෙන් මුදල් ලබා ගැනීම
43. යටිතල පහසුකම් ලබා දීම. (ජලය, විදුලිය සහ දුරකථන)
44. වාහන සංචිතය නඩත්තු කිරීම සහ විධායක කාර්ය මණ්ඩලය සඳහා කණ්ඩායම් ප්‍රවාහනය සැපයීම
45. කාර්ය මණ්ඩල උසස් කිරීම සඳහා කාර්ය මණ්ඩල දුක්ගැනවිලි කමිටු නිර්දේශය ක්‍රියාත්මක කිරීම
46. පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම
47. විදේශ පුහුණු බැඳුම්කර සහ ගිවිසුම් පවත්වාගෙන යාම
48. කාර්ය මණ්ඩලයේ වත්කම් හා බැරකම් ප්‍රකාශය පවත්වාගෙන යාම රැස්වීම් සහ සිදුවීම් සඳහා ප්‍රණීත ආහාර සැපයීම
49. කාර්ය මණ්ඩලය තහවුරු කිරීම සඳහා මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
50. සියලුම එන ලිපි සහ පිටතට යන තැපැල් හැසිරවීම
51. පාරිභෝගික සේවා/පිළිගැනීමේ සේවාව ලබා දීම
52. නීති රීති පවත්වාගෙන යාම
53. පුවත් පත්‍රිකා සැපයීම
54. ප්‍රසම්පාදන අයිතම 2021 සම්පූර්ණ කළ නිෂ්කාශනය කිරීම

55. වාර්තා කාමරය පවත්වාගෙන යාම.
56. කාර්ය මණ්ඩල නිවාඩු සහ පැමිණීම පවත්වා ගැනීම
57. කම්කරු දෙපාර්තමේන්තුවේ පරීක්ෂණවලට සහභාගී විය.
58. දෙදින උපාය මාර්ගික සැලසුම් වැඩමුළුව සම්බන්ධීකරණය කිරීම
59. විගණන කරුණු සහ වැටුප් විෂමතා පිළිබඳ සම්බන්ධීකරණ මණ්ඩල අනුකමිටු හා රැස්වීම් 10 ක් පැවැත්වීම
60. කාර්ය මණ්ඩලය සඳහා සූදානම් කළ වැඩ උපදෙස් ක්‍රියා පටිපාටි පරිපාලනය කිරීම

7.3 මානව සම්පත් සංවර්ධනය

ආයතනය හා සම්බන්ධ තනි පුද්ගල වාහක මාර්ගය වැඩිදියුණු කිරීමේ අරමුණින් කෙටිකාලීන දේශීය පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 57 දෙනෙකු සහභාගී විය. ඊට අමතරව කාර්යාල පද්ධතිය සහ සාමාන්‍ය පරිපාලනය, මූල්‍ය නියාමනය සහ ගිණුම්කරණ පද්ධතිය, මූලික ප්‍රසම්පාදනය සහ ස්ථාපිත ක්‍රියා පටිපාටිය පිළිබඳ කාර්ය මණ්ඩලයේ මූලික දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් කණ්ඩායම් පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. කාර්යක්ෂමතා කඩඉම් විභාග අපේක්ෂකයින් පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු මාලාවක් ද පවත්වන ලදී. ආයතනය සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහා ජ්ෂ්ඨ කළමනාකරණ කමිටුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ද ඇතුළුව පිරිසකට දෙදින වැඩමුළුවක් පවත්වන ලදී.

ඉහත ක්‍රියාකාරකම් සඳහා මුළු වියදම රුපියල් .1,270,180.00 කි.

7.4; 2021 පුනරාවර්තන වියදම් වලින් ලබා ගත් ප්‍රාග්ධන අයිතම සහ සේවා ප්‍රසම්පාදනය

2021 සඳහා ප්‍රාග්ධන අයිතම	
කොබෝල්ට් 60 – SLGC	**105,258,595.59**
NCNDT ගොඩනැගිල්ල	**28,263.00**
විද්‍යාත්මක උපකරණ	
ලැබ් ජැක්	71,424.00
ද්‍රව නයිට්‍රජන් සඳහා වන ඇසුරුම	140,200.00
කියත් යන්ත්‍රය	13,970.00
TIG වෙල්ඩින් උපාංගය	60,308.00
තාප මිනුම් උපකරණ	53,460.00
ඩිජිටල් එක්ස්-රේ සමීක්ෂණ මීටරය .	3,800,000.00
ටංස්ටන් ඉඟි මුවහත් කිරීම සඳහා ඇඹරුම් යන්ත්‍රය	19,500.00
Bench Wise	29,500.00
TIG වෙල්ඩින් උපාංගය කොටස්	53,381.16
MIG / MAG උපාංග සමඟ වෙල්ඩින් උපාංග	372,859.92
ඩිජිටල් උෂ්ණත්වමානය	21,600.00
ගැමා මොනිටරය	963,953.08
විද්‍යුත් රසායනික කෝෂය	48,828.00
ඔසිලස්කෝප්	670,760.00
ඊයම් දොර	256,560.00
SMAW යන්ත්‍රය	118,800.00
Net Gate Router	77,431.18
පීඩන රෙගුලේටරය	65,200.00

CNC Router & Drill	775,000.00
එක්ස් කිරණ ටියුබය	460,362.00
එක්ස් කිරණ නල සිසිලන උපාංග	24,457.99
උෂ්ණත්වමානය	10,920.00
High Purity CO2 & O2 ගෑස් සිලින්ඩර්	727,826.10
Esco Fume Cupboard	423,360.00
ආගන් ගෑස් සිලින්ඩර්	294,791.40
ලේසර් කටර් සැපයීම සහ ස්ථාපනය කිරීම	1,782,000.00
Analytical Balance	522,700.00
උෂ්ණත්වමානය	9100.00
ලැබ්ජැක්	5,376.00
ග්ලෝබ් වෑල්ව්	6,372.00
වෙල්ඩින් ඒකකය සඳහා ගෑස් සිලින්ඩර	62,015.54
Ultrasonic ස්කෑනිං පද්ධතිය නිර්මාණය කිරීම සහ ස්වයංක්‍රිය කිරීම	19,485.00
මුළු මුදල	**11,961,501.37**
කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ සහ සවිකෘත	
මුදල් පෙට්ටිය	3,900.00
Heavy Duty Hydralic Floor Jack	59,200.00
Heavy Duty Ladder	12,500.00
Aluminum Heavy Folding ladder	31,800.00
Rice Cooker	5,310.50
Gas Cooker	6,975.00
Plastic Pallets	590,750.00
වායු සම්පීඩකය	623,948.40
Fabrication, Supply & Delivery of Steel Table	144,200.00
stationery and consumables	4,536.00
12.5 Kg Cylinder with Gas	5,450.00
Pneumatic Hose	15,000.00
Horizontal Multistage Water Pump with flexi...	166,860.00
CCTV කැමරාව සහ උපාංග	385,900.00
Compact Jigaw	23,220.00
මෙවලම් පෙට්ටිය	5,500.00
බහු ක්‍රියාකාරී ඉලෙක්ට්‍රොනික බැටරි චාජරය	17,100.00
Spray Gun	12,800.01
Punch & Chisel Set	3,300.00
Pneumatic Accessories	221,708.00
Hydraulic Pallet Jack	129,600.00
විද්‍යාගාර අභ්‍යන්තර සැකසීම	5,385,868.25
මුළු මුදල	**7,855,426.16**
පුස්තකාලය	**23,450.00**
පරිගණක මෘදුකාංග සහ උපාංග	
CB C040-External Hard Disk	62,500.00
Graphic digitizer tablet	16,900.00
High End Laptop Computers	1,149,000.00
Capitalized server computer	397,800.00

මුළු මුදල	**1,626,200.00**
ඉලෙක්ට්‍රොනික උපකරණ	
CB C039-UPS	20,000.00
Dot Matrix Printer PO 5269-14501	52,950.00
මුළු මුදල	**72,950.00**
විද්‍යාත්මක උපකරණ පරිත්‍යාග කිරීම	
IAEA වෙතින් ලැබෙන පරිත්‍යාගය (Vacuum pressure guage, Tweezers, C14 Sample pre...	1,991,480.31
Vacuum pressure guage, Tweezers,...	795,496.34
මෘදුකාංග ස්ථාපනය සහ FTIR SpE පිළිබඳ පුහුණුව...	234,385.38
IAEA වෙතින් ලැබුණු සමීක්ෂණ මීටරය	816,087.79
Radiation Monitor	771,942.80
Cryo Mixer Mill	2,682,260.10
Rapid Oxy Cube	766,980.80
මුළු මුදල	**8,058,633.52**
මෘදුකාංග පැකේජය	
Beign accounting the advance settlement on CB 326	200,000.00
Beign capitalize the server computer of PMSL System	680,000.00
Beign capitalize the barcode system accounted as working progress	200,000.00
මුළු මුදල	**1,080,000.00**

රසායනාගාර පරිභෝජන - SLAEB	
Liqiud Nitrogen PO No 5075	47,039.00
Chemicals - IHS PO No : 4940	11,178.00
Lithium Battery with welding terminals	2,950.00
Milk Powder for Lab Uses	4,560.00
Local Milk Products & FCMP / IMP	7,919.15
මුළු මුදල	73,646.15
රසායනාගාර පරිභෝජන - SLGC	
Refilling Gas Cylinder-SLGC	4,970.00
Micropipette & Pipette tips SLGC PO No 243	19,582.00
High Temperature Grease / Normal Grease Po 252	63,250.00
WD Can & cotton waste PO No : 215	17,080.00
Dosimeters	284625.6
Sterilization indicators	644722.3
High Dose ceric-Cerous Dosimeters	714222.2
Alanine reference dosimeter	296908.9
Chemicals and lab Items	46,935.36
Cylinder Repair Seal Kits Laboratory Consumable SLGC	7,408.00
2021/1796# Puchasing of Polythene bags SLGC	61,800.00
මුළු මුදල	2,161,504.36

රසායනාගාර පරිභෝජන –NCNDT	
ආරක්ෂිත හිස් ආවරණ	41,850.00
රසායනික	1844778
Industrial Radiographic films NDT	199,500.00
Mild steel seam less pipe	69,120.00
cotton waste & turpentine	2,895.00
Essential Consumables to Conduct Welder Qualification tests / Welder Qualification Facility	31,270.09
Industrial X - Ray Films 50HD	307850
battery for fiber scope	1,900.00
Cotton Waste	21,250.00
Washing Overall at NCNDT	5,040.00
Replace the battery pack to UT Flaw Detection-NCNDT	8,700.00
මුළු මුදල	2,534,153.09

8.

මූල්‍ය වාර්තාව -2021



ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශය

(සියළුම මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් වේ.)

	සටහන්	2021		2020	
වත්කම්					
ජංගම වත්කම්					
මුදල් හා මුදල් හා සමාන දෑ	3	46,827,966		135,268,410	
ලැබිය යුතු දෑ	4	32,328,829		30,441,816	
තොග	5	16,977,181		18,885,647	
පෙර ගෙවීම්	6	7,283,562		6,899,824	
වෙනත් ජංගම වත්කම්	7	196,130,663	299,548,201	198,708,071	390,203,768
ජංගම නොවන වත්කම්					
නොනිමි වැඩ	8	5,195,284		4,863,143	
දේපල පිරියත හා උපකරණ	9	976,794,671		828,820,106	
අස්පෘශ්‍ය වත්කම්	9.1	4,112,292		3,565,949	
ඉඩම් හා ගොඩනැඟිලි	9.2.1	1,731,913,195		922,424,970	
භාවිතයට ගත නොහැකි අයිතම	10	31,850	2,718,047,292	31,850	1,759,706,018
මුළු වත්කම්			**3,017,595,493**		**2,149,909,786**
බැරකම්					
ජංගම බැරකම්					
ගෙවිය යුතු දෑ	11	96,379,054	96,379,054	86,825,842	86,825,842
විශ්‍රාම දීමනා ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම්	12	40,899,187		38,836,936	
කොබෝල්ට්-60 ප්‍රභවය අක්‍රිය කිරීමේ ගාස්තු	13	5,683,833	46,583,020	5,413,174	44,250,111
මුළු බැරකම්			**142,962,075**		**131,075,953**
මුළු ශුද්ධ වත්කම්			**2,874,633,418**	-	**2,018,833,833**
ශුද්ධ වත්කම් හා ස්කන්ධ					
ප්‍රාග්ධන හා සංචිත					
රජයේ ප්‍රතිපාදන - ප්‍රාග්ධන	14	2,768,645,448		1,900,845,119	
ප්‍රත්‍යාගණන සංචිතය	14 A	34,066,076			
සමුච්චිත අරමුදල	15	167,419,088		190,774,857	
ඌණතාවය	16	(95,497,195)	2,874,633,418	(72,786,143)	2,018,833,833
මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධ			**2,874,633,418**	-	**2,018,833,833**

පිටු අංක 88 සිට 120 වන පිටුව දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල බව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සහ මූල්‍ය ප්‍රධානියා වශයෙන් අපි අත්සන් කර ඇත්තෙමු.

.....
අධ්‍යක්ෂ -මූල්‍ය

.....
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන අතර 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන් (පසුගිය වසර හා සැසඳීම් සමග) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

.....
සභාපති

.....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

	සටහන්	2021	2020
අයභාරය	17	117,967,357	174,139,707
උපදවන ලද ආදායම්	18	164,703,025	131,754,231
වෙනත් අයභාර	19	11,978,214	10,444,095
මුළු ආදායම්		294,648,596	316,338,033
සේවකයන්ගේ වැටුප් හා ප්‍රතිලාභ වියදම්	20	(145,764,751)	(152,979,068)
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	21	(30,801,732)	(31,834,932)
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	22	(72,254,621)	(70,222,274)
දේපල හා පිරියත උපකරණ අළුත්වැඩියාව	23	(8,158,507)	(6,055,753)
වෙනත් පුනරාවර්තන වියදම්	24	(60,367,659)	(51,323,375)
මූල්‍ය පිරිවැය	25	(44,883)	(22,934)
මුළු වියදම්		(317,392,153)	(312,438,336)
වසර සඳහා අතිරික්තය/(ඌණතාවය)		**(22,743,557)**	**3,899,697**

පිටු අංක 88 සිට 120 වන පිටුව දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අංගයකි.
මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල බව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සහ මූල්‍ය ප්‍රධානියා වශයෙන් අපි අත්සන් කර ඇත්තෙමු.

.....
අධ්‍යක්ෂ -මූල්‍ය

.....
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන අතර 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන් (පසුගිය වසර හා සැසඳීම් සමඟ) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

.....
සභාපති

.....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති
මණ්ඩලය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා
ශුද්ධ වත්කම් හා ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය
(සියළුම මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් වේ)

	ප්‍රාග්ධන ප්‍රදාන	ප්‍රත්‍යාගණන සංචිතය	සමුච්චිත අරමුදල	සමුච්චිත අතිරික්ත/ඌනතාව	එකතුව
2021-01-01 දිනට ශේෂය	**1,794,795,980**		**179,350,567**	**(76,674,040)**	**1,897,472,507**
වර්ෂය සඳහා ලැබීම්	162,975,000		34,211,940	(11,800)	197,175,
ගැලපුම් වර්ෂය සඳහා අතිරික්ත/ඌණතාවය	(56,925,863)		(22,787,649)		(79,713,512)
	------		------	3,899,697	3,899,697
2021-12-31 දිනට ශේෂය	**1,900,845,117**		**190,774,858**	**(72,786,143)**	**2,018,833,832**
වර්ෂය සඳහා ලැබීම්	924,773,724		-	-	924,773,724
ගැලපුම් වර්ෂය සඳහා අතිරික්ත/ඌණතාවය	(56,973,393)	34,066,076	(23,355,770)	32,506	(46,230,581)
	------		------	(22,743,557)	(22,743,557)
2021.12.31 දිනට ශේෂය	**2,768,645,448**	**34,066,076**	**167,419,088**	**(95,497,194)**	**2,874,633,418**

පිටු අංක 88 සිට 120 වන පිටුව දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල බව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සහ මූල්‍ය ප්‍රධානියා වශයෙන් අපි අත්සන් කර ඇත්තෙමු.

.....
අධ්‍යක්ෂ -මූල්‍ය

.....
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන අතර 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන් (පසුගිය වසර හා සැසඳීම් සමග) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

.....
සභාපති

.....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

2021.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියළුම මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් වේ.)

	2021		2020	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය			-	
ලැබීම්			-	
භාණ්ඩ හා සේවා විකිණීමෙන්	172,553,346		138,591,783	
පුනරාවර්තන ප්‍රදාන ලැබීම්	27,000,000		88,000,000	
ණය සඳහා පොලිය ලැබීම්	6,659		395,028	
ඉතිරිකිරීම් පොලි ලැබීම්			-	
වෙනත්	6,766,460	206,326,465	9,807,917	236,794,728
ගෙවීම්				
සැපයුම් කරුවන් සඳහා ගෙවීම්	(87,623,678)		(70,268,857)	
සේවක පිරිවැය	(144,227,700)		(143,929,343)	
අනෙකුත් ගෙවීම්	(10,059,193)	(241,910,571)	(16,397,097)	(230,595,297)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවා.		**(35,584,106)**		**6,199,431**
ආයෝජන ක්‍රියාකා. වලින් ලද මුදල් ප්‍රවාහය				
ගෙවීම්				
දේපල පිරියත උපකරණ මිළදී ගැනීම	(150,560,104)		(51,076,271)	
ඉතිරි කිරීමේ ගිණුමට මාරු කිරීම් - මහජන බැංකුව		(150,560,104)		(51,076,271)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(150,560,104)**		**(51,076,271)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය				
ලැබීම්				
ප්‍රාග්ධන අරමුදල් ලැබීම්	96,569,000		162,975,000	
ණය වාරික අයකර ගැනීම	5,881,395	102,450,395	4,073,990	167,048,990
ගෙවීම්				
සේවක ආපදාණය සඳහා ගෙවීම්	(4,746,630)			
ඉතිරි මුදල භාණ්ඩාගාරයට ගෙවීම්		(4,746,630)	-	(6,092,104)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**97,703,765**		**160,956,886**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**(88,440,445)**		**116,080,046**
මුදල් හා මුදල් සමාන දෑ ආරම්භක ශේෂය		**135,268,410**		**19,188,365**
බැංකුවේ මුදල්- ජංගම ගිණුම		135,201,447		19,183,377
මුද්දර තොග		66,963		4,988
මුදල් හා මුදල් හා සමාන දෑ අවසාන ශේෂය		**46,827,966**		**135,268,410**
21/05/2021	1. විකිරණ ආරක්ෂණ නිළධාරි 2. මෙහෙයුම් නිළධාරී 3. වැ.බ අධ්‍යක්ෂ -ගැමා	ආරක්ෂණ විධිවිධාන කඩකිරීම සම්බන්ධව ගැමා මධ්‍යස්ථානයේ සේවකයින් තිදෙනෙකු පිළිබඳව පැමිණිලි කර ඇත. මෙම කරුණ පිලිබඳව විමර්ෂණය සඳහා අධ්‍යක්ෂ (ජා.ස අංශය), නීති නිළධාරිනී සහ විකිරණ ආරක්ෂණ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදී. මූලික විමර්ෂණ වාර්තාව 24/12/2021දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද නමුත් ඒම වාර්ථාව කල්තබා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වන කමල් පත්මසිරි මයා, මලිත පෙරේරා මයා සහ ජෙයසුගිතන් මයා යන අයගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇත.

9.5 මූලික විමර්ෂණය- නිර්විනාශක ජාතික මධ්‍යස්ථානයේ වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂට තර්ජනය කිරීම

පැමිණිලි දිනය	පැමිණිලි පාර්ශවය	වර්තමාන තත්වය
21/10/2021	වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ	විමර්ෂණය සඳහා අධ්‍යක්ෂ (පාලන), නීති නිළධාරිනී සහ අධ්‍යක්ෂ (RPTSD) ගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදී. ඒහි විමර්ෂණ කටයුතු නිමවී නොමැත.

10. අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම්

10.1. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ ඉන්ධිරා ගාන්ධි රෝහල සමග ඇතිකර ගෙන ඇති අවබෝධතා ගිවිසුම්

ශ්‍රී.ල.ප. බ.ම විසින් සපයනු ලබන ටී.ඒල්.බී සේවාව සඳහා ඉ.ගා.අ.රෝ සමග 01-01-2022 දිනසිට අවබෝධතා ගිවිසුම්ක් ඇති කර ගෙන ඇති අතර, ඒහි විදේශීය පාර්ශවයේ අත්සන් සඳහා මාලදිවයිනට යවා ඇත.

10.2 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ ලලාන් රබර් නිෂ්පාදන සමාගම

ලලාන් රබර් නිෂ්පාදන සමාගම නිෂ්පාදනය කරන අත් මේස් 14th May 2021 to 13th May 2022. දක්වා අඛණ්ඩව ජීවාහනුකරණය සේවය සඳහා ලබා දීමට ඒකඟවන බවට සඳහා ලලාන් රබර් නිෂ්පාදන සමාගම සහ අඛණ්ඩව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමක් ඇති කරගෙන ඇත.

11 වානිජ්‍ය පදනම්න් ඇති කරගෙන ඇති ව්‍යාපෘති වල වර්තමාන තත්වය

11.1 සයික්ලොට්රොන් යන්ත්‍රය භාවිතාකර විකිරණශීලි ඖෂධ නිශ්පාදනය ආයතනයක් ශ්‍රී ලංකාවේ ඇති කිරීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සැපයුම් අංශය සමග සයික්ලොට්රොන් යන්ත්‍රය භාවිතාකර විකිරණශීලි ෙඖෂද නිශ්පාදනය ආයතනයක් ශ්‍රී ලංකාවේ ඇති කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් 2021-ජනවාරි- 13 දින අත්සන්කරන ලදී. රටේ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් රජ්‍ය බැංකුවක් මගින් ණය මුදලක් ගැනීම අනුමතවී නොමැත. ඒ අනුව, සුදුසු ආයෝජකයෙකු සොයාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර EOI කැඳවීමට හා ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඒකඟවී ඇත.

11.2 'Ceylon tea' වල සම්භවය සත්‍යාපනය කිරීම.

තේ නියමු ව්‍යාපෘතියේ ප්‍රගතිය සාරාංශ ලෙස මෙම නියමු ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුල තොරා ගන්නා ලද තේ කර්මාන්තශාලා වලින් තේ සාම්පල 875 එකතු කරන ලද අතර එයට අන්තර් ගත වන්නේ ලංකාවේ තේ වගා කරන කලාප 07 වේ.

උදා :- සබරගමුව, දිඹුල, නුවරඑළිය, උඩපුස්සැල්ලාව, බන්ඩාරවෙල, මට්ටවැලි.
වෙනත් සම්භවයක් සහිත වූ රටවල් වන උතුරු ඉන්දියාව, දකුණු ඉන්දියාව, චීනය, වියට්නාමය සහ කෙන්යාව යන රට වලින් සාම්පල 74 ක් එකතු කරන ලදී.

මෙම සියලු සාම්පල සම්මත ක්‍රමවේදයන්ට අනුව, විශ්ලේෂණය සඳහා සකස් කල අතර, ස්ථායි සමස්ථානික හා විරල මූලද්‍රව්‍ය සඳහා විශ්ලේෂණ කටයුතු කරගෙන යනු ලබයි. COVID -19 වසංගත තත්වය හමුවේ ව්‍යාපෘති කටයුතු සැලසුම් කල ආකාරයට සම්පූර්ණ කිරීමට නොහැකි විය.

IAEA තාක්ෂණික සහයෝගිතාව යටතේ සාම්පල 2000 ක් පමණ විශ්ලේෂණ කිරීමට අවශ්‍ය, රසායනික ද්‍රව්‍ය, සහතික කල විශ්ලේෂණ ද්‍රව්‍ය Elementar සමාගම මගින් අප වෙත ලැබිණි. ස්ථායි සමස්ථානික විශ්ලේෂණය සඳහා වන ප්‍රශස්ත බර සහ අනෙකුත් උපකරණයේ පරාමිතින්, මූලික පරීක්ෂණ කටයුතු සඳහා සම්පූර්ණ කරන ලදී.

12 මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කිරීම

2021-12-31 න් අවසන් වසර සඳහා ඔටෝමොබයිල් ආයතනය මගින් ආයතනයේ මෝටර් රථ ප්‍රත්‍යාගණනය කරගන්නා ලදී.ඒහි වාර්තාව 2022-02-23 දින ලැබී ඇත. මෝටර් රථවල ඉදිරි ඵලදායී ජීවකාලය හා 1.3.2 සටහනේ දක්වා ඇති ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය පදනම් කර ගනිමින් සෘජු ක්‍රමය අනුව ක්ෂය කරනු ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ENR/B/SLAEB/1/21/27 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 ජනවාරි 31 දින

සභාපති

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2019 පෙබරවාරි 21 දින මණ්ඩලය වෙත භාර දී තිබුණු පිරිවැය රු. 587,542,795 ක් වටිනා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව පූර්වකාලපරිච්ඡේද වැරදි අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කිරීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර පිරිවැය වෙනුවට ටෙන්ඩර් වටිනාකම වූ රු. 597,204,722 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් එකතු කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිල්ලේ සමුච්චිත ක්ෂය ප්‍රමාණය වූ රු. 21,543,236 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට පොත්වල අගය ශූන්‍ය වූ තවදුරටත් භාවිතා කරමින් පැවති පිරිවැය රු.67,553,705 ක් වූ විද්‍යාත්මක උපකරණ අයිතම 214 ක් , ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ නිර්විනාශක පරීක්ෂණ විද්‍යාගාර සතු පිරිවැය රු. 33,344,903ක් වූ අක්‍රීය විද්‍යාත්මක උපකරණ 23 ක සහ පිරිවැය තොරතුරු නොමැති උපකරණ 16ක ධාරණ අගය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් කළ යුතු වුවත්, අදාල හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඈ) පූර්ව කාලපරිච්ඡේද වැරදි අතීතානුයෝගී ලෙස නැවත ප්‍රකාශ කිරීම නිසා පූර්ව වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල රේඛීය අයිතමයන් 6 ක් ප්‍රතිශෝධනය කර තිබුණද, මෙම ප්‍රතිශෝධිත අයිතමයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය වෙත ලැබී තිබූ රු. 96,569,000 ක ප්‍රාග්ධන ප්‍රදාන සහ විදේශ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.75,940,112 ක් වටිනා කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය තොගය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ප්‍රකාරව වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ කොබෝල්ට් 60 මූලද්‍රව්‍යයේ ක්ෂය වටිනාකම රු. 4,692,947 කින්ද කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ ක්ෂය රු. 2,293,764 කින්ද ගොඩනැගිලි ක්ෂය රු.11,696,861 අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. 18,683,572 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය ආනයනයට අදාල රේගු ගාස්තුව රු.15,452,157 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සේවාදායක ආයතන 119 ක් වෙත කුලී පදනමින් නිකුත් කර තිබුණු තාප සංදීප්ත විකිරණ මිතිකමාන කාඩපත් (TLD) 2,762 ක් අගය කර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(එ) 2017 වර්ෂයේ මිලදීගත් කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය අපහරණ වියදම (De commissioning cost) වෙනුවෙන් සිදුකරන වෙන්කිරීම සඳහා විදේශ විනිමය ලාභ අලාභ ගලපානොතිබුණි.එසේම, 2021 වර්ෂයේ මිලදීගත් කොබොල්ට් 60 මූලද්‍රව්‍යයට අදාළ අපහරණ වියදම් හඳුනාගෙන ඒ වෙනුවෙන් කිසිදු වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

(ඒ) රු.120,710,750 ක් වූ කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය මිලදීගැනීම සඳහා එළැඹී කොන්ත්‍රාත් ගිවිසුම,රු. 16,977,181 ක් වූ තොග සම්බන්ධයෙන් සත්‍යෝක්ෂණ වාර්තා සහ විදේශ සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘති 12 කට අදාල විදේශ අධාර ගිවිසුම්, ව්‍යාපෘති වියදම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූමගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවනතොරතුරු, අනෙකුත් තොරතුරුයන්නෙන් අදහස් වේ. මෙමඅනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝමතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විටකියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්

කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීමඅගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

X

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද මෙම වාර්තාවේ 1.2 (ආ) සහ (ඉ) ඡේදයේ සඳහන් නිර්දේශ හැර සෙසු නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව		විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
	(i) මුදල් රෙගුලාසි 454 සහ 715(2)(අ), (ඇ), (ඇ), (ඉ) හා (ඊ)	මුදල් රෙගුලාසි ප්‍රකාර නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ විද්‍යාගාරවල ඇති විද්‍යාත්මක උපකරණවල ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් බඩු වට්ටෝරු පොත් පවත්වාගෙන යාම, උපකරණවල භාරය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් පත්කිරීම, විධිමත් අනුමැතියක් සහිතව උපකරණ නිකුත්කිරීම හා විධිමත් වාර්තා පවත්වාගෙන යාම සිදුකර නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 715(ඇ) සහ 104 (1)	නිසි අධිකාරි බලයක් යටතේ භාණ්ඩ නිකුත් කිරීම සහ නියාදනය කළ යුතු වුවත් රු.10,823,587 ක වටිනාකමැති එක්ස් කිරණ යන්ත්‍රයක් නිසි අධිකාරි බලයක් යටතේ නිකුත් කර නොතිබුණු අතර නැවත භාරගැනීමේදී විධිමත් ලෙස භාරගෙන නොතිබුණි.මෙම යන්ත්‍රය ඉන් පසු අක්‍රීය වී තිබුණු අතර ඊට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ සිදු කර නොතිබුණි.
(ආ) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය		මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.10,136,216 ක් වූ විදේශ ප්‍රදාන ලැබීම් භාණ්ඩාගාරය හරහා ලබා නොගෙන සෘජුවම ආයතනය වෙත ලබා ගෙන තිබුණි. මින් රු.2,077,583 ක් මුදල් ප්‍රදාන වශයෙන්ද රු. 8,058,633 ක් භාණ්ඩ ප්‍රදාන වශයෙන්ද ලැබී තිබුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය		මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් අතුලත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද මණ්ඩලය විසින් ගිණුම් වර්ෂය අවසන් වී දින 217 ක් පසු වී ගිණුම් ඉදිරිපත් කර තිබුණි.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 වන්කම් කළමානකරණ චක්‍ර ලේඛය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශය	මූල්‍ය නොවන වත්කම් වර්ෂ පහකට වරක් තක්සේරු කළ යුතු වුවත් මණ්ඩලය සතු පිරිවැය රු. 2,317,764,248 ක් වූ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර නොතිබුණි.

(ඉ) නිර්විනාශක පරීක්ෂණ සඳහා වන ගුණත්ව අත්පොත

6.1.2 ඡේදය	ස්වාධීනව නිර්විනාශක පරීක්ෂණ සේවා සිදුකිරීම සඳහා නිළධාරීන් මාරුකරමින් පරීක්ෂණ සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී සේවාදායක ආයතනයක සිදුකළ නිර්විනාශක පරීක්ෂණ 11 කින් පරීක්ෂණ 8 ක් එක් නිළධාරියෙකු විසින් සිදුකර තිබුණි.
8.1.1 හා 8.1.5 ඡේද	නිර්විනාශක පරීක්ෂණ වාර්තාවල පරීක්ෂක (inspector) ලෙස අත්සන් කිරීමට අවශ්‍ය සුදුසුකම් නොමැති නිළධාරීන් විසින් පරීක්ෂණ වාර්තා අත්සන් කර තිබුණු අවස්ථා 7 ක්ද තිදෙනෙකු සහිත කණ්ඩායමක් ලෙස පරීක්ෂණ සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී තනි නිළධාරියෙකු විසින් පරීක්ෂණ සිදුකර තිබුණු අවස්ථා 8 ක්ද නිරීක්ෂණය විය.
8.2.2 ඡේදය	නිර්විනාශක පරීක්ෂණ උපකරණවලට ප්‍රවේශවීමට හා භාවිතා කිරීමට අවම වශයෙන් ISO 9712 ප්‍රකාරව පළමු මට්ටමේ (Level 01) පුහුණුවක් හෝ තිබිය යුතු වුවත් විද්‍යාගාර සහයක වැනි විද්‍යාත්මක උපකරණ නියමිත තත්ත්වයේ පවතින්නේ ද යන්න පරීක්ෂා කර බලා භාර ගත නොහැකි නිලධාරීන්ට ද උපකරණ නිකුත් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2014 වර්ෂයේදී වැඩ නිමකරන ලද නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ අනුමත කොන්ත්‍රාත් වටිනාකම රු. 308,600,000 ක් වුවත් රු. 120, 900,000 ක් හෙවත් සියයට 39 ක කොන්ත්‍රාත් විචලනයක් සහිතව ඉදිකිරීම් සිදුකර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.13.4 සහ 2012 අගොස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොන්ත්‍රාත් විචලනය සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2022 ඔක්තෝබර් 28 දින දක්වා ලබාගෙන නොතිබුණි. ඉඩම මිලදීගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු රු. 84,000,000 ඉක්මවා ඉඩමේ තක්සේරුව වූ රු. 85,000,000 ක් ඇතුළුව ඉඩම සඳහා රු. 90,800,000 ක් වැයකර තිබුණි.

(ආ) 2020 අගෝස්තු මසදී කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය මිලදීගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු. 96,500,000 ක් අදාල කාර්යය සඳහා භාවිතා කිරීමකින් තොරව මාස 9 ක පමණ කාලයක් ආයතනයේ ජංගම ගිණුමේ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.එසේම 2021 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලද රු. 35,654,823 ක්ද වර්ෂයේ වියදම් නොකර මණ්ඩලයේ ජංගම ගිණුමේ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.

(ඇ) කොන්ක්‍රීට් පරීක්ෂාව සඳහා 2018 වර්ෂයේ පෙබරවාරි මස රු.1,661,000 කට මිලදීගත් Concrete Core Drilling උපකරණය මිලදී ගත් දින සිට 2022 ඔක්තෝබර් 31 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

2.3 වෙනත් කරුණු

(අ) රු. 450,000,000 ක් වටිනා කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය සහිත පැන්සල් 52 ක් වෙන් වෙන්ව හදුනාගත හැකි පරිදි ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණු අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලදී එම ද්‍රව්‍ය භෞතිකව පරීක්ෂා කර වාර්තා කර නොතිබුණි.

(ආ) නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ඒකකයන් කිහිපයක් විසින් (NCBNDT, Training unit සහ Inspection body) නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධ පාඨමාලා පැවැත්වීම හා සම්බන්ධ කටයුතු සහ බාහිර පාර්ශව වෙත පරීක්ෂණ සේවා සැපයීම ආදී සියළු කාර්යයන් සිදුකරමින් පැවතුණි. නමුත් නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධ නියාමනය සහ සුපරීක්ෂණය සඳහා ස්වාධීන ආයතනයක් දක්නට නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් භාවිතා කරන අන්තර්ජාතික ප්‍රමිත ශ්‍රී ලංකාව තුළ නීතිගත කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන කිසිවක් කෙටුම්පත් කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම පවරාගැනීම හේතුවෙන් ජාතික ආධුනිකත්ව හා පුහුණුකිරීමේ

අධිකාරියට බදු හිමිකාරිත්වය ඇති ඉඩමක මුණ්ඩලය විසින් උක්ත ව්‍යාපෘතිය හරහා නව ගොඩනැගිල්ලක් ඉදිකරවා ගෙන තිබුණද මේ දක්වා අදාළ ඉඩම පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද උක්ත ඉඩම තෝරාගැනීමට පෙර මාලඹේ ප්‍රදේශයේ ඉඩමක් තෝරාගෙන නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය විසින් මණ්ඩලය වෙනුවෙන් රු.333,446,138 ක් වැයකර ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතියදී මහජන විරෝධතා නිසා අතර මඟ නවතා දැමීම නිසා වැයකර තිබුණු මුදල් අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. මාලඹේ ඉඩම සඳහා මුදල් ගෙවීමේදී පැරණි ගොඩනැගිල්ල පැවති ඉඩම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරියට ගෙවූ බදු කුලිය වූ රු. 7,663,837 ක් අඩු කර ගෙවිය යුතු වුවත්, එසේ අඩුකර ගෙවීම සිදුකර නොතිබුණි. මෙම ඉඩමේ වෙළඳපොළ වටිනාකම රු.116,000,000 ක්ද, අවුරුදු 30 ක් සඳහා බදු වටිනාකම රු. 75,500,000 ක්ද වූ රජයේ තක්සේරුව නොසලකා රු.181,000,000 ක් ගෙවා තිබුණි.

(ඇ) 2021 වර්ෂය සඳහා නිසිලෙස අයවැය පුරෝකථනය නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 16ක වියදම් සීමාව ඉක්මවා ගෙවීම්. කර තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් 6 ක අයවැයගත ප්‍රතිපාදනය හා තත්‍ය වියදම අතර සියයට 30 සිට සියයට 100 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය විය.

ඩබ්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

9.

2021 වසරේ විගණකාධිපති වාර්තාව සහ එහි දෝෂ නිරාකරණය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ගෙන ඇති ක්‍රියාමාර්ග :

2021 වසරේ අවසන් විගණකාධිපති වාර්තාව සහ එහි දෝෂ නිරාකරණය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ගෙන ඇති ක්‍රියාමාර්ග

විගණකාධිපති වාර්තාවට යොමුව	විගණකාධිපති විසින් වාර්තා කල දෝෂය/ පෙන්වා දුන් අඩුපාඩු	වාර්තා කල දෝෂය / පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග (කෙටුම්පත් විගණකාධිපති වාර්තාවට ලබා දී ඇති පිලිතුරු මෙහි ඉදිරිපත් කර ඇත)	වර්තමාන ප්‍රගතිය
1.2 (අ)	<u>තත්වාගණනය කල මතය</u> විගණකාධිපති වාර්තාවේ තත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 202-12-31 දිනට මූල්‍ය තත්වය සහ එම වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිඹිබු කරන බව විගණකාධිපති දරන්නා වූ මතය වේ. <u>තත්වාගණනය කල මතය සඳහා පදනම</u> මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2019-02-21 දින මණ්ඩලය වෙත භාර දී තිබුණු පිරිවැය රු.587,542,795 ක් වටිනා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව පූර්ව කාලපරිච්ඡේද වැරදි අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කිරීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර පිරිවැය වෙනුවට ටෙන්ඩර් වටිනාකම වූ රු.597,204,722 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් එකතු කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද 2020-12-31 දිනට ගොඩනැගිල්ලේ සමුච්චිත ක්ෂය ප්‍රමාණය වූ රු.21,543,236 ක් ගිණුම්ගත කර නොතිබුණි.	නිවැරදිව ගිණුම්ගත කර 2021 වර්ෂයේ ගිණුම් නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ.	2022 වසරට අදාල අවසන් ගිණුම් පිළියල කිරීමේදී 2021 වසරට අදාලවූ නිවැරදි කිරීම් ජනල් අංක 1080, 1081, සහ 1085 මගින් නිවැරදි කර නැවත ප්‍රකාශ කර ඇත. (Re -state)
(ආ)	2020-12-31 දිනට පොත්වල අගය ශූන්‍ය වූ තවදුරටත් භාවිතා කරමින් පැවති පිරිවැය රු.67,533,705 ක් වූ විද්‍යාත්මක උපකරණ අයිතම 214 ක්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව	2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	අගය ශූන්‍ය වූ විද්‍යාත්මක උපකරණ ප්‍රත්‍යාගණන කටයුතු සිදුකරමින් පවතියි. නමුත් ඒම ක්‍රියාවලියේ පවතින ගැටළු නිරාකරණය

	ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.		කර ගැනීම සඳහා පත්කර ඇති කමිටු නිර්දේශමත ඉදිරි කටයුතු කරනු ලැබේ.
(ඇ)	මණ්ඩලයේ නිර්විනාශක පරීක්ෂණ විද්‍යාගාරය සතු පිරිවැය රු.33,344,903 ක් වූ අක්‍රීය විද්‍යාත්මක උපකරණ 23 ක සහ පිරිවැය තොරතුරු නොමැති උපකරණ 16 ක ධාරණ අගය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීම් කලයුතු වුවත්, අදාල හෙලිදරව් කිරීම් සිදු කර නොතිබුණි.	මෙම උපකරණ නිර්විනාශක පරීක්ෂණ සඳහා පමණක් නොව නිර්විනාශක පරීක්ෂණ පාඨමාලා සහ විභාග කටයුතු සඳහාද භාවිතා කරනු ලැබේ.එම නිසා මෙම උපකරණ දීර්ඝ කාලයක් පුරාවට නිරන්තරයෙන් භාවිතා කිරීම නිසා කාලයක් ගත වන විට අක්‍රිය වීම් සහ ගැටලු තත්ව පැන නැගීම සිදු වේ. එලෙස අක්‍රිය වීම සහ ගැටළු තත්ව පැන නැගීම සිදු වූ විට උපකරණයට ලැබී ඇති වගකීම් කාලය ඉකුත් වී නොමැති නම් මිලදීගත් ආයතනය සම්බන්ධකර ගැනීම හෝ වගකීම් කාලය ඉකුත් වී ඇත්නම්අලුත්වැඩියා කිරීම සිදුකරනු ලැබේ. එලෙසද යථා තත්වයට පත්කල නොහැකි වූ උපකරණ මෙලෙස දීර්ඝ කාලයක සිට අක්‍රිය තත්වයේ තිබුනද ඉවත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් නොතිබුනු නිසා NCNDT හි රඳවා ගෙන ඇත.මෙම උපකරණ විද්‍යාගාර වලින් ඉවත් කිරීමට නිසි ක්‍රියාපිළිවෙලක් මේ වන විටත් සකස් වෙමින් පවතින බව වැඩිදුරටත් දන්වමි.	අක්‍රීය වී ඇති උපකරණ සම්බන්ධව මූ.රේ 104 (3) ප්‍රකාරවද අනෙකුත් වක්තම් සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීම් කරනු ඇත.
(ඈ)	පූර්ව කාලපරිච්ඡේද වැරදි අතීතානුයෝගී ලෙස නැවත ප්‍රකාශ කිරීම නිසා පූර්ව වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල රේඛීය අයිතමයන් 6 ක් ප්‍රතිශෝධනය කර තිබුණද, මෙම ප්‍රතිශෝධිත අයිතමයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ඉදිරියේදී නැවත දෝෂ ඇති නොවන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ
(ඉ)	සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය වෙත ලැබී තිබූ රු.96,569,000 ක ප්‍රාග්ධන ප්‍රදාන සහ විදේශ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.75,940,112 ක් වටිනා කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය තොගය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ප්‍රකාරව වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ජ නල් අංක 1079 සහ 1089 මගින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කර ඇත
(ඊ)	සමාලෝචිත වර්ෂයේ කොබෝල්ට් 60 මූලද්‍රව්‍යයේ ක්ෂය වටිනාකම රු.4,692,947 කින්ද කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ ක්ෂය රු.2,293,764 කින්ද ගොඩනැගිලි ක්ෂය රු.11,696,861 අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. 18,683,572 කින් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙම දෝෂය ජ නල් අංක 1082 සහ 1088 මගින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කර ඇත.

(ඩ)	කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය ආනයනයට අදාල රේගු ගාස්තුව රු.15,452,157 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙම දෝෂය ජ නල් අංක 1090 මගින් නිවැරදි කර ඇත.
(ඪ)	සේවාදායක ආයතන 119 ක් වෙත කුලී පදනම්න් නිකුත් කර තිබුණු තාප සංදීප්ත විකිරණ මිනිකමාන කාඩ්පත් (TLD) 2,762 ක් අගය කර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	TLD කාඩ්පත් 2762 කුලී පදනම මත ආයතන 119 සඳහා පමණක් ලබා දී ඇත. පහත හේතු අනුව TLD කාඩ්පත් භාවිතයට ගත් පසුව ස්ථාවර හෝ අර්ධ ස්ථාවර වත්කමක් ලෙස සලකා ගිනුම් ගත කිරීමට අපහසුය. • වරින් වර විවිධ මිල ගණන් යටතේ මිල දී ගත් කාඩ් පත් ඉහත තොගය යටතේ පැවතීම. • කාඩ් පතෙහි ගුණාත්මක බව එය භාවිත කල කාලට අනුරූපී නොවීම නිසා කාලය අනුව වටිනාකම ක්ෂයවීම ගණනය කිරීමට නොහැකි වීම. • තාක්ෂණික හේතු මත භාවිතයට ගත නොහැකි අවස්තාවට පත්වූ පසු භාවිතයෙන් ඉවත් කිරීමට සිදු වීම.	TLD කාඩ්පත් ස්ථාවර වත්කමක් ලෙස සලකා ගිණුම් ගත කිරීමට නොහැකි වන බැවින් වාර්ෂිකව තොග ලෙස නඩත්තුකරනු ඇත.
(එ)	2017 වර්ෂයේ මිලදීගත් කොබොල්ට් 60 මූලද්‍රව්‍ය අපහරණ වියදම (Decommissioning Cost) වෙනුවෙන් සිදුකරන වෙන් කිරීම සඳහා විදේශ විනිමය ලාභ අලාභ ගලපා නොතිබුණි. එසේම,2021 වර්ෂයේ මිලදී ගත් කොබෝල්ට් 60 මූලද්‍රව්‍යයට අදාල අපහරණ වියදම් හඳුනාගෙන ඒ වෙනුවෙන් කිසිදු වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	2021 වර්ෂයේ මිලදී ගත් කොබෝල්ට් 60 මූලද්‍රව්‍යයේ අපහරණ වියදම ගිවිසුමේ සඳහන්වී නොතිබීම හේතුවෙන් අදාල අපහරණ වියදම් සඳහා වෙන්කිරීමක් සිදුකිරීමට නොහැකිවිය.
(ඒ)	රු.120,710,750 ක් වූ කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය මිලදීගැනීම සඳහා එළැඹී කොන්ත්‍රාත් ගිවිසුම රු.16,977,181 ක් වූ තොග සම්බන්ධයෙන් සත්‍යෝක්ෂණ වාර්තා සහ විදේශ සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘති 12 කට අදාල විදේශ ආධාර ගිවිසුම්, ව්‍යාපෘති වියදම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි	කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය මිලදීගැනීම සඳහා එළැඹී කොන්ත්‍රාත් ගිවිසුම BRIT ආයතනය වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. තොග සම්බන්ධයෙන් ගබඩා අයිතම සත්‍යෝක්ෂණය කල අතර විද්‍යාත්මක අංශ විසින් ලබාදෙන තොග පිළිබඳ සත්‍යෝක්ෂණ වාර්තා 2022 වර්ෂයේ සිට ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. (කෙටුම්පත් විගණකාධිපති වාර්තාවේ මෙම දෝෂය ඉදිරිපත් කර නොමැත)	කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය මිලදීගැනීම සඳහා එළැඹී කොන්ත්‍රාත් ගිවිසුම BRIT ආයතනය වෙතින් ගෙන්වාගෙන ඇත. තොග සම්බන්ධයෙන් ගබඩා අයිතම සත්‍යෝක්ෂණය වාර්තා 2022 වර්ෂයේ දී විගණනයට ලබාදී ඇත.

2 **(අ)** **(i)**	**මුදල් රෙගුලාසි 454 සහ 715 (2) (අ), (ඇ),(උ),(ඉ) හා (ඊ)** මුදල් රෙගුලාසි ප්‍රකාර නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ විද්‍යාගාරවල ඇති විද්‍යාත්මක උපකරණවල ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් බඩු වට්ටෝරු පොත් පවත්වාගෙන යාම, උපකරණවල හාරය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් පත්කිරීම, විධිමත් අනුමැතියක් සහිතව උපකරණ නිකුත් කිරීම හා විධිමත් වාර්තා පවත්වාගෙන යාම සිදුකර නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි දෝෂ සිදුනොවන ලෙස කටයුතු කරනු ලැබේ. ඒ සඳහා ප්‍රධාන කාර්යාලය යටතේ පවත්නා මධ්‍යස්ථාන දෙක වෙත ඉහතින් සඳහන් මූ.රේ. වලට අනුකූලව වත්කම් හා දේපල භාරගැනීම, නිකුත් කිරීම, යනාදී සම්බන්ධව කටයුතු කළයුතු ආකාරය පිළිබඳව අදාල වගකිවයුතු නිළධාරීන් ලිඛිතව දැනුවත් කරනු ඇත.	ඉදිරියේදී මෙවැනි දෝෂ සිදුනොවන ලෙස කටයුතු කරනු ලැබේ. ඒ සඳහා ප්‍රධාන කාර්යාලය යටතේ පවත්නා මධ්‍යස්ථාන දෙක වෙත ඉහතින් සඳහන් මූ.රේ. වලට අනුකූලව වත්කම් හා දේපල භාරගැනීම, නිකුත් කිරීම, යනාදී සම්බන්ධව කටයුතු කළයුතු ආකාරය පිළිබඳව අදාල වගකිවයුතු නිළධාරීන් ලිඛිතව දැනුවත් කර ඇත. රජයේ විගණනයෙන් පසුව NCNDT හි විද්‍යාගාරවල ගැටළු කිහිපයක් හඳුනා ගැනීමෙන් පසුව වහාම ඒවා නිවැරදි කිරීමට තීරණාත්මක පියවර ගන්නා ලදී. ඒ අනුව පළමුවෙන්ම, විද්‍යාගාර උපකරණ නඩත්තු කිරීම සඳහා පුළුල් ක්‍රියා පටිපාටියක් සකස් කිරීමට පියවර ගැනීම, සියලුම උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර නිතිපතා පරීක්ෂා කිරීම , නඩත්තු කිරීම සහ ප්‍රශස්ත තත්වයක තබා ගැනීම සිදුකරන ලදී. දෙවනුව උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර විද්‍යාගාර වලින් නිකුත් කිරීම සහ ආපසු විද්‍යාගාර වෙත බාරගැනීම, නිසි ලෙස ලොග් සටහන් තබා ගැනීම, අස්ථානගතවීම් සහ උපකරණයට හානි වීම වැළැක්වීම සඳහා උපකරණ වල ආරක්ෂාව නිරීක්ෂණය කිරීමට ක්‍රමවේද සකස් කිරීම සිදුකරන ලදී. තෙවනුව, විද්‍යාගාර උපකරණ සම්බන්දව ගුණත්ව අත්පොතෙහි සඳහන් ආකාරයට කටයුතු කිරීම සඳහා ඒ ඒ විද්‍යාගාර වලට විද්‍යාගාරභාර නිලධාරීන් (OICs), විද්‍යාගාර තාක්ෂණික සහකාර (TAs) සහ විද්‍යාගාර සහායකයින් ලෙස සුදුසුකම් ලත් සහ වගකිවයුතු පුද්ගලයින් පත් කරන ලදී.

			මෙම ක්‍රියාමාර්ග සමඟින් එනම් සුදුසුකම් සැලකිල්ලට ගනිමින් වගකීම් පැවරීම, කාර්යක්ෂම උපකරණ කළමනාකරණය, ගුණත්ව අත්පොතෙහි සඳහන් ආකාරයට ලොග් සටහන් පවත්වාගැනීම සිදුකරමින් මේ වනවිට විද්‍යාගාර සුදුසු තත්ත්ව පාලනයක් යටතේ පවත්වාගෙන යනු ලබයි.
(ii)	**මුදල් රෙගුලාසි 715 (2) (ඇ) සහ 104 (1)** නිසි අධිකාරී බලයක් යටතේ භාණ්ඩ නිකුත් කිරීම සහ නියාදනය කළ යුතු වුවත් රු.10,823,587 ක වටිනාකමැති එක්ස් කිරණ යන්ත්‍රයක් නිසි අධිකාරී බලයක් යටතේ නිකුත් කර නොතිබුණු අතර නැවත භාරගැනීමේදී විධිමත් ලෙස භාරගෙන නොතිබුණි. මෙම යන්ත්‍රය ඉන් පසු අක්‍රීය වී තිබුණු අතර ඊට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ සිදු කර නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි දෝෂ සිදුනොවන ලෙස කටයුතු කරනු ලැබේ. ඒ සඳහා ප්‍රධාන කාර්යාලය යටතේ පවත්නා මධ්‍යස්ථාන දෙක වෙත ඉහතින් සඳහන් මූ.රේ. වලට අනුකූලව වත්කම් හා දේපල භාරගැනීම, නිකුත් කිරීම, යනාදී සම්බන්ධව කටයුතු කළයුතු ආකාරය පිළිබඳව අදාල වගකිවයුතු නිළධාරීන් ලිඛිතව දැනුවත් කරනු ඇත. නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඇමුණුම 01 හි පරිදි සැලසුම් කර ඇති බව දන්වා ඇත.	කොරෝනා වසංගතයේ අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ, NCNCTහි තිබූ x-ray යන්ත්‍රය ක්‍රියා විරහිත වූ අතර , සැපයුම්කරු තවදුරටත් අදාළ නිෂ්පාදනයේ දේශීය නියෝජිතයා නොවූ බැවින්, මව් සමගම සමඟ ගැටළුව නිරාකරණය කර ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. මෙම පසුබෑම නොතකා, NCNCT ආයතනය කඩිනම් විසඳුමක් සෙවූ අතර යන්ත්‍රය වැඩිදුර පරීක්ෂණයක් සඳහා AEB හි RPTSD වෙත යවන ලදී. RPTSD විසින් ඉලෙක්ට්‍රොනික දෝෂයක් හඳුනා ගත් නමුත් එය අලුත්වැඩියා කිරීමට නොහැකි විය. පසුව යන්ත්‍රය ආතර් සී ක්ලාක් ආයතනය වෙත යොමු කරන ලද අතර, එහිදී ඔවුන්ගේ විශේෂඥතාව අනුව ගැටලුව සාර්ථකව විසඳා ඇත. ඔවුන්ගේ නොපසුබට උත්සාහය සහ සම්පත්දායකත්වය තුළින්, NCNCTහි මූලික බාධකය ජය ගැනීමට සමත් වූ අතර, x-ray යන්ත්‍රය දැන් නිසි ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. රටෙහි පවතී අසීරු අවස්ථාවට අදාලව ඉහත පරිදි තීරණ ගැනීමට සිදුවුවත් ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව වත්කම් හා දේපල භාරගැනීම පිලිබඳ අනුමත ක්‍රමවේදයන් මත සිදුකරන බව දන්වමි.

(ආ)	**1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය** මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.10,136,216 ක් වූ විදේශ ප්‍රදාන ලැබීම් භාණ්ඩාගාරය හරහා ලබා නොගෙන සෘජුවම ආයතනය වෙත ලබාගෙන තිබුණි. මින් රු.2,077,583 ක් මුදල් ප්‍රදාන වශයෙන්ද රු.8,058,633 ක් භාණ්ඩ ප්‍රදාන වශයෙන්ද ලැබී තිබුණි.	2022 වර්ෂයේදී මේ අනුව කටයුතු කරනු ලැබේ.	නිවැරදි ක්‍රමවේදයට අනුව කටයුතු කිරීම සඳහා මේ වන විට ප්‍රතිපත්තියක් සකස්කරමින් සිටියි.
(ඇ)	**2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය** මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද මණ්ඩලය විසින් ගිණුම් වර්ෂය අවසන් වී දින 217 ක් පසු වී ගිණුම් ඉදිරිපත් කර තිබුණි.	ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලයට මූල්‍ය ප්‍රකාශන අදාල ආයතන වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.	2021 වසරෙදී රටේ ඇතිවූ වාතාවරණය හේතුවෙන් සිදුවූ ප්‍රමාදය හේතුවෙන් ගිණුම් වාර්ථා නියමිත කාලය තුලදී ඉදිරිපත් කිරීමට නොහැකි විය. නමුත් 2022 වසරේදී මූල්‍ය ප්‍රකාශන ගිණුම් 2023 පෙබරවාරි 28 දින වනවිට අමාත්‍යාංශයට ඉදිරිපත් කර පසුව අමාත්‍යාංශය මගින් රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. එම කාලසීමාව වනවිට අධ්‍යක්ෂ මන්ඩලයක් පත් නොකර තිබූ බැවින් මෙම මූල්‍ය ප්‍රකාශ සෘජුවම අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදී. අධක්ෂ මණ්ඩලය 2023 අප්‍රියෙල් මස පත්කිරීමෙන් අනතුරුව එයටද ඉදිරිපත් කර ඇත.
(ඈ)	**2018-12-31 දිනැති අංක 04/2018 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශය** මූල්‍ය නොවන වත්කම් වර්ෂ පහකට වරක් තක්සේරු කළ යුතු වුවත් මණ්ඩලය සතු පිරිවැය රු.2,317,764,248 ක් වූ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර නොතිබුණි.	අදාල චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරි වර්ෂයේදී වත්කම් තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ.	අවශ්‍ය කටයුතු මේවන විට සිදුකරමින් සිටියි.
(ඉ)	**නිර්විනාශන පරීක්ෂණ සඳහා වන ගුණත්ව අත්පොත** **6.1.2 ඡේදය** ස්වාධීනව නිර්විනාශක පරීක්ෂණ සේවා සිදුකිරීම සඳහා නිලධාරීන් මාරුකරමින් පරීක්ෂණ සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී	2021 වසර යනු කොවිඩ් වසංගත තත්වය දරුණුව පැවති කාලයයි. එකල සිදුකල නිර්විනාශක පරීක්ෂණ සේවාවන් සඳහා අවම ගමන් වියදමක් සහිතව	නව Inspection කාර්යමණ්ඩලය මේ පිලිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවනු ඇත.

	සේවාදායක ආයතනයක සිදුකළ නිර්විනාශක පරීක්ෂණ 11 කින් පරීක්ෂණ 8 ක් එක් නිළධාරියෙකු විසින් සිදුකර තිබුණි.	inspection සඳහා ගෙන්විය හැකි මෙන්ම අවම කාලයකින් අදාළ ස්ථානයට ලගාවිය හැකි නැවත නැවත සිදුකෙරෙන එකම ආකාරයේ පරීක්ෂණයන් සඳහා පළපුරුදු කණ්ඩායම් ගෙන්වීමට ප්‍රමුඛතාව දෙනලදී. අන්තර් පළාත් ගමනාගමනය තහනම්ව පැවති කාලයක බස්නාහිර පළාත තුල වාසය කරන නිලධාරින් පමණක් සේවයට ගෙන්වීමට අප හට සිදුවිය. එවන් අවස්ථාවල එකම කණ්ඩායම් නිර්විනාශක පරීක්ෂණ සේවාවන් සඳහා සම්බන්ධ වීම සිදුවිය.	
	8.1.1 හා 8.1.5 ඡේද නිර්විනාශක පරීක්ෂණ වාර්තාවල පරීක්ෂක (inspector) ලෙස අත්සන් කිරීමට අවශ්‍ය සුදුසුකම් නොමැති නිළධාරීන් විසින් පරීක්ෂණ වාර්තා අත්සන් කර තිබුණු අවස්ථා 7 ක්ද තිදෙනෙකු සහිත කණ්ඩායමක් ලෙස පරීක්ෂණ සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී තනි නිළධාරියෙකු විසින් පරීක්ෂණ සිදුකර තිබුණු අවස්ථා 8 ක්ද නිරීක්ෂණය විය.	ගුණත්ව අත්පොතේ 8.1.1 අනුව විකිරණ රේඛ පරීක්ෂණ සඳහා පැවතිය යුතු සුදුසුකම් සහිත සත්‍යාපන නිලධාරියෙකු (Verifier) විසින් අදාළ පරීක්ෂණ වාර්තා සියල්ලෙහි අත්සන් කර ඒවා නිවැරදි බවට සහතික කර ඇත. 2007-06-72 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව පරීක්ෂණ කණ්ඩායම යන්න පහත පරිදි උපුටමි. “One inspection group consist of executive staff – 01, technical staff -01, minor staff – 01 or executive staff – 02, technical staff – 01 or executive staff – 02 and minor staff -01”. මෙම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව තුල පරීක්ෂණ කණ්ඩායම Inspector, Operator, Helper වියයුතු බව අර්ථ දක්වා නොමැත. එසේම ගුණත්ව අත්පොත ප්‍රකාරව එහි නීති අනුගමනය කිරීමට තරම් සේවක මඩුල්ලක් නිර්විනාශක පරීක්ෂණ සේවා සඳහා අප සතුව නොමැති අතර, සීමිත කාර්ය මණ්ඩලයකින් ඉහත සේවා පවත්වාගෙන යනු ලැබේ.	වර්තමාන අවශ්‍යතාවට අනුව පරීක්ෂණ කණ්ඩායම්වල සංයුතිය වෙනස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට පියවර ගනු ඇත.
	8.2.2 ඡේදය නිර්විනාශක පරීක්ෂණ උපකරණවලට ප්‍රවේශවීමට හා භාවිතා කිරීමට අවම වශයෙන් ISO 9712 ප්‍රකාරව පළමු මට්ටමේ (Level 01) පුහුණුවක් හෝ තිබිය යුතු වුවත් විද්‍යාගාර සහයක වැනි විද්‍යාත්මක උපකරණ නියමිත තත්ත්වයේ පවතින්නේද යන්න පරීක්ෂා කර බලා භාරගත නොහැකි නිලධාරීන්ට ද උපකරණ නිකුත් කර තිබුණි.	නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඇමුණුම 01 හි පරිදි සැලසුම් කර ඇති බව දන්වා ඇත.	විද්‍යාගාරවල හඳුනාගත් ගැටළු විසඳීම සඳහා NCNDT විසින් ක්‍රියාකාරී පියවර කිහිපයක් ගෙන ඇත.ඒ අනුව විද්‍යාගාර උපකරණ නඩත්තු කිරීම සඳහා පුළුල් ක්‍රියා පටිපාටියක් සකස් කිරීමට පියවර ගැනීම, සියලුම උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර නිතිපතා පරීක්ෂා කිරීම , නඩත්තු

			කිරීම සහ ප්‍රශස්ත තත්වයක තබා ගැනීම සිදුකරන ලදී. තවද උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර විද්‍යාගාර වලින් නිකුත් කිරීම සහ ආපසු විද්‍යාගාර වෙත බාරගැනීම, නිසි ලෙස ලොග් සටහන් තබා ගැනීම, අස්ථානගතවීම් සහ උපකරණයට හානි වීම වැළැක්වීම සඳහා උපකරණ වල ආරක්ෂාව නිරීක්ෂණය කිරීමට ක්‍රමවේද සකස් කිරීම සිදුකරන ලදී. මීට අමතරව උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර විද්‍යාගාර වලින් නිකුත් කිරීම සහ ආපසු විද්‍යාගාර වෙත බාරගැනීම, නිසි ලෙස ලොග් සටහන් තබා ගැනීම, අස්ථානගතවීම් සහ උපකරණයට හානි වීම වැළැක්වීම සඳහා උපකරණ වල ආරක්ෂාව නිරීක්ෂණය කිරීමට ක්‍රමවේද සකස් කිරීම සිදු කර විද්‍යාගාර උපකරණ සම්බන්ධව ගුණත්ව අත්පොතෙහි සඳහන් ආකාරයට කටයුතු කිරීම සඳහා ඒ ඒ විද්‍යාගාර වලට විද්‍යාගාර භාර නිලධාරීන් (OICs), විද්‍යාගාරවල තාක්ෂණික සහකාර (TAs) සහ විද්‍යාගාර සහායකයින් ලෙස සුදුසුකම් ලත් සහ වගකිවයුතු පුද්ගලයින් පත් කරන ලදී. මෙම ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන්, රසායනාගාර දැන් නිසි තත්ත්ව පාලනයකින් යුතුව ක්‍රියාත්මක වෙමින්, සුමට ක්‍රියාකාරිත්වය සහතික කරමින් සහ එදිනෙදා කටයුතුවල කාර්යක්ෂමතාව ඉහළ නංවා ගනිමින් පවත්වාගෙන යනු ලබයි .
2.2.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව		මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල මෙතෙක් කටයුතු කර ඇත.

2.2.4	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව		ප්‍රසම්පාදන නීති රීතිවලට අනුකූලව ක්‍රියාකිරීම සම්බන්ධයෙන් අදාළ කාර්ය මණ්ඩල හැකි සැමවිටම දැනුවත් කර උපදෙස් ලබාදෙනු ඇත.
(අ)	2014 වර්ෂයේදී වැඩ නිමකරන ලද නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ අනුමත කොන්ත්‍රාත් වටිනාකම රු.308,600,000 ක් වුවත් රු.120,900,000 ක් හෙවත් සියයට 39 ක කොන්ත්‍රාත් විචලනයක් සහිතව ඉදිකිරීම් සිදුකර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.13.4 සහ 2012-08-07 දිනැති අංක 02/2012 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොන්ත්‍රාත් විචලනය සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2022-10-28 දින දක්වා ලබාගෙන නොතිබුණි. ඉඩම මිලදීගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු රු.84,000,000 ඉක්මවා ඉඩමේ තක්සේරුව වූ රු.85,000,000 ක් ඇතුළුව ඉඩම සඳහා රු.90,800,000 ක් වැයකර තිබුණි.	(කෙටුම්පත් විගණකාධිපති වාර්තාවේ මෙම දෝෂය ඉදිරිපත් කර නොමැත) මෙම ඉඩම සඳහා තක්සේරු වාර්තාව (ENR/B/AB/AEB/2021/19/AQ-04 විමසුමේ ඇමුණුම 12 සඳහන් කර ඇත) ඉඩම මිලදී ගැනීම් සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබූ මුදල රුපියල් මිලියන 84ක් වූ අතර ඊට අමතරව මුද්දර ගාස්තු, NTB, තක්සේරු සහ අනෙකුත් ගාස්තු සඳහා රුපියල් මිලියන 7 ක් වැය කිරීමට සිදුවිය. ඒ අනුව ඉඩම් මිලදී ගැනීම් සඳහා වූ මුළු මුදල රුපියල් මිලියන 90.7 ක් විය.	කොන්ත්‍රාත් විචලනයට අදාලව අනුමත සීමාව ඉක්මවා වියදම්කල මුදල් සහ ඊට අදාළ තාක්ෂණික කරුණු සහිතව සවිස්තර වාර්තාවක් මීට අදාළ තාක්ෂණික කමිටුව විසින් රෙබීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ සහිතව ඉදිරියේදී කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යොමුකෙරෙනු ඇත.
(ආ)	2020 අගෝස්තු මසදී කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය මිලදීගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු.96,500,000 ක් අදාල කාර්යය සඳහා භාවිතා කිරීමෙන් තොරව මාස 9 ක පමණ කාලයක් ආයතනයේ ජංගම ගිණුමේ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.එසේම 2021 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලද රු.35,654,823 ක්ද වර්ෂයේ වියදම් නොකර මණ්ඩලයේ ජංගම ගිණුමේ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.	2020-2021 වර්ෂ සඳහා සැලසුම් කරන ලද ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් මෙම මුදල් ලද අතර ඇතැම් ප්‍රසම්පාදන කටයුතු විදේශ විනිමය ප්‍රතිපත්තිය වෙනස් වීම සහ මිල ගණන් අධික ලෙස වැඩිවීම යන හේතු මත අවසන් කරගත නොහැකි විය.ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇතිවුවහොත් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.	2020-2021 වර්ෂ සඳහා සැලසුම් කරන ලද ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් මෙම මුදල් ලද අතර ඇතැම් ප්‍රසම්පාදන කටයුතු විදේශ විනිමය ප්‍රතිපත්තිය වෙනස් වීම සහ මිල ගණන් අධික ලෙස වැඩිවීම යන හේතු මත අවසන් කරගත නොහැකි විය.ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇතිවුවහොත් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	කොන්ක්‍රීට් පරීක්ෂාව සඳහා 2018 වර්ෂයේ පෙබරවාරි මස රු.1,661,000 කට මිලදීගත් Concrete Core Drilling උපකරණය මිලදී ගත් දින සිට 2022-10-31 දක්වා නිෂ්කාර්යව පැවතුණි.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආයතනය වෙත පරිපාලන හා මූල්‍ය මාර්ගෝපදේශයක් සකස් කරන ලදී. එය භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට යැවීමෙන් පසුව රාජ්‍ය ව්‍යාපාර දෙපාරුතමේන්තුව මගින් සියළුම ආයතන සඳහා මාර්ගෝපදේශයක් සාදන තෙක් මෙය ක්‍රියාත්මක නොකරන ලෙස දන්වන ලදී. එහෙත් මෙතෙක් සිදුකල කාර්ය සඳහා සැපයුම්කරුට අදාල	2015 වසරේ ඉදිකිරීම් සිදුකල මීගමුව රෝහල තුල අප ආයතනය හරහා දීර්ඝ කාලසීමාවක් සිදුකරන ලද පරීක්ෂන කටයුත්තකදී මෙම උපකරණයේ අවශ්‍යතාවය තදින්ම දැනුනු අතර එවකට සිටි අධ්‍යක්ෂ තුමා මෙම උපකරණය මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු වලට යොමු

		ගෙවීම සිදුකල යුතු අතර එබැවින් මෙය නිෂ්කාර්ය වියදමක් නොවේ.	කරන ලද නමුත් වසර කිහිපයක් ගතවිමෙන් පසුව මෙම උපකරනය මිලදීගැනීමට හැකිවිය. මෙම (Concrete core drilling) උපකරනය මඟින් කොන්ක්‍රීට් ස්ථරයක අවශ්‍ය පුමාණයේ කොටසක් ඉවත්කර එම ඉවත්කරන ලද කොටස සම්පීඩක යන්ත්‍රයක් (crusher) මඟින් සම්පීඩනය සිදුකර ඉවත්කරන ලද කොටසේ සම්පීඩ්‍යතා ශක්තිය (Compressive strength) මැනීම සිදුකරන නමුත් අප සතුව එම උපකරනය නොමැති බැවින් දැනට එම පරීක්ෂන කටයුත්ත සිදුකිරීමේ හැකියාව නොමැත. සම්පීඩක යන්ත්‍රයක් මිලදී ගැනීමට අවශ්‍යතාවය තිබුනත් 2019 වසරේ සිට රට තුල පැවති ආර්ථික අස්ථාවරත්වය නිසා මුදල් වෙන්කරවාගැනිමට හැකියාවක් නොහැකි වූ බැවින් එම උපකරණය තවමත් මිලදී ගැනීමට නොහැකි වී ඇත. ඉහත උපකරණ දෙකම නොමැතිව තනි උපකරණයකින් මෙම පරීක්ෂණ කටයුත්ත සිදුකරගත නොහැකි වී ඇති හේතුව මත මෙම උපකරණය පරීක්ෂණ කටයුතු සඳහා යොදාගැනීමට නොහැකි වී ඇත. 2022 වසරේ පෞද්ගලික ආයතනයක ඉල්ලීම මත කොන්ක්‍රීට් කොටසක සිදුරු කිහිපයක් සාදාගැනීමට අප විසින් මෙම උපකරණය යොදාගත් අතර මෙම වසර අගදී IAEA (International atomic energy authority) ආයතනය මඟින් අප ආයතනයට කොන්ක්‍රීට් පරීක්ෂණ සඳහා විදේශ පුහුනු නියෝජිතයෙකු පැමිනීමට නියමිත අතර මෙම උපකරනයේ භාවිතයන් සඳහා ඔහුගේ සහයෝගය ලබාගැනීමට අප බලාපොරොත්තු වන්නෙමු.

2.3 **(අ)**	<u>**වෙනත් කරුණු**</u> රු.450,000,000 ක් වටිනා කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය සහිත පැන්සල් 52 ක් වෙන් වෙන්ව හදුනාගත හැකි පරිදි ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණු අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලදී එම ද්‍රව්‍ය භෞතිකව පරීක්ෂා කර වාර්තා කර නොතිබුණි.	මෙම කොබෝල්ට්-60 පැන්සල්, අධික විකිරණශීලිතාවයක් සහිත බැවින් සමීපයට ගොස් භෞතිකව නිරීක්ෂණය කල නොහැක. යමෙක් එසේ සමීපයට ගියහොත් තත්පර ගණනක් ඇතුලත මරණයට පත්වනු ඇත. සිදුකල හැකි එකම දෙය වනුයේ ජල තටාකය තුල මෙම විකිරණශීලි පැන්සල් අදාළ රාක්කයේ ස්ථානගතකළ පසු ජල තටාකයට ඉහල සිට නිරීක්ෂණය කලහැකි වීමයි. මෙම කොබෝල්ට් 60 විකිරණශීලි පැන්සල් වලට අදාළ අනුක්‍රමික අංක සටහන පාදක කරගනිමින් එය ඉන්වෙන්ට්‍රිගත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	ඉන්වෙන්ට්‍රිගත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
(ආ)	නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ඒකකයන් කිහිපයක් විසින් (NCBNDT, Training unit සහ Inspection body) නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධ පාඨමාලා පැවැත්වීම හා සම්බන්ධ කටයුතු සහ බාහිර පාර්ශව වෙත පරීක්ෂණ සේවා සැපයීම ආදී සියළු කාර්යයන් සිදුකරමින් පැවතුණි. නමුත් නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධ නියාමනය සහ සුපරීක්ෂණ සඳහා ස්වාධීන ආයතනයක් දක්නට නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් භාවිතා කරන අන්තර්ජාතික ප්‍රමිත ශ්‍රී ලංකාව තුළ නීතිගත කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන කිසිවක් කෙටුම්පත් කර නොතිබුණි.	NDT පුද්ගලයින්ගේ සුදුසුකම් සහ සහතික කිරීම පහත සඳහන් මූලික ඝාධක හතර මත පදනම් වේ: 1. පුහුණු අවශ්‍යතා (NDT training) 2. NDT විභාග අවශ්‍යතා (NDT qualification) 3. අදාල NDT පළපුරුද්ද (Industrial Experience) 4. දෘෂ්ටි අවශ්‍යතා (vision requirement) NDT පුද්ගලයින්ගේ සුදුසුකම් සහ සහතික කිරීම සඳහා වූ බොහෝ යෝජනා ක්‍රම (scheme) ඇති අතර ඒවායින් ප්‍රමුඛ වන්නේ ISO 9712 සහ SNT-TC-1A වේ. ISO 9712 යනු ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ NDT සඳහා පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතියයි. SNT-TC-1A ප්‍රකාශයට පත් කරනු ලබන්නේ the American Society for Non-Destructive Testing (ASNT) විසින් නිර්දේශිත පුහුණුවයි. විවිධ සුදුසුකම් සහ සහතික කිරීමේ වැඩසටහන් සේවා යෝජකයා (employer base) මත පදනම්ව හෝ මධ්‍යම (central) ලෙස ව¾ගිකරණය කළ හැකිය. SNT-TC-1A, යනු නිර්දේශිත පුහුණුක් වන අතර (recommended practice), ලිඛිතව ස්ථාපිත කිරීම සඳහා මාර්ගෝපදේශ සපයයි. මෙය භාවිතා කර කිසි යම්	NCNDT ආයතනය ලෙස, අපි NDT පුහුණු පාඨමාලා පැවැත්වීම, NDT සහතික කිරීම (Certification) සහ NDT පරීක්ෂණ (Inspection) වැනි විවිධ සේවාවන් සැපයීමෙහි සක්‍රීයව නිරත වී සිටින්නෙමු. කෙසේ වෙතත්, අප නියාමන ආයතනයක් නොවන බව පිළිගැනීම ඉතා වැදගත් වේ. එබැවින්, අපි යම් රෙගුලාසි හෝ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදහස් කරන්නේ නම්, අපි ඒවා ප්‍රවේශමෙන් සලකා බලා සුදුසු නියාමන අධිකාරියක් විසින් නියම කර ඇති නියෝග සහ මාර්ගෝපදේශ සමඟ පෙළගැස්විය යුතුය.

		ආයතනයකට / පුද්ගලික සමාගමට ඊට අදාල වන පරිදි එහි සිටින NDT පුද්ගලයින්ගේ සුදුසුකම් සහ සහතික කිරීම සඳහා අවශ්‍ය මූලික ලේඛනයක/ලිඛිත පරිවයක් පිළියෙළ කර ගත හැක(written practice). මෙම ලිඛිත පරිවය මගින් සමාගම/සේවායෝජකයා(Employer), විසින් බලාපොරොත්තු වන පළපුරුද්ද,විභාග අවශ්‍යතා, පුහුණු අවශ්‍යතා එක් එක් NDT මට්ටම් වලට (NDT level) ඊට අදාලව නිර්වචනය කරනු ඇත. කලින් කියූ පරිදි SNT-TC-1A, සමාගමක් හෝ සේවා යෝජකයා මත පදනම්ව කරණු ලබන යෝජනා ක්‍රමයකි. එනම් යම් කිසි අපේක්ෂකයෙකු වෙනත් සමාගමකට බැඳීමට කැමති නම්, ඔහු දැනට වැඩකරමින් සිටින ආයතනයේදී ලබා ගත සහතිකයේ වලංගුභාවය ඔහු යෑමට අදහස් කරන ආයතනයේ අවශ්‍යතාවලට සරිලන පරිදි ඇත්නම් පමණක් හා එම ආයතනය එම සහතිකය පිළිගනු ලබන්නේ නම් පමණක් වලංගු වේ SNT-TC-1A යනු දැඩි නීති රීති මාලාවක් රහිත පුහුණුවක් වන අතර, යෝජකයා ගේ ලිඛිත පරිවයට අනුව ලබා දෙන පුහුණුව හෝ පරීක්ෂණ එම සේවාව ලබා ගැනීමට පැමිණෙන පුද්ගලයා හෝ ආයතනය එකග වේ නම් පමනක් එම සේවාව ලබා ගැනීමට හෝ නොගැනීමට හැකියාව ඇත. තවද, SNT-TC-1A මාර්ගෝපදේශ නියම කරන අතර මේවායේ විශේෂ අවශ්‍යතා හෝ සුදුසු නොවන තැන් වෙනස් කිරීම් සඳහා සේවායෝජකයාට ඉඩ දෙයි. සේවායෝජකයා විසින් ම තම සේවාව පවත්වාගෙන යාමට මූලික විය යුතුය. එබැවින් සේවායෝජකයා, තම සංවිධානයේ යහපත සඳහා නම්‍යශීලීභාවය තම අභිමතය පරිදි භාවිතා කළ යුතුය. නමුත් කිසිම ආකාරයකින් යෝජනා ක්‍රමය අනීතික ලෙස භාවිතා නොකළ යුතුය.එබැවින් ලෝක සම්මතයට අනුව මෙම SNT-TC-1A පුහුණු කිරීම් කරණ ආයතන සඳහා නියාමනයක අවශ්‍යතාවයක් නොමැත. ISO 9712 ප්‍රමිතියක් ලෙස දක්වා ඇති අතර ලිඛිත පරිවයක් අවශ්‍ය නොවේ.ISO ප්‍රමිතියේ අවශ්‍යතා අනුව	

		වගකීම්, පළපුරුද්ද, පුහුණුව සහ විභාගය සඳහා අවශ්‍යතා ලේඛනගත කළ යුතුය. ISO 9712 මධ්‍යම සහතික කිරීමේ ක්‍රමයක්වේ. ISO 9712 අනුව විභාගය පවත්වනු ලබන්නේ සේවා යෝජකයාගෙන් (EMPLOYER) ස්වාධීන ආයතනයක් විසිනි. එම පුහුණුව, අධ්‍යාපනය, පළපුරුද්ද අවශ්‍යතා ප්‍රමිතියකට අනුගත වන අතර එම නිසා සහතිකය රැකියා ස්ථානයේ වෙනසක් සිදු වුවද වලංගු වේ. ISO 9712 ට අදාලව තම රට තුල පුද්ගල සහතික කිරීමේ ආයතනය මගින් මෙම සහතික කිරීමේ ක්‍රියා පටිපාටිය පරිපාලනය කිරීමට සුදුසුකම් පවරා ඇත. එලෙසම විභාග පැවැත්වීමට හා පුහුණු කටයුතු සිදු කරගෙන යාමට සුදුසුකම් සහිත ආයතනයකට බලය පැවරිය හැක. තවද ISO 9712 තෙවන පාර්ශවීය තක්සේරු යෝජනා ක්‍රමය සඳහා අවශ්‍යතා නියම කරයි එනම් ISO 17024 තත්ත්ව කළමනාකරණ පද්ධතිය (ISO/IEC 17024:2012, Conformity assessment - General requirements for bodies operating certification of persons,),යටතේ එම පුද්ගල සහතික කිරීමේ ආයතනය ප්‍රතීතනයට ලක්විය යුතුය. ශ්‍රී ලංකාව තුල මෙම ක්‍රියාවලිය සිදු කරනුයේ NCBNDT මගිනි. රට තුල ISO 9712 ට අදාලව විභාග හා පුහුණු කටයුතු සිදු කරන්නේ NCNDT හි පුහුණු කිරීමේ අංශය හා NCBNDT ට අයත් විභාග කමිටුව විසින් පමණක් වන අතර NCBNDT හි ජාත්‍යන්තරව හා දේශීයව ප්‍රතීතනය පවත්වාගෙන යාමේදී මෙම අංශයන්වලද එම කටයුතු සිදු කරයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) ISO/IEC 17024:2012 “අනුකූලතා තක්සේරුව — පුද්ගල සහතික ආයතන සඳහා සාමාන්‍ය අවශ්‍යතා” හි තත්ත්ව කළමනාකරණ පද්ධතියට අනුකූලව 2013 වසරේ සිට NCBNDT ප්‍රතීතනයට ලක් කර ඇත. නිර්විනාශක පරීක්ෂණ සඳහා වූ ජාත්‍යන්තර කමිටුවේ බහු පාර්ශවීය පිළිගැනීමේ ගිවිසුම 2 (Personnel Certification Bodies Registered under the	

		International Committee for NDT-ICNDT MRA 2) යටතේ ලියාපදිංචි ආයතනයක් ලෙස NCBNDT කටයුතු කරන අතර තවමත් ලෝකයේ සුදුසුකම් සපුරා මේ හා ලියාපදිංචි වී ඇත්තේ රටවල් 20 පමණ සුළු ප්‍රමාණයක් වේ. තවද NCNDT හි පුහුණු කිරීමේ අංශය තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ද ලියාපදිංචි පුහුණු කිරීමේ බලයලත් අංශයකි. එම නිසා ISO 9712 යෝජනා ක්‍රමය අනුව NDT පුහුණු පුහුණු කිරීමේ හා සහතිකකරණ ක්‍රියාවලිය සඳහා පිළිගත් දේශීය යාන්ත්‍රණයක් NCBNDT මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම NDT සහතිකය ලබාගත් පුද්ගලයින් හට එම NDT මට්ටමට (NDT LEVEL) අනුව ඊට අදාල වගකීම් සහිතව NDT සේවා සැපයීම පරීක්ෂණ සහ පුහුණු කිරීම් කටයුතු සඳහා සහභාගී විය හැක . NDT සේවා වලින් පසුව ලබා දෙන NDT INSPECTION වාර්තා වල වලංගු භාවය රදා පවතින්නේ එය සිදු කරනු ලබන පුද්ගලයන්ගේ සුදුසුකම් මත පමණක් වන අතර ඕනෑම පුද්ගලයෙකුට හෝ ආයතනයකට NDT සේවා සිදු කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ගත් පසුව එම සේවා සිදු කිරීමට කිසිදු බාධාවක් නොමැති අතර, එය නියාමනය කිරීමට මෙතෙක් ලෝකයේ හඳුනාගත් ප්‍රයෝගික ක්‍රමයක් නොමැත. තවදුරටත් එය සේවා සපයන සහ සේවාව ලබන ආයතන හෝ පුද්ගලයන් අතර පවතින විශ්වාසනීයත්වය හා සුදුසුකම් මත පමණක්ම රදා පවතී.	
(ඇ)	2015 වර්ෂයේදී නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම පවරාගැනීම හේතුවෙන් ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරියට බදු හිමිකාරීත්වය ඇති ඉඩමක මණ්ඩලය විසින් උක්ත ව්‍යාපෘතිය හරහා නව ගොඩනැගිල්ලක් ඉදිකරවා ගෙන තිබුණද මේ දක්වා අදාල ඉඩම පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද උක්ත ඉඩම තෝරාගැනීමට පෙර මාලඹේ ප්‍රදේශයේ ඉඩමක් තෝරාගෙන නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය විසින් මණ්ඩලය වෙනුවෙන් රු.333,446,138 ක් වැය කර	ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරිය හා ජාතික ආධුනිකත්ව මණ්ඩලය සමග මේ පිළිබඳව සාකච්ඡාකර අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය සම්බන්ධව විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් සිදුකල විශේෂ විගණනයේ අවසන් වාර්තාව ලබාගැනීම හා ව්‍යාපෘති	මාලඹේ ඉඩම වෙනුවෙන් මිලියන 181 ක් ගෙවා ඇති අතර එම අවස්ථාවේදී පැරණි ඉඩමෙහි භුක්ති නොවිඳි කාලයට අදාල බදු කුලිය අයකර ගැනීමට කටයුතු කර නොමැති බැවින් ඒ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය වෙතද ලිඛිතව දැනුම් දීම් කරමින් මණ්ඩලයට ලැබිය යුතු වන්දි මුදල ලබා ගැනීමට කටයුතු කරමින්

	ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතියදී මහජන විරෝධතා නිසා අතර මඟ නවතා දැමීම නිසා වැය කර තිබුණු මුදල් අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. මාලඹේ ඉඩම සඳහා මුදල් ගෙවීමේදී පැරණි ගොඩනැගිල්ල පැවති ඉඩම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරියට ගෙවූ බදු කුලිය රු.7,663,837 ක් අඩු කර ගෙවිය යුතු වුවත්, එසේ අඩු කර ගෙවීම සිදුකර නොතිබුණි. මෙම ඉඩමේ වෙළඳපොල වටිනාකම රු.116,000,000 ක්ද, අවුරුදු 30 ක් සඳහා බදු වටිනාකම රු.75,500,000 ක්ද වූ රජයේ තක්සේරුව නොසලකා රු.181,000,000 ක් ගෙවා තිබුණි.	අධ්‍යක්ෂකගෙන් මේ පිළිබඳ වැඩිදුරටත් විමසීම් කර අවසන් පිළිතුරක් ඉදිරියේදී ලබාදීමට කටයුතු කරමි.	ඇත. මේ සම්බන්ධව අදාල අමාත්‍යාංශ නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් අදාල ආයතනවල නිලධාරීන්ද සමග සාකච්ඡාවන් පැවැත්වුවද මෙතෙක් පැහැදිලි ප්‍රතිචාරයක් ලැබී නොමැත. මේ පිළිබඳව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් පරිදි අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ සාකච්ඡාවක් කැඳවීම සඳහා ඉල්ලුම් කරමින් 2023.01.30 දිනැති ලිපිය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. මෙම ගැටළුව සම්බන්ධව 2023 මැයි මස 08 දින පැවති පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීමේදීද දන්වන ලදුව එම කමිටුවට එම ගැටළුව යොමු කරන ලෙස ලබාදුන් උපදෙස් අනුව ඊට අදාල වාර්තාවක් එම කමිටුව වෙත යොමු කර ඇත.
(ඈ)	2021 වර්ෂය සඳහා නිසි ලෙස අයවැය පුරෝකථනය නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 16 ක වියදම් සීමාව ඉක්මවා ගෙවීම් කර තිබුණු අතර පුනරාවර්ථන වැය විෂයයන් 6 ක අයවැයගත ප්‍රතිපාදනය හා තත්‍ය වියදම අතර සියයට 30 සිට සියයට 100 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය විය.	අයවැය ප්‍රතිපාදනය හා තත්‍ය වියදම අතර වෙනස අවම වන පරිදි කටයුතු කරනු ලැබේ.	අයවැය ප්‍රතිපාදනය හා තත්‍ය වියදම අතර වෙනස අවම වන පරිදි කටයුතු කරනු ලැබේ.

.....

සභාපති,
ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය.